# 2020 දෙසැම්බර් මස 01 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**<u>සහභාගිත්වය</u>**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ශ්‍රේෂන් කෙරම්ණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්ර්රි |
| ඒ.පී ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදූර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මඟගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී.ජී. ආර්. පේෂලා කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්. ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| රාහුල ලලිත වික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්.එම්. සරත් චන්ද්‍ර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මඟගේ චම්පා සුමුදු කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |

- **පන්සිල් සමාදන් විමෙන් අනතුරුව පෙ.ව.9.30 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී**

**( 01 )** සභා රැස්වීම් වාර්තා සම්මත කිරීම

**01.01** 2020.11.03 හා 10 වෙනිදින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.11.03 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කරන ලෙස ඉල්ලා සිටිනවා.

- **පෙ.ව. 09.32 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී පේෂලා කුමාරි මහත්මිය හා ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතාගේ පැමිණීම**

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

2020.11.03 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.11.03 දින පැවති වාර්තාවේ සංශෝධනයක් තිබෙනවා. එය මා විසින් ඉදිරිපත් කරනවා. 2020.11.03 දින පැවති මාසික සභාවේ මන්ත්‍රීවරුන්ගේ පැමිණීම සටහන් කිරීමේදී සභා වාර්තා යතුරු ලියන කටයුතු සිදු කිරීමේදී ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතාගේ නම ඇතුළත් කිරීම සිදු වී නොමැත. නමුත් 2020.11.03 දින ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා ඒ දින මාසික සභාවට පැමිණ ඇත. මාගේ අතින් යතුරු ලියන කටයුතු සිදු කිරීමේදී සිදුවූ දෝෂය සංශෝධනය කරන මෙන් අපගේ සටහන්කාරියම ඉල්ලා සිටිනවා. එම සටහන සංශෝධනයක් වශයෙන් ඇතුළත් කිරීමට මා යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.11.03 දින පැවති මාසික සභා රැස්වීමේ මන්ත්‍රීවරුන්ගේ පැමිණීම සටහන් කිරීමේදී යතුරු ලියන කටයුතු සිදු කිරීමේදී ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතාගේ නම ඇතුළත් කිරීම සිදු වී නොමැති අතර එදින මාසික සභා රැස්වීමට එතුමා සහභාගි වී ඇති අතර යතුරු ලියන කටයුතු සිදු කිරීමේදී සිදුවූ දෝෂය සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ

ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**( 02)** සභාපතිවරයා විසින් නිකුත් කරන විශේෂ නිවේදන **නැත**

**( 03)** ලැබී ඇති පැමිණිලි , පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 2020.11.05 දින පොදු කටයුත්තක් සඳහා ප්‍රජාමූල අරමුදලින් මුදල් වෙන්කර ගැනීම සඳහා ඕකන්ද ප්‍රජා මණ්ඩලය මඟින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ප්‍රජා බල මණ්ඩලය ඕකන්ද ප්‍රජා මණ්ඩලය වෙනුවෙන් පොදු කටයුත්තක් වෙනුවෙන් අවසර ඉල්ලා සිටිම. ඕකන්ද ශ්‍රී ජයබෝධිරාම විහාරධිපතිහිමියන් විසින් ඕකන්ද ප්‍රජා මූල මණ්ඩලයේ නිලධාරින් කැඳවා අවශ්‍යතාවයක් වන අත් සෝදන ආධාරයක් ප්‍රජා මූල මණ්ඩලය මඟින් ලබාදීම සඳහා ඉල්ලීමක් කරන ලදී. විහාරස්ථානයේ කඨින පිංකම සහ වෙනත් පිංකම් සඳහා සෞඛ්‍යාරක්ෂිත කටයුතු වලින් ආරක්ෂා වීම පිළිබඳ අවධානය අපි සමිතිය මඟින් අවධානය යොමුකර ඇත. විහාරස්ථානයේ පොදු කටයුත්ත වෙනුවෙන් වැයවන මුදල වන රු.10000/= ක මුදල ප්‍රජා මණ්ඩල ගිණුමෙන් ලබා ගැනිමට අනුමැතිය ඉල්ලා සිටිනවා. එය අනුමත කර තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ ගැන කතා කරන්න අවශ්‍ය නැහැ. විහාරාධිපති හිමියන්ගේ ඉල්ලීම මා මාගේ පුද්ගලික වියදමින් සිද්ධ කර දුන්නා. දැන් ඒ ගැන මුදල් වෙන්කිරිම හෝ වෙන කිසිම දෙයක් අවශ්‍ය නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මෙය ඉතාම අත්‍යවශ්‍ය කටයුත්තක්. එය ඔබතුමාගේ පෞද්ගලික ධනයෙන් ලබාදීම පිළිබඳව අප සියළු දෙනාගේම ස්තුතිය පුද කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

එහෙමනම් එය ඉවත් කිරීමක් කරන්න . එය ලබා දී තිබෙනවානේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මුදල් ලබා දීම අවශ්‍ය වෙන්නේ නැහැ. එම නිසා ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාට අපේ ස්තූතිය පුද කරමින් මෙම ඉල්ලීම අවශ්‍ය නොවන බැවින් ප්‍රතික්ෂේප කරනවා.

**තීරණය-**

ඕකන්ද ශ්‍රී ජයබෝධි විහාරස්ථානයේ පොදු කටයුත්තක් වෙනුවෙන් රු.10000/- ක මුදලක් ඕකන්ද ප්‍රජාමූල අරමුදලින් නිදහස් කරදෙන ලෙස ඉල්ලා කර ඇති ඉල්ලීම ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කළ අතර, ඒ සඳහා තම පෞද්ගලික මුදලින් රු.10000/- ක් පරිත්‍යාග කළ බවට ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා පැවසූ හෙයින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී.

**03.02 අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය මඟින් රතන සූත්‍ර සජ්ඣායනාවෙන් බලගතු කරන ලද පිරිත් පැන් ඉසීම වෙනුවෙන් ප්‍රවාහන පහසුකම් සහා අනුමැතියට යටත්වලබා දීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය මඟින් රතන සූත්‍ර සජ්ඣායනාවෙන් බලගතු කරන ලද පිරිත් පැන් ඉසීම වෙනුවෙන් ප්‍රවාහන පහසුකම් ඉල්ලා තිබෙනවා. 2020 නොවැම්බර් මස 06 වෙනිදින සිට පුරා දින හතක් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සමිතිය මඟින් පිරිත් සජ්ඣායනා කළා. පැන් ඉසීම සඳහා වාහනයක් ඉල්ලා සිටියා. එම වාහනය සභාවේ අනුමැතියට යටත්ව ලබා දුන්නා. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය-**

රතන සූත්‍ර සජ්ඣායනාවෙන් බලගතු කරන ලද පිරිත් පැන් ඉසීම සඳහා ප්‍රවාහන පහසුකම් ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය විසින් එවා ඇති ලිපිය අනුව සභා අනුමැතියට යටත්ව ප්‍රවාහන පහසුකම් ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව එකමතිකව සභා සම්මත විය.

**03.03 මහ අම්බලන්ගොඩ මාර්ගය අලුත් වැඩියා කිරිම සඳහා වැඩ ක්ෂේත්‍ර පරිපාලක මහතා විසින් ABC කියුබ් 70ක් ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මිළඟට මහ අම්බලන්ගොඩ පාර අලුත් වැඩියා කිරිම. මෙම අමුණා ඇති ඇස්තමේන්තු අනුව මාර්ගය අලුත්වැඩියා කිරිම සඳහා අවශ්‍ය ABC කියුබ් 70ක් අවශ්‍ය වෙනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් එහි ගල් කියුබ් බාන විට කවුරු හරි අධික්ෂණ කටයුතු සිදු කරනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගෙවිම් සඳහා කාර්මික නිලධාරින් අධික්ෂණය කරන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

දැනට බා කොටසක් වෙන් කර තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ තාක්ෂණසේවා නිලධාරි මහතාණෙනි, මේ මහ අම්බලන්ගොඩ පාර අලුත්වැඩියා කටයුතු කිරිමේදි වැඩ කේෂත්‍ර නිලධාරි මහතගේ ඉල්ලිම පරිදි ABC කියුබ් 70ක් සපයන්න කියා ඉල්ලා සිටියා. මේ සම්බන්ධව අධික්ෂණය කරනවාද කියා සභාව විසින් අහනවා. එතකොට ගෙවීම් වලදි කොහොමද ඔගොල්ලන් අනුගමනය කරන්නේ. ක්‍රමවේදය මොකක්ද ? මෙය ගබඩාවට පෙන්වා තමයි වැඩබිමට යන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව අපේ මන්ත්‍රිවරු දැනුවත් කළානම් හරි. මොකද අපි මේ ක්ෂේත්‍රයේ සිටින නිසා අපි මේ ගැන දන්නවා. සාමාන්‍යයෙන් අපේ මේ කාර්මික නිලධාරින් මේ ඇස්තමේන්තු හදන්නේ  සාමාන්‍යයෙන් මාර්ගයක 100ක් දිග තිබෙනවා නම් පළල මිටර් 03 ක් තිබෙනවා නම් එම මීටර් 3 කඩනවා නම් දිග මිටර් 100ක් කඩනවා නම් කොච්චර ප්‍රමාණයක් එහි ABC වැටෙනවා ද කියා. එය ගණන් හදා බැලුවාම ඒ කිලෝමිටර් ගණන තිබෙනවා. සාමාන්‍යයෙන් අපේ නිලධාරින් වැඩය අවසන් වූ පසු අපේ කාර්මික නිලධාරින් බලනවා නම්

මෙය කොච්චර දමනවාද කියා අපේ මන්ත්‍රීවරු ගිහින් බලනවා නම් මෙහි කොච්චර විතර වැටෙනවාද කියා එතකොට අපිට එහි දිගින් පළලින් උසින් වැඩ කළාම එහි ප්‍රමාණය එනවා. මෙය හොරකමට එහෙම ගෙවන්න බැහැ. එමනිසා මා ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. මෙයට මන්ත්‍රීවරු දැනුවත් කරන්න . එමනිසා මන්ත්‍රීවරුත් දැනුවත් කරන්න. වැඩේ කරනවා . ඒ ප්‍රදේශවල සිටින මන්ත්‍රීවරු කවුරුවත් දන්නේ නැහැනේ. එමනිසා මා ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. ඒ ප්‍රදේශවල සිටින මන්ත්‍රීවරු දැනුවත් කරන්න. එතකොට මේක ගැටළුවක් වෙන්නේ නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

තාක්ෂණසේවා නිලධාරි මහතාණෙනි මෙය මැනිම් කටයුතු කරන්න ඔබ විසින් අනුගමනය කරන පිළිවෙල කුමක්ද ? පැහැදිලි කර දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා මෙහිදි එක දෙයක් කිව යුතුයි. එතකොට අපේ නිලධාරියෙකු සමඟද ඒ තැන්වලට යන්නේ. අන්න එතනයි මට තිබෙන ප්‍රශ්නය. අර උප සභාපතිතුමා කිවු ක්‍රමවේදයත් හරි . ඔක්කොම කරන්න පුළුවන්. අපේ මෙහේ ගබඩාවෙන් භාර ගෙන එහෙට යනකොට එයින් භාගයක් කොහේට හරි දමා ගියහොත් එහෙම එම ක්‍රමය හරි යන්නේ නැහැ. එතකොට යන්න වෙන්නේ අර උප සභාපතිතුමා කිවු ක්‍රමවේදයට තමයි. නැතිනම් මෙතනින් භාරගෙන එයට ගෙවිම් කරනවා නම් වැඩබිමට යනකම් එහි අධික්ෂණය කරන්න ඕනේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අපිට පැහැදිලි කිරිමක් කරන්න ඕනේ.

**ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාගයේ දැක්ම වැඩසටහන හොඳයි. සංවර්ධන වැඩ කටයුතු සඳහා ඒ සියළුම දේවල් හොඳයි. මෙකයි දැන් මේ ABC පුරවනවනේ. දැන් අයින පුරවනවානේ. මෙය කරන්නේ ජල සම්පාදනයෙන් ලබා දුන් ඇස්තමේන්තුවකටද . නැතිනම් අපේ තාක්ෂණසේවා නිලධාරින් ඇස්තමේන්තුවක් හදා තිබෙනවාද? කොපමණ දමා තිබෙනවා ද ? මෙතැනින් කොපමණ ප්‍රමාණයක් චෙක් කරලා පැමිණ තිබෙනවාද කියා. ඒවගේ ලොග් සටහන් දමා තිබෙනවාද කියා. අපේ ධම්මික කොඩිකාර

මහතාත් ප්‍රකාශ කළා. අතනට කොපමණ ප්‍රමාණයක් ගල් ගිහින් තිබෙනවාද කියා දන්නේ නැහැනේ. එමනිසා ඒ ගැන දැනුවත් වෙන්න. විනිවිදභාවයකින් කරන්න. ඔය වාර්තා අපිට දෙන්න. කොච්චර දිලා තිබෙනවාද ? කොච්චර ගණන් දමා තිබෙනවා ද? තාක්ෂණසේවා නිලධාරි කෙනෙකු ගිහින් එහි වැඩ පරික්ෂණ කරනවාද කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා මා ඒ සම්බන්ධව ඔබතුමාලාට බලතල පැවරිම සම්බන්ධව 05.01.03 යටතේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මෙතෙක් කල් කර්මාන්ත සඳහා එවැනි බලයක් තිබ්බේ නැහැ. කමිටුවකට. කමිටුවක් වශයෙන් කටයුතු කරන්න ඉදිරියේදි ඔබතුමලාට බලය ලැබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

දැන් ABC පුරවනවානේ. අපිට දැන ගන්න ලැබුණා . ලොකු තද වු ගල් ඉවත් කරලා කියා ඕක දැම්මේ. ABC පුරවනකොට පසු කාලයකදි ඕක බහිනවා. කෝටි ගණන් වියදම් කරන කාපට් එකේ වටිනාකම නැති වෙනවා. ටික කාලයක් යනකොට.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එහෙම වෙන්නේ නැහැ. ABC දැම්මාම 98% කට වගේ ගන්න පුළුවන්. එතරම් මේකක් වෙන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

දැන් ගොඩක් තැන්වල එහෙම වෙලා තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහෙමයි. සාමාන්‍යයෙන් අපි ඉංජිනේරු වාර්තා පිළිගන්නවා. එම වාර්තා පිළි ගන්න වෙනවා. එහි ABC දාන්න තමයි නියම කර තිබෙන්නේ. මේ මහ අම්බලන්ගොඩ පාර සම්බන්ධයෙන් කියන්න ඔනේ. මේ මහ අම්බලන්ගොඩ පාර කැඩිම සම්බන්ධව අපිට මුදල් ගෙවා තිබෙන්නේ ජල සම්පාදන මණ්ඩලය. එතකොට අපි ABC සඳහා යන වියදම තාර සඳහා යන වියදම සියල්ලම අයකරගෙන තිබෙන්නේ. එකයි වෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මහ අම්බලන්ගොඩ පාර ගැන කතා කරනකොට මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ජීවත්වන මන්ත්‍රීවරයෙක් වශයෙන් ඒ ගැන කතා කිරිමේ විශේෂත්වයක් තිබෙනවා. මා එම ගල් දමන විට ටිකක් ගිහින් බැලුවා. තාම ලෝඩ් 70ක් කිවුවාට තාම ලෝඩ් 20ක් වගේ දමා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමිය මේ අනුමැතිය ඉල්ලන්නේ. ඒ ගෙවීම් කරන්නේ අවශ්‍ය ප්‍රමාණයට විතරයි. ඒ අය ඇස්තමේන්තුව ඉක්මවා යනවා නම් වෙනම අනුමැතියක් මෙතන ගන්නවා. ඒ අය ඇස්තමේන්තුව ඉල්ලා තිබෙන්නේ මෙච්චර ප්‍රමාණයක් ඕනේ. එතකොට වැඩ කරපු ප්‍රමාණයට තමයි ගෙවන්නේ. එතකොට මේ මන්ත්‍රිවරුන්ට මෙහි දිග පළල මේවගේ බලා ගන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

අපිට කාපට් එක දමන්නේ කොච්චර ප්‍රමාණයකට කියා දැන ගන්න කැමතියි. ඇත්තටම මේ කඩපු පැත්ත හැර අනිත් පැත්තේ වල් බිහිවෙලා තිබෙනවා. ඒ පැත්ත හැර අනිත් පැත්ත මා අපේ කාර්මික නිලධාරි මහතාගෙන් ඉල්ලනවා. අපේ බැකෝ යන්ත්‍රය යොදා

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එහි පළල පිළිබඳ මා දැනුම් දෙන්න පුළුවන්. මාර්ග සංවර්ධන අධිකාරියෙන් දැනුම් දී තිබෙනවා. නැහැ මට ඊයේ අපේ උත්සවයේදි ලබා දුන්නා. ඒ පළල පිළිබඳව. ඒ පළල පිළිබඳව දැනුවත් කිරිම කරන්න පුළුවන්. එහි මැනලා අපේ කාර්මික නිලධාරින් සමඟ ගිහිල්ලා තමයි ඇස්තමේන්තු කර තිබෙන්නේ. අපි කියා තිබෙනවා. උපරිම පළලට අරගෙන දෙන්න කියා. එම පළල අරගෙන දෙන්නම්. මාර්ග සංවර්ධන අධිකාරියේ ඇස්තමේන්තුව අනුව තමයි එය තීරණය වෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , අපි ඉල්ලා සිටිනවා. පුළුවන් තරම් මාර්ගය පළල් කර ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ පාරවල් ටික හොඳින් කර ගැනිමේ බලාපොරොත්තුව තිබෙනවා. එමනිසා මන්ත්‍රිවරු මේ කරන ව්‍යාපෘති කිරිමේදි උපරිම සහාය අරගෙන දෙන්න. දැන් මෙහෙම දෙයක් තිබෙනවා මේ

පාරවල් කිරිමේදි මේ පාරවල් දහවල් කාලයේදි අපිට මේ පාරවල් වහන්න සිද්ධ වෙනවා. ඒ සඳහා අපිට උදවු කරන්න. ඒ ප්‍රදේශවල සිටින මන්ත්‍රිවරුන්. දැනට අපි ඉතා ඉක්මනින්ම අවසන් කරන්න පුළුවන් ටික අවසන් කරනවා. ලබන සතිය වෙනකොට කාපට් ඇතිරිම කරනවා. මේ දිනවල කරන්නේ ABC දැම්මයි. පාරේ තිබෙන පළලට වඩා වැඩි වෙනවා. ආර්.පි. ආතර් ද සිල්වා මාවතේ ABC දමා පළල් කර හදනවා. මෙහි හොඳ අලංකාර විදියට වැඩය කෙරෙයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ඒ විදියට කරන්න කියන ඉල්ලිම තමයි ඔබතුමාගෙන් කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මහ අම්බලන්ගොඩ පාර අලුත් වැඩියා කිරිම සම්බන්ධ ලිපිය තමයි සභාගත කර තිබෙන්නේ. මහ අම්බලන්ගොඩ මාර්ගය ප්‍රධාන මාර්ගයක් අම්බලන්ගොඩ ප්‍රදේශයේ. එය නිසි ලෙස සකස් කර ගන්න ඕන. එකනිසා තමයි මේ මන්ත්‍රිවරුන් මන්ත්‍රිවරියන් මෙය පුන පුනා අහන්නේ. මේ ජල සම්පාදන මණ්ඩලයෙන් ඇස්තමේන්තුවක් සකස් කරලාද මේ ගෙවා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ජල සම්පාදන මණ්ඩලයෙන් මේ පාරට අපිට මුදල් ගෙවුවා. ඒ ඇස්තමේන්තුවට අපි මිට වසරකට කලින් තමයි අපි මුදල් ගෙවුවේ. නමුත් ඒ අය කරන්නේ නැතුව තිබුණා. අපේ අපේ මේ සෞභායේ දැක්ම වැඩසටහන නිසා අපි ඒ අයගෙන් ඉල්ලා සිටියා අපිට මෙය කරදෙන්න කියා. ඒ අනුව තමයි අපි මෙය කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙතන ගැටුමක් තිබෙනවා. දැන් අපිටත් කතා කරනවා සමහර උදවිය. මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ සමහර උදවිය. මේක පාර හැරුවා. ජල සම්පාදන මණ්ඩලයෙන් පයිප්ප දැම්මා. ඒ පාර පස් පුරවා තැන් තැන් වල ගසා තිබුණා. ඒවා මිනිසුන් ඇඳ ගත්තා. ඒවා මෙහෙට හරි ගෙනත් දාන්න තිබුණා. ඒක එකක්. අනිත් එක මේ කියුබ් 70ක් මෙහෙම දැම්මාම වැරදි මතයක් යන්න

පුළුවන්. මෙහෙම දැම්මාම. දැන් මේක නගර සභාවෙන් නම් මෙය පුරවන්නේ එතන කවුරු හරි වැඩ පරික්ෂක කෙනෙකු ඉන්න ඕන වැඩය ආරම්භයේ සිට අවසානය දක්වා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වැඩ පරික්ෂක කෙනෙකු ඉන්නවා. ජානක මහතා ඉන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මටත් ඔය පැමිණිල්ල ලැබුණා. මා නිලානි මන්ත්‍රීතුමියටත් කතා කර ඇහුවා මොකක් ද මේ කියන්නේ කියා. සේවකයන්ට ඕන විදියට වැඩ කටයුතු ටික කරනවා. කිසිම අධීක්ෂණයක් නැහැ. මේ කියන කතාව ඇත්ත. අපි කියන්නේ 70ක් නෙමේ 100 ක් දැම්මාත් කමක් නැහැ. වැඩය හරියට කරලා. වැඩය හරියට ඕනේ. නැතිනම් දොස් අහන්න වෙනවා ගමේ මන්ත්‍රීවරුන්ටත් එක්ක. ඔබතුමාටත් මෙය අහන්න වෙනවා. එමනිසා වැඩය ප්‍රමිතියට අනුව වැඩය කරන්න ඕනේ. ABC 70 නෙමේ. මේ ඔබතුමාගේම මන්ත්‍රීවරයෙක් කිවුවා. මෙතන 70 නෙමේ . වෙන කොහේ හරි බැවොත් එහෙම . එක කියන්න බැහැ. අද රටේ තිබෙන තත්ත්වයක් එක්ක. අපි නිතරම සභාවත් බෙරිලා . අනිවාර්යෙන් වැඩය ප්‍රමිතියට කෙරෙන්න ඕනේ. ඒක නිසා අපි කියන්නේ වැඩය කෙරෙන්න ඕනේ. මා හිතන්නේ ඉනෝකා මන්ත්‍රීතුමියත් දන්නවා ඇති. පස් වගයක් තිබිලා ඇද්ද බව. එක්කෝ මෙහෙන් අවසරයක් අරගෙන ඕන කෙනෙකුට දෙන්න ඕන. මේවා මේ මහජන පොදු දේපල . ඉතිං මේවා ආරක්ෂා කිරිම අපේ නගර සභාව සතු දේපල ආරක්ෂා කිරිමේ වගකිම අපේ වගකීම අපිට තිබෙනවා. එක නිසා තමයි අපි මේ කතා කරන්නේ. මේ ව්‍යාපෘති වලට මොකකටමත් අපි අකමැති නැහැ. හැබැයි විනිවිදභාවය තුළ මේ ගෙවන්න ඕන දේවල් ගෙවා ගන්න. කිසිම ගැටළුවක් නැහැ. මෙතන ප්‍රශ්න ගැටළු එන්නේ මෙහෙම දැම්මාම . මෙහි වැඩයේ දැනට කොටසක් කරනවා. දමන කියුබ් ගණන මා දන්නේ නැහැ කොහොම දනවා ද කියා. මේ තාක්ෂණසේවා නිලධාරි මහත්වරු කියනවා. කිවුවාම අපි ඔබතුමලා කියන දේ පිළිගන්නවා. සභාපතිතුමා වුණත් ඔබතුමලා කියන දේ පිළි ගන්නවා. කිවුවාම අපිත් විශ්වාස කරනවා. අපි මන්ත්‍රීවරු අනුමත කළාට මේ වගේ ප්‍රශ්න ගැටළු තිබෙනවා. අපිට කොච්චර කියුබ් ගණන් ලැබි තිබෙනවා ද කියා. අපිට වාර්තාව සලසන්න. අද මෙතනට ආපු ABC ප්‍රමාණය. ගිහින් බාන ලද ප්‍රමාණය. මේ අය මේ කාණු පද්ධති වලට යා යුතු ABC ප්‍රමාණය කොපමණද කියා ඔය වාර්තාවේ සඳහන් වෙලා ඇතිනේ. දැන් හදපු කිලෝ මීටර් ප්‍රමාණය අනුව. මීටර් 500 ද 1000 ද . කොච්චර ABC ප්‍රමාණයක් දමා තිබෙනවා ද ? වාර්තාවක් විදියට සලකන්න. ජනතාවගේ වැඩ

කිරිමට අපි කොහොමත්ම කැමතියි. නමුත් විනිවිදභාවය තුළ , මේ සභාවේ ගරුත්වය ආරක්ෂා කරන විදියට වැඩ කළ යුතුයි. එක කරන්න තමයි අපි ඉල්ලා සිටින්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අපේ පක්ෂ විපක්ෂ මන්ත්‍රී සියළු දෙනාගේ අදහස් වලට අපි ගරු කරනවා. මේ සියළු කාරණා ඉදිරිපත් කරන්නේ මෙය නිසියාකරව කර ගැනීමට. ඒ අනුව අපි සියළුම මන්ත්‍රීවරු අධික්ෂණය කරලා මේ වැඩ කටයුත්ත කිරීමේ අපේ තාක්ෂණ සේවා නිලධාරි නිසි ලෙස අධික්ෂණය කරලා සැපයුම් කරන නිලධාරින්ගේ වගකීමක්. ඒ වගකීම නිසියාකාරව ඉටු කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ස්තුතිය පුද කරනවා. පලමුව මේ පාර තෝරා ගැනිම පිළිබඳ ස්තුතිය පුද කරනවා. ඔය පාර තමයි නගර සභා කොටසේ හදනන් ඕන පාර. සෞභාග්‍යා දැක්මේ මේ පාරවල් හදනවා වගේම තමයි පාරවල් කිහිපයක් කාපට් කළා. පවතින රජයටත් ගිය රජයටත් අපි ස්තුතිය පුද කළ යුතුයි. මේ කාපට් එක ලබා දීම සම්බන්ධව. කාපට් පාරවල් ලබා දිම පිළිබඳව. නගර සභාවට. අනිවාර්යෙන්ම පාරවල් තෝරා ගැනීමේදි ඔය මහ අම්බලන්ගොඩ පාර වගේ නගර සභාවේ අත්‍යවශ්‍ය පාරවල් ජනතාව වැඩියෙන් ගැවසෙන පාරවල් කරනවා. මොකද කාපට් පාරවල් සැකසීමේදි මා දකින දෙයක් තමයි මා මාර්ග සංවර්ධන අධිකාරියේ සිටින නිසා . ඕකන්දේ වුණත් බොහොම අබලන් වෙන තැන් තිබෙනවා. කාපට් පාරවල් කිරිම අත්‍යවශ්‍යයි. මොකද ඕකන්ද කියන්නේ ගම්මානයක්. එහි සැහෙන්න මිනිසුන් ගැවසෙන තැන්. මෙහි හැමදාම පාරවල් කැඩෙනවා. ඇත්තෙන්ම මා ඉල්ලිමක් කරනවා . ඕකන්දටත් අර පන්සල පාරටත් ඔය කාපට් පාරවල් දැම්මට අවශ්‍යතායක් ලබා දෙන්න කියා. ඒ වගේම හැමෝම කියනවා වගේ මාත් කියනවා මේ පස් කියුබ් මෙතනට එනවා. එතනට යනකොට මොනවා වෙනවාද දන්නේ නැහැ. තාක්ෂණසේවා නිලධාරි මහත්වරු අවිශ්වාස කරනවා නෙමේ. නමුත් අවංකම එහෙම කරන බව ඔබතුමා පිළිගත්තානේ. එක එහෙම වෙන්න ඕනේ. එතන කවුරු හරි අපේ සේවක මහත්මයෙක් තබන්න. මේ අංකය දරන මේ කියුබ් එක මේ වේලාවට මෙතනට ආවා කියා. මෙතනින් පිටත් වෙලා එතනට ගියා. එක සනාථ කරගෙන වැඩ කරන්න කියන ඉල්ලිමක් කළා. මේ පාර කාපට් කිරිම සම්බන්ධව සභාවේ මන්ත්‍රීවරුන්ටත් මේ වේලාවේ මා ස්තුතිය පුද කරනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

සැපයුම් නිලධාරි ඉන්නවාද ? දැනට සපයා ඇති ප්‍රමාණයක් අපිට සභාවට ලබා දෙන්න. ප්‍රමාණය පිළිබඳ දෙන්න. කොහොමද ? කියක් ගෙනත් තිබෙනවාද කියා. වාර්තාවක් ලේකම්තුමිය කැඳවන්න.

**තීරණය-**

මහ අම්බලන්ගොඩ මාර්ගය අලුත්වැඩියා කිරිම සඳහා ABC කියුබ් 70 ක් ලබාදෙන ලෙස වැඩ ක්ෂේත්‍ර පරිපාලක මහතා විසින් කර ඇති ඉල්ලීම අනුව ABC කියුබ් 70 ක් ලබාදීමට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් තීරණය කරන ලදී.

**03.04 වැඩ ක්ෂේත්‍ර පරිපාලක කේ.ජේ.ඒ. සිල්වා මහතා විසින් නගර සභාව සතු කැනපි රෙදි හා සිටුවන සුදු කොඩි සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

කේ.ජේ.ඒ. සිල්වා. වැඩ ක්ෂේත්‍ර පරිපාලක. අප නගර සභාව සතු කැනපි සහ රෙදි සිටුවන සුදු කොඩි සම්බන්ධවයි. අම්බලන්ගොඩ නගර සභාව තුළ නගර සභාව මඟින් සුදු කොඩි සහ කැනපි රෙදි පළුදු වි ඇත. මෙම කැනපි රෙදි 2020.04.29 දින මා විසින් භාණ්ඩ ලැයිස්තුගත ඇතුළත් කර ඇති අතර ගබඩාවෙන් ලබාගෙන සේවයේ යොදවා ගෙන ඇත. මෙම රෙදි කෙටි කාලයකින් ඉරි ගිය එවා තත්ත්වයේ පෙනි යයි. මින් ඉදිරියට කැනපි රෙදි සකස් කරන විට ඒ සම්බන්ධව දැනුමක් ඇති අය ලවා පරික්ෂා කර බලා ක්‍රමවේදයක් සකස් කරන ලෙස ඉල්ලා සිටින අතර දැනට ඉරිගිය කැනපි රෙදි පිලිසකර කිරිම කළ යුතුව ඇත. අවමංගල උත්සව වලට දැනට භාවිතා වන සුදු කොඩි ඇතත් සමහර අවස්ථාවලදි කොඩි මදිවන අවස්ථා ඇති අතරත් කොඩි 20ක් පමණ මසා දෙන ලෙස ඉල්ලිමක් කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

එය ලබාදිමට කටයුතු කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මේ ඉල්ලිම ඉටු කිරිම හොඳයි. කාලෝචිතයි. හැබැයි අපි මේ කොඩි ලබා දි අවුරුද්දක් වෙන්නේ නැහැ තාම. එතකොට මේ සභාවේ මේ නිලධාරින් අනුමත කරලා තමයි මේවා ලබා දුන්නේ. එතකොට අපිට පැහැදිලිව පෙනෙවා නිලධාරින්ගේ තාක්ෂණයේ අඩුවක්

මෙතන තිබෙනවා. මෙක මේ සභාව පුරාවටම තිබෙන දෙයක්. එකයි මා මේ නැගිට්ටෙ කතා කරන්න. ඒ පිළිබඳව ප්‍රායෝගික අවබෝධයක් ගන්න ඕන. තාක්ෂණ නිලධාරින් පොතේ පතේ ගණන් වලට විතරක් මේ ඇස්තමේන්තු හදලා වැඩක් නැහැ. වෙළඳපොළේ දාහක් දේ තිබෙනවා . සැපයුම් නිලධාරිට කතා කර හැමදාම කියනවා. අන්තර්ජාලය හරහා මේවා දේවල් බලන්න කියා. සැපයුම් නිලධාරින් මේ පිළිබඳව අවබෝධයක් ලබා ගන්න ඕන. කැනපි රෙදි වර්ග 20ක් වෙළඳපොළේ තිබෙනවා නම් මෙතැන ටෙන්ඩර් කළාම අඩුම එකට අනුමැතිය දෙනවා. එක තමයි මේවායේ ප්‍රතිඵල. ඉතිං මේවා ජාතික අපරාධ. ඒ පැත්තෙන් බැලුවාම මෙවැනි ආයතනයක ඒ වගේ දේවල් ඉතාම ශක්තිමත්. වෙළඳපොළේ තිබෙන ශක්තිමත්ම රෙදි වලින් මේ කැනපි ටික නිර්මාණය කළ යුතු වෙනවා. මොකද කුළියට දෙන පුද්ගලයෙක් මෙය බොහොම පරිස්සමින් සවි කරලා නැවත ගෙදර ගෙනහින් සෝදා බ්‍රෂ් කර වේලා අරන් තියනවා. මේවාට ඒ කිසිම දෙයක් නැහැ. ගෙනියන තැන්වල සුමාන ගණන් සමහර වේලාවට තිබෙනවා. අපි අපේම වැරදි. සමහර වේලාවට අපේ මන්ත්‍රිවරුන්ගේත් වැරදි ඇති. නිලධාරින්ගේත් අඩුපාඩුකම් ඇති. මේවා නිවැරදි කර ගන්න. නැතිනම් තව මාස හයකින් තව සෙට් එකක් ගෙනවා. මේක තමයි වෙන්නේ. එමනිසා මේ ගෙන එක වෙළඳපොළ නිරික්ෂණයක් කරලා සපයන්නන් ගෙන් අඩුම ගණනේ මේවා කුලියට දෙන ආයතන වලින් වත් විමසිමක් කරලා මේ ටෙන්ට් රෙද්ද මොකක්ද කියා බලා ලබා ගන්න කියන එක තමයි මා කියන්නේ. නැවත වරක් එම වරද නොවෙන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, සුදු කොඩි 100ක් මැසුවානේ ගියපාර.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

සුදු කොඩි කියක් මැසුවාද? කෝ සැපයුම් නිලධාරි

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

අනිත් එක මේ කියන්න ගත්තේ. මේ සුදු කොඩි මහන විට එකපට තමයි තියලා මහන්නේ. දෙපට තියා මහන්න. එකෙන් තමයි ඔය සුදු කොඩි ගැලවිලා තිබෙන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

දැන් මෙහෙම දෙයතකුත් තිබෙනවා. අපි නිලධාරින්ට චෝදනා කළාට ගෙනයාම පිළිබඳ හුභාක් මැදිහත් වෙන්නේ අපේ මන්ත්‍රිවරු 21. ඒ කියන්නේ ප්‍රදේශයේ මරණයක් වුණාම අපි කියනවා

මේ කොඩි ටික දමන්න කියා. එතකොට නැවත කොඩි ටික භාරදීම , කොඩි ඉරීම අපිත් වගකීමක් දැරිය යුතුයි. එමනිසා මේවා ආරක්ෂා කර ගැනීම අප සියළු දෙනාගේම වගකීම. කොඩි 100ක් අපි මැහුවාට දැන් අද වෙනකොට තිබෙන්නේ 20ට නම් මේවා ඉරිලා ඇති. මරණයක් වුණාම සමහර වේලාවට මේවා ගලවන්නෙත් නැහැ. සමහර වේලාවට කොඩිය පිටින්ම බිම දමා එහෙමම තියනවා. ඊළඟ මරණයට ගෙනියන්න කොඩිය බලන කොට කොඩිය දූඹුරු පාට වෙලා තිබෙන්නේ. අන්න ඒ විදියේ ප්‍රශ්නයක් තිබෙනවා. අපි මේක සේවාවක් විදියට කරන එක ඇත්ත. නමුත් මේ සේවාව ලබා ගන්න ජනතාවට එය සාමාන්‍ය දෙයක් බවට පත්වෙලා. ඔගොල්ලන් ගැසුවා නම් කොඩි ටික ගලවා ගෙන යන්න කියන තත්ත්වය. සමහර වේලාවට සිකුරාදා වැඩ කරපු මළ ගෙවල් වල සඳුදා වෙනකම් කොඩි ටික ගලවන්නේ නැතුව එහෙමම තිබෙනවා. ඒ අය උදවුව ගත්තාට අපිට සභාවට එහෙම උදවුවක් කරන්නේ නැහැ. සතයක්වත් වියදම් නැහැ. අපිම ගිහින් හිටවනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

මා මේ කියන්න ගත්තේ වාටිය දෙපට තියා මහන්න කියා. එතනින් තමයි ගැලවීම තියෙන්නේ. එකෙන් තමයි ඔය සුදු කොඩි ඉරෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය කියන මන්ත්‍රීවරුන්ගේ අදහස් පිළි අරගෙන ඒ අනුව අපි වැඩ කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

හොඳ ප්‍රමිතියක් තිබෙන රෙද්දකින් මහන්න. අඩුම මේක නැතුව. එතකොට ටික කාලයක් පාවිච්චි කරන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා මෙහෙම දෙයක් තිබෙනවා. මේ කොඩි පිළිබඳව ටෙන්ඩර් එක කඩන්නෙත් මේ සභාවේ. එතකොට ටෙන්ඩර් එක පිළි ගන්නෙත් අපිම තමයි. එතකොට අපේත් වරදක් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

එහෙමනම් ඒ ටෙන්ඩර් කරන කට්ටියට රෙද්දේ තත්ත්වය බලන්න. එතකොට බලන්න පුළුවන් රෙද්දේ තත්ත්වය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රීතුමා කියන කතාව හරි. ඒ වාටිය දෙපට දමා මහන්න ඕන. ප්‍රමිතියෙත් මොනවා හරි ගැටළුවක් ඇති. එක වෙනම කතන්දරයක්. මේ කොඩි පාවිච්චි කිරිමේදි කොට්ඨාශ 13 යි අම්බලන්ගොඩ නගර සභාවේ තිබෙන්නේ. මේවා කතා කරන්න ගියාම අපි නරක මිනිසුන් වෙනවා. මොකද මා මෙය කතා කරන්නේ නැත්තේ එකයි. මොකද මෙය පොදුවේ මල ගෙයක් වුණාම කොඩියක් දමන්න ඕන. එහෙමනම් මේ කොට්ඨාශ 13 මළ ගෙවල් වලට ඕක ගියාත් පසු ඔය හානිය එන්නේත් නැහැ. අනිත් එක එදත් මා කිවුවේ මන්ත්‍රීවරු අපිත් අධික්ෂණය කරන්න ඕන. දැන් අපේ පළාතේ මොකක් හරි වුණොත් අපි එතන ඉන්නවා. එක හැම කෙනාගේම මන්ත්‍රීවරු යනවා. නමුත් මන්ත්‍රීවරුන්ට දවසේම ඉන්න බැහැනේ ඕතන. එමනිසා ඔබතුමා මැදිහත්වෙලා මෙය ගෙනයන විට මන්ත්‍රීතුමාලාගේ අනුමැතිය අනුව මෙය කරගෙන යන්න. හැබැයි ප්‍රමිතිය පිළිබඳව මැහිම පිළිබඳව එකත් අවබෝධය තබා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට ඔය සම්බන්ධව වචනයක් කතා කරන්න තිබෙනවා. චෝදනා කරනවා නෙමේ . කියන්න කනගාටුයි. මේ වැඩය කොච්චර සිද්ධ වුණත් නගර සභාවට වටිනාකමක් අවාට එක මළ ගෙදරක් ඇවිත් අනිත් මළගෙදර ගසන විට අර කැනපි ටික දූර්වර්ණ වෙලා තිබෙනවා. ඒක හරි අශෝබනයි. අපිටත් වගකිමක් තිබෙනවා. මේක ඇවිත් අපිට චෝදනා කරන්න බැහැ. සේවාවක් සපයන්නේ නගර සභාවෙන්. අදාළ මළගෙදරට. එහි ලොකු වටිනාකමක් තිබෙනවා. මිනිසුන්ට ඒ දුක්බර වේලාවේ. ඒ වටිනාකම දෙන එක ගොඩක් වටිනවා. අර දූර්වර්ණ වෙලා ආපහු දෙන එකෙත් වටිනාකමක් නැති වෙනවා. එක අශෝබනයි. මෙය සුද්ද පවිත්‍ර කරලා කවුරු හරි දන්න පුළුවන් නම් වටිනාකමක් තිබෙනවා. සුදු කොඩි 10 ගණනේ ගසන විට මල ගෙවල් තුන හතරක් ආවොත් එහෙම කොඩි නැහැ ගහන්න. සුදු කොඩි 100ක් ලබා දෙන්න කියා අපි යෝජනාවක් කළා. මා දන්නේ නැහැ ඒවාට මොනවා වුණාද කියා. යෝජනා වෙනවා. වැඩේ කෙරෙන්නේ නැහැ. 100ක් කෙසේ වෙතත් අඩුම ගණනේ 30ක්වත් ලබා ගන්න පුළුවන් නම් හරි

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

60 ක් තමයි ලබා දි තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

60න් කියක් දැන් තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැනට තිබෙන්නේ 20ක් පමණයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

තව 40 ක් විතර . මෙකට දෙන වටිනාකම අපිට සභාවට ලැබෙන්න ඕන. දූර්වර්ණ වෙලා තිබෙන ඒවා ලබා දෙනකොට වටිනාකම අඩු වෙනවා. ඒ ගැන අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා යෝජනා කරනවා. මේ වගේ එකක් එක කොට්ඨාශයකට මෙය ලබා දෙන්න. ඒ කියන්නේ මල ගෙයක් වුණොත් ඒ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා යටතේ තමයි එය තියා ගන්නේ. එහෙම නැතිනම් අපේ ප්‍රජා මණ්ඩලයක් යටතේ තියා ගන්න වෙනවා. ඉන්වෙන්ට්‍රි කරලා. කොට්ඨාශ 13 තියෙන්නේ. ඒ 12 ට යම් සුදු කොඩි ප්‍රමාණයක් මසා ඒ ප්‍රමාණයට කොඩි කණුත් ලබා දිලා ප්‍රජා මණ්ඩලය හරහා ලබා දෙන්න. අපේ ප්‍රජා මණ්ඩල තිබෙනවා. එතකොට මේ ප්‍රජා මණ්ඩලය නිලධාරින්ට පුළුවන් මෙය පිරිසිදු කර ගැනිම ඒ වගේ දේවල් කරන්න. අපේ නිලධාරින් මෙවාට යෙදවිමෙන් අපේ වැඩ කර ගැනිමට ප්‍රමාද වෙනවා. එම ගැටළු තිබෙන නිසා මෙය ප්‍රජා මණ්ඩල වලට නිකුත් කිරිම හොඳයි. ඉදිරියට මෙය ප්‍රජා මණ්ඩල හරහා මෙය කරන්නම්. ප්‍රජා මණ්ඩල නිලධාරින්ට පුළුවන් මේවා පිරිසිදු කර ගැනිම් ඒ වගේ දේවල් කර ගන්න. මේ සඳහා අපේ නිලධාරින් යෙදවීමේන් එකක් අපේ වැඩ කටයුතු කරන්න ටිකක් ප්‍රමාද වෙනවා. ඊළඟට ඒ ගැටළු තිබෙනවා. ප්‍රජා මණ්ඩල වලට මෙය නිකුත් කිරිම හොඳයි. ඉදිරියට අපි ප්‍රජා මණ්ඩල වලට ලබා දිමට කටයුතු සිදු කරන්නම්

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, එතකොට ඒ අය පිරිසිදු ද කියා බලා තමයි ගන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය ප්‍රජා මණ්ඩලයට භාරයි. අපි ඒ ප්‍රදේශයේ තිබෙන ප්‍රජා මණ්ඩලයට දෙන්නම්. කොඩි 20ක් හා කණු 20 ක් දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ප්‍රජා මණ්ඩලයට භාරයි. මේ භාණ්ඩ එහෙම නැති වුණායින් පසු. මේවා රජයේ භාණ්ඩනේ. ආරක්ෂාව තියාගෙන මේවා කරගෙන යන්න ඕන. පසු විපරමක් කරන්න නිලධාරින් පත් කරන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපේ ප්‍රජා සංවර්ධන නිලධාරියාට තමයි එක දෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක බලා ඒ විදියට කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඒ අදහසට මා එකඟයි. මට ඕන වුණේ නිලධාරින්ට එන පීඩනය අඩු කරන්න. අපේ කට්ටියටත් කියන්න. කාටහරි එය දුන්නාම් එය වගකීමෙන් කරන්න. දැන් මේ යෝජනාවෙන් ඒ ඔක්කොම හරි යයි. එක වුණේ එක කට්ටිය අතරට මාරු වුණා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි දැන් එකට තීන්දුවක් ගත්තානේ. එක කරන්නම්. ප්‍රජා මණ්ඩලයට අයිතියක් තියෙනවා. එක එච්චර සලකන්න දෙයක් නැහැ. දැනට අපිට ප්‍රජා මණ්ඩල 13යි තිබෙන්නේ. එතකොට වැඩි වෙන්නේ කළුවඩුමුල්ල ප්‍රදේශයටනේ. කළුවඩුමුල්ලට දෙකක් තිබෙන නිසා. එකත් මේ ගමේමනේ තිබෙන්නේ. ඒ ගමේ ඕන දෙයක් කර ගන්න පුළුවන්.

**තීරණය-**

අවමංගල්‍ය අවස්ථා සඳහා ලබාදීමට සුදු කොඩි 20 ක් ලබාදෙන ලෙස ඉල්ලා වැඩ ක්ෂේත්‍ර පරිපාලක කේ.ජේ.ඒ. සිල්වා මහතා විසින් කර ඇති ඉල්ලීම අනුව , එක් කොට්ඨාසයකට සුදු

කොඩි 20 ක් සහ කොඩි කණු 20 ක් බැගින් සියලුම කොට්ඨාසවල ප්‍රජා මූල සමිති සඳහා ලබාදීම සුදුසු බවත් එය ප්‍රජා සංවර්ධන නිලධාරිනියගේ අධීක්ෂණය යටතේ සිදුකිරීම සුදුසු බවටත් ගරු සභාව විසින් තීරණය කරන ලදි.

**03.05 2019.11.28 දින පැවති ත්‍රිරෝද රථ කමිටු වාර්තාවේ ත්‍රිරෝද රථ නතර කිරිමේ අතුරු ව්‍යවස්ථාවේ පළමුවන උපලේඛනයේ 13 පරිදි තල්ගස්ගොඩ ඩිපෝ මංසන්දියේ තල්ගස්ගොඩ පාරේ සිට ගොඩහේන පාර දෙසට වරකට උපරිම ත්‍රිරෝද රථ 06ක් නවතා තැබිමට අනුමැතිය ලැබි ඇති නමුත් මෙය නැවත එක් වරකට නැවැත්විය හැකි ත්‍රිරෝද රථ ගණන 03 ක් ලෙස සංශෝධනය කිරීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ ගොණුව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

2019.12.03 දින 06.08 යටතේ සභාව යටතේ තින්දුවක් ගෙන ප්‍රකාශ කර තිබෙනවා. ඒ තින්දුව තමයි රථවාහන හා ත්‍රිරෝද රථ කමිටුවේ තින්දුවක් පරිදි සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කිරිමෙන් ඒකමතිකව සම්මත කර තිබෙනවා. එහිදි තල්ගස්ගොඩ ග්‍රාමසේවා වසමේ අපේ ත්‍රිරෝද රථ ගාලක් ඇති කර තිබෙනවා. ත්‍රිරෝද ගාල සම්බන්ධයෙන් අම්බලන්ගොඩ පොලිසියට පැමිණිල්ලක් ඇතිවෙලා පොලිසියේ ස්ථානාධිපතිවරයා මේ සම්බන්ධ පරික්ෂා කර බලා අපිට වාර්තා කරන්න කියා ඉල්ලා සිටිනවා. ඒ අනුව එම ගත්ත සභා තින්දුවේ වෙනසක් කරන්න ඕන කියා ඉල්ලිමක් තිබෙනවා. මේ ආකාරයෙන්. ශ්‍රී ලංකා පොලිසිය අම්බලන්ගොඩ මඟින්. ත්‍රිරෝද රථ ගාලේ ඇති අරවුල සම්බන්ධයෙන් 2019.11.04 පැවති ඉල්ලිම හා බැඳේ. එම ලිපිය අනුව සභාවේ තාක්ෂණසේවා නිලධාරි විසින් ස්ථානිය පරික්ෂාවක් කර ලබා දුන් වාර්තාවට අදාල පරිපාලන නිලධාරිතුමිය විසින් ඉල්ලුම්කර ආදායම් පරික්ෂක වාර්තාවට අනුව කරුණු වාර්තාව ඉදිරිපත් කරයි. මේ වන විටත් නිත්‍යානුකූලව ක්‍රියාත්මක වන 2019.09.06 අනුමත කර ඇති ගැසට් පත්‍රයේ පළකර අනුමත කර ඇති ත්‍රි රෝද රථ නවතා තැබිමේ ගාස්තු පැනවීම සහ අතුරු ව්‍යවස්ථාවේ හා එම අතුරු ව්‍යවස්ථාවේ 5 ව්‍යවස්ථාවේ ත්‍රිරෝද රථ නවතා තැබිම සම්බන්ධ එහි සඳහන්ව ඇත. නමුත් ගැටළුකාරි තත්ත්වයක් උද්ගත වී ඇති තල්ගස්ගොඩ ඩිපෝ හංදිය ත්‍රිරෝද රථ නවතා තැබිමේ ස්ථානයක් ගැන සඳහනක් නොමැත. නමුත් අප සභාවේ එම ත්‍රිරෝද රථ නවතා තැබිමේ අතුරු ව්‍යවස්ථාවේ කෙටුම්පත් කර අනුමැතියට ඉදිරිපත් කර ඇත. එම නව අතුරු ව්‍යවස්ථාවේ ත්‍රි රෝද රථ නවතා තැබිමේ ස්ථාන ඇතුළත් උප ලේඛණයේ තල්ගස්ගොඩ ඩිපෝ

හංදිය සිට තල්ගස්ගොඩ පාරේ සිට ගොඩහේන දෙසට වරකට උපරිම ත්‍රි රෝද රථ 6ක් නවතා තැබීමට සභාවේ අනුමැතිය ලබා දි ඇත. මේ ලිපියේ සඳහන් අලගියාවඩු සුමිත් නිශාන්ත මහතා 2020 වසරේදි බලපත්‍ර ලබා දීමේදි ලේඛණ ගත වි ඇති බැවින් 2020 වසර සඳහා බලපත්‍ර ගාස්තු ගෙවා ඇත. මෙම ගැටුම සම්බන්ධවන අනිත් පාර්ශවය වන රාජපක්ෂ මනික්කුනම්බි අකිල චාමික යන අය විසින් අප වෙත ත්‍රි රෝද රථ අවසර පත්‍ර ලබා දි නොමැති අයෙකි. ඉහතින් කරුණු අනුව විධිමත් තීරණ ගැනිම ගැටලුකාරි තත්ත්වය මග හරවා ගැනිමට අතුරු ව්‍යවස්ථාව ආණ්ඩුකාරගේ අනුමැතිය ලබා ගැනීමට සුදුසු බව එම ස්ථානයේ තාක්ෂණසේවා නිලධාරි ත්‍රි රෝද රථ 6 ක් නතර කිරිම කියන එක සංශෝධනය කරලා 3ක් පමණක් නතර කිරිම යෝග්‍යයයි කියා තිබෙනවා. එම යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා. ත්‍රි රෝද රථ 6 ක් ගහන්න තමයි අපි අනුමැතිය ලබා දුන්නේ. නමුත් ඒ පැමිණිලිකරු පුද්ගලයා විසින් ආසාධාරණ විදියට තමන්ගේ ඉඩමේ මේ කොනේ සිට අනිත් කොන වෙනකම් තාප්පය කඩලා ඉඩමේ සම්පූර්ණ මුහුණතම ගෙට ඇතුළු වන ගේට්ටුව සැදීමට තමයි සැරසෙන්නේ. ඉතාමත් අසාධාරණයි. මොකද ඒ ත්‍රිරෝද රථ රියදුරත් ජීවත් වෙන්න ඕන. එහෙම නිතියක් නැහැ. සාමාන්‍යයෙන් නිවසකට ඇතුළු වන ගේට්ටුව තැබිය හැක්කේ අඩි 10ක් 12 ක් අතර ප්‍රමාණයක් තමතයි. නමුත් දැන් මේ වනකොට එය හදලා ඉවරයි. මා එම ප්‍රදේශයේ මහජන නියෝජිතයා වශයෙන් ඒ පුද්ගලයන්ටත් කිවුවා. අපි ගැටුමකට යන්න ඕන නැහැ. මේ ත්‍රි රෝද රථ 6 තුනකට අඩු කරලා ඒ තුනට අවසර ඉල්ලන්න කියලා. ත්‍රි රෝද රථ කමිටුවෙනුත් කැමති වුණා. ඒ අපේ නිලධාරින් දුන් වාර්තාව අනුව ඒ තුනට ත්‍රි රෝද රථ ගණන අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මේ ස්ථානයේ ත්‍රි රෝද රථ නතර කරන්න අපි සභාවෙන් අවසර ලබා දි තිබෙනවා. ඒ වෙනකොට එතන තිබුණ පසුබිම ගැන අපිට පැහැදිලි අවබෝධයක් තිබුණේ නැහැ. තල්ගස්ගොඩ හංදිය ගැන මා නොදන්නවා නෙමේ. නමුත් ඒ ව්‍යාපාර ස්ථාන කොහොමද ? ඒ ව්‍යාපාර ස්ථාන වලින් මාර්ගයට පිවිසිමේ දොරටු කොහොමද ? ඒ ගැන අපිට අවබෝධයක් තිබිලා නෙමේ. හංදියේ හරි අපි දමමු කිවුවාම අපි කැමති වෙනවා. අපි විරුද්ධ වෙන්නේ නැහැ. ඒ වගේම මේ ස්ථානයේ එම ත්‍රිරෝද රථ නතර කරන මහත්වරු සියළු දෙනාමත් මා පුද්ගලිකව

හඳුනනවා. හිතවත්. මේ අය මෙතන කාලයක් තිස්සේ නතර කර තිබෙනවා. නමුත් අද වෙනකොට මේ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. අද වෙනකොට ඔය චෝදනා කළා කියන පුද්ගලයා එතන ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යනවා. ඒ පුද්ගලයාට මෙතනට තමයි මාර්ගයට පිවිසීමට පහසුම ස්ථානය තිබෙන්නේ. ගොඩනැඟිල්ලේ ස්වභාවය අනුව. එතකොට ඒ මනුස්සයා මෙතනින් මාර්ගයට පිවිසින්නේ නැතුව වෙන කොහොන්ද මාර්ගයට පිවිසින්නේ. ඉතිං අපේ ගරු උප සභාපතිතුමා කිවුවා එයා මහ අසාධාරණ විදියට මෙය සිදු කරන්නේ කියා. ඉතිං ඒ මනුස්සයාට පාරට පිවිසෙන්න තිබෙන ස්ථානය මෙතන නම් මා හිතන්නේ නැහැ අසාධාරණයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා මා පොඩි පැහැදිලි කිරිමක් කරන්නම්. මට තාක්ෂණසේවා නිලධාරි මහතා දිපු වාර්තාව තිබෙනවා මෙතන. එහි ඒ මහතාගේ ගේට්ටුවේ පළල අඩි 26 ක් තිබෙනවා. අඩි 26න් එපිට තල්ගස්ගොඩ පාරට පැත්තේ ත්‍රිවිල් රථ 3ක් නතර කිරිමට හැකියාව තිබෙනවා කියා වාර්තාවේ තිබෙනවා. ඒ අනුව මෙකෙදි දැන් තිබෙන තත්ත්වය මත වත් ඒ තැනැත්තාගේ ප්‍රවේශයට අවහිර වෙන මේවා එකක් මෙකේ නැහැ. එහිදි ත්‍රි රෝද රථ හිමියන් ගැන සලකා බලා මේ ඉල්ලුම්කරු එක්කත් සාකච්ඡා කරලා දෙදෙනාටම ගැලපෙන තින්දුවක් තමයි මෙහි ලියා තිබෙන්නේ. ඕන නම් මා එවන්නම් බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

එවන්න උවමනා නැහැ. ඔබතුමාගේ වචනය මා පිළිගන්නවා. මේ ස්ථානයේ මෙය පවත්වාගෙන යනවා. මේ පුද්ගලයා පවත්වා ගෙන යන්නේ බෙහෙත් ශාලාවක්. අලෙවි කරන ස්ථානයක්. විශේෂඥ වෛද්‍යවරු එනවා. මේ ස්ථානයට ආභාරණයක් මේ ස්ථානය. ඒ පුද්ගලයාට කාරුණික සහායෝගය ලැබුණොත් හොඳයි කියන එකයි මාගේ හැඟිම. මේ ත්‍රිවිල් තුන තතර කිරිමෙන් එම ස්ථානයට හානියක් සිදු වෙනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔය සැකිල්ල බලන්න. අපි සහාය දිලා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මට එක ගැටළුවක් නැහැ. මා හිතනවා එතන අසාධාරණයක් වෙන එකක් නැහැ කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපේ සරත් චන්ද්‍ර මන්ත්‍රීතුමා කිවූ පරිදි එතන ඖෂධ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යන්නේ. එය ලොකු දෙයක්. ඒ වගේම අපි ත්‍රිරෝද රථ කරුවනුත් ආරක්ෂාකර ගත යුතුයි. මොකද මමත් ඔය දෙගොල්ලන්ම හඳුනනවා. දන්න අය. ත්‍රිරෝද රථ කමිටු වාර්තාවේ ත්‍රි රෝද නතර කිරීමේ අතුරු ව්‍යවස්ථාවේ එදා කමිටුව ගත් තීරණයට ත්‍රිරෝද රථ 6ක් වෙනුවට දැන් ත්‍රි රෝද රථ 03ක් නතර කරන්න අනුමැතිය දී  තිබෙනවා. එය ප්‍රශ්නයක් නොවෙනවා නම් ව්‍යාපාරික ප්‍රජාවට ගැටළුවක් නැහැ. නැතිනම් බෙරෙන්න එපායි . ත්‍රි රෝද රථ රියදුරන් එහාට යවන්න එපා. එමනිසා එම ව්‍යාපාර කටයුත්තේ ඇතුල්වීමේ දොරටුවට කරදරයක් නොවන විදියටත් රියදුරන්ටත් කරදරයක් නොවන විදියට සාධාරණයක් කරන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපේ කාර්මික නිලධාරි මහතාගේ සැකිල්ල බැලුවාම පැහැදිලි වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එක හරි. අපේ උප සභාපතිතුමාගේ කොට්ඨාශයේ. මෙහෙමයි ඉදිරියටත් ප්‍රශ්න ගැටළු එනකොට කොහොම වුණත් ඔය වගේ ප්‍රශ්න ගැටළු එන්න පුළුවන්. එකනිසා අපි ව්‍යාපාරිකයනුත් ආරක්ෂා කරන්න ඕන. නැතිබැරි අයගේත් හම්බ කිරීම කළ යුතුයි. ඉතිං මේවා කරන කොට අරවගේ තාක්ෂණික කමිටු වාර්තා අරගෙන ඕනේ කරන්න . අරවගේ ප්‍රශ්න ගැටළු එනවා. එගොල්ලන්ට කියලා ප්‍රශ්න ගැටළුවක් නැද්ද? නිවස සම්බන්ධව. ඇතුලේ මේ ප්‍රශ්නය සාකච්ඡා කළානේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව තිබෙන සියළු ගැටළු එතනින් අවසන් වෙනවා.  කිසි ගැටළුවක් නැහැ. අඩි 26 ක ඇතුල් විමක්. අඩි 10ක ඇතුල් විමක් තමයි තියන්න ඕන. ව්‍යාපාරික ස්ථානයක් නිසා අඩි 26 ක පළල එකක් තිබෙනවා. ඒ පළලට මෙහායින් තමයි යෝජනා කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>**

පැමිණිලිකරුගේ ගැටළුවක් නැහැනේ. එයාට ගැටළුවක් වෙන්න විදියක් නැහැ. නැහැ මා කියන්නේ සාකච්ඡා කරාද ඒ අය සමඟ.

- **පෙ.ව. 10.10ට පමණ ටෙන්ඩර් විවෘත කරන ලදී.**
- **පෙ.ව.10.10 ට ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය හා ගරු සභා ගර්භයට පැමිණියහ.**
- **පෙ.ව.10.10 ට ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා හා ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා ගරු සභා ගර්භයෙන් පිටවීම**

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක තමයි. උත්තරය සොයන කොට සාධාරණව තිබෙන්න ඕන. ඔබතුමා කියන කතාව හරි. එතකොට ඔය ත්‍රිවිල් ගසන අයටත් උපදේශක් දෙන්න ඕන. එහා තාප්පයක් තිබෙනවා නම් එතන ගැහුවාට ගැටළුවක් වෙන එකක් නැහැ. නමුත් සාකච්ඡා කරලා ඒ විදියට යන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට ප්‍රශ්නයක් තිබෙනවා. මට දැනගන්න ඕන අපේ ගරු උප සභාපතිතුමා ත්‍රිවිල් කමිටුවෙන් අයින් වුණේ. මා ආවේ නැති සභා වාරයේදි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එතුමා අයින් වුණා. ඒ වෙනුවෙන් අවශ්‍ය වැඩ කටයුතු මා සිදු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

මොකද ත්‍රි රෝද කමිටුවේ ප්‍රශ්නයක් තිබෙනවා. එකක් වත් සම්පූර්ණ කර ගන්න බැරි වුණා. ඉක්මනින් ඒ ටික කර දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හරි. අපේ එවන් මහතා ඇවිත් ඉන්නවාද? මා අපේ ක්‍රීඩාංගණයේ ක්‍රිඩාගාරය සැදිම සම්බන්ධව එහි සැලැස්ම පිළිබඳව සභාවේ සියළුම මන්ත්‍රීවරුන්ට දැන ගැනීම සඳහා කරනවා. ඒ කටයුතු සිදු කළේ අපේ එවන් මහතා. එතුමාට ඒ සැලැස්ම පැහැදිලි කර දෙන්න කිවුවා. සභාවේ අදහස් අනුව එය අපිට අවශ්‍යද නැද්ද ? එහෙම නැතිනම් වෙනත් දෙයක් කළ යුතුද කියා. මෙයට අපිට

තීන්දුවක් ගන්න පුළුවන්. එතුමාගේ මේ සම්බන්ධව වැඩසටහනක් අපි මේ අවස්ථාවේ සිදු කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේ කරන්න බැහැනේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

හරි කාරක සභා අවස්ථාවට පැමිණ තමයි කරන්නේ.

- **පෙ.ව.10.15 ට ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා හා ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා ගරු සභා ගර්භයට පැමිණීම.**

**තීරණය-**

2019.11.28 දින පැවති ත්‍රිරෝද රථ කමිටු වාර්තාවේ ත්‍රිරෝද රථ නතර කිරිමේ අතුරු ව්‍යවස්ථාවේ පළමුවන උපලේඛනයේ 13 පරිදි තල්ගස්ගොඩ ඩිපෝ මංසන්දියේ තල්ගස්ගොඩ පාරේ සිට ගොඩහේන පාර දෙසට වරකට උපරිම ත්‍රිරෝද රථ 06ක් නවතා තැබිමට අනුමැතිය ලැබී ඇති නමුත් මෙය නැවත එක් වරකට නැවැත්විය හැකි ත්‍රිරෝද රථ ගණන 03 ක් ලෙස සංශෝධනය කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.06 වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් හික්කඩුව ජාතික උද්‍යානයේ භාරකරු විසින් එවා ඇති මාදම්පාවිල අභය භූමිය තුල පිහිටි සංවර්ධිත ප්‍රදේශ අභය භූමියෙන් ඉවත් කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, උද්‍යාන භාරකරු , හික්කඩුව ජාතික උද්‍යානය, වනජීවි දෙපාර්තමේන්තුව , හික්කඩුව. මාදම්පාවිල අභයභූමිය පිහිටි සංවර්ධන ප්‍රදේශ අභයභූමියෙන් ඉවත් කිරිම. විවිධ ජෛව්‍යාත්වයන් අතිරින් ඉහළ කඩොලාන පරිසරයක් රැක ගැනීම උදෙසා වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ පණතේ 02.02 යටතේ උප වගන්තිය යටතේ ප්‍රතිපාදන යටතේ වනජීවි

විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් වර්ෂ 2007 ක් වූ සැප්තැම්බර් මස 21 දින 1515/21 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමනයන් මඟින් මාදම්පා විල අභය භූමිය බිහිවේ. ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ බලපිටිය කරන්දෙණිය ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශවලට මාදම්පාවිල ගඟට යාබද පිහිටි අම්බලන්ගොඩ නගරය ඇතුළු තවත් ගම් ප්‍රමාණයක් මෙම රක්ෂිතයට මායිම් වේ. හෙක්ටර්යාර් 1217.75 ක වපසරියකින් යුක්ත වන ලෙස නිරපෙක්ෂ කාණ්ඩ අංක යොදා ගනිමින් මෙම අභය භූමිය ප්‍රකාශයට පත්ව ඇත. පරිසර පද්ධතියෙන් ලැබෙන අම්ලමය සේවාවය, නියාමන සේවය , සහායක සේවය , සෞන්දර්යාත්මක සේවාව නොමසුරුව මෙම අභය භූමිය මධ්‍යස්ථ මානවයා කෙරෙහි දයානුකම්පාවෙන් දයාද කර දේ. දකුණුබල මුහුදු බඩ කලාපයේ ප්‍රධානම නිෂ්පාදන ආර්ථිකමයක් දක්නට නොමැති අතර මාදම්පාවිල අභය භූමිය ඇතුළු මෙම කලාපයේ පිහිටි සුන්දර පරිසර පද්ධතින් අරමුණු කරගත් පාර්ශික සංචාරක ප්‍රධාන ආදායම් උපදවීම වන්නේය. මෙම පාර්ශව සම්බන්ධව එක්තරා ප්‍රදේශයක ජීවත් වන ජනතාව සතු දේපලක් නොවන අතර සමස්ත රට වැස්සොම පොදු සම්පතක් වන්නේය. ශ්‍රී ලංකාව සතු  සමස්ත කඩොලාන ශාක කිහිපයකට පමණක් පවතී. ඒ අනුව බොහෝ ප්‍රදේශවල පවතින ඒ කඩෝලාන මානව සම්පත හේතුවෙන් මේ වන විට බාදනයට ලක්ව ඇත. කඩෝලාන පද්ධතියේ වෙනත් ශාක වැස්මක් මඟින් තිර කරනවාට වඩා කාර්යක්ෂම කාබන් කිරිමක් සිදුවේ. එබැවින් මෙවැනි නාගරික ප්‍රදේශයක අවම ඉඩමක් යොදා ගැනීම පරිසර පද්ධතියේ කාබන් හා පා සටහන අවම කරගෙන යා හැකිවේ.

- **පෙ.ව. 10.25 ට පමණ ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා සභා ගර්භයෙන් පිටවීම.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙහිදි කියන්න ඕන මෙම කොට්ඨාශයේ පැහැදිලිව මට පෙනි ගිය කොටසක් තමයි ගහපු එක ස්ථානයක් තමයි ගාලුපාරේ මහ මාර්ගයේ තිබෙන මාධ්‍ය ලක්ෂය එතනට ගෙන්න කියා. ඉල්ලිමක් කළා. එක දිගේ ඇවිත් අපේ පිහිනුම් තටාකයක් හදා තිබෙනවා. එකේ දිගේ අයිනෙන් ගිහින් එතන සිට දැනට තිබෙන මායිම තිබෙන්නේ මුළු මහ අම්බලන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශයම අයිති වෙලා තිබෙන්නේ. එය ලක්ෂය ගසා ඊළඟ ලක්ෂය අරගෙන තිබෙන්නේ දෙල්දුව පාලම ළඟට. එතකොට ඒ ඔස්සේ ගන්න සම්පූර්ණ සිරස් ලේඛණයට අයිති ගොඩ ඉඩම්

සියල්ලම , නිවාස සියල්ලම වනජීවි කලාපයට අයත් වෙනවා. එමනිසා වනජීවි කලාපය නැවත වෙනස් කිරිමට. මාගේ ඉල්ලීම වුණේ කඩොලාන පද්ධතිය රැක ගැනීම අපේ වගකීමක්. එමනිසා සියළු කඩොලාන තිබෙන තැන් අතහැර මායිම් ලකුණු කරලා නැවත ගැසට් කිරිමට අපි එකඟයි. අපි ඇත්තටම මේ සියල්ලම අපිට ලබා දෙන්න කියන ඉල්ලීම කරන එක වැරදියි. අපිත් මෙහි පරිසරය රැක ගැනීම සඳහා අපිත් මුලිකත්වයක් දෙන්න ඕන. එමනිසා ඒ අවශ්‍ය කොටස් ටික අතහැරලා ඉතුරු අවශ්‍ය කොටස් පමණක් තෝරාගෙන මේවා කරන්න. කොටස් රාශියක් ඉවත් කළා. මැනිම් කටයුතු කිරිමේදි අදාල ප්‍රදේශවල මන්ත්‍රිවරු සහභාගි වෙලා ඔවුන් ඉල්ලා සිටින්නේ කඩොලාන ශාක වැවි ඇති කොටස් අභය භූමියට ඇතුළත් කරලා ඉතිරි කොටස් නිදහස් කිරිමට එකඟතාවය තිබෙනවා. එමනිසා ඒ කටයුත්ත කිරිම සඳහා මන්ත්‍රිවරුන්ගේ සක්‍රිය දායකත්වය ඒ අවස්ථාවේදි පල කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මහ අම්බලන්ගොඩට ඔක්කොටම බලපා තිබෙන්නේ. අම්බලන්ගොඩ , පනියන්දුව අපි වටකරගෙන ඉන්නේ ඔය කලාපය. ඉතිං ඔහොම අත් හරින එක පිළිබඳව මගේ නම් කිසිම කැමත්තක් නැහැ. මාදම්පා විල අභය භූමියක් නැතිවෙලා යන තත්ත්වයක් ඇතිවෙලා තිබෙන්නේ. මොකද දැන් තුඩුවමුල්ල පැත්තට ගියාම තුඩුවමුල්ල ගඟ ඉවුරයි. මාදම්පෙට පයින් යන්න පුළුවන් විදියට ඔය ඔක්කොම ඉදිකිරිම් කර තිබෙන්නේ. ඉතිං මා දන්නේ නැහැ හික්කඩුව අඩවි වනජීවි කාර්යාලය විසින් ඔවැනි ලිපියක් එවිම සම්බන්ධව. මා ඇත්තටම පුදුමයට පත් වෙනවා. මොකද මේ රජය කියන්නේ මේ සියළු දේ ආරක්ෂා කරන්න කියලා. ඔබතුමාට නෙමේ මේ සියළුම දෙනාට ගියාම බලන්න පුළුවන් . තුඩුවමුල්ලෙන් පටන් ගත්තාම දෙල්දූවට වනකම් එතන ඉදගෙන පෝය සිමාව ළඟ සිට පයින් යන්න පුළුවන්. මාදම්පෙට. ඉතිං ඕක අත්හරින්න ගියාම ඔක්කොම අතහැරියාම අර පැත්තෙනුත් ගොඩ කළහොත් මාදම්පා ගඟ පැත්තේ මිනිසුන් කියයි අපිටත් අතහරින්න කියා. එතකොට ගඟත් ඇත්තෙම නැති තත්ත්වයට පත් වෙනවා. මා නම් ඔකට සම්පූර්ණ විරුද්ධයි.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , වනජීවි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් හික්කඩුව අඩවි වනජීවි කාර්යාලයේ භාරකරු විසින් මාදම්පාවිල අභය භූමිය සංවර්ධනය තුළ අභය භූමියෙන් ඉවත් කිරිම සම්බන්ධ ලිපිය . මේවාගෙන් ලිපියක් එවන්න හේතුව මොකක්ද සභාපතිතුමා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක ඉල්ලීමක්. අම්බලන්ගොඩ නගර සභාව , රත්ගම ප්‍රාදේශීය සභාව , බලපිටිය ප්‍රාදේශීය සභාව. එම ඉල්ලීම් අනුව තමයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්</u>**

දැන් මේ ඉල්ලීම අනුව අපි කවුරුත් දන්නේ නැහැ. මේ සීමාවන් මොනවාද කියා. අනිත් එක මේ රජයේ නිලධාරියා මේ ලිපිය එවන්නේ. ඇයි මේ නිලධාරියා මේ නීතිය ක්‍රියාත්මක කර නොකර තිබෙන්නේ. එකමතිකව වැඩ කරන්න දීලා. එයාගේ නීතිය දැන් ආණ්ඩුවේ ඕනැම දෙයකට හානි කරනකොට නීතිරීති මාලාවක් අණ පණත් තිබෙනවා. ඒ තුළ මේ නිලධාරීන් මා දන්නේ නැහැ කවුරුද කියා . එයට වගකිව යුත්තොද කියා. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවනේ වග කියන්න ඕනේ. දැන් මෙහි අනුමැතියක් අරගෙන ද ? ගෙනැල්ලා තිබෙන්නේ. කොයි ආකාරයෙන්ද ? මේ නගර සභාව දැනුවත් වෙලාද ? කොහොමද කියන එක තමයි අපිට ගැටළුව තිබෙන්නේ. අනවසරනේ. එතකොට මේ නිලධාරීන්ගේ මේ නීතිය කඩලා තිබෙන්නේ. මේ නීතිය කඩලා තිබෙන්නේ නිලධාරීන් අතින් . එතකොට මේ කුණ්ඩවාලේ දමනවා අපේ නගර සභා මන්ත්‍රීවරුන්ට. කවදා හරි දිනයක අපේ ජනතාව කියාවි තමුන්නාසේලා මේවා ඉවත් කරලා මෙන්න මේ සංවර්ධිත යෝජනා ඉදිරිපත් වෙලා තිබෙන්නේ. කර්තව්‍යයන් ඉටු වෙලා තිබෙන්නේ. දැන් මෙය ඉවත් කළාට පසු ලක්ෂ්මී මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළ ආකාරයට මදම්පෙට වෙනකම් ගොඩවෙයි. අනිත් එක මෙහෙම කරන්න බැහැ. නැති බැරි මිනිසුන් ඉන්නවා. අපි එය පිළිගන්නවා. ඒ අයට යම්කිසි සහනයක් දෙන්න ඕන කියන එකත් අපි පිළි ගන්නවා. මේක මේ සභාවේ තින්දුවක් ගන්න පුළුවන් දෙයක් නෙමේ. හොඳ සාකච්ඡාවක් තියන්න මේ නිලධාරීනුත් ගෙන්වා. එතකොට අපේ කොට්ඨාශ 13 ජනතාව වෙනුවෙන් අපි සේවය කරන්න ඕන. එකේ කිසි ගැටළුවක් නැහැ. අපේ මන්ත්‍රීවරු කොට්ඨාශ වල ඉන්නවා. එගොල්ලන්ගේ අන්‍යතාවය තුළ කටයුතු කරන්න ඕන. ඒ අයගෙනුත් සලකා බලා මේ නිලධාරියෙක් කියන ලියුම් වලට ඕන ඕන විදියට වැඩ කරන්න දෙන්න බැහැ. අනිත් එක අපේ අතිගරු ජනාධිපති ගෝඨාභය මහතාගේ ප්‍රතිපත්තිය අනුව කෘෂි කර්මාන්තය නඟා සිටුවීම. කෘෂි කර්මාන්තය නඟා සිටුවන්න ඕන. ඇයි අපි ඒ න්‍යායන්ට යන්න බැරි . ඉතිං අපි කාටත් ප්‍රයෝජන වෙනවා කෘෂි කර්මාන්තය නඟා සිටුවීම. දැන් කොරෝනා වසංගතය පැමිණ තිබෙන්නේ යම් යම් රසායනික ප්‍රශ්න නිසා. ඒ ගැටළුවත් එකක් මේ ස්භාව සෞන්දර්ය ආරක්ෂා නොකරන නිසා. එකනිසා සමහර වේලාවට පෞද්ගලික පටු ආකල්ප තුළ  වනජීවී දෙපාර්තමේන්තුව අල්ලා ගෙන මොනවා හරි මේවා කරන්නත් ඉඩ

තිබෙනවා මේ තත්ත්වය තුළ . එකට ඉඩ දෙන්න බැහැ. එමනිසා මෙය බොහොම අධික්ෂණයක් කරලා නැති බැරි අය ඉන්නවානම් අවුරුදු ගණනක් සිටින අය සිටිනවා නම් හේතු කාරණා එක්ක සාකච්ඡා කරලා මෙය විශේෂ කරුණක් ලෙස සලකා ඔබතුමා මේ නිලධාරින් කැඳවා අදහස් අරගෙන කොට්ඨාශ වල ඒ සියළු මන්ත්‍රිවරුත් අරගෙන ඔක්කොම එකට තින්දුවක් ගන්න කියා අපි ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අපි තින්දුවක් ගන්න නෙමේ බලාපොරෝත්තු වෙන්නේ. අපි ගන්නේත් නැහැ තින්දුවක්. තින්දුවක් ගන්නේත් නැහැ. දැන් එගොල්ලන් එකඟවෙලා තිබෙනවා. ඒ අය ගසපු ගැසට් එක වැරදි විදියට ගහලා තිබෙනවා කියා. එතකොට එක සංශෝධනය කරන්න එකඟ වෙලා තිබෙනවා. ලක්ෂ්මි මන්ත්‍රිතුමියට තමන්ගේ ගේ වුණත් ඇතුල් කර ගන්න ඕන නම් ඇතුල් කර ගන්න. එකේ ප්‍රශ්නයක් නැහැ. ඒ වුණාට ඉවත් කර ගන්න ඕන තැන් තිබෙනවානේ. ඉවත් කරන්න ඕන තැන් අවශ්‍යතාවය පෙන්වන්න කියන මේවා එක තමයි. මිනිසුන්ට ප්‍රශ්න තිබෙනවා මේකේ. එමනිසා මිනිසුන් ගැන කල්පනා කර බලලා ඔය ඇතුලත් කරන්න ඕන . මා හිතන්නේ කඩෝලාන පද්ධතිය රැක ගැනීම සඳහා අපි එකඟයි. සමහර තැන්වලදි අපි ගත් තින්දු ඒ කියන්නේ මේ නගර සභාව විසින් ගත් 1988 දි අරගනෙ තිබෙනවා අක්කර 248 ක් . එතකොට ඒ අක්කර 248 ම මේකට අයිති කර තිබෙනවා. එතකොට මේ 248 ම මෙයට බැහැර කරනවාද එයින් යම්කිසි කොටසක් හරි අපේ සංවර්ධන වැඩ කටයුතු වලට ලබා ගන්නවාද ? කියන තින්දුව තමයි ගන්න ඕන. දැන් උදාහරණයක් වශයෙන් මේකේ ඇතුළේ තමයි පින්නදුව විහාරස්ථානය තිබෙන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

බස්නැවතුම්පොළ තිබෙන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

බස්නැවතුම්පොළ මෙයන් ඉවත් වෙලා තිබෙන්නේ. ගා/ පි ද එස් කුලරත්න විද්‍යාලය අයිති වෙලා තිබෙන්නේ මේක ඇතුළේ. ඉතිං මේවා අපි ඉවත් කරනවාද නැද්ද කියන තින්දුවයි ගන්න ඕන. මෙන්න මේ විදියට එකඟතාවය ඇවිත් තිබෙනවා. මෙයට මැනිමක් තිබෙනවා. මැනිමක් තියෙනකොට මන්ත්‍රිවරු ගිහින් මෙය ඇතුළත් වෙන්න. මෙය ඉවත් වෙන්න. කියන එක ඒ

ප්‍රදේශවල සියළු මන්ත්‍රිවරු සහභාගි වෙලා ඒ කටයුත්ත කරන්න. සියළු දෙනා දැනුවත් වීමට තමයි මෙය කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මටත් ඇත්තටම කියන්න ඕන වෙලා තිබුණේ මේක. අපි එකතු වෙලා අපේ මන්ත්‍රිවරු ඒ අය සමඟ ගිහින් බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක තමයි මේ දැනුවත් කරන්නේ. මේහෙම දෙයක් තිබෙනවා. සහභාගි වෙන්න. ඒඅය අපිට ලිඛිතව දැනුවත් කරනවා . අපිට කියන්නේ මෙයට සහභාගි වෙලා සක්‍රිය දායකත්වය දීලා අවශ්‍ය මිනිසුන්ගේ තිබෙන පහසුකම් මොනවාද ? ඉතුරු කරන්න ඕන මොනවාද කියන මේවා එක අපිට දක්වන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

අපි දවසක් වෙන්කරගෙන උදේ වරුවේ ගිහින් ඔය තැන් ටික බලා හවස ඇවිත් මෙතන රැස්වීමක් තියා අපි සැලසුම් කළයුතු ඒ අය සමඟම. එතකොට වැඩය හරි. හැබැයි අදාළ තැන් බලා එන්න වෙනවා. නැතුව අපිට මෙතන සිට කරන්න බැහැ. එගොල්ලන්ගෙන් අපි දිනයක් ඉල්ලාගෙන එහෙම කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ඉල්ලිමක් කරන්නම් සභාවටත් ඒ මායිම් සහිතව ඒ පෙන්වීම කරන්න කියා. ඉතිං මා නම් දැක්කා. එමනිසා අපි සභාවටත් එහෙම කරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා , ඇත්තෙන්ම මේ ලිපිය සම්බන්ධයෙන් කතා කරන කොට ඇත්තෙන්ම සාධාරණ තත්ත්වයක් ඉෂ්ඨ වෙයි කියන මතයේ තිබෙනවා. මොකද අවුරුදු ගණනාවක් තිස්සේ අපේ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවක් සිටිනවා. ඒ ජනතාව ඇත්තෙන්ම අයින් කරන්න බැහැනේ දැන් . අවුරුදු 30ක් 40ක් දැන් එතන සිටින නිසා අපේ මන්ත්‍රිතුමියත් දන්නවා එක නිසා . ඔබතුමා ඒ නිලධාරින් මහතුන් එනවිට ඒ සිටින ජනතාවත් ගෙන්වා අපි අර කිවුව වගේ සියළුම පදිංචි වෙලා සිටින ඒ අය සභාවට ගෙන්වා යම්කිසි දෙයක් කිරිමේ වැඩ පිළිවලක් යොදන්න. මේ පැමිණි ලිපිය සම්බන්ධයෙන් අපි සතුටු වෙන්න ඕන. යම්කිසි සාධාරණයත්වයක් ජනතාවටත් වෙන්න

පුළුවන්. එමනිසා ඔබතුමා කිවුව වගේ අපේ මන්ත්‍රීවරු දැක්වූ අදහස් වලටත් සවන් දිලා ඒ වනජීවි අමාත්‍යාංශයෙන් එනවා නම් අපේ මන්ත්‍රීවරුත් ඒ සඳහා සහභාගි කරවන ඉල්ලීම කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , වනජීවි දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය සම්බන්ධවයි. විශේෂයෙන් මතක් කළ යුතුයි. මේ අපේ කතා කළ මන්ත්‍රීවරුත් සමඟ මාත් එකඟයි. දෙපැත්තක් තෙ◌ිබෙනවා මේකේ. ස්වභාව දහම ජෛව විවිධත්වය මේ සියළු දේම අපි රැක ගත යුතුයි. වනජීවි කලාප . අපේ සීමා මායිම් තවම ලකුණු කරලා නැහැනේ. මායම් ලකුණු කරන්න. එය සංශෝධනය කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. මායිම් ලකුණු කරලා තිබෙන්නේ. එහිදි සමහර වේලාවට අපේ දුම්රිය ස්ථානයත් මෙයට ඇතුළත් කර තිබෙන්නේ. මෙය ඉවත් වෙන්න ඕනේ මොනවාද කියා වෙනස් කිරිමට ඔබතුමාලාට අවස්ථාවක් ලැබිලා තිබෙනවා. වෙනදා මෙහෙම දෙයක් තිබ්බේ නැහැ. දැන් මේ ප්‍රථම අවස්ථාව. මෙය ගැසට් කිරිමේදි වත් කවදාවත් අපෙන් ඇහුවේ නැහැ. මෙය සංශෝධනය කරන්න අදහස් දැන් විමසා ගෙන යනවා. එහිදි එකඟවෙලා තිබෙනවා. අපේ මැනිම් කටයුත්තක් කරලා අපි කියන්නේ කඩොලාන පද්ධතිය තිබෙන එවා ආරක්ෂා කරන්න. අනිත් එවා අත් හරින්න කියන එක තමයි මාගේ ඉල්ලීම. එ ඉල්ලිම අනුව සභාවේ මන්ත්‍රීවරු කැමතිනම් එක කරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, රක්ෂිත භූමියේ ප්‍රදේශයත් , නව මායිම් සංශෝධනයත් පරිසර ඇගයිම් වාර්තාවක් සමඟ මෙය අපි කතා කළ යුතුයි. මේ සියළු දේවල් මන්ත්‍රීවරු සමඟ සාකච්ඡාවක් දමන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ වගේම මන්ත්‍රීවරුන්ට මා දන්වන්න ඕන මෙවැනි ගැසට් එකක් දැම්මාම එය නැවත සංශෝධනය කරන්න ඕන නම් පරිසර ඇඟයිම් වාර්ථාවක් අපි ලබා දිය යුතුයි. දැනට රත්ගම ප්‍රාදේශිය සභාව තමන්ගේ ප්‍රදේශවලින් ඉවත් කිරිම සඳහා පරිසර ඇඟයිම් වාර් ථාවක් දිලා තිබෙනවා. ඒ වාර්ථාවට ඒ අය ලක්ෂ 126ක් වියදම් කර තිබෙනවා. ඇත්තටම මා මතය පළ කළේ

මේ විදියේ ගැසට් එකක් ගසන කොට ඒගොල්ලන් පරිසර ඇඟයිම් වාර් ථාවක් අරගෙන නෙමේ ගසා තිබෙන්නේ. සාමාන්‍ය යෙන් නිකං ගියා. පාරේ ඉන්න ගමන් කියවීම් ගත්තා කළා. එහෙමනම් එය අයින් කරන්න අපෙන් මෙකක් ඉල්ලන්නේ කියා. දැන් බැලුවාම අපි මෙය ඉවත් කරන්න පරිසර ඇඟයිම් වාර්ථාවක් දෙන්න ඕන. හරි වැරදි නිතියක් . ඒ පාර අමාත්‍යාංශ ලේකම්තුමා ම කිවුවා එය වැරදියි කියා. අපිට එහෙම මේකක් නැතිනම් ඒ මිනිසුන්ට ඇයි එහෙම කරන්නේ කියා. ඒ අනුව තමයි මේ තින්දුව ඇවිත් නැවත ගැසට් කරන්න මෙය තින්දු කළා. ඒ අනුව තමයි මන්ත්‍රිවරුන්ට දැනුවත් කරන්නේ ඒ ඒ ප්‍රදේශ. සමහර තැන් තිබෙනවා . මා දැක්කා දැන් උදාහරණයක් වශයෙන් ඉරක් ඇද්දාම ඌරවත්තේ පාලම ළඟ සිට ඊළඟ ඉර තිබෙන්නේ කෙලින්ම දෙල්දූව පාලම උඩ. එතකොට ඒ ඉරට අසුවන දකුණු අත පැත්තේ තිබෙන සියළු ඉඩම් අයිතියි. ඇත්තටම මෙහි තීරයක් තමයි අයින් වෙන්න ඕන. නමුත් ගෙවල් පිටින් ගෙවල් වල අයිතිය ඒ සියළු ගෙවල් මට පේන විදියට මහ අම්බලන්ගොඩ කොට්ඨාශයේ නිවාස වලින් 60% කට වඩා මේ වනජිවි කලාපය තුළ තිබෙනවා. එතකොට සාමාන්‍ය විදියට නිවසක් හදන්න යනකොට වනජිවි දෙපාර්තමේන්තුවෙනුත් අවසර ගන්න වෙනවා. ඉතිං එය මා නම් දකින්නේ එච්චර හොඳ දෙයක් නෙමේ. පනියන්දුව අයිති වෙනවා. විලේගොඩ කොටසක් අයිති වෙනවා. විලේගොඩ එක කොටසක් අරගෙන තිබෙන්නේ පරික්ෂණ වලින් මා පෙන්වන්නම් කිසිම දෙයකින් නෙමේ තිබෙන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

වනජිවි කලාප කඩොලාන අප අරක්ෂා කර ගත යුතුයි. අපිට පවරා ගත්තා නේද අක්කර 245 ක් විතර . එයට මුදල් ගෙවලා අපිට ලබා ගෙන අක්කර 60ක්

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මා මේ අවස්ථාවේදි වනජිවි එකට කිවුවේ අපේ මේ පවරා ගත් 248 වනජිවි එක අත්පත් කර ගන්නවා නම් ඒ මිනිසුන්ට වන්දි ගෙවීම වනජිවි එක භාර ගන්න. එතකොට අපි නිදහස් වෙනවා මෙකෙන්. නැතිනම් වැඩක් නැහැනේ මෙය පවරා ගෙන. මොකද තේරුමක් නැහැ. නැතිනම් අපි නගර සභාව වන්දි ගෙවිම භාර ගන්න වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මේ කඩොලාන ආශ්‍රිත වනජීවි කලාප ගොඩ කරලා තිබෙනවා. මෙහි අක්කර 60ක් තිබෙනවානේ. තව එකක් දුප්පත් මිනිසුන් නිවාස ඉදි කරලා තිබෙනවා. ඔය හැම තැනම වගේ. ඒ අයටත් සාධාරණයක් ඉෂ්ඨ වෙන්න ඕන. මොකද මේ මායිම් ඉදිරියට මේවා කරගත යුතුයි. මොකද ඔය සංවර්ධන කටයුතු තිබෙන ඒවා හරියට. නිත්‍යානුකුලව තිබෙන ඒවාත් . නිත්‍යානුකුල නොවන ඒවා තිබෙනවා. ගෙවල් දොරවල් සාදා. ඒ අයටත් සාධාරණයක් කරමින්. ඒ මායිම් අපි නිර්නය කර ගත යුතුයි . අනිවාර්යෙන්ම. ඒ ගැන අවධානය යොමු කරන්න කියා සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, වනය මාදම්පා විල , කඩොලාන ඒ වගේම පරිසරය සුරැකිම අපේ රජය ප්‍රමුඛ අභිලාෂයයි. මේ අද්යාෂය තුළ සිටිමින් ක්‍රියා කරන අපිට වත්මනෙහි අපිට ගැටළුවක්ව පැවති සිමා නිර්න ගැටළුව තිරණය කර ගන්න අපිට මහඟු අවස්ථාවක් උදා වෙලා තිබෙන්නේ. ඒ සඳහා පසුගිය දිනක මට මතකයි අපේ රත්ගම ආසනයට අදාල අමාත්‍යවරයා පවා පැමිණිලා මේ මුලික පසුබිම සකසන්නට සහාය සැලැස්සුවා. මේ අවස්ථාවේ මේ ලිපිය එවා ඇති නිලධාරියා පිළිබඳව මත භේදයක් ඇතිවිය යුතු නැහැ. කෘෂි කර්මයට අපි ලැදියි. නමුත් මේ වනවිටත් සංවර්ධනය වෙමින් තිබෙන භුමි වල කෘෂි කර්මය කළ නොහැකියි. කෙසේ වෙතත් ඔබතුමා කිවූ පරිදි ඒ සංවර්ධිත භුමින් ඉවත් කිරිම පමණයි. ඇයි මේ නිදහස් කරන්නේ. එසේ නොවේ කඩොලාන විනාශ කරමින් ගඟ ගොඩ කිරිමක් මෙයින් කියවෙන්නේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි , අපි අපේ සහාය දිලා කෙසේ හෝ මේ කටයුත්ත මේ පියවරෙන්ම අවසන් කර ගත යුතුයි. එසේ නොමැති නම් තව බොහෝ කාලයක් ලතවිමට අපිට සිදු වෙයි. මේ සියළුම මන්ත්‍රීවරුන්ගේ අද්යාෂය පල වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දිර්ඝ ලිපියක් ලේකම්තුමිය විසින් කියවනු ලැබුවා. අපිට මේ සියළුම කාරණා එකපාරට විශ්ලේෂණය කර ගැනීමට ග්‍රහනය කර ගැනීම මනසින් ටිකක් අමාරු කරුණක්. නමුත් සාරාංශය හැටියට ගත්තාම අපි එකඟ වුණොත් අපි දන්නේ නැහැ මෙහි සිමා මායිම් මොනවාද කියා. එවායෙන් තමයි ගෙවල් කැඩෙනවාද ගඟ ගොඩ වෙනවාද කියන ප්‍රශ්නය එන්නේ. ඒ සිමාවන් අපි දන්නේ නැහැ. නොදැන තමයි අපි එකඟ වෙන්නේ. ඒ ලිපියේ විවිධ අංශ පිළිබඳව

කියවුණා. අනවසර ඉදිකිරීම් කරලා තිබෙනවා නම් එවා අතහරින්න. එහෙම එකකුත් කියවුණා වගේ . එතකොට සංවර්ධන කියන සුන්දර වචනය දමා මෙතන මොකක් හරි මගඩියක් වෙනවා කියන එක තමයි මටනම් තෙරෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමිය මෙහි පිටපතක් හැම මන්ත්‍රීවරයෙකුටම ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

සංවර්ධනය කියන වචනය ලස්සනයි. එහි යටි අරමුණක් තිබෙන බව තමයි  අපිට හැඟෙන්නේ. මොකද සෑම සිදුවීමක් හරහාම අපිට එත්තු ගිහිල්ලා තිබෙන්නේ එකයි. අනිත් එක තමයි ලවණ සාන්ද්‍රණය වැඩි කුඹුරු ගැනත් කියවුණා මෙතන. ලවණ සාන්ද්‍රණය වැඩි කුඹුරු තිබෙනවා නම් ලවණ සාන්ද්‍රණයට ඔරොත්තු දෙන වී වර්ග තිබෙනවා. ප්‍රශ්නේ වෙලා තිබෙන්නේ රජයේ වැඩ පිළිවළක් නැහැ. ඒවා අස්වද්දන්න. කොච්චර වුණත් මා එකඟ නැහැ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ප්‍රතිපත්තියට. මා ඇයට ගරු කරනවා. දේශපාලනයක් එක්ක. 70 දශකයේ ඔය කුඹුරු වල වැඩ කළා. නමුත් එතනින් එහාට ගොඩ දා ගන්න වැඩ පිළිවළක් රජයට තිබුණේ නැහැ. එහෙම අවබෝධයක් නගර සභාවට තිබුණේ නැහැ. එමනිසා ඒවා පුරන් වුණා. ඒවා අසාර්ථක වුණා. නමුත් අද වනකොට විද්‍යාව දියුණුයි. මේ කුඹුරු අස්වද්දන තියෙන්න ඕන. ලවණ සාන්ද්‍රණයට ඔරොත්තු දෙන  වී වර්ග තිබෙනවා. එවා අපිට යොදන්න පුළුවන්. මොකද කුඹුරක් නැවත හදන්න බැහැ. කියන එක වැදගත් පුවතක්. කුඹුරක් නැවත හදන්න බැහැ අපිට. ගොඩ ඉඩමක් මඩ කරලා එහෙම හදන්න බැහැ කුඹුරක්. එමනිසා අපිට අද ප්‍රයෝජනයට ගන්න බැරිනම් මේ වෙල් එහෙම නැතිනම් කුඹුරු එවා අනාගතයේදි යම් පරම්පාරවක් ඒවා ප්‍රයෝජනයට ගනිවි. අනික තමයි ප්‍රධානම කාරණය අපි එකඟ වෙලා තිබෙනවා රැන්ඩා ගිවිසුමට. තෙත් බිම් සම්බන්ධව ලෝකයේ තිබෙනවා රැන්ඩා කියා ආයතනයක්. එක මා හිතන්නේ 1979 ගිවිසුම් ගත වෙලා තිබෙනවා. මේ කරන මගඩියක් මේ ගිවිසුම් වලට හානි නොවි කරාවි කියා මා විශ්වාස කරනවා. මට මේ කියන සංවර්ධනය හෝ මේ කියන වචන පිළිබඳව මට විශ්වාසයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම සරත් චන්ද්‍ර මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය සමඟ මාත් එකඟ වෙනවා. මොකද මේ වනවිට අපේ ස්වභාවික සම්පත් විනාශ වෙමින් පවතිනවා. අද තත්ත්වය නෙමේ. මීට කලිනුත් මේක තිබුණා. ඉතිං කඩොලාන කියන්නේ අපි ආරක්ෂා කර ගත යුතු

තැනක්. කලින් වතාවකත් ප්‍රකාශ කළා. එකනිසා මෙහි අපිට දෙපැත්තක් ගැන හිතන්න වෙනවා. එතකොට මාදම්පාවිල අභය භූමිය ආරක්ෂා කර ගැනිම අපි එක කරන්නත් ඕන. ඒ අතරේ අනවසර ඉදිකිරිම් තිබෙනවා නම් එතකොට අපිට අනවසර ඉදිකිරිම් පිළිබඳවත් අපිට එකඟතාවය පළ කරන්න බැහැ. ඉතිං අන්න එකනිසා මේ අපේ රටට බලපාන විශේෂයෙන් අපේ රටේ ස්භාවික සම්පත් ග්‍රහණව තිබෙන නිසා  ස්වභාවික පරිසරය ආරක්ෂා කර ගන්නත් ඕන. භෞතික සම්පත් පිළිබඳව ආර්ථිකමය වටිනාකමකුත් තිබෙනවා. නමුත් අපේ ගහකොළ ටික , වන සිවුපාවුන් , වගේ අපිටම ආවේණික වූ ශාක සහ පක්ෂීන් විශේෂයන් අපි ආරක්ෂා කර ගත යුතුයි. එමනිසා මාත් කියනවා පිටපතක් අපිට ලැබෙන්න ඕන කියා. මෙය දිර්ඝ ලිපියක් . අපිට මෙය මෙහෙම කිවුවාට තේරුම් ගන්න බැහැ. එහි සාරාංශයක් අපිට එතකොට දැන ගන්න පුළුවන් . එක නිසා මා විශේෂයෙන්ම ඉල්ලිමක් කරනවා. මේ සියළු දේ විශේෂ කරගෙන ඔය කිවුවා වගේ කෙරම්ණිය පින්නදූව අයිති වෙන්නේත් මාදම්පා විල අභය භූමියට. අපේ නිවස තිබෙන්නේත් මාදම්පාවිල අභය භූමිය තුළ තමයි. නමුත් අපිට වැදගත් වෙන්නේ අපේ මේ ශාක හා සත්ව විශේෂ රැකිමයි. අපිට වැදගත් . ඒ වගේම රටේ සංවර්ධනය , ගමේ සංවර්ධනය අපිට වැදගත් තමයි. ඔය දෙක තුලනය කරගෙන මේ වැඩය කරගන්න කියන අදහස මා කියනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලිමක් කරනවා මෙවැනි දිර්ඝ ලිපියක් ආවායින් පසු අපිට එය ලබා දෙන්න අවස්ථාවක් කර දුන්නොත් එය ගොඩක් වටිනවා. මොකද එතකොට අපි එය කියවා බලා තමයි කතා කරන්නේ. කියවන ටික බලා තමයි අපි කතා කරන්නේ. විශේෂයෙන්ම කඩෝලාන පද්ධතිය ආරක්ෂා කර ගන්න ඕන. මෙය ඉතාමත්ම වැදගත් ලිපියක් . මොකද සිමා නිර්නයන් හරියටම හිතා ගන්න බැරි යුගයක විසඳාගන්න මුලින්ම අඩිතාලමක් දමා තිබෙනවා.  අපි ශක්තිය දෙන්න ඕන. අපේ ගරු මන්ත්‍රීවරු කිවුවා වගේ මේ කණ්ඩායම මන්ත්‍රීවරු සමඟ මුණ ගස්සවා මෙය සාර්ථකව සිදු කර ගන්න ඕන. නැතිනම් මෙයට වැරදි විදියට සිමා නිර්නයන් අයිති වුණොත් මේක ගැසට් කරලා වෙනස් කිරිමක් කරන්න බැහැ. ගැසට් ගහනවා. වෙනස් කරනවා. මේ වගේ දේවල් . එමනිසා ගරු සභාපතිතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලිමක් කරනවා අම්බලන්ගොඩ නගර සභාවේ සියළුම මන්ත්‍රීවරුන්ගේ අවධානය මෙයට යොමු කරවා මේ අභය භූමිය කඩොලාන ශාක ශක්තිමත් කිරිමට කර ගැනීමටත් විශේෂයෙන් වසර 30 ක් 40 ක් ජීවත් වන මිනිසුන් ගැන සාධාරණයක් ඉටු කරන්න වෙනවා. ඒ අයගේ ජීවත් වන ජිවිකාව වලට බරපතල හානියක් නොකර ඒ අයගේ ජිවිකාව කරගෙන යාමට අවස්ථාවක් කර ගැනීමට

කටයුතු කරන්න. ජීවත් වන මන්ත්‍රීවරු වශයෙන් වගකීමක් තිබෙනවා. ඒ අයගේ ජීවනෝපාය ගැන බලාපොරොත්තු තබා ගනිමින් ඒ අයගේ සිතුම් පැතුම් වලට උදවු කරන්නත් ඕන. එමනිසා මේ ඔක්කොම සමබර විදියට හිතලා මේ කණ්ඩායම එක්කගෙන ඇවිත් අපේ මන්ත්‍රීවරු සමඟ සාකච්ඡා කරලා මෙය සාර්ථකව කරන්න කියා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ වනජීවි කාර්යාලයේ නිලධාරි විසින් එවන ලද ලිපිය වනජීවි අමාත්‍යාංශයේ වගකීව යුතු නිලධාරියෙකු එව්වා නම් හොඳයි කියන එක තමයි මගේ අදහස . විශ්වාසය පළ කරනවා. එතුමා ප්‍රාදේශීය නිලධාරියෙක් විතරයි. නීතියක් සකස් කරන අවස්ථාවේ එම නීතිය සඳහා අවසර ඉල්ලා සිටින්නේ මේ නගර සභාව . එතකොට ඒ නගර සභාවට නීතියක් සැකසීම සඳහා ගැසට් එකක් සැකසීම සඳහා සංශෝධනය කිරීම සඳහා වගකිව යුතු ආයතනයකට ඉල්ලීමක් කරන කොට වගකිව යුතු නිලධාරියෙකු විසින් එම ලිපිය යොමු කළ යුතුව තිබෙනවා. මා එය පෙන්වා දීමක් කළේ. මේ සභාවට සම්පූර්ණ අපේ ඉල්ලීමට නම් අපේ ඉල්ලීමට අනුව ගරු සභාපතිතුමනි, කඩොලාන පද්ධතිය පිළිබඳව කතා කිරීම අපිට අවශ්‍ය නැහැ. මොකය මෙය අයිති වාරිමාර්ග දෙපාර්තමේන්තුවට . ගඟ හෝ ඇළ රක්ෂිතය අඩි 40ක් . ගඟ දෙපැත්ත. එතකොට මෙය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයිති ප්‍රශ්නයක්. ඒ නිලධාරිතුමා අපිට යොමු කරන්න අවශ්‍යතාවයකුත් නැහැ. 100% ක් ආරක්ෂා කර ගත යුතුයි කියන මතයේ අපි ඉන්නවා. එය ආරක්ෂා කිරීමේ වගකීම ඒ නිලධාරින් අර නිලධාරින් හා සාකච්ඡා කර කළ යුතු වැඩක්. අපි අවසර අමුතුවෙන් දෙන්න අවශ්‍ය වෙන්නේ නැහැ. වාරිමාර්ගයට නිල වශයෙන්ම අයිති තිබෙනවා ඇළ රක්ෂිතය හෝ ගඟ රක්ෂිතය මෙච්චරයි කියන්න. එක පණතෙම තිබෙනවා. කිසි කෙනෙකුට අත තියන්න තහනම්. ඊළඟ එක දැනට මෙහි යම් යම්. මා දන්නේ නැහැ. මට ඇහුණ විදියට. මේ දැනට පදිංචිවෙලා ඉන්න. නිරන්තරයෙන් හෝ මෙය ඉවත් කිරීමේ ප්‍රවණතාවයක් තිබෙනවා. එය විය යුතු නම් එය විය යුතු ක්‍රමවේදයක් තිබෙනවා. එයට මා එකඟයි. ගැසට් කරලා මේ අය ඉවත් කිරීමේ ක්‍රමවේදයකට පාදන්න එපා. විශාල ප්‍රශ්න ඇති වෙනවා. අපි මන්ත්‍රීවරු. අපි කෙරමිණිය, පින්නදූව , මහ අම්බලන්ගොඩ , පනියන්දූව , තල්ගස්ගොඩ ඔය සියළුම මන්ත්‍රීවරුන්ට ඔක්කොටම අඩුවැඩි නැතුව මුළු සභාවටම මුහුණ දෙන්න වෙනවා. මොකද එය ලෙහෙසි පහසු කාර්යයක් නෙමේ. දැනට අනවසරයෙන් හෝ අවසරයෙන් හෝ පදිංචිවෙලා ඉන්න එක අඩුම වශයෙන් එක නිවසක් ඉවත් කරන එක ඉතාමත්ම අසීරු කාර්යකි. එතකොට අපි දන්න තරමින් දැනට ගෙවල් 100 ක් හෝ 200 ක් ගෙවල් විතරක් නෙමේ. ඒ කලාපය තුළ පන්සල් පවා

තිබෙනවා. එතකොට විශාල ප්‍රමාණයේ හෝ කුඩා ප්‍රමාණයේ ආයතනය පවා තිබෙනවා. ඒ පිළිබඳව ගැටළුවක් තිබෙනවා. ඒ වුණාට මේ ලිපියට අදාල මූලික මාතෘකාව අපි අමතක කරලා. ඉතිහාසයේ කවදා හරි දිනයක මේ ඉඩම නගර සභාවට පවරා ගැනීම අපි අමතක කරලා. මොකක් උදෙසාද ? මොකක් අරභයා ද මෙය පවරා ගෙන තිබෙන්නේ නගර සභාවට. අම්බලන්ගොඩ නගරයේ ජනතාවගේ සුබ සිද්ධිය උදෙසා නගරය සංවර්ධනය කිරීමේ පරම පවිත්‍ර චේතනාවෙන් මෙය පවරා ගෙන තිබෙන්නේ. එතකොට ඒ පවර ගැනීම තුළ අදටත් වන්දි නොගෙවපු පිරිසක් ඉන්නවා. වේදනා විඳින කොටසකුත් ඉන්නවා. එතකොට අවුරුදු 15 ක් 20 ක් එහෙම නැතිනම් 25 ක් ගිය තැන නැවත මෙය අපි අවසතු කරනවාද ? එහෙම නැතිනම් මේ තිබෙන තත්ත්වයට මුහුණ දීලා අර පසුගිය සභාවල අපි කතා කළා වගේ අපි වන්දි දීලා සත්‍ය වශයෙන්ම සුදුසුකම් තිබෙන අයට වන්දි ලබා දීලා මෙය ආරක්ෂා කරගෙන වනජීවි කලාපයට හෝ ගංගා නිම්න සංවර්ධනයට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය සකස් කරන්න. නැතුව අපිට අවශ්‍ය ප්‍රමාණය තියාගෙන අපිට වෙච්චරයි ඕනේ එගොල්ලන්ට සියළුම දේ දෙනවා. දැන් ඔබතුමා කියන විදියට කුලරත්න විද්‍යාලයත් දෙන්න වෙයි. එහෙම දෙන්නේ නැහැනේ. එතකොට කුලරත්න විද්‍යාලයට වෙනකම් යනකොට හල්වතුරේ භාගයක් අභය සිමාවේ. පනියන්දූව ඒ කොටසේ අක්කර 50 ක 60 ක විතර ප්‍රමාණයක් මේ පැත්තෙන් ගත්තාත් පදිංචි වෙලා සිටින කොටසක් ඉන්නවා. ඒ අනුව අපි ඉල්ලා සිටින්නේ මේ කියන වනජීවි කලාපයක් ලෙස නම්කරන්න උවමනා ප්‍රමාණය ඉතිහාසයේ කවදා හරි දිනයක අමාත්‍යාංශය මඟින් වනජීවි කලාපයක් ලෙස නම් කළහොත් හැබැයි එකෙත් යම් යම් අඩුපාඩු තිබෙන්න පුළුවන්. මොකද අදාළ පළාත් පාලන අයාතන වලින් හෝ කිසිදු විමසිමක් නොමැතිව තමයි මෙය සිද්ද වෙලා තිබෙන්නේ. එතනදී මේ භූමිය ගත්තාත් වනජීවි කලාපය කිවුවාම . මෙකේ වෘක්ෂලතා , සතුන් සිවුපා සියල්ලටම වාසියක් වෙන්න ඕන . අපි දන්න විදියට ප්‍රායෝගිකව ධිවර අමාත්‍යතුමා සමඟ නිරික්ෂණ චාරිකාවක් ගිහපු පුද්ගලයෙක් මා. ඔකේ මිරිදිය ධිවර මත්ස්‍ය වගාවත් කළා. පොළොවේ සම්පූර්ණ තිබෙන්නේ පරමාණු හැල් ඒ ඉඩමේ. මැරිච්ච පොළවක්. එතකොට මේකේ කොහොමද වෘක්ෂලතා තිබෙන්නේ. මහ පරිමාණයේ . එහෙම නම් කොක්කු , ගිරව් එහෙම කුරුළු පරාදිසයක් එහෙම තිබෙන්නේ. ඒ අශ්‍රිතව ඒ අයට අවශ්‍ය භූමි ප්‍රමාණය වෙන්කිරිම ඉතාම කලෝචිතයි. ඉතාම වැදගත්. හැබැයි මේ නගරය හෙක්ටයාර් 6 ½ . මේක එතනින් එහාට කොහොමද සංවර්ධනය වෙන්නේ. මෙහි ජනග්‍රහනය එන්න එනන් වැඩි වෙනවා. මෙකට අවශ්‍ය ඉල්ලුම වැඩි වෙනවා. අදටත් අලුත් පරේ ඉඩම් වර්ග අඩි 240ක වටිනාකම් ලක්ෂ 50කි . එහෙම නැත්නම් ලක්ෂ 20කි. වර්ග අඩි 240 කි. එහෙම නැතිනම් කළුවඩුමුල්ලේ ලක්ෂ 8කි. වර්ග අඩි 240 කි. එතකොට මේ ඉදිරි පාරම්පාරව කොහේද යන්නේ.

මේක අතහැරලා යන්න සිද්ධ වෙනවා. එතකොට මේක පිටස්තර පුද්ගලයන්ගේ අයිතිවාසිකම් වෙනවා අම්බලන්ගොඩ නගරය. අපි එකට වගකියන්නේ. අපි මේ අයට ජීවත් වෙන්න පරිසරය හදලා නැහැ. එකට තමයි ඉතිහාසයේ දවසක කවුරු හරි නගරාධිපතිවරයෙක් මෙය පවරා ගෙන දස අවුරුදු විසි අවුරුදු සැලසුම් නාගරික සංවර්ධන අධිකාරිය හරහා ඉදිරිපත් කර තිබෙන්නේ. මා දන්නේ නැහැ. මා එදත් කතා කළා . මේ සැලසුම් නගර සභාවේ තිබෙන්න ඕන. මා නිකං උදාහරණ දෙකක් කිවුවොත් අම්බලන්ගොඩ නගර සභාවට හෝ දේවානන්ද විද්‍යාලයට , කුලරත්න විද්‍යාලයට අවශ්‍ය දුරස්ථ ක්‍රීඩාංගණ තුනම තිබෙන්නේ ඔය හල්වතුර ඉඩමේ. කුලරත්න විද්‍යාලයේ සිට පොඩි පාලම දක්වා. ඒ සැලසුමේ. මේවත් මේ සාකච්ඡා වලදී අපි ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. මේවා මේ පසුබිමේ තියාගෙන මේ අනුමැතිය දෙන්නේ. මා දන්නේ නැහැ ගැසට් එකක් සඳහාද කියා මේ අනුමැතිය දෙන්නේ කියා. සභාපතිතුමා ඒ අවශ්‍ය තීන්දු ගන්න. හැබැයි ගැනිමේදි මේ අපි මතක් කරන කාරණා ගැනත් අවබෝධයෙන් කටයුතු කරන ලෙස ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, දිර්ඝ කාලයක් මේ සභාවේ කතා කරපු , මේ සභාවේ තීරණය කරපු මා හිතන්නේ අපේ මෙතන හිටපු විපක්ෂනායකතුමා දිගින් දිගටම අපි කතා කරලා මෙයට සාකච්ඡාවක් ගරු අමාත්‍යතුමා සමඟ ඉල්ලා මේ සභාව ඒකමතිකව සම්මත කරපු කාරණයක් තමයි අද මේ අපිට යෝජනා වෙලා පැමිණ තිබෙන්නේ. අපි දිගින් දිගටම ඉල්ලුවේ මේ වනජීවි කලාපයට තියෙන මිනිසුන්ගේ පෞද්ගලික ඉඩම් පවා මෙයට ඇතුළත් වෙලා තිබෙනවා. ඒවා නිදහස් කරන්න කියන ඉල්ලිම තමයි අපි හැමදාම කරන්නේ. මට මතකයි . අපේ ඩෙනට් පනියන්දුවගේ මහතා අපි එකඟ වුණා. පක්ෂභේදයක් නැතුව අපි ගිහින් ගරු අමාත්‍යවරයා පත් වුණාට පසු ගිහින් කතා කරලා මේ සම්බන්ධව මේ අම්බලන්ගොඩ නගරයට මේ වේලා තිබෙන මේ වනජිවියෙන් 2007 ගැසට් කළේ. මේ කවුරුම ප්‍රා දේශිය ලේකම්වරයෙක් දන්නේ නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2013 ගැසට් කරලා තිබෙන්නේ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , 2007 ආරම්භ කරලා තිබෙන්නේ. එතකොට අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම්තුමිය දන්නේ නැහැ. එතකොට හිටපු නගාරාධිපතිවරයා දන්නේ නැහැ. මන්ත්‍රිවරු දන්නේ

නැහැ. කවුරුවත් දන්නේ නැතුව මෙය ගැසට් වුණේ. මෙය වනජීවි කලාපයක් කියලා. කිසිම නිරික්ෂණයක්, කිසිම නිලධාරියෙක් නිරික්ෂණයක් කරලා නැහැ. අන්තිමට මෙය ගැසට් කරලා එනකොට අපි හැමදාම කියනවා අම්බලන්ගොඩ බස්නැවතුම්පොළත් දැන් මේ අම්බලන්ගොඩ දුම්රියපොළත් මේ වනජීවි කලාපයට අයිති. එමනිසා මෙහි විශාලම හානිය තිබෙන්නේ මහ අම්බලන්ගොඩ , පෝරඹ , කෙරමිණිය , පින්නදූව , තල්ගස්ගොඩ කියන ගරු සභාපතිතුමා කිවු පරිදි දෙල්දූව පාලම ගත්තාම කරණ්දෙණිය දක්වාම මෙය තිබෙනවා. එතන සිට කරණ්දෙණිය දක්වාම වනජීවි. එතකොට මේවා පෞද්ගලිකව මිනිසුන්ගේ ඉඩම්නේ. පෞද්ගලික ඉඩම් නිදහස් කරන එක මේ ලිපියෙන් කියන්නේ අදාළ ප්‍රදේශයේ මන්ත්‍රීවරයාත් අරගෙන ග්‍රාම නිලධාරිත් අරගෙන මොනවාද මෙතනින් පෞද්ගලික ඉඩම් අයින් කරන්න ඕනේ . එතකොට ඒ ගැසට් වෙන්න ඕනේ කියන කාරණය මටනම් හැඟෙන්නේ. ඔය ලිපියෙන් කියවෙන්නේ එකයි. එමනිසා අපි දැන ගන්න ඕන. මහ අම්බලන්ගොඩ , කෙරමිණිය , පින්නදූව , තල්ගස්ගොඩ , පෝරඹ ඉන්නවා. ලොකු විශාල ගැටළු තිබෙන තැන්වලට ගිහිල්ලා මෙන්න මේවා පෙන්වා දිලා මේ නිලධාරින්ට මේවා ඉවත් කරන්න එක තමයි මෙහි කරන්න තිබෙන්නේ මේ ගැසට් එකෙන් .එමනිසා අපි කවුරුවක්වත් මා අපේ සරත් ශ්‍රී ලාල් මහතා සමඟ එකඟ වෙනවා. මොකද කඩොලාන ආරක්ෂා කිරිමේ අයිතිය තිබෙන්නේ වාරිමාර්ග අමාත්‍යාංශයට. ඇළක් ගතහොත් ඒ ඇළේ රක්ෂිතයක් තිබෙනවා. අඩි 20, 30,40 ඒ වගේ රක්ෂිත තිබෙනවා. ඇළක් ගතහොත් ඒ අදාළ ඇළේ පළල අනුව ඊට අදාල රක්ෂිතයක් තිබෙනවා. ඒ වගේ රක්ෂිත ප්‍රමාණයක් තිබෙන්න ඕන. අපි වාරිමාර්ග එකකටත් ඒ වගේ කැඳවා මොනවාද තිබෙන්න ඕන කඩොලාන පද්ධති කියා හඳුනාගෙන තමයි මෙය ක්‍රියාත්මක කරන්න ඕන. අපි මේ සභාව දිගින් දිගටම යෝජනා කරපු එකක්. හැම සභාවෙන්ම පත්වෙච්ච පාලක පක්ෂ වලින් මේ ගැන ඉල්ලිමක් කළා. 2007 සිටම. එමනිසා අද මෙය අපේ රජයේ වර්තමාන වනජීවි අමාත්‍යාතුමා මෙයට සක්‍රියව දායක වෙලා ඒ ප්‍රදේශයට ඇවිත් විශේෂයෙන්ම දැන් මෙය අම්බලන්ගොඩ නගර සභාවට ක්‍රියාත්මක වෙලා අම්බලන්ගොඩ නගර සභාවට තමයි වැඩිම මෙහි බලපෑම තිබෙන්නේ. නමුත් එහෙම නෙමෙයි රත්ගම ආසනය ගත්තාම මුළු රත්ගම ආසනයටම මෙය බලපානවා. මා හිතන්නේ ඔකේ කියවුණා . ගල්කුරි ගැන. ගලගොඩ තිබෙන ගල්කුරි. ගලගොඩ තිබෙන එක ගල් කැටයක්වත් කඩන්න බැහැ. ඒ ගල්කුරි සියළු ඒවා වනජීවි එකට අයිති වෙලා තිබෙන්නේ. ඒ මිනිසුන්ට අද ජීවත් වෙන්න විදියක් නැහැ. ගලගොඩ ප්‍රදේශෙය් මිනිසුන්ට අද ජීවත් වෙන්න විදියක් නැහැ. ගල් කැඩිම. එක තමයි ඒ මිනිසුන්ගේ ජීවනෝපාය. ඉතිං එකත් නැතිවෙලා තිබෙන්නේ. රත්ගම ප්‍රාදේශිය සභාවෙන් හෝ මැදිහත්වෙලා මෙය මේ තත්ත්වයට ගෙන ආ එක ගැන ගරු අමාත්‍ය

මොහාන් ද සිල්වා මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා තමයි මෙහි වගකීම අරගෙන මෙය ක්‍රියාත්මක වුණේ. ඒ හරහා තමයි අම්බලන්ගොඩ නගරයේ ජනතාව වෙනුවෙන් . අද විශාල ජනතාවක් සිටිනවා සරත් මන්ත්‍රීමා කිවු පරිදි අනවසර මේවා හදාගෙන. අවුරුදු ගණනක් අවුරුදු 50 ක් 60ක් සිටින මිනිසුන් ඉන්නවා. ඒ මිනිසුන්ට අපි සහනයක් දෙන්න ඕන. ඒ සහනය දෙන්න තමයි ඕක යෝජනා වෙලා තිබෙන්නේ. ප්‍රදේශයේ මන්ත්‍රීවරයා , ග්‍රාම නිලධාරියා . ඒ අවශ්‍ය කියන කොටස් නිදහස් කළ යුතුයි. මෙය වනජීවි කලාපයෙන් නිදහස් කිරීම හොඳ වැඩක්. ඒ නිසා එයට සහායෝගය දෙන්න ඕන. අපි කනගාටු වෙන්නේ දිගින් දිගටම දිගින් දිගටම මේ සභාවේ මෙය නිදහස් කරන්න ඕන කියන කරුණු ඇවිල්ලා මේ වගේ යෝජනාවක් ආවාම මේකට විරුද්ධව කතා වෙනවා එක එක මන්ත්‍රීතුමලා. එමනිසා අපි සහායෝගයෙන් මේ වැඩය කරන්න. එම නිසා අපි එකතු වි මෙයට සහායෝගය දෙන්න. දිලා මෙය නගරයේ දියුණුව වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණේ මේ මන්ත්‍රීවරයා හැමදාම හැමදෙයටම විරුද්ධ වෙනවා. අපි දිගින් දිගටම මොනවා කිවුවාත් විරුද්ධ වෙනවා. එතුමාලාට මෙහි ආණ්ඩුවක් නැති නිසා ඒ අයට කිසිම වගකීමක් නැහැ. අපි පාලක පක්ෂ මන්ත්‍රීවරු වශයෙන් අපිට වගකීමක් තිබෙනවා. අපේ ආණ්ඩුවක් තිබෙන්නේ. අපේ ආණ්ඩුවෙන් වැඩක් කරන කොට මෙය හොඳද නැද්ද කියා බලා අපිට සහායෝගය දෙන්න. එතුමාලාට ආණ්ඩුවක් නැහැ. එතුමාලා පැමිණ මෙහෙම කියනවා. මේක හොඳ නැහැ. එමනිසා එතුමාලා දිගින් දිගටම මොනවා ගෙනාවත් කියනවා. මා කියන්නේ එහෙම දෙයක් වෙන්න ඕන නැහැ. මෙයට ආණ්ඩුව ගාව ගන්න ඕන නැහැ. ඔබතුමා කියන එක හරි. හැබැයි එතුමා තමයි ආණ්ඩුව ගවලා කළේ. මෙයට සහායෝගය දෙන්න. මේක නොකෙරුණොත් මේකට කතා කරන්න වෙනවා. එමනිසා මෙයට සහායෝගය ලබා දිලා මෙය ක්‍රියාත්මක කරන්න කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මා හිතන්නේ දිර්ඝ වශයෙන් සාකච්ඡා කරන්න අවශ්‍ය නැහැ. නමුත් මීට ඉස්සර සභා රාශියකින් ඉල්ලන ලද ඉල්ලීමකට තමයි මා ගිහින් සාකච්ඡා කිරීම කළේ. ඇත්ත වශයෙන්ම අපිට මේ සාකච්ඡාව සඳහා අපිට උදවු කළේ ගරු රාජ්‍ය අමාත්‍ය මොහාන් පි ද සිල්වා මැතිතුමා. එතුමාගේ ඒ මේවා එක අනුව අපේ සභාවේ දැනුම අනුව මා ප්‍රකාශ කළා . මෙහිදි මා මතක් කරන්න ඕන 1986 දි 1988 දි අක්කර 248 ක් නගර සභාවට පවරා ගෙන තිබෙනවා. හිටපු නාගරාධිපති ජී.එම්. එස්. ද සිල්වා මහතාගේ කාලයේ . ඒ කාලයේ නගර සැලැස්මක් සාදා තිබෙනවා. අපි එය 1997 ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු වශයෙන් බලයට පැමිණියාම අපි එය පිළිගත්තා. ඒ එක්සත්

ජාතික පක්ෂය විසින් ඉදිරිපත් කළ යෝජනාවලිය අපි විසින් පිළිගත්තා. දැන් සිටින පොදුජන පෙරමුණත් එම පොදුජන පෙරමුණත් එදා අපි පිළිගත්ත විදියට ඒ ආකාරයෙන්ම අදත් ඒ කටයුත්ත සංවර්ධන කාර්ය පිළි අරගෙන වැඩ කටයුතු කරමින් ඉන්නවා. ඒ අනුව අපේ අදහසක් තමයි මේ වැඩසටහන ක්‍රියාත්මක කර ගැනීම. අපිට බාධාවන දෙයක් තිබෙනවා නම් අපිට දැනට තිබෙන නිතිමය කටයුත්ත. මේ කටයුත්ත ජාතික කටයුත්තක් ලෙස සලකා ආරක්ෂා කර ගනිමින් , අපේ කොටසත් ආරක්ෂා කර ගනිමින් වැඩ කටයුත්ත කර ගැනිමට ඇවිත් තිබෙනවා. නැවත ගැසට් කිරිම සඳහා අමාත්‍යාංශය එකඟ වෙලා තිබෙනවා. එමනිසා අමාත්‍යාංශය ඉල්ලන්නේ මෙච්චරයි. ග්‍රාම නිලධාරි මහතුන්ගෙනුත් අපේ මන්ත්‍රිවරුන්ගෙනුත් ඉල්ලා සිටින්නේ එම සක්‍රිය මැනිමක් කරන අවස්ථාවේදි මැනිම කරන අවස්ථාවේදි එතනට සහභාගි වෙලා ඒ ප්‍රදේශයට අදාල කොටස් මුදවා ගැනීම සඳහා කරුණු ඉදිරිපත් කරලා සාධාරණ කරුණු බලා යම් විසඳුමකට එන්න කියන එකටයි මූලික දැනුවත් කිරිම කළේ. මෙය නොබෝ කාලයකින් ඉදිරියේදි සිද්ධ වෙවි. එකට සහාය ලබා දෙන්න කියන එක තමයි මාගේ එකම ඉල්ලිම. මා මේ සාකච්ඡාවට සහභාගි වුණේ මේ සභාව ගත්ත මන්ත්‍රිවරු විසින් මට ලබා දුන් උපදෙස් අනුව මිසක මාගේ පෞද්ගලික දර්ශනයක් මත නොවන බවත් මතක තියා ගන්න ඕන. මා ඒ දිනවලම කිවුවා අපිට මෙන්න මේ මේවා කර දෙන්න. එගොල්ලන්ට ප්‍රශ්න තිබෙනවා. එතකොට ඒ ප්‍රශ්න බෙරන්න ඕන අපි. ඒ කරුණු අපි ඉදිරිපත් කරා. එමනිසා ඉදිරියේදි වනජිවි දෙපාර්තමේන්තුවත් එක්ක . ඒ වගේම මේ වනජිවි දෙපාරත්තමෙන්තුවේ නිලධාරියා ඒ වගකිව යුතු නිලධාරියෙක් නොවන කෙනෙකු නෙමේ. එතුමා මේ ලිපිය එව්වේ ගරු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි තමයි. අපි ඉදිරියට ඒ අනුව කටයුතු කරන්න. එතුමා අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ දක්වාම පැමිණ සාකච්ඡා කළා. මේ වගේ ඒවා ඇතුල් වෙලා තිබෙනවා නම් වහාම ඉවත් කරන්න ඕන කියන උපදේශය තමන්ගේ නිලධාරින්ට ලබා දුන්නා. මාත් එක්කමයි ආවේ. ඇත්ත වශයෙන්ම වනජිවි අමාත්‍යා සි.බි. රත්නායක අමාත්‍යතුමාට අපි විශේෂයෙන්ම ස්තුති වන්ත වෙනවා. ජනතාවගේ සිතුම් පැතුම් බලා ඒ වගේම සභාවන්ගේ , ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල සිතුම් පැතුම් බලා ඒ කටයුතු කිරිම ගැන බලා මේවා කර තිබෙනවා. මේවාට එක ප්‍රශ්නයකට තුඩු දෙන දේවල් තිබෙනවා නම් ඉවත් කෙරෙනවාත් එක්කම සමහර දේවල් ඇතුල් කර තිබෙනවා. එමනිසා සක්‍රයව දායකත්වය දෙන්න. නැතිනම් අපේ අයිතිවාසකම් නැතිවෙනකොට තව කෙනෙකුගේ අයිතිවාසිකම් ඇතිවන මට්ටමක් යන්න තිබෙනවා. එමනිසා අපි ඒවා ගැනත් කල්පනා කරලා කළ යුතුයි. මෙහි පිටපත් සියළුම මන්ත්‍රිවරුන්ට ලබා දෙන්නම්. එය ලබා ගෙන ඉදිරියට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි කාගේ කාගේත් ආත්ම ගරුත්වය රැකෙන ආකාරයට ඔබතුමා වචන ප්‍රකාශ කරන්න . මා බොහොම කම්පාවට පත්වෙලා ඉන්නේ . පාරම්පාරාවෙන් ආපු පර්චස් 80ක තමයි මා ජීවත්වෙලා ඉන්නේ. මේක අප්පුවාඩු ඡසෝහාමි කියා තමයි පත්ඉරුවල තිබෙන්නේ. පර්චස් 80. ඔබතුමාට එය වැදගත් විදියට කියන්න තිබුණා. මේ අහන්න ඉන්න කිට්ටිය හිතන්නේ මමත් ඔකට මොනවා හරි කියලානේ. මානිම්මුල්ල නගර සභා නිවාස වලට දිලා තිබෙන්නේ මාගේ තාත්තා හා ලොකු තාත්තා. අදටත් තිබෙනවා අප්පුවාඩු මනිමෙල් සිල්වා , විලියම් සිල්වා කියා.

**තීරණය-**

**මාදම්පාවිල අභය භූමිය තුල පිහිටි සංවර්ධිත ප්‍රදේශ අභය භූමියෙන් ඉවත් කිරිම** යන මැයෙන් වනජිවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් හික්කඩුව ජාතික උද්‍යානයේ භාරකරු විසින් එවා ඇති ලිපිය අනුව ඉදිරියේදී මැනුම් කටයුතු සිදුවන අවස්ථාවලදී ජනතාවගේ ගැටලු වෙනුවෙන් සාධාරණ කරුණු ඉදිරිපත් කර ගරු මන්ත්‍රීවරුන් සහාය දක්වන ලෙසත්, අභය භූමියෙහි මායිම් පිළිබඳව විස්තරයක් මාසික සභා රැස්වීමට ඉදිරිපත් කරන ලෙස වනජිවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් හික්කඩුව ජාතික උද්‍යානයේ භාරකරු වෙත ඉල්ලීමක් කරන ලෙසත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දන්වන ලදී.

## 03.07 2020 ඔක්තෝම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020 ඔක්තෝම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව ඔක්තොම්බර් මස ඉදිරිපත් කරනවා. ආයතනය විවෘතව තිබු දින ගණන 20 කි. පැමිණි රෝගින් සංඛ්‍යාව 1189, රෝගින් පැමිණි දෛනික සංඛ්‍යාව 59 කි. ගියවියදම රු53015.68. එව ඉදිරිපත් කරනවා.

**තීරණය-**

2020 ඔක්තෝම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.08 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමික්ෂණ මණ්ඩල පත් කිරිම සම්බන්ධ ලිපි ගොණුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමික්ෂණ මණ්ඩල පත් කිරිම. ඒ අනුව මණ්ඩල පත් කරන්න ඕන. ප්‍රධාන ගබඩාව , ඉන්වෙන්ට්‍රි භාණ්ඩ, ප්‍රධාන පුස්තකාලය , ශාඛා පුස්තකාලය සඳහා නම් කර තිබෙනවා. ඒ අනුව ප්‍රධාන කාර්යාලය අචිරා රංජනි මහත්මිය සභාපති , ගෞරි මෙබලා , දුල්කා මදුරංගනී , හර්ෂණ නිලමුණි, ඒ සඳහා අතිකාල පැය 100 බැගිනුත් උපරිම දින 4ක් බැගිනුත් දක්වා තිබෙනවා. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඉනෝකා ක්‍රිශාන්ති මිය , ජීවනි ලක්මාලි මිය , ප්‍රසංගි මාදුවගේ මිය , ඒ අයටත් අතිකාල පැය 100 බැගින් ලබා දෙනවා. පුස්තකාල පොත් සමික්ෂණය එම් රෝෂණි මිය , පවනි මහාආරච්චි මෙනවිය, ශාඛා පුස්තකාල පොත් සමික්ෂණය මංජරි ඉරෝමිකා , දිලිනි උදේශිකා නම්කර තිබෙනවා. ප්‍රධාන පුස්තකාලය කේ.ඩි රෂිනි , මාලනී පුෂ්ප ලතා , ජයලත් අතිකාල පැය 100 ක් ලෙස නම්කර තිබෙනවා. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ නලින් මාදුවගේ මහතා පුස්ත කාල පොත් පමික්ෂණය සඳහා මනෙල් රංජනි , ප්‍රියන්ති මෙනවිය , මනෝරි චන්ද්‍රවංශ මිය, ඉන්ද්‍රදාස මයා යන අයත් පුස්තකාලාධිපතිනියට අතිකාල පැය 100 කුත් අනිකුත් අයට අතිකාල පැය 50කුත් අනුමත කර තිබෙනවා. පුස්තකාල පොත් සමික්ෂණය කෙරමිණිය පුස්තකාලය ඒ.ජී. රසිකා මිය, ඕකන්ද පුස්තකාලය පැය 50 බැගින් මෙවාට නම්කර තිබෙනවා. එමෙන්ම සමික්ෂණ කාර්ය මණ්ඩල සඳහා ඉතිරි අතිකාල ගෙවීම , නිවාඩු වැටුප් ගෙවීම , පරික්ෂා කිරිම සඳහා නාගරික මන්ත්‍රිවරු පත් කිරිම සුදුසු බවට කියා තිබෙනවා. ප්‍රධාන ගබඩාව සඳහා මන්ත්‍රිවරු කීදෙනෙක් පත් කර තිබෙනවාද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ අත් සේදිමට භාවිතා කරන දියර සිල් කරලාද ගෙන්නේ. මොකද සාන්ද්‍රතාවය පිළිබඳව ගැටළු ඇති වෙන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගබඩාවට තමයි එන්නේ. සිල් කරලාද නැද්ද කියන එක. ලේකම්තුමිය මෙයට පිළිතුරු දෙයි. ප්‍රධාන ගබඩාව සඳහා ලලිත් ධම්මික කොඩිකාර මහතා හොඳටම මේ කටයුත්ත කළා. එතුමාව අපි යෝජනා කරනවා . ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සඳහාත් ඔබතුමාම යෝජනා කරනවා. විපක්ෂයේ මන්ත්‍රිවරයෙක් යෝජනා කරන්න. රාහුල මන්ත්‍රිතුමාගේ නම යෝජනා කරනවා කවුරු හරි ස්ථිර

කරන්න. පුස්තකාල පොත් සමික්ෂණය ශාඛා පුස්තකාලය සඳහා චම්පා මන්ත්‍රීතුමිය අපේ එය භාර ගන්නවාද ? ග්‍රේෂන් මන්ත්‍රීතුමාත් එයට යෝජනා කරනවා .

**තීරණය-**

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමික්ෂණ මණ්ඩල පත් කිරිම සම්බන්ධව,

01. **ප්‍රධාන ගබඩාව** සඳහා අචිරා රංජනි ලොකුගේ මිය, පී.ඩී.ගෞරි මේබලා මිය, දූල්කා මධුරංගනී මිය හා හර්ෂණ නීලමුණි මයා පත්කිරීම සුදුසු බවත් ඔවුන්ගේ සහාය සඳහා කේ.ටී.රෂිනි මිය, මාලනී පුෂ්පලතා මිය සහ එච්.ඒ.ජයලත් මයා පත්කිරීම සුදුසු බවටත් හර්ෂණ නීලමුණි මහතාට උපරිම දින 04 ක දින වැටුප් ද අනෙක් නිලධාරීන් හා සේවකයින් සඳහා පැය 100 ක අතිකාල අනුමත කිරීම සුදුසු බවටත්, අධික්ෂණය සඳහා ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා පත්කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

02. **ඉන්වෙන්ට්‍රි භාණ්ඩ** සඳහා එම්.ඉනෝකා ක්‍රිෂාන්ති මිය, ඩබ්.එම්.ජීවනී ලක්මාලි මිය, ප්‍රසංගි මාදුවගේ මිය පත්කිරීම සුදුසු බවත් ඔවුන්ගේ සහාය සඳහා නලින් මාදුවගේ මහතා පත්කිරීම සුදුසු බවටත් ඔවුන් හට පැය 100 ක අතිකාල අනුමත කිරීම සුදුසු බවත් අධික්ෂණය සඳහා ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා පත්කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

03. **ප්‍රධාන පුස්තකාලයේ පුස්තකාල පොත් සමීක්ෂණය** සඳහා එම්.එච්.රෝෂිණී මිය සහ පවනි මහ ආරච්චි මෙනවිය පත්කිරීම සුදුසු බවටත් ඔවුන් හට පැය 100 ක අතිකාල අනුමත කිරීම සුදුසු බවටත් , ඔවුන්ගේ සහාය සඳහා කේ.එම්.මානෙල් රංජනී මෙනවිය, පී.එච්.එල්.ප්‍රියන්ති මෙනවිය, මානෙල් චන්ද්‍රවංශ මිය හා ඒ.ඩබ්.ඉන්ද්‍රදාස මයා පත්කිරීම සුදුසු බවටත්, කේ.එම්.මානෙල් රංජනී මෙනවියට පැය 100 ක් ද අනෙක් තිදෙනාට පැය 50 බැගින් ද අතිකාල අනුමත කිරීම සුදුසු බවටත් අධික්ෂණය සඳහා ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේස න් කෙරමිණීයගේ මහතා සහ ගරු නගර සභා මන්ත්‍රීනී මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය පත්කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**04. ශාඛා පුස්තකාලවල පොත් සමීක්ෂණය** සඳහා එම්.ඩබ්.මංජලී ඉරෝමිකා මිය සහ ඩබ්.දිලිනි උදේශිකා මෙනවිය පත්කිරීම සුදුසු බවටත් ඔවුන් හට පැය 100 ක අතිකාල අනුමත කිරීම සුදුසු බවටත් , ඔවුන්ගේ සහාය සඳහා කෙරමිණිය ශාඛා පුස්තකාලයට ඒ.ජී.රසිකා මිය ද, මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයට සුසිල් දීපානි මිය ද, ඕකන්ද ශාඛා පුස්තකාලයට මාලනී ආරියසිංහ මිය ද, පොල්වත්ත ශාඛා පුස්තකාලයට ජිලේකා සුමංගලී මිය ද, පෝරඹ ශාඛා පුස්තකාලයට කේ.නිරෝෂා මියද, හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලයට දිල්රුක්ෂි මිය ද,

හිරේවත්ත ශාඛා පුස්තකාලයට විසුද්ධි රේණුකා මිය ද පත්කිරීම සුදුසු බවටත් ඔවුන් හට පැය 50 ක අතිකාල අනුමත කිරීම සුදුසු බවටත් අධික්ෂණය සඳහා ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේස න් කෙරම්ණියගේ මහතා සහ ගරු නගර සභා මන්ත්‍රිනී මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය පත්කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.09 2020 වර්ෂය සඳහා නොමිලේ අභ්‍යාස පොත් ලබා දීම සම්බන්ධ වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

2020 වර්ෂය සඳහා අභ්‍යාස පොත් ලබා දීම සඳහා සම්පූර්ණ ලැයිස්තුව ඉදිරිපත් කරනවා. පිටපත් සියල්ලටම ලබා දි තිබෙනවා. එය අනුමැතිය සඳහා සභාවේ අවසරය ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ඒ වාර්තාව සම්බන්ධව තමයි මා කතා කරන්නේ. නගර සීමාවේ පිරිවෙණ් ගත ස්වාමින් වහන්සේලා 30 යි. අම්බලන්ගොඩ නගර සීමාවේ දහම් පාසැල් දරුවන් සඳහා 2683, අම්බලන්ගොඩ නගර සීමාවේ පාසැල් සිසුන් සඳහා 2128. මොකක්ද ඒ කියන එකයි මට දැන ගන්න ඕනේ. ඒ කියන්නේ දහම් පාසැල් ළමුන් වැඩිද ?

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

දැන් මෙහෙමයි වෙලා තිබෙන්නේ. අම්බලන්ගොඩ නගර සීමාවේ එනකොට අඩු ආදායම්ලාභි එනකොට සාමාන්‍ය තත්ත්වය සහතික කරන්න ඕන ග්‍රාම නිලධාරි විසින් . නමුත් අපි දහම් පාසැල් වලට ලබා දීමේදි එය ලබා දිලා තිබෙන්නේ ප්‍රධානාචාර්ය වශයෙන් ගරු ස්වාමින් වහනසේ . එතකොට මේ ස්වාමින් වහන්සේ විසින් සහතික කරන ලද ප්‍රමාණය තමයි මේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එහෙමනම් අපිට මේ වාර්තා ටික බලන්න ඕනේ. මෙය අනුමත කරන්නේ ඉන් පස්සේ. මොකද හේතුව මෙහි දහම් පාසැල් ළමුන් වැඩි වෙන්නේ කොහොමද කියන එක.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

එක තමයි ඒ අනුමත කිරිම කර තිබෙන්නේ විහාරස්ථානයේ  ලොකු හාමුදුරුවන් විසින් .  ඒ අනුව තමයි අපි මේ ගණන දි තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක හරි එතකොට විදුහල්පතිවරු මෙය අනුමත කර නැද්ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒ වගේම දහම් පාසැල් ළමුන් සඳහා ලබා දි තිබෙන්නේ පොත් දෙකයි. ළමයි වැඩි වුණාට අනිත් අයට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපිට බලන්න පුළුවන්ද ඔය වාර්තාව.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ තමයි වාර්තාව

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එහෙම නෙමේ. ගනිපු මේවා ටිකක් එක්ක.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා කෙලින්ම ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය මුණ ගැසෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා කෙලින්ම මට බලය දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හරි එය ලබා දෙන්නම්. කිසි ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට මේක පෙනෙනකොට හිනා යන්නේ. මේ අපේ දහම් පාසැල් වල මේ ගණනකුත් අම්බලන්ගොඩ නගර සීමාවේ තිබෙන පාසැල් වල මේ ගණනකුත් වීම.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා මෙන්න මෙහෙම දෙයක් තිබෙනවා. අපි දැන් නගරයේ ඇතුළේ විතරයි පොත් ලබා දෙන්නේ. නමුත් දහම් පාසලක නගරයෙන් පිට ළමුනුත් ඕකේ ඇතුළේ සිටිනවා. එතකොට අපි දහම් පාසලට ලබා දෙන්නේ ඒ පන්සලේ ලොකු හාමුදුරුවන්ගේ නියමය පරිදි. හැබැයි එතනදි ලබා දෙන්නේ පොත් දෙකයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එක හරි මම එකට එකඟ වෙනවා. මට තිබෙන ගැටළුව තමයි මෙච්චර මේ දස දහස් ගණනක් සිටින පාසැල්4 ම මා කියන්නේ අපි හැමෝම දැන ගන්න ඕන මන්ත්‍රීවරු මෙන්න මෙකයි අද තත්ත්වය. පාසැල් වලට යන ළමුන්ගේ ධර්මාශෝකයට යන ළමුන්ගේ තත්ත්වය. මෙහි ප්‍රතිශතයක් ගෙන බලන්න. මොකක්ද වෙලා තියෙන්නේ කියා. ඕන්න එකයි තත්ත්වය. ඒ ළමයි තමයි අපේ පාසැල් වලට එන්නේ. එකයි වෙලා තියෙන්නේ. එකයි මෙයට හේතුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

නැහැ. කොඩිකාර මහතා මා හිතන්නේ අපේ අඩු ආදායම් ළමුන් අඩු ඇති. ඒ කියන්නේ අම්බලන්ගොඩ නගරයේ ඔක්කොම සල්ලිකාරයෝ. අඩු ආදායමලාභි ළමුන් අඩු නිසා තමයි මෙය අඩුවෙලා ඇත්තේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඕන්න ලේකම්තුමිය අපේ රාහුල මන්ත්‍රීතුමාට මෙය අධික්ෂණය කරන්න ඉඩ දෙන්න.

***තීරණය-***

2020 වර්ෂය සඳහා නොමිලයේ අභ්‍යාස පොත් බෙදාදීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති වාර්තාවට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපන්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.10 මහජන සෞඛ්‍ය පරික්ෂවරුන්ට හිමි දීමනා සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මහජන සෞඛ්‍ය පරික්ෂකට හිමි දීමනාව සම්බන්ධවයි. උක්ත කරුණ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්ගේ 01/1/9 දිමනා 2020.10.14 දින ලිපියේ පිටපතක් අමුණා ඇත. අම්බලන්ගොඩ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරික්ෂක පි. වයි යසවර්ධන මහතාට හිමි දීමනා වාර්ෂික ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන සීමාව ඉහළ දැමීමක් . එයට අනුමැතිය ලබා ගැනීමට පිටපත් අමුණා ඇත. ඒ අනුව අතිකාල දීමනා පැයකට රු.205. මසකට පැය 100යි. ගමන් වියදම් දීමනාව රු.4800/= නිවාඩුවල වැඩ කිරිමේ දීමනාව වැටුපෙන් 1/20 ක් නිල ඇඳුම් දීමනාව රු.15000/= ක් වශයෙන්. ගෙවීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන්න ඕන. මහජන සෞඛ්‍ය පරික්ෂකවරු කරන කාර්ය භාර්ය මේ අවස්ථාවේ. එක නිසා කිසි ගැටළුවක් නැහැ කාගේ වත් . එය ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදි ඇත්ත වශයෙන්ම අපි යෝජනාවට එකඟ වෙනවා. කැමැත්ත ප්‍රකාශ කරනවා. මා හිතන්නේ එතුමාලා කරන අති විශේෂ සුවිශාල සේවාව අපිට මේ අවස්ථාවේ වැදගත් වෙනවා. ඒ වගේම ඉල්ලිමකුත් කරන්න තිබෙනවා. මොකද එතුමන්ලා ජීවිතය පරදුවට තබා තමයි මෙය කරන්නේ. පසුගිය දිනවල ලංකාවේ සියළුම පාසැල් විවෘත කළා. ඒ විවෘත කරපු අවස්ථාවේ අම්බලන්ගොඩ එක්තරා සිද්ධියක් වුණා. එක දෙමාපියෙක් පැමිණ තමන්ගේ දරුවා පාසැලට ඇතුළත් කළා. ධර්මාශෝක විද්‍යාලයටත් , කුලරත්න විද්‍යාලයටත් ඇතුළත් කළා. ඒ අයගේ පියා පොසිටිව් වුණා. ඒ අවස්ථාවේදි ඒ පියා නිරෝධානය වෙමින් සිටි පුද්ගලයෙක්. නමුත් ඒ සිද්ධියෙන් පස්සේ පාසැල් පද්ධතියම අක්‍රිය තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ. දෙමාපියන් බයවෙලා තිබෙනවා. අද මා ඉල්ලා සිටින්නේ ඒ නිරෝධානය වන නිතිය අනුව කටයුතු කරන්න ඕන. මා මෙතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මොකද අද කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතතුමාට තර්ජනයක් ඇවිත් තිබෙනවා. එතුමා මාධ්‍යයට මේ සම්බන්ධව ප්‍රකාශයක් කළා කියා. මා හිතන්නේ ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිතුමාත් ප්‍රකාශයක් කළා. එතුමාට ඒ පොසිටි වු තාත්තාගෙන් තර්ජනයක් වෙලා තිබෙනවා. නිතරම ඒ පුතාගෙන් හා තාත්තාගෙන් තර්ජනාත්මක දුරකථන ඇමතුම් ලැබෙනවාලු බලා ගන්නම්

මෙහෙමයි කියා. නමුත් මේ විදුහල්පතිතුමාට අයිතියක් තිබෙනවා මේ මාධ්‍යයට ඇවිත් ඒ වෙලා තිබෙන සිද්ධිය ප්‍රකාශ කරන්න. ඇත්ත වශයෙන්ම ඒ පුද්ගලයා ඒ ආකාරයෙන් කරන ප්‍රකාශය රටට ජාතියට කරන ලොකු අපරාධයක්. මෙතුමාලා මේ අවස්ථාවේදි අන්න ඒ නිරෝධාන නිතිය ක්‍රියාත්මක වෙන්නේ. එහෙම අය මෙහෙම හැසිරෙන්න ගතහොත් ඒ සාමාජයට විශාල කරදරයක් ඉදිරියේදි සිද්ධ වෙනවා. ඉදිරියේදි මේවාට පිළියම් යොදනවා නම් හොඳයි කියා මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා එයත් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. එතුමාගේ කලින් එවාත් තිබෙනවා නම් එවත් ගෙවා දමන්න. එක එක්කෙනා කතා කර කියනවා. අම්බලන්ගොඩ නගරයේ නිරෝධානයට දැම්මාම මහජන සෞඛ්‍ය පරක්ෂක මහත්වරු බලන්නේ නැහැ කියා. එම නිසා එහෙම වෙනවා කියා. මධ්‍යවේදි මහත්වරු සිටිනවා නම් මෙය ලියන්න ඕන. අපි ඇත්තටම මෙය අවබෝධ කර ගන්න ඕන. මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරුන්ට නම් කියටවත් මෙය කරන්න බැහැ. අපේම මහජනතාවගේ ඇතුලෙන් එන්න ඕන මෙය කරන්න ඕන කියා. අනිත් එක නිවාස වල නිරොධානය කරන අය මුළු ලංකාවේම පොලිසිය දැම්මාත් ගෙයින් ගෙට දමන්න ඕන. ඉතිං එක පොඩ්ඩක් දැනුවත් වෙන්න ඕන. මා හිතන්නේ දුරකථන ඇමතුම් 10 ක් විතර ආවා . මේ අය නිරෝධානය වුණාම මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරු දැන ගන්න ඕන කියා. ඒ මහත්වරුන්ට එක කරන්න බැහැ. ඒ තම තමන්ගේ වගකීම ඉෂ්ඨ කරන්න ඕන. මා හිතන්නේ මාධ්‍යවේදි මහත්වරු ඒවා සටහන් කරන්න. මෙහෙම දේවල් තිබෙනවා කියා. මටත් කැගැසුවා. ඔගොල්ලන්ගේ මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරු දැනුවත් කරන්නේ නැද්ද කියා. ගිහිල්ලා බලන්න කියා. එක මේ සභාවට ඉදිරිපත් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මහජන සෞඛ්‍ය නිලධාරිතුමාටත් දිමනාව ලබා දෙන්න කියා මාත් යෝජනා කරනවා. මේ මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරු මේ රටතුළ කොරොනා වසංගතය හේතුවෙන් ගන්නා උත්සාහය ඉතා අඟය කොට සලකන බවත් ඒ සම්බන්ධව ස්තුතිය ප්‍රකාශ කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ කතා කරන්නේ යසවර්ධන මහතා ගැන පමණයි. අපිට ඊට අමතරව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කරන ලද මහජන සෞඛ්‍ය පරික්ෂක මහතෙකුත් ඉන්නවා. ඒ මහතා සම්බන්ධයෙන් අපිට යම්කිසි දිමනාවක් හෝ යම්කිසි දෙයක් කිරිමට හැකිද කියන එක තමයි මා විමසන්නේ. නිත්‍යානුකුලව. ඒ මහත්වරු දෙදෙනා ඔය යතුරු පැදි දෙකෙන් ඇවිදින තරම අපි සියසින් දැක තිබෙනවා. එතකොට දහවල් රෑ තිස්සේ මේ කරන සේවය ඉතාම ගරු කරනවා. මේ සභාව අඩු වැඩි නැතුව එකඟ වෙනවා. නගරයේ ජනතාව එකඟ වෙනවා. කොහේ හරි පොඩි අඩුපාඩුවක් ඇති. ඔවුන් දිවි හිමියෙන් අපි ආරක්ෂා කර යුතුව තිබෙනවා. යම් හෙයිකින් වැරදිලා හරි ඔවුන්ට මේ තත්ත්වය උදා වුණහොත් මුළු නගරයම ඉවරයි. ඉතිං සභාවක් විදියට අපි ඔවුන්ට කරන්න පුළුවන් යුතුකමක් කරන්න පුළුවන් ද කියන එකත් ආණ්ඩුකාරතුමාගේ අවසරය අරගෙන හරි දෙන්න පුළුවන් ද කියන එක ගැන අපි එකඟතාවය පල කරනවා. එය විමසා බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමියණනි, ඒ සම්බන්ධව නිත්‍යානුකුලව අපිට තොරතුරු තිබෙනවා නම් එය ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරු ගැන මුළු ලංකාවේම අපි ඇත්තටම අභය කරන්න ඕන. ඉතාමත් බැරුරුම් කාලයක බැණුම් අහන්නෙත් වැඩිපුර මහජන සෞඛ්‍ය පරික්ෂකවරු තමයි. හැබැයි තමන්ගේ ජීවිත පරදුවට තබා වැඩ කරන සෑම මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්මයෙකුටම කවුරු හරි දොසක් කියනවා. නිරෝධාන අවස්ථාවේදි එහෙ මෙහෙ ඇවිදින එකට මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරුන්ට දොස් කියා වැඩක් නැහැ. මොකද මා කිවුව වගේ එතුමන්ලාට ගිහින් නිදි මරාගෙන ඒ නිවස රැක ගෙන ඉන්න බැහැ. කවුරු හරි යනවා ද කියා. අවට පාත ගම්වාසිනුත් එය දැන ගන්න ඕන. අවට නිවසේ අය මෙය ඉටු කරන්නේ නැතිනම් මෙයට රාජ කාරියක් කරන්න. ඒ වගේම මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරුන්ට දෙන දිමනාව තවත් දෙයක් පුළුවන් නම් ලබා දෙන්න. මහජන සෞඛ්‍ය පරික්ෂකවරු නිදි මරාගෙන තමන්ගේ දරුවන් ගැනවත් හිතන්නේ නැතුව මේ කරන කැපවීම සම්බන්ධව නගර සභා

මන්ත්‍රීවරියක් වශයෙන් ඉතාමත් අගය කොට සලකනවා. විශේෂයෙන් අම්බලන්ගොඩ. අම්බලන්ගොඩ නගරය මේ තත්ත්වයට පවත්වාගෙන යන්න දැඩි මහන්සියක් දරන්නේ එතුමන්ලා. මොකද එතුමන්ලා තමයි මේ රෝගයෙන් ආරක්ෂා කිරිම, මේ රෝගය බෝ නොවිම සම්බන්ධව වගකිම අරගෙන තිබෙන්නේ. දැන් කොළඹ මහ නගර සභාවට මේ රෝගය පාලනය කර ගන්න බැරුව ගිහින් තිබෙන්නේ. නමුත් මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරු දැඩි උත්සාහයක නිරත වෙනවා. මහජන සෞඛ්‍ය පරික්ෂක සංගමයේ සභාපතිතුමා දැඩි පිළිකුලෙන් හෙලා දකිනවා. මේ වැඩ කටයුතු කරන්න ආමාරු තත්ත්වයක සිටිනවා කියා. අපි ඒ තත්ත්වයට පත් නොවි . ඔබතුමන්ලා කරන්නේ ලොකු මෙහෙවරක්. අම්බලන්ගොඩ නගරය ආරක්ෂා කිරිමට. මා හිතන්නේ අපේ මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරුන්ගේ ප්‍රමාණයත් මදියි අම්බලන්ගොඩ නගර සභාවට තිබෙන. මේ කොරොනා වසංගතය නිසා තවත් මහජන සෞඛ්‍ය මහත්වරු සිටියා නම් හොඳයි. මොකද දැඩි අවධානය රැක ගැනීම. තව වසර කිහිපයක් මෙය යයිද දන්නේ නැහැ. අපි ප්‍රාර්ථනා කරනවා ඉතා ඉක්මනින් මෙය ශ්‍රී ලංකාවෙන් දුරු වේවා කියා. හැබැයි මේ රට ආරක්ෂා කර ගැනිම සඳහා කටයුතු කරන ඒ අයට උපරිම සහායෝගය ලබා දෙන්න. අපි නගර සභාව නෙමේ . අම්බලන්ගොඩ නගරයම රැකෙන්නේ මේ අය නිසා. ඒ නිසා අර කිවුව වගේ හිඟ දේවල් තිබෙනවා නම් ඒවා ලබා දෙන්න. දිරි දිමනාවක් ලබා දෙන්න පුළුවන් නම් එකත් ලබා දෙන්න. ශක්තිමත් කරන්න. ඔබතුමලා අතේ තමයි ජීවිතය තිබෙන්නේ. ඔබතුමලාගේත් ලොකු කැප විමක් වෙනදාටත් වැඩියෙන් ඉටු කරන්න ඕන. තවත් පුළුවන් නම් සහාය කණ්ඩායම් වල සහාය ලබා ගන්න. මෙය ඉක්මනින්ම තුරන් කරන්න. අම්බලන්ගොඩ නගරයෙන්. තුරන් කිරිමේ වගකීම ඔබතුමන්ලා භාර ගන්න. ඔබතුමන්ලාට දෙන්න ඕන සියළුම සහායෝගය අපි මන්ත්‍රීවරු ලබා දෙන්න සුදානම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ අයිතිවාසිකම් දිමනා ලබා දෙන්න කියා මාත් ඉල්ලා සිටිනවා. මොකද ඔවුන් අසම සම මෙහෙවරක් පසුගිය ටිකේ ඉටු කළා. මේ වනවිටත් කරනවා. ඒ පිළිබඳව වාදයක් නැහැ. මට මේ අපේ ධර්මදාස මහතා කිවු කාරණය ගැන මතක් කරන්න හිතුණා. මොකද අපේ ප්‍රධාන පාසැලක් . කුලරත්න විදුහලේ විදුහල්පතිතුමාට කෝවිඩ් ආසාධිතයයි කියන රෝගියා ගෙන් තර්ජනයක් එල්ල වෙන එක. මෙය අපේ විදුහල්පතිතුමාට විතරක් නෙමේ සමස්ත අපි හැම දෙනාටම එල්ල වු තර්ජනයක් කියා මට හිතෙනවා. එය පක්ෂ පාට බලන්නේ නැතුව එහි නිතිය ක්‍රියාත්මක වෙයි කියා අපි බලාපොරෝත්තු වෙනවා. අනිවාර්යෙන් මෙතන එවැනි ප්‍රශ්නයක්

බලපා ඇති කියා මා හිතනවා. මොකද විදුහල්පතිවරයෙක් කියන්නේ අපේ දරුවන් රැක බලා ගන්න නිලධාරි මහතෙකි. එතුමා රැක ගන්න එක අපේ රාජකාරියක්. එමනිසා මා මේ සභාවට යෝජනා කරනවා. ඒ සම්බන්ධව නිතිය ක්‍රියාත්මක කරන්න සුදුසු ආකාරයට පෙළඹෙන්න කියා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරුන්ගේ දිමනාව දෙන එක කිසි ප්‍රශ්නයක් නැහැ. එගොල්ලන්ට එක ලබා දෙන්න ඕන. අනිත් එක තමයි එතුමාත් එක්ක සේවය කරන අනිත් මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා එතුමා අපිට අනුයුක්ත කරන ලද නිලධාරියෙක්. එතුමාට කලින් නිලධාරියෙක් වැඩ කළා මේ සභාවේ. එතුමා වෙනුවට අනුයුක්ත කරපු ඒ නිලධාරියා වැඩ කළා. ඒ නිලධාරියාට අපි නගර සභාවෙන් ලේකම්තුමිය ගෙවූවා. ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ගෙවීමක් කළා. මේ මැතකදි තමයි ඒ ගෙවීම කළේ. අනුමත වෙලා ඇවිත් . එම නිසා මා ඉල්ලිමක් කරනවා. ඒ නිලධාරියාටත් ඒ දිමනාව ගෙවීමට කටයුතු කරන්න කියා.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නිත්‍යානුකුලව ලබා දිය හැකි ඕනෑම ගෙවිමක් ගෙවනු ලබනවා.

**තීරණය-**

මහජන සෞඛ්‍ය පරික්ෂවරුන්ට හිමි දිමනා මහජන සෞඛ්‍ය පරික්ෂක පී.වයි.එම්.යසවර්ධන මහතාට ලබාදිම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

01. අතිකාල දීමනාව - පැයකට රු.205/- බැගින් මසකට පැය 100-රු.20500/-

02. ගමන් වියදම් දීමනාව - මසකට උපරිම රු.4800/-

03. නිවාඩු දින වැඩ කිරීමේ දීමනාව - මසකට මූලික වැටුපෙන් 1/20 ක් බැගින් උපරිම දින 03

04.නිල ඇඳුම් දීමනාව - වසරකට රු.15000/-

**03.11 2021වර්ෂය සඳහා කමිටු සඳහා කමිටු සාමාජිකයන් නම්කිරිම සම්බන්ධ ගොණුව සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2021 වර්ෂය සඳහා කමිටු සාමාජිකයන් නම් කිරිමේ ගොණුව සභාගත කිරිම. ඒ අනුව සභාවේ මුල්‍ය කමිටුව සඳහා නම්කළ යුතු අය නම්කරන ලෙස ඉල්ලා සිටිනවා. විපක්ෂයෙන් මුල්‍ය කමිටුව සඳහා පත්වෙන්න කැමති අය යෝජනා කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමාම නම්කරන්න.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා අපේ පාලක පක්ෂය සඳහා ලලිත් ධම්මික කොඩිකාර මහතාත් , දිනයාදූර ධර්මදාස මහතාත් , අපේ ගරු උප සභාපති කමල් මහතාත් , ජී. සරත් ශ්‍රි ලාල් මැතිතුමාත් , නන්දන රාජපක්ෂ මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා රාහුල මන්ත්‍රිතුමා යෝජනා කරනවා.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තවත් ඉන්නවාද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සෝභිත මන්ත්‍රිතුමා

**<u>ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මාගේ නම යෝජනා කරනවා.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අතුල මන්ත්‍රිතුමා හරි. ඊළඟට ටෙන්ඩර් කමිටුව සඳහා නම් යෝජනා කරන ලෙස ඉල්ලා සිටිනවා. අපේ උප සභාපතිතුමා , ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා , නන්දන රාජපක්ෂ මැතිතුමා, ජගත් කුමාර මැතිතුමා, යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ආර්.එම් . ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා එම යෝජනාව.

**<u>ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කලින් හිටි ටෙන්ඩර් කමිටුවේ සාමාජිකයන් කවුද කියා බලා ඒ අය යෝජනා කරනවා.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එක තමයි යෝජනා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

රාහුල මන්ත්‍රිතුමා

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

අතුල මන්ත්‍රිතුමා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මමත් සහභාගි වෙනවා.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අතුල මන්ත්‍රිතුමා, අයිරාංගනී මන්ත්‍රිතුමිය

**<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා කලින් ටෙන්ඩර් කමිටුවේ සිටියා.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සරත් මන්ත්‍රීතුමාත් ඇතුල් කරන්න. අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් වෙන්න මෙකට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

සරත් චන්ද්‍ර මහතාගේ නම ඇතුළත් කරන්න.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සරත් චන්ද්‍ර මහතා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ඉල්ලීමක් කරනවා . සාමාන්‍යයෙන් සහභාගි වෙනකොට විපක්ෂයේ මන්ත්‍රීවරුන් විතරයි සහභාගි වෙන්නේ පාලක පක්ෂයේ කිහිප දෙනෙක් හැර සමහර අය සහභාගි වෙන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එක මා මෙය පත්කිරිමෙන් පසු කියන්න හිටියේ. දැන් මෙහෙම දෙයක් තිබෙනවා. මට නම් කරන්න මන්ත්‍රීවරු කමිටු 11 කට නම් කරන්න තිබෙනවා. මේ 11 සභාපතිවරයා මා මේ දින 11 ම කමිටු වලට සහභාගි වෙන්න ඕන. නමුත් මන්ත්‍රීවරු පැමිණීන්නේ නැහැ. මට හරි ප්‍රශ්නයක් මේක. එමනිසා සියළු මන්ත්‍රීවරුන් වගකිම භාර ගත්ත අය පැමිණෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමාට වැඩක් පලක් නැති නිසා පැමිණිය හැකියි.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා කඩ කරන්නේ නැති නිසා පැමිණෙන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔකට හේතුවක් තිබෙනවා. අපි ඉදිරිපත් කර යෝජනාවක් ක්‍රියාත්මක වෙන්නේ නැතිනම් මේ අහසින් පාත් වෙනවා වගේ වෙනත් යෝජනා ඇවිත් ක්‍රියාත්මක වෙලා සම්මත වෙලා යනවා නම් . අපි මොකටද මේකට එන්නේ කියා.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාගේ එහෙම දෙයක් තිබෙනවා නම් අපි එය ඉෂ්ඨ කරන්නම්. එහෙම දුක් වෙන්න එපා. මන්ත්‍රිතුමා අපි මේ වසරේ ඉතාමත් දුෂ්කර විදියට කටයුතු කළ වසරක්. මේ ළඟදි මා ගණකාධිකාරි මහත්මියගෙන් විමසා සිටියා මේ කොවිඩ් නිසා අම්බලන්ගොඩ නගර සභාවට සිදු වූ පාඩුව කොපමණ කියා. පාඩුව ලක්ෂ 100 කට තක්සේරු කර තිබෙනවා. ආසන්න වශයෙන්. ඒ කියන්නේ වෙනදා වැටෙන ලක්ෂ 100ත් මේ වසරේ වැටිලා නැහැ. ඒ තත්ත්වයත් එක්ක අද දින තත්ත්වයට මුහුණ දිගෙන ඕනේ යන්න. ඉතිං අපි හැමදේම හිමිට හිමිට බේරා ගත්තා. මේ පාඩුව බේර ගෙන යන්න පුළුවන් වුණේ අපේ මුදල් පළාත් සභාවේ රඳවාගෙන මුදල් ඉතිරිවෙලා තිබෙනවා. අද වෙනකොට හික්කඩුව නගර සභාවට පළාත් සභාවෙන් මුදල් දීලා අද වෙනකොට තිබෙන්නේ එන මුදල් විතරයි. නමුත් අපිට හිඟ මුදලක් තිබෙනවා. පළාත් සභාවෙන් එන්න. ඒ මුදල් හම්බ වුණේ නැතිනම් අපිට වැඩක් කරන්න මෙච්චරවත් බැහැ. ඉතිං අපි ආණ්ඩුකාරතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනේ. අපිට මෙහෙම මුදල් ලබා දිම සම්බන්ධයෙන්. ඊළඟට ආපදා කළමනාකරණ කමිටුවේ හිටියේ පක්ෂ නායකයින් තිදෙනා තමයි හිටියේ. මෙතන වෙනස් වෙලා තිබෙන්නේ සෝභිත මන්ත්‍රිතුමා එකට අතුලත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

මට එන්න අමාරුයි.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙමනම් අයිරාංගනී මන්ත්‍රිතුමිය. රාහුල මන්ත්‍රිතුමා, සරත් චන්ද්‍ර මන්ත්‍රිතුමා , ගරු උප සභාපති කමල් මහතා, ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා දමන්නම්. පරිසර හා සෞඛ්‍ය සනීපාරක්ෂක කමිටුව.

**<u>ගරු නගර සභා මන්ත්රි පී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මා සිටි කමිටුව වල මා තියන්න.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සරත් ශ්‍රී ලාල් මහතා . ඒ වගේම නන්දන රාජපක්ෂ මහතා.අපේ ධර්මදාස මහතා, ලසන්ත මහතා යෝජනා කරනවා. ඒ වගේම ජගත් කුමාර මහතා

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කවුද විපක්ෂයේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මා හිටපු කමිටු වල මාගේ නම තියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

නිලානි මන්ත්‍රීතුමිය දමන්න.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නිලානි මන්ත්‍රීතුමිය, ඉනෝකා මන්ත්‍රීතුමිය, අයිරාංගනී මන්ත්‍රීතුමිය, ජේෂලා මන්ත්‍රීතුමිය, චම්පා මන්ත්‍රීතුමිය. ඊළඟට නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව. හිටපු කමිටුවම නම් කරන්නම්. ක්‍රිඩා කමිටුව .

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඉනෝකා මන්ත්‍රීතුමිය

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ක්‍රිඩා කමිටුව මා අපේ උප සභාපති කමල් මහතා , නන්දන රාජපක්ෂ මහතා , ධම්මික කොඩිකාර මහතා , සරත් ශ්‍රී ලාල් මහතා , ජගත් කුමාර මහතා, ධර්මදාස මහතා යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත  මහතා කතා කරමින්</u>**

ඉනෝකා මන්ත්‍රීතුමිය යෝජනා කරනවා. ඒ වගේම සෝභිත මන්ත්‍රීතුමාත් යෝජනා කරනවා. අයිරාංගනී මන්ත්‍රීතුමියත් දමන්න.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප්  මහතා කතා කරමින්</u>**

අයිරාංගනි මන්ත්‍රීතුමිය, ජනතා විමුක්ති පෙරමුණේන් මන්ත්‍රීවරයෙක් නම් කරන්න. චම්පා මහත්මිය නම් කරනවා. පුස්තකාල කමිටුව වෙනුවෙන් නම් යෝජනා කරන්න කියා ඉල්ලා සිටිනවා. ධර් මදාස මහතා නන්දන රාජපක්ෂ මහතා ධම්මික කොඩිකාර මහතා ,ලසන්ත මහතා . සරත් ශ්‍රි ලාල් මහතාත් හිටියා නේද? ඒ නම් හතර යෝජනා කරනවා. ශ්‍රේෂන් කෙරම්ණිය මන්ත්‍රීතුමා

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත  මහතා කතා කරමින්</u>**

චම්පා මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරනවා.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප්  මහතා කතා කරමින්</u>**

චම්පා මන්ත්‍රීතුමිය, ධනසේන මාදුවගෙ මන්ත්‍රීතුමා. ඉනෝකා මන්ත්‍රීතුමිය. රථ වාහන හා ත්‍රි රෝද රථ කමිටුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත්  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ත්‍රිරෝද කමිටුවෙන් ඉල්ලා අස්වෙනවා. ඒ මොකද අපි දැන් වසර 2ක් පමණ උප සභාපතිතුමා සමඟ වැඩ කළා.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප්  මහතා කතා කරමින්</u>**

නැහැ. අපි එය කරන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්**

බැහැ. මා නිතරම නගරයේ ගැවසෙන කෙනෙක්. ත්‍රිවිල් ප්‍රශ්න වලට මුහුන දීලා තිබෙනවා. ඒ මොකෝ කිසිම දෙයක් කෙරිලා නැහැ. වාහන වල බඩු බානවා. බඩු පටවනවා. ඊට පස්සේ මා බැණුම් අසනවා. මා නගරයේ නිතරම ගැවසෙනවා. මා එම කමිටුවෙන් ඉල්ලා අස් වෙනවා.

**ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමා මෙහෙම දෙයක් තිබෙනවා. අපි ගන්න තීන්දු ත්‍රි රෝද රථ කමිටුව හරහා ක්‍රියාත්මක කරන්න වෙන්නේ පොලිසිය හරහා. නැතුව පොලිස් බලතල නගර සභාවට පවරා නැහැ. එතකොට පොලිසිය හරහා ක්‍රියාත්මක වීමේ දුර්වලතා ඇති වුණාම අපි එකට කනගාටු වෙන්න හොඳ නැහැ. ඉතිං අපි යම්කිසි නීතියක් කරනවා නම් අපි ඒ නීතිය හරියට කළ යුතුයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්**

නැහැ. සභාපතිතුමා, දැන් අවුරුදු 2ක් තිස්සේ ඔය නීතිය හරියට කරනවානේ. අපි මෙතනට අනුමැතිය ගෙනත් තිබෙනවා. ඒ අනුමැතිය අරගෙන තිබෙනවා. අද වෙනකොට ත්‍රිවිල් කමිටුවේ කිසිම දෙයක් වෙලා නැහැ. මා කැමති නැහැ. නිකං නිස්කාරණයේ මිනිසුන්ගෙන් බැණුම් අහන්න. මා එමනිසා ඉල්ලා අස්වෙනවා. එයට වෙන කෙනෙකු පත් කර ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මාත් ඉල්ලා අස්වෙනවා.

**ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි පසුගිය කමිටුවම නම් කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා නැහැ.

**ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හරි. සරත් ශ්‍රී ලාල් මහතා, ලසන්ත මන්ත්‍රීතුමා, ලක්ෂ්මි මන්ත්‍රීතුමිය යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපේ නිලානි මන්ත්‍රීතුමිය යෝජනා කරනවා.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නිලානි මන්ත්‍රීතුමිය, අයිරාංගනී මන්ත්‍රීතුමිය , ජනතා විමුක්ති පෙරමුණේන් සරත් චන්ද්‍ර මහතා

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, රථ වාහන හා ත්‍රිවිල් කමිටුව කියානේ යන්නේ. එතකොට මා ජිවත් වෙන පොල්වත්ත හංදියේ වාහන අරියාදුවට නතර කරනවා. මට ගෙදර යන්න නැහැ පාරේ. මට එය පාලනය කර ගන්න බැරිනම් සභාවට කිවුවාම සලකන්නේ නැති නම් මා මොකටද මේ කමිටුවේ ඉඳලා . මා ගෙදර යන පාරේ හංදියේ වාහන ගහලා මුඩිය ගැහුවා වගේ. අඩි 12 යි තිබෙන්නේ පාරේ. එතන ග්‍රොසරිය ඉස්සරහා වාහන ගහනවා. එක මට පාලනය කරන්න බැරිනම් මෙකටද?

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි ඒ වගකීම භාර ගන්න එපායි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ඔබතුමා පොරොන්දු වෙනවා ද ? ඒ වාහන ගැසිම සම්බන්ධව

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා පොලිසියේ මුලස්ථාන පරික්ෂක වුණොත් කරලා දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

එහෙමනම් ඉතිං කෙරෙන්නේ නැහැ. මා කමිටුවට එන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තේරුම් ගන්න ඕනේ. අපේ රාජකාරිය ප්‍රතිපත්ති හැදිම. එතකොට එය ක්‍රියාත්මක කිරිමේ එජන්සිය තමයි පොලිසිය. අපිට පොලිස් බලතලයක් දිලා නැහැනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමාටත් බලතලයක් දිලා තිබෙනවානේ. පොලිසියෙන් ගෙන්වා කියලා එය කරවන්න පුළුවන්. ඔබතුමා එක කරන්නේත් නැහැනේ. අපි මොකටද නිකං ගිහින් බැණුම් අහන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

පොලිසියෙන් කියනවා එතන බොඩ් එකක් ගහලා නැහැ කියා. නගර සභාවෙන් කියනවා පොලිසිය කරලා නැහැ කියා. දැන් මොකක් ද අපිට භාර ගන්න වෙන්නේ.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

බෝඩ් එකක් නැතිනම් අපි ඒ බෝඩ් එක ඇති කරන්න ඔනනේ. ඉතිං ප්‍රතිපත්ති වගකීම තමයි අපෙන් ඉෂ්ඨ වෙන්න ඕනේ. ඉතිං සහභාගිවෙලා කතා කරලා අපි එය විසඳා ගත යුතුයි. මෙතනදී මතක තියා ගන්න කවලම් කරන්න එපා. අනිත් එක්කෙනාගේ රාජකාරිය. අපි හදන්නේ ප්‍රතිපත්තිමය තීරණය. අපි ප්‍රතිපත්ති තිරණය හැදුවාට පසු ක්‍රියාත්මක කර ගන්න ඔනේ ඒ අය ලව්වා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මට අභියෝග කළා පොල්වත්ත ත්‍රිවිල් රථ ගාලෙන්. එක පුද්ගලයෙක් අභියෝග කළේ. මා එයට ගත්ත ක්‍රියා මාර් ගය නිසා මුළු ත්‍රිවිල් රථ ගාලම මා සමඟ අමනාප වුණා. කමක් නැහැ මා නිවැරදි තැන හිටියා. මට වාහනයක් ගෙන්න ගන්න බැරි තත්ත්වයට මා පතත්වුණා.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා මිට වසර 20කට පෙර මාත් ඔය තත්ත්වයේ සිටියා නම් එහෙනම් මේ පුටුවේ ඉන්න බැහැ. ඒ වගේ ප්‍රශ්න තමයි. සභාවෙන් ගන්න තින්දු හරිම වැරදියි අපි ක්‍රියාත්මක කරන්න ඕනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මගේ ඉල්ලීම සලකා බලනවා නම් මා එන්නම්. නැතිනම් ඇවිත් වැඩක් නැහැ.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සරත් මහතාගේ ඉල්ලීම අපි සලකා බලන්නම්. අපි මුලින්ම අපි නිවැරදි විය යුතුයි. ඊට පස්සේ පොලිසිය නිවැරදි වෙන්න කළ යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ සෝභිත මන්ත්‍රීතුමලා, සරත් මන්ත්‍රීතුමලා සහභාගි වෙලා මෙතුමාලාගේ සහභාගිත්වය අනුව තමයි ඒ නිසි ක්‍රියා මාර් ග අර ගත්තෙ. ප්‍රශ්නේ වුණේ පොලිසියේ නිලධාරින්ගේ ක්‍රියා කලාපය ද දන්නේ නැහැ. නමුත් මෙය ක්‍රියාත්මක වෙන්න මොනවා හරි යට තිබුණා පොඩි පොඩි බලපෑම් ටිකක් තිබුණා. එකතුළ තමයි ඕක වුණේ. එමනිසා ඔබතුමා සභාපති හැටියට , පාලක පක්ෂයේ නිලයක් දැරීමේ පුද්ගලයා හැටියට මෙතුමලා කියන දේවල් අහලා පොලිසිය ලවා ඒවා කරවන්න. එක නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වුණේ. දැන් උප සභාපතිතුමා අයින් වෙන්න ඕනේ නැහැනේ. හොඳ දක්ෂ උප සභාපති කෙනෙක්නේ ඉන්නේ. ඕන දෙයකට මුහුණ දෙනවා මැරෙන්න වුණත් .

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඊළඟට වෙළඳ සංගමය සමඟ

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මූල්‍ය කමිටුවට මා සම්බන්ධ වුණා. වාර්තාවේ පැමිණීමට මගේ නම නැහැ.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි වාර් තා සම්මත කරන විට එය ඇතුළත් කරන්නකියන්න. සරත් ශ්‍රී ලාල් මහතා , ලසන්ත මහතා , ජගත් කුමාර මහතා යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

වෙළඳ සංගමයට සෝභිත මහතා එනවාද ? සෝභිත රංජිත් මහතා . තව කවුද ? අතුල මහතා ඒ වගේම රාහුල මහතා, ඔබතුමා වෙළඳාමට සම්බන්ධයිනේ. රාහුල මන්ත්‍රීතුමා, යෝජනා කරනවා. මා සභාවෙන් ඉල්ලා සිටිනවා මේ ක්‍රීඩාංගණයේ හදන ක්‍රීඩාගාරය සම්බන්ධව අවශ්‍ය වන ඉංජිනේරු උපදෙස් ලබා දුන්නේ එවන් ද සිල්වා මැතිතුමා. එතුමාට අපි කිව්වා මේ සඳහා වැඩ සටහනක් හදා ගෙන ඇවිත් මන්ත්‍රීවරුන්ට පෙන්වන්න කියා. ඔබතුමලාගේ අවසර ලැබෙනවානම් පොඩි විනාඩි 05ක වගේ කාලයක් නරඹලා එතුමා නිදහස් කරන්න. විශේෂයෙන් මා කියන්න ඕනේ. එවන් ද සිල්වා මැතිතුමාට විශේෂ ස්තුතිය පුද කරනවා. මොකද එතුමා ස්වේච්ඡාවෙන් ඇවිත් අද වෙනකම් අපෙන් මුදල් මොකුත් ගත්තේ නැහැ. සියළු සැලසුම් ඉදිරිපත් කරනවා. ඒ සියළු සැලසුම් එතුමාගේ පුද්ගලික වියදමින් ලබා දිලා .උප දෙස් ලබා දිලා අපිට කරනු ලැබුවා. එම කටයුත්ත කරන්න කාරක සභා අවස්ථාවට පත් කරනවා.

- පෙ.ව. 11.45 ට පමණ කාරක සභා අවස්ථාවට පත් කිරිම.
- පෙ.ව. 11.55 ට පමණ සභාව නැවත ආරම්භ කිරිම.

**තීරණය-**

2021 වර්ෂයට කමිටු සඳහා සාමාජිකයින් පත්කිරිමට අදාලව පහත සඳහන් පරිදි කමිටු සාමාජිකයන් පත්කිරීම සුදුසු බවට ගරු සභාපති විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

<u>මූල්‍ය කමිටුව සඳහා පත් කරන ලද ගරු මන්ත්‍රීවරුන්</u>

01. ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා
02. ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා
03. ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා
04. ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා
05. ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා
06. ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා
07. ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා

08. ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා

09. ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා

<u>ටෙන්ඩර් කමිටුව සඳහා පත් කරන ලද ගරු මන්ත්‍රීවරුන්</u>

01. ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා

02. ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා

03. ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා

04. ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා

05. ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා

06. ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා

07. ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා

08. ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා

09. ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය

10. ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා

<u>ආපදා කළමනාකරණ කමිටුව සඳහා පත් කරන ලද ගරු මන්ත්‍රීවරුන්</u>

01. ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා

02. ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා

03. ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා

03. ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය

04. ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා

05. ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා

<u>පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පත් කරන ලද ගරු මන්ත්‍රීවරුන්</u>

01. ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා

02. ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා

03. ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා

04. ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා

05. ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා

06. ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා

07. ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය

08. ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය

09. ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය

10. ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්.පේෂලා කුමාරි මහත්මිය

11. ගරු නගර සභා මන්ත්‍රිනී එම්.චම්පා සුමුදු කුමාරි මහත්මිය

<u>නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා පත් කරන ලද ගරු මන්ත්‍රීවරුන්</u>

01. ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා

01. ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා

02. ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා

03. ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා

04. ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය

05. ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා

06. ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය

07. ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය

08. ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා

<u>ක්‍රීඩා කමිටුව සඳහා පත් කරන ලද ගරු මන්ත්‍රීවරුන්</u>

01. ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා

02. ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා

03. ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා

04. ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා

05. ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා

06. ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා

07. ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා

08. ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා

09. ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය

10. ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා

<u>පුස්තකාල කමිටුව සඳහා පත් කරන ලද ගරු මන්ත්‍රීවරුන්</u>

01. ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා

02. ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා

03. ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා

04. ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා

05. ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා

06. ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා

07. ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා

08. ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය

09. ගරු නගර සභා මන්ත්‍රිනී එම්.චම්පා සුමුදු කුමාරි මහත්මිය

10. ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා

<u>රථවාහන හා ත්‍රීරෝද රථ කමිටුව සඳහා පත් කරන ලද ගරු මන්ත්‍රීවරුන්</u>

01. ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා

02. ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා

03. ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා

04. ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා

05. ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තාද සිල්වා මෙනවිය

06. ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය

07. ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා

08. ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය

<u>වෙළඳ සංගමය හා ඒකාබද්ධ කමිටුව සඳහා පත් කරන ලද ගරු මන්ත්‍රීවරුන්</u>

01. ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා

02. ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා

03. ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා

04. ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා

05. ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා

06. ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා

07. ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා

**03.12 2020.11.20 දින ප්‍රාදේශිය මහලේකම් කාර්යාලය මඟින් නිවසක් නොමැති මධ්‍යම පාන්තික පවුල් සඳහා සෑම මැතිවරණ කොට්ඨාශයකම නිවාස 100 කින් සමන්විත මහල් නිවාස සංකීර්ණය ඉදිකිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ප්‍රාදේශිය මහලේකම් කාර්යාලය, අම්බලන්ගොඩ , නිවසක් නොමැති මධ්‍යම පාන්තික පවුල් සඳහා සෑම මැතිවරණ කොට්ඨාශයකම නිවාස 100 කින් සමන්විත මහල් නිවාස සංකීර්ණය ඉදිකිරිම සම්බන්ධව. උක්ත කරුණ සම්බන්ධයෙන් ග්‍රමිය නිවාස හා ගොඩනැඟිලි ද්‍රව්‍ය ඉදිකිරිමේ රාජ්‍ය අමාත්‍යතුමාගේ 2020.11.03 දිනැති ලිපියක් අමුණා ඇත. දිස්ත්‍රික් ලේකම් විසින් එවන ලද 2020.11.20 දිනැති ලිපිය හා බැඳේ. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඵලදායි පුද්ගලයන් සතුටෙන් ජිවත් වන පවුලක් යන තේමාව යටතේ සෑම පවුලකටම සුවපහසු නිවසක් යන සංකල්පය යටතේ දෙමහල් යටතේ මහල් නිවාස සංකිර් ණයක් හෝ පොකුරු නිවාස සංකිර් ණයක් ඉදිකිරිම ක්‍රියාත්මක කිරිම සඳහා අම්බලන්ගොඩ කොට්ඨාශයේ නාගරික පහසුකම් යටතේ ඇති ඉඩම් හඳුනා ගෙන මා වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. ඒ පිළබඳව අදහස් ලබා දෙන ලෙස දැන්විම් කරනවා. ඒ පිළිබඳව දැනුවත් කරනවා. එවැනි නිවාස යෝජනා ක්‍රමයක් සෑම මැතිවරණ කොට්ඨාශයකම මහල් නිවාස යෝජනා ක්‍රමයක් කරනවා . මේක බලාපොරෝත්තු වන ආකාරයට මෙය චක්‍ර ලේකයේ තිබෙන ආකාරයට මෙන්න මෙහෙමයි තිබෙන්නේ. මෙම නිවාස යෝජනා ක්‍රමය නිවාස නොමැති මධ්‍ය පන්තිකයන් හට මිලියන 4 සහ 5 යන සහන මිලකට නිවසක් ලබා දිමට සැලසුම් කර ඇත. රාජ්‍ය බැංකු වලින් ණය ලබා දිමට අග්‍රමාත්‍යතුමා විසින් යෝජනා කර ඇත. මෙම යෝජනා ක්‍රමයට ඉදිවෙන නිවාස ලබා දිමට අපේක්ෂා කරන්නේ නිවාස නොමැති නිවසක් ඉදිකිරිමට ඉඩමක් නොමැති ස්ථිර ආදායමක් පවතින තරුණ පවුල් හා මැදි මට්ටමේ පවුල් සඳහා වේ. එම යෝජනා ක්‍රමයේ නාගරික ප්‍රදේශවල ක්‍රියාත්මක කිරිමට යෝජිත වේ. ඒ අනුව මෙය සම්පුර් ණ හදලා දිලා ඉවර වෙලා විකිණිමට තමයි බලාපොරෝත්තු වෙන්නේ. අපෙන් අහනවා ඉඩම් තිබෙනවා ද දෙන්න කියලා. එහෙම ඉඩම් යෝජනා කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

හල්වතුර යෝජනා ක්‍රමයේ යෝජනා කරනවා.

<u>**ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

හල්වතුර ගත්තාම නැවත පාරක් අර ගැටළුව එනවා. නැවත පාරක් වනජීවි ගැටළුව එනවා. ඒවා නිරාකරණය කර ගන්න ඔනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

නිරාකරණය කරගෙන තමයි දෙන්න ඕනේ. එක හොඳයි. නගරයටත් ළඟයි. සෑම කොට්ඨාශයකටම දෙනවාද මේක.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේක මතක තියා ගන්න. මෙය නාගරික මාධ්‍ය පන්තික නිවාස යෝජනා ක්‍රමයක්. මෙය හදලා ඉවර වෙලා ලක්ෂ 40ට 50 ට විකුණනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

මේක ලක්ෂ 40 ට 50ට විකුණන්න පුළුවන් හල්වතුරේ හැදුවාම. නගරයටත් ළඟයි. පයින් යන දුර

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එතකොට ඉඩමේ වටිනාකම කවුද ගෙවන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

එක ඉතිං මෙකෙන් ගෙවන්න ඕනේ. දෙකම කෙරෙන්න ඕනේ. මොකද පාසැල් වලටත් අසු වෙනවා. සභාපතිතුමා යෝජනා කරනවා නම්.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි යෝජනා කරන්නම් . ඉඩමට මුදල් දෙන්නේ නැහැ. අපිට යෝජනාව පමණයි. ඉඩම දෙන්න ඔනේ නිකං.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මෙම යෝජනාව සම්බන්ධයෙන් මට අදහස් දක්වන්න තිබෙනවා. මේ හල්වතුර කියන එක අදහස් කළේ මේ කුණු දමන එකේ පාර හරියට වෙන්න. එතකොට දැනටත් ඒ ප්‍රදේශයේ සිටින මිනිසුන්

චෝදනා කරනවා. මේ ලසන්ත මන්ත්‍රීතුමාම චෝදනා කරනවා. කෑමක් කන්න බැහැ. මැස්සෝ වහනවා. ඒ ප්‍රශ්නය තිබෙනවා. ඒ ප්‍රශ්නය තිබෙද්දි අපි එතන හදනවා ගොඩනැඟිල්ලක් මධ්‍යම පන්තික පවුල් සඳහා. එතකොට ඔබතුමා හිතනවාද එකට ඔය මැස්සා එන්නේ නැහැ කියා. එතකොට පරිසර ප්‍රශ්නය එන්නේ නැද්ද? එමනිසා දුරදිග බලා මේවා කරන්න කලින් කියන්නන් වාලේ කරන්නේ නැතුව හිතලා බලන්න මෙතනට මේවා ගැලපෙනවාද කියා. එහෙම නැතිනම් එතන පරිසරය රැකෙන විදියට ප්‍රතිචක්‍රකරණ මොකක් හරි හදලා එ ආකාරයට එහෙම එනවා නම් එන්න. හදිස්සියේ මෙතන පිට්ටු බම්බුව වගේ මේක ගෙනැල්ලා ගැහුවා. එතනත් පරිසර ප්‍රශ්න. එතන ගොඩනැඟිල්ලෙනුත් අපිට ප්‍රශ්න. එමනිසා දෙපාරක් හිතලා මේ වැඩ කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

හොඳයි සියළුම මන්ත්‍රිවරු දැනුවත් කර තිබෙන්නේ. එහෙම තැන් තිබෙනවා නම් යෝජනා කරන්න. පෞද්ගලික ඉඩමක් වුණත් කමක් නැහැ යෝජනා කරන්න පුළුවන්.

**තීරණය-**

**නිවසක් නොමැති මධ්‍යම පාන්තික පවුල් සඳහා සෑම මැතිවරණ කොට්ඨාශයකම නිවාස 100 කින් සමන්විත මහල් නිවාස සංකීර්ණය ඉදිකිරිම** යන මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් එවා ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කළ අතර ඒ සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

**03.13 මගින් 2020.11.13දින වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යොමු කරන ලද යෝජනා ඉදිරි කටයුතු සඳහා යොමු කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යොමු කරන ලද යෝජනා ඉදිරි කටයුතු සඳහා යොමු කිරිම . උක්ත කරුණ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධ කමිටුවේ ලේකම්ට එවන ලද ලිපියක් අපිට දැන ගැනීම සඳහා එවා තිබෙනවා. එය ඉදිරිපත් කරනවා. දකුණු පළාතේ ගාල්ල පරිපාලන බලපිටිය , කරන්දෙණිය , අම්බලන්ගොඩ ,

හික්කඩුව ප්‍ර දේශිය ලේකම් කොට්ඨාශ වල හෙක්ටයාර් 1217.75 ක භූමි ප්‍රමාණයක් සමන්විත මාදම්පේ අභය භූමිය 2007 සැප්තැම්බර් 21 දින 15/21 යටතේ අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ලංකාවේ ඉතා වැදගත් කඩොලාන පරිසරයක් මහින් තෙත් බිමක් ලෙස මාදම්පා විල අභය භූමිය ජෛව විවිධත්වයෙන් යුතු ප්‍රදේශයකි. මාදම්පා විල අභය භූමිය ආසන්නයේ රක්ෂිතයේ ගඩගොඩ වත්ත නැමැති කළු ගල කැඩිමෙන් අතීතයේ ජීවනෝපාය සකස් කරගෙන ඇත. අපි කලින් ඉදිරිපත් කළ ලිපිය දිස්ත්‍රික් සම්බන්ධිකරණ රැස්වීමටත් ඉදිරිපත් කර තිබෙනවා. එය දැන ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**තීරණය-**

**ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යොමුකරන ලද යෝජනා ඉදිරි කටයුතු සඳහා යොමු කිරීම** යන මැයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් එවා ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

**03.14 අම්බලන්ගොඩ මහජන ක්‍රිඩාංගනයේ යාබද ඉඩමෙහි ක්‍රිඩාංගණයේ අලුතෙන් ඉදිකෙරමින් පවතින පැති විකට්ටුවට අවදානම් තත්ත්වයේ පවතින පොල්ගස කපා ඉවත්කිරිම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ මහජන ක්‍රිඩාංගනයේ යාබද ඉඩමෙහි ක්‍රිඩාංගණයේ අලුතෙන් ඉදිකෙරමින් පවතින පැති විකට්ටුවට අවදානම් තත්ත්වයේ පවතින පොල්ගස කපා ඉවත්කිරිම. පැති විකට්ටුව අවධානම් තත්ත්වයේ පවතින පොල් ගෙඩි සහ ඉනි වැටිම් ප්‍රමාණයක් වැටිමට වැඩි ප්‍රවනතාවයක් පවති. නැගෙනහිර මායිමේ තාප්ප වලට ඉතා ආසන්නව ඇති පොල්ගස කපා ඉවත් කිරිම සඳහා අදාල ගෙවිම් කිරිමට ඉල්ලුම් කර ඇති ලිපියට සටටන් කරයි. 2020.11.20 දින නගර සභාව විසින් මිල ගණන් පිළිගෙන ඇති අතර ගස් කැපුම් විසින් කපා ඉවත් කිරිමේදි අනපේක්ෂිත ලෙස ගසේ කොටසක් ඉදිවෙමින් පවතින නගර සභා පැති විකට්ටුව මතට පතිත වීම සිදූ විය. එම කොටස විකට්ටුව මතට වැටිමේදි සිදුවූ ගිලා බැසිම යථා තත්ත්වයට පත් කිරිමට ඉදිකිරිම්කරුගෙන්

විමසිම් කළ විට ඒ සඳහා රු.5000/= වියදමක් වැය වන බව පවසන ලදී. එම මුදල කැපුම් කරු විසින් කොන්ත්‍රාත්කරුට ගෙවා ගෙවිම්කරුගේ සටහනක් අනුව නගර සභාව දැනුවත් කළ පසුද අද දින මේ මුදල කැපුම්කරු විසින් ගෙවිය යුතු බවටද යෝජනා ඉදිරිපත් කරන බවට තාක්ෂණසේවා නිලධාරි මහතා විසින් වාර් තා කර තිබෙනවා. එය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරපත් කරනවා. ඒ කියන්නේ එයා මුදල් බඳින්න ඕනද අපිට.

**තීරණය-**

අම්බලන්ගොඩ මහජන ක්‍රිඩාංගනයේ යාබද ඉඩමෙහි ක්‍රිඩාංගණයේ අලුතෙන් ඉදිකෙරමින් පවතින පැති විකට්ටුවට අවදානම් තත්ත්වයේ පැවති පොල්ගස කපා ඉවත්කිරිමේදී සිදු වූ අලාභය පිළිබඳව තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව අනුව, රු.5000/- ක මුදලක් ගස් කැපුම්කරු විසින් කොන්ත්‍රාත්කරුට ගෙවා එය ඉදිකිරීම්කරුගේ සටහනක් අනුව නගර සභාව දැනුවත් කළ පසු අදාල කැපුම්කරුට ගෙවිය යුතු මුදල ගෙවීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 03.15 2021.01.01 සිට 2021.06.30 දින දක්වා කාලය සඳහා අභ්‍යාන්තර විගණන සැලැස්ම ( පළමු අර්ධ වර්ෂය සඳහා ) සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අභ්‍යාන්තර විගණන සැලැස්ම පළමු අර්ධ වාර් ෂය සඳහා 2021.01.01 සිට 2021.06.30 දින දක්වා කාලය මා යෝජනා කරනවා.

**තීරණය-**

2021.01.01 සිට 2021.06.30 දින දක්වා කාලය සඳහා අභ්‍යාන්තර විගණන සැලැස්ම ( පළමු අර්ධ වර්ෂය සඳහා ) සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 03.16 දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් ඇස්තමේන්තු සකස් කිරිමේ සීමාවන් , අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් ඇස්තමේන්තු සකස් කිරිමේ සීමාවන් , අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරිම. උක්ත කරුණ සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කිරිමේ සිමා , හා අනුමත කිරිමේ සිමාවන්ට එළඹීමේ සිමාවන් සංශෝධනය කිරිම . 2019.12.18 ප්‍රධාන ලේකම්ගේ චක්‍ර ලේඛය මුදල් 11/219 හා 2020.03.05 පැවති ප්‍රධාන ලේකම්ගේ චක්‍ර ලේඛය මුදල් 11/2009/01 ට අතිරේක වශයෙනි. දකුණු පළාත් සභාවට අයත් ආයතන වල ඉදිකිරිම් කටයුතු කඩිනම් කිරිම සඳහා ඇස්තමේන්තු සකස් කිරිමේ සිමාවන් හා අනුමත කිරිමේ සිමාවන් , ගිවිසුම් වලට එළඹීමේ සිමාවන් සංශෝධනය කිරිම ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර 2019.11.30 වන දින ආණ්ඩුකාර ලේකම් සමඟ පැවති සාකච්ඡාව අනුව ආණ්ඩුකාර ලේකම්ගේ 2012දිනැති ලිපියෙන් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන 2019.12.21 දින ප්‍රධාන ලේකම්ගේ මුදල් 11/2019 ආණ්ඩුකාර ලේකම්ගේ දිමනා හා 2020.02.27 දිනැතිව ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන 2020.12. දින මෙම චක්‍ර ලේඛය සකස් කරන ලදි. ඒ අනුව එම ප්‍රධාන ලේකම්ගේ චක්‍ර ලේකණයෙහි 03.02 ඉංජිනේරුවන්ගෙ ඇස්තමේන්තු අනුමත කිරිම හා ගිවිසුම් වලට එළඹීමේ බලතල යටතේ ඇති අංක 07 යටතේ ඇස්තමේන්තුවල මුලා සීමාව ලක්ෂ 10 ට වැඩි ලක්ෂ 20 ට අඩු ඇස්තමේන්තු නිර් දේශ කිරිමේ බලය iii ශ්‍රේණියේ තාක්ෂණික නිලධාරින්ට ලබා දෙන ලෙස කරන ලද ඉල්ලිම දකුණු පළාත් ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරිමෙන් ලදුව පහත ආකාරයට එම වගන්තිය සංශෝධනය කිරිමට ආණ්ඩුකාරතුමා 2020.11.11 දින ගෙන ඇති බව ප්‍රධාන ලේකම්ගේ 2020/11/13 ලිපියෙන් දන්වා ඇති බව කාරුණිකව දන්වා සිටි. ඒ අනුව ලක්ෂ 10 සිට 20 දක්වාත් ඇස්තමේන්තු සකස් කිරිම ශ්‍රි ලංකා පුහුණු iii, ii, i තාක්ෂණ සේවා නිලධාරින් නම්කර ඇත. I, ii , ශ්‍රේණිවල තාක්ෂණික සේවා නිලධාරින් නොමැති නොමැති පළාත් පාලන ආයතන වල iii, ශ්‍රේණියේ තාක්ෂණ සේවා නිලධාරිට එය කළ හැකි බවට චක්‍ර ලේඛය නිකුත් කර තිබෙනවා. වෙනස් කර තිබෙනවා. විශේෂයෙන්ම රාහුල මන්ත්‍රිතුමාට දැන ගැනිම සඳහා ඉදිරිපත් කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රි ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , එහි පිටපතක් අපිට දෙන්න

**ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

පිටපතක් දෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඊට පස්සේ ඔය අතුරු ඇස්තමේන්තු දමන එක තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

**තීරණය-**

**ඇස්තමේන්තු සකස් කිරිමේ සීමාවන් , අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරිම** යන මැයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් එවා ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

04. යථා පරිදි කල් දි ඇති ප්‍රශ්න — නැත

05. යථා පරිදි කල් දි ඇති යෝජනා

**05.01 ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.01.01** **2021 වර්ෂයට අදාල වරිපනම් බදු ,සංවර්ධනය නොකල ඉඩම් මත බදු , වාහන හා සතුන් පිළිබඳ බදු , වෙළඳ බලපත්‍ර ගාස්තු , කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, ප්‍රචාරණ දැන්වීම් ප්‍රදර්ශනය කිරිම සඳහා ගාස්තු, පරිසර ආරක්ෂණ බලපත්‍ර හා ත්‍රීරෝද රථ නවතා තැබීමේ ගාස්තු , විනෝද බදු පැනවීම සම්බන්ධ ගැසට් නිවේදනය ගරු සභාවට යෝජනා කිරිම සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

**2021** වර්ෂයට අදාල වරිපනම් බදු ,සංවර්ධනය නොකල ඉඩම් මත බදු , වාහන හා සතුන් පිළිබඳ බදු , වෙළඳ බලපත්‍ර ගාස්තු , කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, ප්‍රචාරණ දැන්වීම් ප්‍රදර්ශනය කිරිම

**සඳහා ගාස්තු, පරිසර ආරක්ෂණ බලපත්‍ර හා ත්‍රීරෝද රථ නවතා තැබීමේ ගාස්තු , විනෝද බදු පැනවීම සම්බන්ධ ගැසට් නිවේදනය ගරු සභාවට මා යෝජනා කරනවා.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

මා එය ස්ථිර කරනවා

**අම්බලන්ගොඩ නගර සභාව**

2021 වර්ෂයට අදාලව වරිපනම් බදු පැනවීම

**(1)** (:255 අධිකාරිය වන ) නගර සභා අඥා පනතේ 166 වගන්තිය මඟින් අම්බලන්ගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටියා වු නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා තක්සේරුව 2020 වර්ෂයේ තක්සේරුව ලෙස සම්මත කළ බවත් එකී තක්සේරුව මත නේවාසික ස්ථාන සඳහා වාර්ෂික වටිනාකමින් 7% (සියයට හතක්) සහ වෙළඳ හෝ වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරන ස්ථාන සඳහා 11% (සියයට එකොළහක්) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තවද, 2021 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද එකවර හෝ කාර්තු ලෙස සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2021 වසරේ ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 10% (සියයට දහයක)ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල අම්බලන්ගොඩ නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් 5%(සියයට පහක) ක වට්ටමක්ද අම්බලන්ගොඩ නගර සභාව ලබා දිය යුතු බවටත් යෝජනා කර සිටිමි.

| **උපලේඛනය** | | |
|---|---|---|
| කාර්තුව | ගෙවිය යුතු දින | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
| පළමුවන කාර්තුව | 2021 මාර්තු මස 31 දිනට පෙර | 2021.01..31 |
| දෙවන කාර්තුව | 2021 ජුනි මස 30 දිනට පෙර | 2021.04..30 |
| තුන්වන කාර්තුව | 2021 සැප්තැම්බර් මස 30 දිනට පෙර | 2021.07..31 |
| හතරවන කාර්තුව | 2021 දෙසැම්බර් මස 31 දිනට පෙර | 2021.10..31 |

**තීරණය -**

**(1)** (:255 අධිකාරිය වන ) නගර සභා අඥා පනතේ 166 වගන්තිය මඟින් අම්බලන්ගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටියා වු නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා තක්සේරුව 2020 වර්ෂයේ තක්සේරුව ලෙස සම්මත කළ බවත් එකී තක්සේරුව මත නේවාසික ස්ථාන සඳහා වාර්ෂික වටිනාකමින් 7% (සියයට හතක්) සහ වෙළඳ හෝ වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරන ස්ථාන සඳහා 11% (සියයට එකොළහක්) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්, 2021 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද එකවර හෝ කාර්තු ලෙස සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2021 වසරේ ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 10% (සියයට දහයක)ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල අම්බලන්ගොඩ නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් 5%(සියයට පහක) ක වට්ටමක්ද

අම්බලන්ගොඩ නගර සභාව ලබා දිය යුතු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

| **උපලේඛනය** | | |
|---|---|---|
| කාර්තුව | ගෙවිය යුතු දින | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
| පළමුවන කාර්තුව | 2021 මාර්තු මස 31 දිනට පෙර | 2021.01..31 |
| දෙවන කාර්තුව | 2021 ජුනි මස 30 දිනට පෙර | 2021.04..30 |
| තුන්වන කාර්තුව | 2021 සැප්තැම්බර් මස 30 දිනට පෙර | 2021.07..31 |
| හතරවන කාර්තුව | 2021 දෙසැම්බර් මස 31 දිනට පෙර | 2021.10..31 |

**අම්බලන්ගොඩ නගර සභාව**

2021 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම.

**(2)** (:255 අධිකාරිය වන ) නගර සභා අඥා පනතේ 165 ඈ. වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාර අම්බලන්ගොඩ නගර සභාවේ බල ප්‍රදේශය ඇතුලත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථිර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන යුක්ති සහගත වියදමින් ඒ ඉඩම එකී කාර්යයන් සඳහා සංවර්ධනය කළ හැකි විටෙක එවැනි යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටෙක හෝ

(ආ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට හා වගාවන්ට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය සියයට පනහ (50%)ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකල ඉඩමක් වශයෙන් සැළකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2021වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් 1% (සියයට එකක) වාර්ෂික බද්දක් පනවා අයකලයුතු බවට **යෝජනා කර සිටිමි.**

**තීරණය -**

**(2)** (:255 අධිකාරිය වන ) නගර සභා අඥා පනතේ 165 ඈ. වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාර අම්බලන්ගොඩ නගර සභාවේ බල ප්‍රදේශය ඇතුලත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථිර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන යුක්ති සහගත වියදමින් ඒ ඉඩම එකී කාර්යයන් සඳහා සංවර්ධනය කළ හැකි විටෙක එවැනි යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටෙක හෝ

(ආ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට හා වගාවන්ට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය සියයට පනහ (50%)ට වඩා අඩු වන්නේ නම්, එකී ඉඩම සංවර්ධනය නොකල ඉඩමක් වශයෙන් සැළකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2021වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් 1% (සියයට එකක) වාර්ෂික බද්දක් පනවා අය කළ යුතු බවට **ගරු සභාව තීරණය කරන ලදී.**

**අම්බලන්ගොඩ නගර සභාව**

20*21* වර්ෂයට වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම.

**(3)** (:255 අධිකාරිය වන ) නගර සභා අඥා පනතේ 162 වගන්තිය සමග කියවිය යුතු එකී ආඥා පනතේ 163 වැනි වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුල 2021වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වන තීරුවෙහි

නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙම එහි II වන තීරුවෙහි නිරූපිත බද්දක් 2021 වර්ෂයට පනවා අයකළ යුතු බවට **යෝජනා කර සිටිමි.**

| | | | |
|---|---|---|---|
| | **උපලේඛනය** | | |
| I තීරුව | | | II තීරුව |
| | | | රු. ශත |
| (i) | මෝටර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මොටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | | 25.00 |
| (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් ම සඳහා | | |
| | (අ) | එය වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් | 10.00 |
| | (ආ) | එය වෙළඳ කටයුතු නොවන කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් | 5.00 |
| (iii) | සෑම කරත්තයක් සඳහාම | | 20.00 |
| (iv) | සෑම අත් කරත්තයක් සඳහාම | | 10.00 |
| (v) | සෑම රික්ෂෝවක් සඳහාම | | 75.00 |
| (vi) | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙක් සඳහාම | | 15.00 |
| (vii) | සෑම අලියෙකු සඳහාම | | 50.00 |

රෝදවල විශ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා භාවිත කෙරෙන අත් කරත්ත සහ වෙළඳ කටයුතු සඳහා භාවිත නොකරන අත් කරත්ත මෙම ගෙවීම් වලින් නිදහස් කෙරෙයි.

**තීරණය -**

**(3)** (:255 අධිකාරිය වන ) නගර සභා ආඥා පනතේ 162 වගන්තිය සමග කියවිය යුතු එකී ආඥා පනතේ 163 වැනි වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුල 2021වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වන තීරුවෙහි නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙම එහි II වන තීරුවෙහි නිරූපිත බද්දක් 2021 වර්ෂයට පනවා අයකළ යුතු බවටත්, රෝදවල විශ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා භාවිත කෙරෙන අත් කරත්ත සහ වෙළඳ කටයුතු සඳහා භාවිත නොකරන අත් කරත්ත මෙම ගෙවීම් වලින් නිදහස් කළ යුතු බවටත් **ගරු සභාව තීරණය කරන ලදී.**

| | | |
|---|---|---|
| | **උපලේඛනය** | |
| I තීරුව | | II තීරුව |
| | | රු. ශත |
| (i) | මෝටර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මොටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25.00 |
| (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් | |

| | | | |
|---|---|---|---|
| | කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් ම සඳහා | | |
| | (අ) | එය වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් | 10.00 |
| | (ආ) | එය වෙළඳ කටයුතු නොවන කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් | 5.00 |
| (iii) | සෑම කරත්තයක් සඳහාම | | 20.00 |
| (iv) | සෑම අත් කරත්තයක් සඳහාම | | 10.00 |
| (v) | සෑම රික්ෂෝවක් සඳහාම | | 75.00 |
| (vi) | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙක් සඳහාම | | 15.00 |
| (vii) | සෑම අලියෙකු සඳහාම | | 50.00 |

**අම්බලන්ගොඩ නගර සභාව**

*2021 වර්ෂයට අදාළව වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම*

**(4)** 255 වන අධිකාරී නගර සභා අඥා පනතේ 164 වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2016/11/01 දිනැති තීරණ අංක 01:12 යටතේ අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් විසින් ක්‍රියාත්මක කිරීමට පිළිගෙන ල එසේම 2017/08/04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2031 දරණ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පලකරන ලද්දාවූ 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1811 හා 2013-05-17 දිනැති ගැසට් පත්‍රයේ IV(අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූ ද , දකුණු පළාතේ නගර සභා බල ප්‍රදේශය තුල සියලු සම්මත අතුරු ව්‍යවස්ථාවන්ට අනුවපනතේ සම්මත අතුරු ව්‍යවස්ථාවන්ට අනුව අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා අම්බලන්ගොඩ නගර සභා බලප්‍රදේශය ඇතුලත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් භාවිත කිරීමට බලය දෙමින් 2021 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙ'II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2021 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරණ සංචාරක මණ්ඩල පනතේ කාර්යයන් සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, ලැගුම්හලක් වන විටදී උපලේඛනයේ II තීරුවේ කුමක් සඳහන් වුවද ඊට අදාල බලපත්‍ර ගාස්තුව එම හෝටලයේ, ආපන ශාලාවේ, ලැගුම්හලේ 2020 වර්ෂයේ ලැබීම් වලින් 1% ක් විය යුතු බවට ද 2021-01-31 දිනට ප්‍රථම අදාල පරිශ්‍රය සඳහා බලපත්‍ර ලබා ගත යුතු බවටද **යෝජනා කර සිටිමි.**

| **උපලේඛනය** | | | | |
|---|---|---|---|---|
| I තීරුව | | II තීරුව | | |
| බලපත්‍රයේ ස්වභාවය | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු.750ට වැඩි නොවන | රු.751 සිට රු.1500 දක්වා | රු.1500ට වැඩි වන විට |
| | | රු ශත | රු ශත | රු ශත |
| 01. | මාළු විකිණීම | 500. 00 | 750. 00 | 1000. 00 |
| 02. | මස් විකිණීම | 500. 00 | 750. 00 | 1000. 00 |
| 03. | සිසිල් බීම කර්මාන්තශාලා | 500. 00 | 750. 00 | 1000. 00 |

| | | | | |
|---|---|---|---|---|
| 04<br>. | කොන්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු, සැලුන් හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන | 500. 00 | 750. 00 | 1000. 00 |
| 05. | බේකරි | 500. 00 | 750. 00 | 1000. 00 |
| 06. | කිරි පට්ටි | 500. 00 | 750. 00 | 1000. 00 |
| 07. | පිහිණුම් තටාක | 500. 00 | 750. 00 | 1000. 00 |
| 08. | අයිස් කර්මාන්තශාලා | 500. 00 | 750. 00 | 1000. 00 |
| 09. | බත්කඩ, ආපනශාලා, තේ හෝ කෝපි කඩ | 500. 00 | 750. 00 | 1000. 00 |
| 10. | හෝටල් | 500. 00 | 750. 00 | 1000. 00 |
| 11. | නවාතැන් පොළවල් | 500. 00 | 750. 00 | 1000. 00 |
| 12. | ලොන්ඩරි | 500. 00 | 750. 00 | 600. 00 |
| 13. | කර්මාන්තශාලා | 500. 00 | 750. 00 | 1000. 00 |
| 14. | අවමංගල්‍ය සේවා සැපයීම | 500. 00 | 750. 00 | 1000. 00 |
| 15. | සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම | 500. 00 | 750. 00 | 1000. 00 |
| 16. | ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන | 500. 00 | 750. 00 | 1000. 00 |
| 17 | අන්තරාදායක ව්‍යාපාර<br>i. වෙල්ඩින් වැඩපලක් හෝ ග්‍රිල් වැඩපලක් පවත්වාගෙන යාම.<br>ii. බලවේග යන්ත්‍ර මඟින් නූල් නිෂ්පාදනය කීරීමේ, පුළුන් සකස් කිරීමේ හා රෙදි විවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.<br>iii. කොන්ක්‍රීට් සිලින්ඩර් හෝ වෙනත් සිමෙන්ති භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.<br>iv. සිමෙන්ති බ්ලොක්ගල්, මල්පෝච්චි, බීරලු නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.<br>v. වායුසමීකරණ යන්ත්‍ර හා ශීතකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.<br>vi. පරිගනක යන්ත්‍ර, ජංගම දුරකතන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.<br>vii. පොහොර වර්ග, කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම ,සත්ව ආහාර වර්ග නිපදවීම, ගබඩා කර තැබීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>viii. ගල්වලක් හෝ අතින් ගල් කඩන ස්ථානයක් පවත්වා ගෙන යාම.<br>ix. වී පාහින මෝලක් පවත්වා ගෙන යාම.<br>x. විදුලිබලයෙන් හෝ අත් යන්ත්‍ර මඟින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.<br>xi. ගුවන් විදුලියන්ත්‍ර ,රූපවාහිනි යන්ත්‍ර ,වීඩියෝ කැමරා, ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.<br>xii. ලී මෝලක් පවත්වා ගෙන යාම.<br>xiii. ස්වර්ණාභරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.<br>xiv. බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.<br>xv. බිම් මල් නිපදවීමේල පැකට් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.<br>xvi. ආයුර්වේද වෛද්‍ය චිකිත්සක මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම<br>xvii. බටහිර වෛද්‍ය ප්‍රතිකාර කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xviii. වානේ වැහි පීලි නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xix. යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | xx. ත්‍රීරෝද රථල මෝටර්සයිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.<br>xxi. මෝටර්රථ අළුත්වැඩියා කිරීම (ගරාජයක්)ස්ථානයක් පවත්වාගෙන යාම<br>xxii. වානේ ගෘහ භාණ්ඩ නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.<br>xxiii. සත්ව ආහාර වර්ග ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.<br>xxiv. ත්‍රීරෝදරථල මෝටර්සයිකල් සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xxv. වාහනලයතුරු පැදිලත්‍රීරෝද රථල පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.<br>xxvi. වෛද්‍ය රසායනාගාරයක් (ලේ හා මුත්‍රා ඇතුළු සාම්පල් පරීක්ෂා කිරීම) පවත්වා ගෙන යාම.<br>xxvii. දන්ත චිකිත්සාගාරයක් ලදත් බදින ස්ථානයක් ලඑක්ස්රේ යන්ත්‍රයක් පවත්වා ගෙන යාම.<br><br>xxviii. පශු වෛද්‍ය ගිලන්හලක් හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම.<br><br>**අප්‍රසන්න ව්‍යාපාර**<br><br>1. කුල්ස්පොට් එකක් හා කිරිහලක් හෝ ස්නැක් බාර් එකක් පවත්වා ගෙනයාම<br>2.. බිත්තර සිල්ලරට හෝ තොග විකුණන ස්ථානයක් පවත්වා ගෙනයාම<br>3.. රසකැවිලි නිපදවීම,කේක් වර්ග තිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම<br>**4.** පපඩම් හෝ නූඩ්ල්ස් නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම<br>5. අයිස්ක්‍රීම්,යෝගට් ,බීම පැකට් නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම<br>6. ජෑම්,සිරප්,සෝස් වර්ග,නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම<br>**7.** කරවල,ජාඩි වේලීම.විකිණීමේ හෝ ගඩඩා කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>8. කුරුදු තැලීමේ කුරුදු තෙල් මඩුවක් පැවැත්වීම හෝ කුරුදු දර විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම<br>9. ඔසු පැන් හලක් ,කොල කැද හෝ බැදපු කඩල.රටකජු,(ටෙස්ට් කඩල )විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම<br>10. පානීය ජලය බෝතල් ගත කර ගබඩා කර තැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 11. ගෝතකාගාරයක් පවත්වා ගෙනයාම<br>12. කුකුලන් 100 ට අඩු කුකුල් කොටුවක් පවත්වා ගෙන යාම<br>13. කුකුලන් 100 ට වැඩි කුකුල් කොටුවක් පවත්වා ගෙන යාම<br>14.ඌරන් 25 ට අඩු ඌරු කොටුවක් පවත්වා ගෙන යාම<br>15. ඌරන් **25** ට **වැඩි** ඌරු කොටුවක් පවත්වා ගෙන යාම<br>16. එළදෙනුන් 25 ට අඩු ඇති කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>17. එළදෙනුන් 25 ට වැඩි ඇති කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>18. ග්‍රොසරියක් පවත්වා ගෙන යාම<br>19 .පිසින ලද ආහාර සකස් කර සපයන ස්ථානයක් (කේටරින්) පවත්වා ගෙන යාම<br>20. නරක් විය හැකි ආහාර වර්ග, කුළු බඩු තොග හා සිල්ලරට විකිණීම<br>21. පොල් තෙල් මෝ ලක් පවත්වා ගෙන යාම.<br>22 .ශීත කල මස් හෝ මාළු ගබඩා කර තැබීම<br>23. මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තැබීම.<br><br>**අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර**<br>i. මිරිස්,ධාන්‍ය වර්ගලපිටි ඇඹරුම්හලක් පවත්වා ගෙන යාම.<br>ii. ෆයිබර් ග්ලාස් වැඩපලක් පවත්වා ගෙන යාම<br>iii. කොහු මෝලක් පවත්වා ගෙන යාම<br>iv. පොල්ලෙලි හා දැව පල්කිරීමේ ස්ථානයක් පවත්වාගෙනයාම<br>v. හුණු වැරටි පිළිස්සීම සඳහා පෝරණුවක් පවත්වාගෙන යාම<br>vi. හම් වර්ග පදම් කරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම<br>vii. රබර් බුෂ් සාදන වැඩපලක් පවත්වා ගෙන යාම<br>viii. රබර් දුම් ගෙයක් පවත්වා ගෙන යාම<br>ix. ගිනි කෙළි භාණ්ඩ ,රතිඤ්ඤා නිපදවීම,විකිණීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>x. වාහන ගැස් කිරීම හෝ ගැස් විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xi. ගැස් ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xii. රෙදි පින්තාරු කිරීමේ ස්ථානයක් (බතික් වැඩපලක්) පවත්වා ගෙන යාම<br>xiii. මෙට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xiv. සබන් නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xv. ලෝහ භාණ්ඩ නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xvi. පිත්තල භාණ්ඩ නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xvii. ටයර් ටියුබ් වෝල්කනයිසින් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | xviii. අළුත් හෝ පරණ ටයර් ටියුබ් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xix. කොප්පරා නිෂ්පාදනය කිරීමල ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xx. අවමංගල සේවා සපයන ස්ථානයක් (මල් ශාලාවක් ) පවත්වා ගෙන යාම<br>xxi. වාහන ගාල් කර තැබීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xxii. පොල් තෙල් හෝ වෙනත් තෙල් වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xxiii. මෝටර් අවත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම<br>xxiv. ටයර් සේවා සැපයීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | | | |

**තීරණය -**

**(4)** 255 වන අධිකාරි නගර සභා අඥා පනතේ 164 වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2016/11/01 දිනැති තීරණ අංක 01:12 යටතේ අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම් විසින් ක්‍රියාත්මක කිරීමට පිළිගෙන , එසේම 2017/08/04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2031 දරණ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පලකරන ලද්දාවූ 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1811 හා 2013-05-17 දිනැති ගැසට් පත්‍රයේ IV(අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වු ද , දකුණු පළාතේ නගර සභා බල ප්‍රදේශය තුල සියලු සම්මත අතුරු ව්‍යවස්ථාවන්ට අනුවපනතේ සම්මත අතුරු ව්‍යවස්ථාවන්ට අනුව අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා අම්බලන්ගොඩ නගර සභා බලප්‍රදේශය ඇතුලත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් භාවිත කිරීමට බලය දෙමින් 2021 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙ'II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2021 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් , තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරණ සංචාරක මණ්ඩල පනතේ කාර්යයන් සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, ලැගුම්හලක් වන විටදී උපලේඛනයේ II තීරුවේ කුමක් සඳහන් වුවද ඊට අදාල බලපත්‍ර ගාස්තුව එම හෝටලයේ, ආපන ශාලාවේ, ලැගුම්හලේ 2020 වර්ෂයේ ලැබීම් වලින් 1% ක් විය යුතු බවටත් 2021-01-31 දිනට ප්‍රථම අදාල පරිශ්‍රය සඳහා බලපත්‍ර ලබා ගත යුතු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

| **උපලේඛනය** | |
|---|---|
| I තීරුව | II තීරුව |

| | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු.750ට වැඩි නොවන | රු.751 සිට රු.1500 දක්වා | රු.1500ට වැඩි වන විට |
| | | රු ශත | රු ශත | රු ශත |
| 01. | මාළු විකිණීම | 500. 00 | 750. 00 | 1000. 00 |
| 02. | මස් විකිණීම | 500. 00 | 750. 00 | 1000. 00 |
| 03. | සිසිල් බීම කර්මාන්තශාලා | 500. 00 | 750. 00 | 1000. 00 |
| 04 . | කොන්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු, සැලුන් හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන | 500. 00 | 750. 00 | 1000. 00 |
| 05. | බේකරි | 500. 00 | 750. 00 | 1000. 00 |
| 06. | කිරි පට්ටි | 500. 00 | 750. 00 | 1000. 00 |
| 07. | පිහිණුම් තටාක | 500. 00 | 750. 00 | 1000. 00 |
| 08. | අයිස් කර්මාන්තශාලා | 500. 00 | 750. 00 | 1000. 00 |
එම විගණන වාර් තාව මා ඉදිරිපත් කරන්නම්. දැන් මෙහෙමයි දැනට විගණන වාර් තාව පැමිණ අපිට මත විමසුමට ඉල්ලා තිබෙනවා. ඒ මත විමසුමට ඉල්ලා තිබෙන්නේ අපේ සමහර පෙර පාසැල් වල ළමුන් ගණන අඩුයි. හැබැයි මෙහිදි විගණන නිලධාරියා විසින් තක්සේරු කරලා තිබෙන්නේ වැරදි විදියට. අවුුරුදු දෙකක වියදම එකතු කරලා තිබෙනවා. විගණන නිලධාරියාට එක කරන්න පුළුවන් අවුරුද්දක වියදම විතරයි. නමුත් අවුරුදු දෙකක වියදම දමා ළමයි සංඛ්‍යාව මෙච්චරයි. අපි මෙච්චරක් වියදම් කර තිබෙනවා. එය ඉතාමත් වැඩියි කියා වාර්තාවක් වශයෙන් එවා තිබෙනවා. අපි එයට පිළිතුරු යවනවා. ඔබතුමලා ඔය කියන කාරණයට සමානයි. අපේ පෙර පාසැල් වලට එන්නේ දුප්පත් මිනිසුන්ගේ ළමයි. ඉතිං ඒ මිනිසුන්ට පහසුකම් දිම එදා සිට අද වෙනකම්ම කර තිබෙනවා. එක ළමයෙකුට හරි එය අවශ්‍යා නම් අපි විසින් එය කළ යුතුයි. අවශ්‍යා නැති කියන අවස්ථාවක මෙය අපි වසන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, හිරේවත්තේ ළමයි ටික දෙනයි ඉන්නේ. හුඟාක් අය මුදල් දීලා යන තැන්වලට තමයි යන්නේ. දැන් ඌරවත්තේ පාලම ළඟත් ළමයි හත් අට දෙනෙක් එතනට එනවා. කවුරු වුණත් දුප්පත් ළමයිනේ. ළමයි හත් දෙනෙකු පැමිණියත් එය පවත්වාගෙන යන්න කියා මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර් ම දාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් පෙර පාසැල් වල හෙප්පුමුල්ලේ තත්ත්වය අනුව යම් යම් ආරංචි මාර් ග පවසනවා ඒ උගන්වන ගුරුතුමියගේ යම් යම් අඩුපාඩුකම් තිබෙනවා කියා. එකනිසාත් ළමයි පෙර පාසැලට නොඑම සිද්ධ වෙනවා. මා හිතන්නේ ඒ ගැනත් කරුණු පිළිබඳව සොයා බලන්න. එහෙම එවත් තිබෙනවා. එමනිසා පෙර පාසැල් වැසීම නම් සුදුසු නැහැ. ළමයි 8ක් 10ක් සිටියා කියා. ඒ අහිංසක ළමයි එන්නේ. ඒ අයට කර කියා ගන්න දෙයක් නැති නිසා තමයි එන්නේ. ඒ අය අර ලැබෙන පොත් ටිකත් බෑග් එකත් පාසැල් ඇඳුමත් ඒ අයට අවුරුද්දටම වටිනවා. අන්න එමනිසා ඒ කර් තව්‍ය එහෙමම කරගෙන යාම සුදුසුයි කියා මා යෝජනා කරනවා.

**<u>ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඇත්තටම අපේ මන්ත්‍රීවරුන් දැනගන්න ඕනේ. අපේ පෙරපාසැල් වල සිටින ගුරුවරු හුඟාක් ටිකක් දැන් වයසයි. දැනට මේ සියළුම ජනප්‍රිය පෙර පාසැල් වල පරණ ගුරුතුමිය ඉන්නවා. අලුතෙන් කවුරු හරි තරුණ කෙනෙකු අරගෙන තමයි මේක දුවන්නේ. එකනිසා මා මේ පෙර පාසැල් ගුරුවරුන්ටත් කිවුවා ටිකක් ලස්සනට ඇඳලා ප්‍රියතාවයක් වන විදියට එන්න කියා. ගුරුතුමිය වයසට ගියාම ටිකක් ළමයි එනවා අඩුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා යෝජනාවක් කරනවා. ඔය පෙර පාසැල් සම්බන්ධව ඔහොම කියන නිසා ඔකට සහායිකාවක් පත් කර ගන්න. එතකොට අපිට පුහුණු වන තරුණ ළමයෙකු පත් කර ගත් පසු එහෙම සිටින විට ළමයිනුත් කැමතියි. සභාවේ තිබෙන පෙර පාසැල් වලට සහාය ගුරුවරියකුත් පත් කර ගන්න. අර තුමිය විශ්‍රාම යන කොට පත්වීම ලබා දෙන්න පුළුවන් විදියට දිමනාවක් දී එහෙම කරන්න. අනිත් එක ප්‍රජා මුල සමිති තිබෙනවා අපේ කොට්ඨාශ වල . හැම සමිතියක්ම දැනුවත් කරන්න. තමන්ගේ ගමේ සිටින අම්මලා තාත්තලා දැනුවත් කරලා ඒ ළමයාට තිබෙන වරප්‍රසාද ලබා දීලා පෙර පාසලට ළමයි වැඩි කරන්නත් ප්‍රචාරයක් යන්න. මොකද මේක කරගන්න පුළුවන්. ළමයි වැඩි කර ගැනීමත් කරන්න ඕන ගම්මාන වල සිටින අයයි. නගර

සභාවෙන් දෙන දිමනාවන්, ළමයාට දෙන ඇඳුම් ටික , දෙන පොත් බෑග් එක , ළමයාගේ අධ්‍යාපනය , ඒ සම්බන්ධව ප්‍රචාරයකුත් ලබා දෙන්න. මොකද වෙන ප්‍රචාරණ දැන්වීම් ටිකක් හරි ගසා ගමේ ප්‍රජා මූල සමිතිත් දැනුවත් කරලා ඒ වගේ විශේෂ වැඩපිළිවළක් කරන්න ළමයි දිරිමත් කරන්න. ඒ ගුරුතුමියටත් වෙනම පුහුණුවක් ලබා දෙන්න. ළමයිට අවශ්‍ය ළමයි ඇද ගැනීමේ ශක්තිය ලවා ළමයින්ට අවශ්‍ය සිංදු ටික කියා , කවි ටික කියා ළමයා රඳවා ගැනිමට ඒ ගුරුතුමියට වෙනම පුහුණුවක් ලබා දෙන්න. මෙහෙම කරලා සහායිකාවකුත් පත්කර ගන්න. විශ්‍රාම යනකොට එතුමියට පත්වීම දෙන්න. දිමනාවක් දෙන්න සභාවේ අනුමැතිය අරගෙන මොනවා හරි . එතකොට ඕක වහන්න ඕනේ නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්**</u>

ඊට අමතරව නව ක්‍රමයකට ඔය තියෙනවානේ වෙන වෙන පෙර පාසැල් වල. අන්න එහෙම එකකුත් යොදන්න. අපේ එවා යල්පැන ගිය එවා නිසා අපේ එවාට එවන්න කැමති නැහැ. මා දන්නවා අපේ ගෙවල් ළඟ නගර සභා නිවාස වල වුණත් ඔය ලොකු එවාට තමයි යවන්නේ. මා ඇහුවාම කියනවා මේකේ මෙහෙම නැහැනේ. ඉංග්‍රිසි නැහැනේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

හොඳ ඉංග්‍රිසි නම් ටිකක් දමන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්**</u>

නව ක්‍රමයකට යන්. නව යන සමාජ රටාවත් එක්ක ඒ පෙර පාසැල් ගුරුවරියන්ට ඒ යන ඒ පාඨමාලාවක් හරි දේශන හරි දිලා ඒ අය මේ නවතාවයට යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. මා හිතන්නේ මේ ළමයින් එන එක වැඩි වෙනවා. එක නැති නිසා තමයි දෙමාපියන් එවන්න කැමති නැත්තේ. එහෙම එකක් තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මූලික වශයෙන්ම කියන්න ඕනේ අපි මේ පෙර පාසැල් කරන්නේ දුප්පතුන්ට නෙමෙයි කියන එක. මොකද අපේ ප්‍ර දේශයේ සිටින මිනිසුන් ටිකක් මන්නාක්කාර මිනිසුන්. සරලවම කියනවා නම් එක තමයි තත්ත්වය. යම් අභිමානයක් තිබෙන මිනිසුන් ඉන්නේ. ඒ මිනිසුන් කැමති නැහැ. නගර සභාවේ තිබෙන දුප්පත් මිනිසුන්ට යන්න තියෙන පෙර පාසැලක් කිවුවාම ටික්ක මානසික කඩා වැටිමක් එනවා. එමනිසා මුදල් දිලා කිය දිලා ණය වෙලා තමයි

අතේ මුදල් නැහැ තමයි . එක හන්දා ලක්ෂ්මි මන්ත්‍රීතුමිය කිවූ පරිදි නව ක්‍රමවලට යන්න. එකයි අර මානසිකත්වයෙන් අර මිනිසුන් මුදවා ගන්න. අපි මෙය කරන්නේ දූප්පත් මිනිසුන්ට නෙමේ . ප්‍ර දේශවාසීන්ට. අපේ නගර සභාවෙන්. ඒ වගේම තව කතන්දරයක් මා කියන්නම් . මගෙන් ඉල්ලුවා එක ගුරුවරියක් පෙර පාසලකට ගීතයක් ඕන කියා. ඉතිං එක අද වනතුරු ඉෂ්ඨ වුණේ නැහැ. මා සභාවට යෝජනා කරනවා. එකට යම්කිසි ක්‍රියාමාර් ගයක් ගන්න කියා. මා දූන්නා තමයි. මොකද ඒක මට කියන්න බැහැ . මේ මගේ එක දමන්න කියා. මේක සමූහ ආයතනයක්. විවිධ කට්ටිය ගීත ඉදිරිපත් කරන්න පුළුවන්. එහෙම කරලා තෝරා ගත්ත එකක් මේ පෙර පාසැලකට දෙන්න. දැන් අපේ ජාතික ගීතය තිබෙනවා. විද්‍යාල ගීත තිබෙනවා. ඒ වගේම අපේ නගර සභාවටත් පෙර පාසැල් ගීතයක් තිබෙනවා නම් හොඳයි. එතකොට පොඩි අභිමානයක් එනවා. ළමයා තව අවුරුදු 20ක් යනකොටත් එයාගේ මතකයේ තිබෙනවා. එක සටහනක්. එමනිසා එක වැදගත් . එමනිසා ඒ ගැනත් ටිකක් සැලකිලිමත් වෙන්න කියා මා ඉල්ලා සිටිනවා. මා දූන්නා තමයි එකක්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අපගේ පෙර පාසැල් පද්ධතිය තුළ මා නම් දන්නේ නැහැ. පෙර පාසැල් ගුරු මහත්ම මහත්මීන් අධික්ෂණයකට ලක් වෙනවාද කියා. සාමාන්‍ය යෙන් පෙර පාසැල් වල එවැන්නක් සිද්ධ වෙන්නේ නැහැ වර් තමානයේ . මෙය අනාගත පරම්පාරාව. මේ පෙර පා ැසැල් දරුවන් අඩු බුද්ධි මට්ටමකින් අඩු වෙලා ගියහොත් ඒ භාර ගන්න පාසැල් වල ළමයින් එක්ක සම්බන්ධ වුණාම ඒ ළමයි පහළට යාමේ ප්‍රවණතාවයක් එනවා. එතකොට නිරන්තරයෙන්ම මේ පෙර පාසැල් ප්‍රතික්ෂේප වෙනවා. එතකොට මේ ළමයි විශේෂ සුවිශේෂිතා දැක්වුවහොත් ඊළඟට අපිට පසු විපරමක් කරන්න වෙනවා අපගේ පෙර පාසැල් දරුවන් මොන පාසැල් වලට ඇතුල් වෙලා තිබෙන්නේ. ඒ අය දක්වා තිබෙන සුවිශේෂි දක්ෂතා මො නවාද ? ශිෂ්‍යත්වය සමත් වෙලා තිබෙනවාද ? එවා හරහා තමයි අපිට අපේ පෙර පාසැල් පද්ධතිය උඩට ගන්න පුළුවන් කම ලැබෙන්නේ. ඒ වගේම ඒ පෙර පාසැල් සම්බන්ධව විශේෂඥ දැනුම ඇති අධ්‍යාපන අමාත්‍යාංශයට හෝ පළාත් සභාවට හෝ අනුබද්ධිත විශේෂ උපදේශක උපදේශිකාවන් සිටිනවා. ඒ අය හරහා මේ පද්ධතියට උප දේශනයක් අවශ්‍යව තිබෙනවා. මා හිතන්නේ මේ විගණන වාර් තාවේ පෙන්වා දි ඇත්තේ ඔය පෙර පාසැල් වල ළමයි 30 ක් 40ක් සිටි පෙර පාසැල් වල

මා යෝජනා කරනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මා එම වාර් තාව ඉදිරිපත් කරන්නම්. ඔබතුමා ඒ වාර් තාව බලා කතා කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ළමයි 40 සිටින පෙර පාසැල් වල ළමයි හත අට දක්වා අඩුවීමට හේතුවක් තිබෙනවා. මා මේ පෙර පාසැලක් කරලා කතා කරන්නේ. එකයි මේ කියන්නේ. මා ආදි ශිෂ්‍ය සංගමයේ ධර් මාශොකේ පෙර පාසැලක් පවත්වා ගෙන ගියා. එහි පෙර පාසැල පෙර පාසැල් 4ක් දක්වා ව්‍යාප්ත කළා. ඒ පෙර පාසැල් 4 අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉහළ නිලධාරින්ගේ උපදෙස් යටතේ සතියේ දින පහේ විශේෂ විදියට සංගිතය වෙනම දිනයක , ඉංග්‍රිසි භාෂා වෙනම දිනයක ඒ සුවිශේෂි දක්ෂතා ඇති ඇති අය වෙනම දිනයක ගෙන්වා එහෙම කරන්න අදහස් කළා. එහෙම කරගෙන යාමේදි මේ නිලධාරින් මාරු විමේදි මගදි ඊළඟට පෙර පාසැලේ උගන්වපු ගුරුවරුන් තමුන් විසින් ස්ව උත්සාහයෙන් මේ ප්‍රසිද්ධියක් එක්ක පෙර පාසැල් විවෘත කළා. ඒ විවෘත කිරිමත් එක්ක අපේ පෙර පාසැල් වල එවකට සිටි නිලධාරින් අලුතෙන් සුදුසුකම් ඇති අය බඳවා ගන්නවා වෙනුවට සහායට සිටි අය ගුරුවරු කළා. මේ තත්ත්වය මෙහි තිබෙනවා ද කියා මා දන්නේ නැහැ. ඒ සහායට සිටි අය ගුරුවරු කිරිම තුළ පෙර පාසැල් 4ම වැසුනා. එක තමයි වුණේ. එතකොට අද අම්බලන්ගොඩ සිටින හොඳම පෙර පාසැල් කිහිපයකින් එක්කෙනෙකු තමයි වත්සලා මහත්මිය. පෙර පාසැල් 50 ක 60 ප්‍රමාණයක් එතුමිය සතුව ඉන්නවා. ඒ අම්බලන්ගොඩ ධර් මාශෝක විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය මඟින් පවත්වන ලද පෙර පාසැලේන් නිෂ්පාදනය කරන ලද ගුරුවරියක්. ඇය එතනින් තමයි ආරම්භ කළේ. එයාට තමයි පෙර පාසැල භාරව තිබුණේ. ඉතිං එයා එතනින් ගිය නිසා එතනින් තෙරුණේ සහකාර එක්කෙනෙක්. අර ළමයින්ගේ අත් උදවුවට හිටිය අය. ඒ අයට සුදුසුකමුත් නැහැ. ඒ යම් යම් නිලධාරින් ගන්න තින්දු නිසා. ඉතිං මෙතන මා දන්නේ නැහැ . මා දකින්නේ නැහැ ඒ තත්ත්වයද තිබෙන්නේ කියා. ඒ මොනවා වුණත් මා හිතන්නේ විගණන නිලධාරින්ට දෙන්නේ එක ළමයෙක් හා ළමයින් 7කු සිටින නිසා මෙය වහන්න කියන එක නෙමේ. ඒ අය දෙනවා නම් දෙන්නේ මේ අධ්‍යාපන මට්ටම පහළ වැටිම නිසා මේ පෙර පාසැල් වලට සම්බන්ධ වීමේ ප්‍රවණතාවය අඩු විමේ සම්භාවිතාවක් වෙන්න ඕනේ. මා දන්නේ නැහැ. කියවා බලන්න ඕනේ. මා හිතන්නේ එහෙම.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මා මේ වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා. සභාවේ පෙර පාසැල් පිළිබඳ සිදු කළ විගණන පරික්ෂාවේදි පහත සඳහන් කරුණු නිරික්ෂණය විය. සභාව සතුව පෙර පාසැල් 9ක් තිබෙන අතර පෙර පාසැල් දරුවන් 145 ක් අධ්‍යාපනය ලබයි. පෙර පාසැලේ ගුරුවරුන් සංඛ්‍යාව 9කි. පෙර

පාසැල පවත්වාගෙන යාම සඳහා 2019 සහ 2020 සැප්තැම්බර් 20 දක්වා සභා අරමුදලින් රු. 1344754 ක් වියදම් කර තිබුණි. සභාවේ පෙර පාසැල් 9 ප්‍රගතිය පරික්ෂා කිරිමේදි පෙර පාසැල් 3ක් හැර අනිත් පෙර පාසැල් 6 ඉගෙනුම ලබන සංඛ්‍යාව අඩු මට්ටමක පැවතිම පහත සඳහන් පරිදිය.

| පෙර පාසැලේ නම | දරුවන් සංඛ්‍යාව |
|---|---|
| හෙප්පුමුල්ල පෙර පාසැල | 06 |
| පියවර පෙර පාසැල ( මානෙල්) | 05 |
| පියවර පෙර පාසැල ( නෙලුම්) | 15 |
| පියවර පෙර පාසැල ( ඕලු) | 17 |
| හිරේවත්ත පෙර පාසැල | 10 |
| කැටන්තොට පෙර පාසැල | 17 |

වශයෙන් මෙම පෙර පාසැල් 6ක පසුගිය වසර 6ක ඉගෙනුම ලැබූ දරුවන් සංඛ්‍යාව පරික්ෂා කිරිමේදි පෙර පාසැල් ළමුන්ගේ පැමිණිම දිගින් දිගටම අඩුවන බව නිරික්ෂණය විය. ඒ අනුව 6ම ඉගෙන ගත් හැටි තිබෙනවා. හෙප්පුමුල්ල පෙර පාසැල 2015 සිට2020 දක්වා 17,12,10,6,10,6 පියවර පෙර පාසැල ( මානෙල්)0,0,5,6,6,5 වශයෙන්. පියවර පෙර පාසැල ( නෙලුම්)23,25,23,15,18,15. පියවර පෙර පාසැල ( ඕලු)20,22,23,17. 25,17 හිරේවත්ත පෙර පාසැල 10,10,10,13,20,10. කැටන්තොට පෙර පාසැල 22, 22,17, 17,19,17 ඒ අනුව පෙර පාසැල් සංවර් ධනය වෙනුවෙන් සභාව විසින් වාර් ෂිකව විශාල මුදලක් වැය කළද පෙර පාසැල සංවර් ධනය අඩු මට්ටමක පවතින බව නිරික්ෂණය විය. 2020 සැප්තැම්බර් 25 සභාවේ පෙර පාසැල් 6 සම්බන්ධයෙන් සිදු කළ භෞතික පරික්ෂාවේදි පහත සඳහන් කරුණු අනාවරණය විය. තල්ගස්ගොඩ පෙර පාසැලේ ළමුන් 24 ක් සිටියද එක් ගුරිවරියක් පමණක් සේවයේ යොදවා තිබුණි. එම පෙර පාසැලේ දරුවන්ගේ කායික මානසික වර් ධනය වන ආකාරයේ සුදුසු මනා පරිසරයක් ගොඩ නඟා ඇති අතර ඉතා ඉහළ මට්ටමේ පෙර පාසැල පවත්වාගෙන යන අතර එයට සාපේක්ෂව අනිකුත් පෙර පාසැල් 5තුළ දරුවන්ට සුදුසු කායික හා මානසික වර් ධනය ඇතිවන ආකාරයේ පෙර පාසැල් ගොඩ නඟා නොතිබිණි. පෙර පාසැලේ දැක්ම වන්නේ ගුණ නුවණින් යුත් ළමා පරපුරක් අනාගතයට දායාද කිරිම වන අතර මෙහි මෙහෙවර වන්නේ ළමා පරපුර තුළ ගුණවත් බව හා නිර් මාණශිලි බව හා පෞරුෂ වර් ධනය ඇති වන ආකාරයට සන්නද්ධ විමත්

බුද්ධිමත් පරපුරක් බිහි කිරිමය. පෙර පාසැල් භෞතික පරික්ෂාවේදි උප කල්පනය වන ආකාරයට පෙර පාසැල් ඇති කර නොගැනීම තිබුණ බව නිරික්ෂණය විය. පෙර පාසැල් දරුවන්ට ප්‍රිය මනාප පරිසරය වන පරිදි සෙල්ලම් උයන  නිර් මාණය කර නොතිබුණි. කෙරමිණිය නගර සභා පෙර පාසැල . සෙල්ලම් උයනේ සෙල්ලම් උපකරණ අලුත් වැඩියා කටයුතු සිදු කිරිම , කෙරමිණිය පෙර පාසැල. ඉගෙනුම ලබන දරුවන් අනුව පෙර පාසැල් ගොඩනැඟිල්ල කුඩා වීම හා අඳුරු ස්භාවයක් ගැනීම නිසා ප්‍රිය මනාප ස්ථානයක් නොවිම - ඕකන්ද පෙර පාසැල (ඇ) ඉගෙනුම ලබන පෙර පාසැල් දරුවන් ප්‍රමාණයට අනුව සෙල්ලම් උයන ප්‍රමාණවත් නොවීම. කැටන්තොට පෙර පාසැලේ විස්තර දැක්වේ. ඇත්තටම කැටන්තොට පෙර පාසැලේ අපි අලුත්ම මේවා එකක් සවි කර තිබෙනවා. නමුත් විගණන නිලධාරියා ගසා තිබෙන්නේ එක තමයි. නමුත් අපි ලක්ෂ 12ක් වටිනා මේකක් සවි කළා. ( ඉ ) දරුවන්ගේ ක්‍රියාකාරකම් හා සෙල්ලම් ගෙවල් නිර් මාණය නොකර නොතිබිම - තල්ගස්ගොට පෙර පාසැල. ඕකන්ද පෙර පාසැල , පියවර පෙර පාසැල, කැටන්තොට පෙර පාසැල . ඔය එකකවත් නැහැ කියා. ඉහත සඳහන් කරුණු කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන දින සිට දින 14ක් ඇතුළත ඔබගේ අදහස් ගෙන ක්‍රියා මාර්ග දක්වන්න කියා විගණකාධිපති විසින් මට ලිපියක් එවා තිබෙනවා. මේක තමයි දන්වා තිබෙන්නේ.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , ඔකෙන් කවදාවත් කියා නැහැනේ ළමයින්ට වියදම් කරපු එක වැරදියි කියා. ඔකේ කියන්නේ අඩුපාඩු නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

වියදම් කර තිබෙනවා. නමුත් ප්‍රතිඵලයක් නැහැ කියා කියන්නේ. මේ සම්බන්ධයෙන් විශේෂයෙන් අපේ මන්ත්‍රිවරු උනාන්දු වෙන්න. දැන් මෙහි හෙප්පුමුල්ල පෙර පාසැලේ 6 සිටින්නේ. මානෙල් පෙර පාසැලේ 5 ක් සිටින්නේ. හිරේවත්ත පෙර පාසැලේ 10කි සිටින්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්.ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්**</u>

හිරේවත්ත පෙර පාසැලේ පොඩි ගැටළුවක් තිබෙනවා. මට ගුරුතුමිය කිවුවා. සභාවටත් කිහිප වතාවක් කිවුවා කියා. බිත්තියක් මෙවා වෙලා තිබෙනවා. ළමයි එවන්න බැහැ කියා දෙමාපියන් කියනවාලු ගුරුතුමියට. මෙය අලුත් වැඩියා කරන කම්. මෙය කඩාගෙන වැටි ළමයෙකුට මොනවා හරි වුණොතින් ගුරුතුමිය වග කියනවාද කියා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මන්ත්‍රිවරු ඒ අඩුපාඩු බලා අපිට ඉදිරිපත් කරන්න. එතකොට අපි එවා හදන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්</u>**

කිහිප සැරයක්ම සභාවට ඇවිත් කියා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් ඔකේ ප්‍රජා සංවර්ධන කියා මහත්මියක් සිටිනවානේ. විෂයභාර. අපිත් එක්ක එකතු වන එකක් . අනිත් එක අපි බලන්නකෝ එතුමිය කීපාරක් ඔය පෙර පාසැල් වලට ගිහින් අධික්ෂණය කර තිබෙනවාද කියා. මුලිකව වෙන්න එපැයි. මෙතන බලපාන්නේ ඔන්න ඕවා. තනතුරු තිබුණාට වැඩක් නැහැ. මේ තනතුරු වලින් ඒ අයට පිඩනය කරන්න ඕනේ. කලින් ඔබතුමාගේ පාලන තන්ත්‍රය තුළ විසි ගණන් පැනලානේ පෙර පාසැල් වල. දැන් මෙතන වෙන්නේ මේ විෂයක් එක්ක මේ පෙර පාසැල් ගුරුවරු සම්බන්ධ වෙන්නේ නැහැ. එක්කෝ වැඩ සටහන් ටිකක් ක්‍රියාත්මක කරන්න ඕනේ. මේ අපේ ජගත් කුමාර මන්ත්‍රිතුමාගේ නෝනා සිටින කාලයේ ඕවා තිබුණා. ගිහිල්ලා බලනවා. අඩුපාඩු බලනවා. සාකච්ඡා තියනවා. ඒ අදහසුත් ගන්නවා. ඔබතුමා සමඟ සාකච්ඡා කරලා ඔබතුමාගේ අදහසුත් ගන්නවා. ඉතිං එකයි වෙලා තිබෙන්නේ. මෙය ගොඩක් දුරට යන්නේ එකයි. අනිත් එක දෙමාපියන්ගේ මනස හැදිමත් එකක්. සමහරුන්ට අර මනසේ තිබෙනවා මුදල් දිලා අර ලොකු තැනකට යන එක. නමුත් අපේ දෙන දේවල්. අපි කියක් වියදම් කරනවා ද? වසරකට පෙර පාසැල් සඳහා. එකෙ ප්‍රතිඵලය අපේ මහජනතාවට දෙන්න ඕනේ. අනිවාර්යෙන් එය සැලසුම් සහගතව කරන්න ඕන එකක්. එමනිසා එයට වැඩ සටහනක් හදන්න කියන එක ඉල්ලා සිටිනවා. මන්ත්‍රිවරුන්ගේත් අදහස් අරගෙන. එකට වැඩ පිළිවළක් හදන්න. හැබැයි ප්‍රජා සංවර්ධන නිලධාරි ගිහින් අපිට ඉදිරිපත් කරන්න. මේ වකවානු තුළ එතුමිය සිටින කාලය තුළ කී වතාවක් පෙර පාසැලට ගිහින් තිබෙනවාද කියා. ඉතිං කොහොමද හදන්නේ. මේ විගණන දෙපාර් ත මේන්තුවෙන් පැමිණියාම එම නිලධාරියා අරගෙන ගිහින් පෙන්වනවා නෙමේ. එකනිසා ඒ වැඩපිළිවළක් හදන්න කියා අපි ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියත් සමඟ ලබන සභාවට එතුමිය ගෙන ඇති පියවර සම්බන්ධව සාකච්ඡා කිරිමට අවස්ථාව දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එතුමිය දක්ෂ නිලධාරිණියක්. එතුමියට මේ දිනවල වැඩ වැඩියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අදහසක් විතරයි. පොල්වත්තේ ප්‍රදේශය නියෝජනය කරනමන්ත්‍රිවරු සිටින නිසා පොල්වත්තේ පෙර පාසැලේ තමයි පෙර පාසැල් 3ක් තිබෙන්නේ. එක එක නිවහනක් යටතේ ළමයි ඔක්කොම සිටින්නේ 40 ගණනක්. 4 ක් යටතේ සිටින්නේ 40 ගණනක්. එතකොට ඒ අය එක මේවා එකක් කර ඒ අය එකට හෝ අපේ නගර සභාවේ තිබෙන ඒවාට අනුයුක්ත කර ගැනීම සුදුසු යි කියන අදහසක් විතරයි. මන්ත්‍රිවරුන්ට ගරු කරන්න ඕනේ. ඒ අය කියන දෙය කරනන ඕනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඉන්න ඔනේ උපරිම ගණන 20 ක් බව තමයි දන්වන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ පෙර පාසැල් වැටිමට ප්‍රධනතම හේතුව වි ඇත්තේ ප්‍රජා සංවර් ධන නිළධාරියම නෙමේ. මා දැක තිබෙනවා එතුමිය විටින් විට පෙර පාසැල් පරික්ෂාවට යනවා.ඒ වගේම එම පාලිකාවන් සමඟ කතිකා වෙනවා, උපදෙස් දෙනවා, එක්රැස් වෙනවා. මේ සමස්ත හේතුව වි ඇත්තේ සමස්ත සාමාජයෙම කඩා වැටිමට හේතු වෙනවා. දැන් මේ වනවිට අපේ කෙරමිණිය පෙර පාසැල දක්ෂතම ආචාර් ය වරියක් සිටින බවටයි අපිට දැනගන්න ලැබුණේ. දැන් මේ වන විටත් ළමුන් ප්‍රමාණයක් සිටිනවා. ගියවසරේ ළමුන් තිස්පහකට ආසන්න ගණනාවක් සිටිනවා. මේ වසරේ ළමුන් 15 ක් පමණ අයදුම්පත් ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මේ කාලයත් එක්ක එන විපත් වලට අප සියළු දෙනාටම මුහුණ දෙන්න වෙනවා. ඒ අභියෝග වලට. මා හිතන්නේ එවාට පිළියම් සෙවිය යුතුයි. මේ වනවිටත් අපේ පෙර පාසැල් මිදුල මේ වනවිටත් අබලන් තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ. අපි නිසි පිලිසකර කිරිම් කර නැහැ. ඒ වගේ දෙවලුත් සකසා අපි මේ පෙර පාසැල් නොවසා පවත්වාගෙන යායුතු බවයි අපි කියන්නේ.

**තීරණය -**

2021 වර්ෂයේ අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් වලට ඇතුළත් වන ළමුන් සඳහා ටීෂර්ට් හා නිල ඇඳුම් කට්ටල 200ක් ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින්

කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.03** **නගර සභා ආඥාපණතේ 29 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව අම්බලන්ගොඩ නගර සභාව වෙත විවිධ ලිඛිත නීතින් මගින් පැවරි ඇති බලතල අතරින් මුල්‍ය පිළිබඳ ස්ථාවර කාරක සභාව වෙත බලතල පවරන ලද 2019.08.06 දින පැවති මාසික සභාවේ තීරණ අංක 11.04 හි ආ ඡේදයෙහි පුනාරාවර්තන වියදම් සම්බන්ධයෙන් ලක්ෂ පහ දක්වා වූ වියදම් ගෙවීම් කිරිමට ආදාළ බලය දීම යන්න පුනරාවර්තන වියදම් ලක්ෂ පහ දක්වා සහ ප්‍රාග්ධන වියදම් සඳහා ලක්ෂ පහළොවක් දක්වා වූ වියදම් ගෙවීම් කිරීමට අදාළ බලය දීම යන්න ලෙස සංශෝධනය කිරීම සුදුසු බවත් මෙම සීමාවන්ට වැඩිවන පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්ද මුල්‍ය කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසුව සභාවට යොමු කලයුතු බව ඇතුලත් කිරිම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නගර සභා ආඥාපණතේ 29 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව අම්බලන්ගොඩ නගර සභාව වෙත විවිධ ලිඛිත නීතින් මගින් පැවරි ඇති බලතල අතරින් මුල්‍ය පිළිබඳ ස්ථාවර කාරක සභාව වෙත බලතල පවරන ලද 2019.08.06 දින පැවති මාසික සභාවේ තීරණ අංක 11.04 හි ආ ඡේදයෙහි පුනාරාවර්තන වියදම් සම්බන්ධයෙන් ලක්ෂ පහ දක්වා වූ වියදම් ගෙවීම් කිරිමට ආදාළ බලය දීම යන්න පුනරාවර්තන වියදම් ලක්ෂ පහ දක්වා සහ ප්‍රාග්ධන වියදම් සඳහා ලක්ෂ පහළොවක් දක්වා වූ වියදම් ගෙවීම් කිරීමට අදාළ බලය දීම යන්න ලෙස සංශෝධනය කිරීම සුදුසු බවත් මෙම සීමාවන්ට වැඩිවන පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්ද මුල්‍ය කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසුව සභාවට යොමු කලයුතු බව ඇතුලත් කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව ඉදිරිපත් කළේ පසුගිය වතාවේ මන්ත්‍රීවරුන් එක කර් මාන්ත ගෙවීමක් සම්බන්ධයෙන් ඔවුනට මුල්‍ය කමිටුවට ඉදිරිපත් කළේ නැහැ කියා යම් චෝදනාවක් ඉදිරිපත් කළා. මුල්‍ය කමිටුවට බලය පවරා තිබුණේ. සැපයුම් ලක්ෂ 5 දක්වා. ගෙවීමට තමයි සභාව විසින් බලතල පවරා තිබුණේ. කර් මාන්ත ගෙවීම් වෙනම සභාවෙන් අනුමත කරන තත්ත්වයක් තමයි තිබුණේ. ඒ අනුව මේ යෝජනාව අනුව අපි අපේකෂා කරන්නේ සියළුම කර් මාන්ත හා සැපයුම් කියන විෂයන් සියල්ලම ලක්ෂ 15 දක්වා මුල්‍ය කමිටුවට ලබා දිලා ඒ ගෙවිම් අනුමත කිරිමේ බලය තමයි මන්ත්‍රීතුමන්ලා එදා ඉදිරිපත් කරණු ලැබු කාරණය. නිත්‍යානුකුලව කටයුතු කිරිම කළ හැකි ආකාරයෙන් විමසිමක් කරලා ඒ කටයුත්ත කිරිමට තමයි අපි බලාපොරෝත්තු වෙන්නේ.ඔබතුමන්ලාගේ ඉල්ලිම තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. මේ ආකාරයෙන් ඇත්ත වශයෙන්ම මා සතුටු වෙනවා. මේ සභාවේ මීට කලින් මුල්‍ය කමිටුවක් මුලින්ම ඉදිරිපත් වුණේ අපේ පාලන කාලය තුළ. ඒ ඉදිරිපත් විම තුළ මන්ත්‍රීවරුන් සියළු දේම අදාල ලිපි ලේඛණ සියළු දේම පරික්ෂා කරලා ඒ නිලධාරින්ට යම්කිසි අඩුපාඩුවක් වෙලා තිබෙනවා නම් එය බැලිම අපේ මන්ත්‍රීවරුන් ඇත්ත වශයෙන්ම ඉෂ්ඨ සිද්ද කළා. ඒ වගේම සභාව යන්න ඕන නිසි මගට ගැනීම සඳහා අවශ්‍ය පහසුකම ඒ වගේම නිලධාරින්ටත් සභාවටත් මුල්‍ය කමිටුව හරහා ලැබුණා. ඒ වගේම මේ මුල්‍ය කමිටුවේ අපි බලාපොරෝත්තු වෙනවා මේ යෝජනාව මඟින් එහි සක්‍රියව යම්කිසි ගෙවිමක් තිබෙනවා නම් ලක්ෂ 5 වශයෙන් තිබු සැපයුම් ලක්ෂ 15 දක්වා වැඩි කිරිමටත් ඒ වගේම කර් මාන්ත සම්බන්ධයෙන් සියළුම බිල්පත් පරික්ෂා කිරිම් ඒ අනුව කළ යුතු වැඩ කටයුතු පරික්ෂා කිරිම් මන්ත්‍රීවරුන්ට ලබා දිම තමයි මෙහිදි අපි සිද්ධ කරන්නේ. මේ යෝජනාවට අපේ මන්ත්‍රීවරු සියළු දෙනා සහාය දක්වනු ඇතැයි මා බලාපොරෝත්තු වෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, නගර සභා ආඥා පණතේ 25 වගන්තියේ සඳහන්ව මුල්‍ය පිළිබඳ ස්ථාවර කාරක සභාවකට මේ බලය පවරා තිබෙනවා. ස්ථාවර කාරක සභාව කවදාද පත්වුණේ. මා දන්නේ නැහැ. මාත් ඉන්නවා ඔය ස්ථාවර කාරක සභාවට. අද වෙනකම් මා දන්නේ නැහැ මේ ස්ථාවර කාරක සභාව පත්වෙලා කියා. එකෙන් හරි ගැටළු තිබෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මන්ත්‍රීතුමා අද තමයි මෙය පත් කරන්නේ. කලින් මුල්‍ය කමිටුවට පත් කළා. කලින් සැපයුම් සම්බන්ධව මුල්‍ය කමිටුව තිබෙනවා. අද තමයි මෙහි බලතල වැඩි කරලා පත් කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

15 එක 20 කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

15 එක 20 කරනවා. එකට කර් මාන්ත සම්බන්ධ කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මුල්‍ය කමිටුවට බලය දිලා ටෙන්ඩර් කරලා ඒ සභා අනුමැතිය ගන්න එක නේද වඩාත් හොඳ .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බලතල පැවරුවාම මෙහිදි අපි බලාපොරෝත්තු වන දෙයක් තමයි සභාවේ කාලය ඉතුරු කර ගැනීම. අපි බලාපොරෝත්තු වෙන්නේ දැන් මේ අපි කමිටු 7ක් ද 8ක්  දමා ගත්තානේ. මේ සභාවේ මේ කමිටු පටන් ගත්තාම උදේ 9.30ට ආරම්භ කළාම රාත්‍රී 7.00 – 8.00 වෙනවා. කමිටු වලට බලය දුන්නාම අයි කතා කරන්න දෙයක් නැහැ. අපි කමිටු වාර් තාව සම්මත කිරිම පමණයි කරන්නේ. එතකොට සියළු මන්ත්‍රීවරු මේ ගැන විශ්ලේෂණය කරලා තමයි මේවා වෙන්නේ. සියළු මන්ත්‍රීවරුන්ට කමිටුවලට සහභාගි වෙන්න පුළුවන් නම් සහභාගි වෙන්න. එක කමක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මුල්‍ය කමිටුවට බලය දිලා විනිවිදභාවයකින් ඒ වැඩය කළොත් හොඳයි. 08.07 යටතේ ගිය සභාවේ යෝජනා ඉදිරිපත් වුණා . මුල්‍ය කමිටුවට ඒ බලය දෙන්න කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. යෝජනාවක් ස්ථිර වුණේ නැහැ. යෝජනාව නිසි විදියට අද තමයි දමන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගිය සභාවේ මෙයා යෝජනා කළා. මා ස්ථිර කළා. නැහැ ඔබතුමා කිවුවා යෝජනා ස්ථිර කරන්න මුල්‍ය කමිටුවට භාර දෙන්න කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් ඒ යෝජනාව නිසි පරිදි ඉදිරිපත් කර තිබෙනවා. නිසි පරිදි හරි විදියට ඉදිරිපත් කරන්න ඕනේ. බලතල පැවරීමේ අංශය යටතේ තමයි මා යෝජනා කළේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

මූල්‍ය කමිටුවට දමා එය සභාවට දමා කටයුතු කරන්න .

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අංක 29 වගන්තිය තුළ නගර සභා ආඥා පණතේ තිබෙන වගන්තිය තමයි මේක. මෙතන කමිටු 2ක්නේ. මේක තිබෙන්නේ මූල්‍ය ස්ථාවර කාරක සභාව. එතකොට මූල්‍ය කමිටුව කියන තව එකක්. මෙය තිබෙන්නේ කාරක සභාවේ මෙවාට යම් උපදෙස් ලබා දීලා නිසි ආකාරයෙන් කරන එක හරි. නිත්‍යානුකූලව ආඥා පණත අනුව තමයි වෙන්නේ. නමුත් හැබැයි පසුගිය වකවානුව තුළ ඔබතුමා මෙය මේවා කළාට මන්ත්‍රීවරු නම් කළා. නමුත් නිලධාරීන් නම් වුණේ නැහැ. අදටත් මේ සභා වාර් තා දෙක අරගෙන බලන්න. මෙකේ මෙන්න මෙවායි ගැටළු කියන්නේ. 08.06 තමයි අපේ මන්ත්‍රීවරු ටික ඔබතුමා පත්කළා. එතනදී උපදෙස් දුන්නා නිලධාරීන් පත්කරලා මේ කමිටුව ඉදිරියට ගෙන යන්න. නිලධාරීන් ටික පත් කරන්න කියා. ඊළඟ සභාවට ඉදිරිපත් කරනවා කියා ආවා. නමුත් 09.03 එකෙත් එක නැහැ. ඕක හොඳයි . ඔබතුමා කියන විදියට යම් ව්‍යාපෘතියක මූල්‍ය පැත්තේ යම් කර් මාන්තයක ඒ වගේම වෙනත් මූල්‍ය සම්බන්ධ තිබෙන මෙවාගේ උපදෙස් ලබා දීම සඳහා කටයුතු කරන්න තමයි එය තිබෙන්නේ. මන්ත්‍රීවරු සහභාගී වෙලා ඒ දැනුම තිබෙන කට්ටිය සහභාගී කරවා නිලධාරීන්ගේත් ඒ දැනුම තිබෙන එවා අරගෙන කරන්න තමයි අපි මේ කළේ. අපි බලාපොරෝත්තු වෙන්නේ එක තමයි. විනිවිදභාවය තුළ ඔබතුමාත් අපි දන්නවා ඒ අනුව කටයුතු කරන නිසා කලින් කරපු මේවා ටික පත් වුණු නැති නිසා තමයි මන්ත්‍රීවරු ටික නම් කළා ඔබතුමා. නමුත් නිලධාරීන්ගේ පැත්තෙන් නිලධාරීන් පත් කරලා මේ කාරක සභා මේ මූල්‍ය ස්ථාවර කාරක සභාව එක දවසක්වත් කැදෙව්වේ නැහැ. ඕක තමයි වෙලා තියෙන්නේ. එකනිසා තමයි අපි කිවුවේ මෙය කැඳ වෙන්නේ නැති නිසා මූල්‍ය කමිටුවට ඕවා ඉදිරිපත් කරන්න. ඉදිරිපත් කළාම අපි මේ ගෙවීම් වලට කර් මාන්ත වලට මොකකටවත් විරුද්ධ වේනනේ නැහැ. මේ ගෙවීම් සම්බන්ධව මේ අලුත් මන්ත්‍රීවරු මොනවා හරි ගැටළුවක් ආවාම මේ සභාවේ අත ඔසවපු මන්ත්‍රීවරු එයට වග කියන්න ඕනේ. ඔබතුමා එක දන්නවා. මතකද එඬෙරමුල්ලේ අයකර ගැනිමට ආවා එක්ලක්ෂ ගණනක් . එකයි මා කියන්නේ . අපි සියළු දෙනාම බේරෙන්නත් ඕන. අපේ කර් මාන්තය කෙරෙන්නත් ඕන. මේක

විනිවිදභාවයෙන් කෙරෙන්නත් ඕන. එක නිසා තමයි අපි මේවා ඉදිරිපත් කරන්නේ. මුල්‍ය කමිටුවට අවාම අපි ඒවා බලා නිවැරදි කරන්න ඕන නම් නිවැරදි කරලා ඒ සහායෝගය ඊට ලබා දෙනවා. මේ අපිට කාගේවත් මුදල් නතර කරන්න එකට නෙමේ. එක නිසා මා ඔය ප්‍රශ්නය ඇහුවාම මුල්‍ය කමිටුවට ඉදිරිපත් කළා ද කියා ඔබතුමා එක මෙවා එකක් කළා. මා ඡන්දය විමසන්න කිවුවේත් නැහැ. මොකද අපි කැමති නැහැ. වැඩක් කරලා මනුස්සයකුට මුදල් නොගෙවා ඉන්න. හැබැයි ගෙවීම පිළිබඳ මේ සියළු මන්ත්‍රීවරුන්ට ඒ හැඟිම ඇවිත් යන්න ඕනේ. එය නිත්‍යානුකුල වෙන්න ඕනේ. ඔබතුමාටත් අපි පෙන්වා දෙන්නේ. සමහර විට ඔබතුමාගේ රාජකාරිත් එක්ක ඕවා එකින් එකවත් බලන්නේ නැහැ. මා දන්නවා ඔබතුමා සමහර එවා ටක් ගලා අත්සන් කරනවා. දැන් මේ ගිණුම් එකෙත් තිබෙනවා පොඩි දෙයක් . නමුත් එහි තුලනය විමේදි වෙනස් වෙනවා. මා පෙන්වන්නම් ඕන නම් එය. අන්න එකයි කියන්නේ. දැන් නිලධාරින්ට ඕන තරම් වැරදි වෙන්න පුළුවන්. ඒ නිලධාරින්ගේ වැඩ කටයුතු කරන කොට ඒ රාජකාරි බහුලත්වය තුළ එය වෙනවා. ඒ වෙනකොට අපි අවාම මගේ මතයට වඩා තව මන්ත්‍රීවරයෙකුගේ මතය හරි. නිලධාරියෙකුගේ මතය අපි ගලප්පලා අපි ගෙවන්න ඕන. ගෙවන ක්‍රමවේදය නිත්‍යානුකුල වෙන්නායි ඕනේ. එතකොට මේ ආඥා පණත තුල මේ ස්ථාවර කාරක සභාව දැන් ඔබතුමා බලන්න ඇතිනේ. එමනිසා මේක තුළ තිබෙන මේ ගැබ් වෙච්ච දෙය මේ සභාව තුළ වුණේ නැහැ. මුල්‍ය ස්ථාවර කාරක සභාව කියන්නේ එකක්. මුල්‍ය කමිටුව කියන්නේ තව එකක්. ඉතිං ඔබතුමා පත් කළා එකට. මෙකේ තිබෙනවා පත් කරන ලද නාමලේඛණයන් තිබෙනවා. 08.06 එකේ. නමුත් එහි ඔබතුමා උපදෙස් දිලා තිබෙනවා. නිලධාරි මණ්ඩලය පත් කරලා මෙය කරගෙන යන්න කියා. ඉතිං එක වෙලා නැහැ. මා දන්නේ නැහැ ලේකම්තුමිය මොකද මන් දන්නේ නැහැ . මෙතුමිය හිටයාද දන්නේත් නැහැ. ඔන්න ඔකයි වුණේ. එක නිසා වෙන්නේ අර කොන්ත්‍රාත් හරි මොනවා හරි ව්‍යාපෘතියක් හරි කරපු මනුස්සයාට මුදල් ගෙවන්න බැරි වෙනවා. අපිත් එය පිළි ගන්නවා. අපිට එක හරි ගැටළුවක්. මොකද ඒ මිනිසුන් මුදල් වියදම් කර පොළියට ගෙන වැඩ කරලා ගෙවා ගන්න බැහැ. හැබැයි අපිටත් අත ඔසවන්න බැහැ. මේක නිත්‍යානුකුල ද කියා ගොණුව බලනකම් අපිටත් පොඩි ගැටළුවක් තිබෙනවා. මෙකේ වැඩ කෙරෙන ආකාරය දිහා බැලුවාම. මේක පත්කරන්න කිවුවාම අදාළ මන්ත්‍රීවරු පත් කළාම. මටනම් මේ මුල්‍ය පිළිබඳ ස්ථාවර කාරක සභාවට එන්න කියා ලියුමක්වත් එවා නැහැ. එකනේ මෙතන මේ ගැටළුව තිබෙන්නේ. එකයි කියන්නේ. මේක දෙකක්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මුල්‍ය කමිටුව වශයෙන් තමයි රැස් වුණේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක තමයි මේ පණත අනුවයි මේකයි දෙකක්. ඔබතුමා එහෙම ඕක කියනවා නම් ඔය ගොණු ටික මුල්‍ය කමිටුවට ආවා නම් ඕක වෙන්නේ නැහැ. ඔබතුමාත් අසීරුතාවයට පත් වෙන්නේ නැහැ. අපිත් අසීරුතාවයට පත් වෙන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙකේ නිවැරදි විදියට අපි බලය පවරපු විදියට තමයි අපි වෙනදා කළේ. සැපයුම් සම්බන්ධව විතරයි මුල්‍ය කමිටුව පත් කර තිබුණේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක හරි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ විදියේ කමිටුවක් කලින් තිබුණේ නැහැ. මේ කමිටුවට බලතල දෙකම දෙනවා. කර් මාන්ත සහ සැපයුම් බලතල දෙකම දෙනවා. ලක්ෂ 5 තිබුණ එක ලක්ෂ 15 දක්වා වැඩි කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා කියන කතාව හරි. මේ නිලධාරින් වශයෙන් පත් කරලා මෙය නිත්‍යානුකූල වශයෙන් ගියා නම් මන්ත්‍රිවරු වුණත් හරි අපහසුතාවයට පත් වෙනවා. දැන් මේක. ඡන්දයක් විමසු පසු පැරදුනාම හරි නැහැනේ එක. එක තමයි අපි කියන්නේ. ඔබතුමාට විරුද්ධව යන ඔබතුමාට

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. මන්ත්‍රීතුමා , කිසිම ගෙවීමක් මාගේ පෞද්ගලික ගෙවීමක් නෙමේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

පෞද්ගලික කියා අපි කියන්නේ නැහැනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එකනිසා ඔගොල්ලන්ට මෙයට පක්ෂ වෙන්නත් පුළුවන්. විපක්ෂ වෙන්නත් පුළුවන්. මට එක ගැටළුවක් නැහැ. මා මෙහි කොන්ත්‍රාත් කර නැහැ. එච්චරයි

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා කොන්ත්‍රාත් කළා කියා අපි කිවුවේ නැහැනේ. ඔබතුමාට අවතක්සේරුවට අපි කිවුවේ නැහැ. නමුත් මේ නගර සභාවේ පොදු වැඩ කරන්නේ. ඒ කරන කොට නගර සභාවේ මුදල් වියදම් කරන කොට අපේ නිත්‍යානුකූල තත්ත්වයට මන්ත්‍රීවරුත් බේරා යන්න ඕනේ. ඒ යන්න ඕන . ලේකම්තුමියක් දි තිබෙන්නේ. එකනේ රීතිය පිළිබඳ ප්‍රශ්නයක් නැගුණොත් අපි අසා නිරාකරණය කර ගන්නේ. එකනිසා තමයි අපි කියන්නේ මේ සියළු දේ මේ යන ආකාරයට හරියාකාරව යන්න. මන්ත්‍රීවරු මුල්‍ය කාරක සභාවේ ඉන්නවා නම් හරියට කැඳවා මේ ටික ඉදිරිපත් කර ඒ විදියට යන්න කියන්නේ. නැතිනම් මොකක්ද වෙන්නේ අපිටත් පුළුවන් ඕකට විරුද්ධ වෙලාම යන්න. අපි එක බලාපොරෝත්තු වෙන්නේ නැහැ. ඔකට විරුද්ධ වෙලා ඡන්දය විමසා අපි එය බලාපොරෝත්තු වෙන්නේ නැහැ. හැබැයි ඒ කියන විදියට යනවා නම් ඔබතුමා අපි ඒ සහායෝගය දුන්නේ ඒ නිසායි. දැන් එතන වුණේ ගැටළුව එකයි. මේ මුල්‍ය ස්ථාවර කාරක සභාව කියන්නේ එකක්. මුල්‍ය කමිටුව කියන්නේ එකක්. ගොණුව ඇවිත් එතකොට අපිට බලන්න පුළුවන් හරියට වෙලාද . නිලධාරින්ගේත් අතපසු වීම් වෙනවා. ඒවා මේවා කරගෙන යන්න පුළුවන්. මෙක තුළ අපේ සභාවේ ගරුත්වය ඔය සියළු දේ ආරක්ෂා වෙලා යනවා කියන එක තමයි මා කියන්නේ. ඔය සියළු දේ මන්ත්‍රීවරුන්ගේ නම්ටික තිබෙනවා මේකේ. 08.06 ඔබතුමාම තමයි පත්කර තිබෙන්නේ. 08.06 මෙහි තිබෙනවා පිටු අංක 122 ( ඇ ) තිබෙනවා. මුදල් පිළිබඳ කාරක සභාව

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක තමයි මෙච්චර කල් රැස් වුණේ. මන්ත්‍රීතුමා මාගේ ගාව වාර් තාව තිබෙනවා. මෙකේ කියා තිබෙනවා. 29 මේවා කරන්න. ( අ ) නගර සභාවේ වාර්ෂික ආදායම් ඇස්තමේන්තු සියළු ආදායම් ප්‍රභව මාසිකව අධ්‍යනය කර වාර් තා පිළියල කිරිම. අම්බලන්ගොඩ වාර් ෂික අයවැය

සම්බන්ධයෙන් පරික්ෂා කර සෙසු නියම කර සභාවට ඉදිරිපත් කිරිම. නගර සභා අරමුදලට අදාල ආදායම් වියදම් ඇස්තමේන්තු වලට ඇතුළත් පුනරාව ර්තන වියදම් සම්බන්ධයෙන් රුපියල් ලක්ෂ 5 දක්වා වියදම් ගෙවිමට සභාවට අදාලව බලය ලබා දිම. නගර සභාවේ ප්‍රසම්පාදන කාර් යේ භාණ්ඩ ලබා ගැනීමේ ලක්ෂ 3 දක්වා ප්‍රසම්පාදන ටෙන්ඩර් වලට අදාල ප්‍රසම්පාදන සලකා ප්‍රතිග්‍රාහකයන් තීරණය කිරිම කියන කාරණා වලට තමයි බලය පවරා තිබෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

නැහැ. සභාපතිතුමා එක හරි. දැන් මේක පත් කළා. මේ කමිටුවට නිලධාරින් වත් පත් කරලා නැහැ. ඊළඟ මේවා එකේ. මෙකේ තිබෙනවා උපදෙස්. එම කමිටුවේ සාමාජිකයන් ලෙස ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා , ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම, ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් , ගරු නගර සභා මන්ත්‍රී එස.එම්. සරත් චන්ද්‍ර මහතා ඒ වගේ කියලා ඉවර වෙලා කියනවා බැවින් සභිකයන් ගණන සම්පුර්ණ කිරිමට නිලධාරින්ට බලය පවරා ලබන සභාවට ඉදිරිපත් කිරිමසුදුසු බවටත් ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා යෝජනා කරන ලදී. මෙකේ මේවා අපිට ප්‍රශ්න ගැටළුවක් නෙමේ. මේ වගේ ඉදිරිපත් කරන්න. ඒ ගොණු ටික බලන්න. එ අනුමැතිය ගන්න තිබෙන එවා අපි සියළු දෙනා සාකච්ඡා කර එය මේවා කරගෙන යන්. නැත්නම් වෙන්නේ මෙහෙමයි. මන්ත්‍රිවරුන්ටත් හරි ප්‍රශ්නයක්. මන්ත්‍රිවරුන්ගේ ගම්වල වැඩ කරලා මුදල් ගෙවුවේ නැති වුණාම මේ යකා ගිහින් කියනවා මෙන්න මේකට මුදල ගෙවුවේ නැහැ. මෙන්න මේ අහවලා තමයි ලෙඩේ දැම්මේ. එක වෙන්න බැහැ. කිසිම මන්ත්‍රිවරුයෙකුට එ ගරුත්වය ආරක්ෂා වෙලා තිබෙන්න ඕනේ. අපි කියන්නේ එක. මන්ත්‍රිවරුන්ගේ ගරුත්වය ආරක්ෂා නොවෙනවා නම් මා නම් මොනම දෙයකට වත් මගේ මේවා එක නැහැ. එකයි කියන්නේ. හොඳයි පත් කරපු එක. ඒ විදියට කරගෙන යන්න. අපි කිසි ගැටළුවක් නැහැ. ලක්ෂ 15 දක්වා එය කරගෙන යන්න කියා ඉල්ලා සිටිනවා. නැතිනම් වෙන්නේ මේ ප්‍රශ්න ගැටළු රාශියක් ඇති වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපි ඔය නීති රිති ඔක්කොම අරගෙන අපිට නගර සභාවට කොන්ත්‍රාත් කරන්න කියා නගර සභාවට කොන්ත්‍රාත් කරන්න කොන්ත්‍රාත් කරුවන් කී දෙනාද ඉන්නේ. අපිට වැඩක් කර ගන්න කොන්ත්‍රාත්කරුවෙකු නැහැ. අපිට එක එක්කෙනා පස්සේ යන්න ඕනේ. හොයන්න නැහැ. එක්කෙනායි දෙන්නායි ඉන්නේ ඕන වැඩක් කර ගන්න කියා නගර සභාවට . ඒ

මිනිසුනුත අමාරුවෙන් වැඩ කරන්නේ. මට නම් තෙරෙන්නේ නැහැ. සභාපතිතුමාට තෙරෙනවාද කියා. ලොකු ලාභත් නැතුව ඇති. මාගේ දැනිමේ හැටියට . ඔය කරන අයට. ඉතිං ඒ අයගේ ගෙවීම් පරක්කු වෙනවා කියන්නේ ඒ අයගෙන් ඊළඟට අපිට වැඩක් කර ගන්න බැරි වෙනවා. එමනිසා අපි හැමෝම එකතු වෙලා ක්‍රමවෙදයක් හදා ඉක්මනට ඒ අයට ගෙවා ඒ අය සතුටු කරලා කරන ක්‍රමවේදයක් හදා ගන්න ඔනෙ. නැතිනම් ඉස්සරහාට වැඩ කරන්න බැහැ. දැන් අපි ටෙන්ඩර් කළා. මොකද වුණේ. කී දෙනෙක් දැම්මාද ටෙන්ඩර්. කී දෙනෙකුට අපිට පාරක ටෙන්ඩරයක් දි ගන්න පුළුවන් වුණාද ? අපිට එකක්වත් දි ගන්න බැරි වුණානේ. ටෙන්ඩර් කරලා මොකද වුණේ. නිකං ඒ මිනිසුන් ඇවිත් කතා කරලා ගියා. අපේ කාලයත් නිකං නාස්ති වුණා. එක ටෙන්ඩරයක් අපිට දි ගන්න බැරි වුණා. කෙහොම හරි අපේ මේ ඉන්න හතර පස් දෙනෙක් තමයි ගැට ගහගෙන අපේ මේ තිබෙන වැඩ ටික කරන්නේ. ඒ අයට හරියට මේ ගෙවිම් ටික ගෙවා ගෙන දැන් මේ මන්ත්‍රිතුමා කිවු විදියට ඒ අයත් දෙනවා සහායෝගය . හැමෝම එක්ක එකතු වෙලා මෙය කරගෙන යන්.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මන්ත්‍රිතුමා මට මේ කොන්ත්‍රාත්කරුවන් අපහසුතාවයට පත් කරන්න මට ඕන කමක් නැහැ. මට කොන්ත්‍රාත්කරුවන් අවාත් එකයි. එක වෙනම කතන්දරයක්. අපි මන්ත්‍රිවරු හැටියට අපි වියදම් කරනකොට අපි නිත්‍යානුකුල වෙන්න ඕනේ. කොන්ත්‍රාත්කරු කරනවා නම් කරයි. නැතිනම් නිකං ඉදියි. එක වෙනම කතන්දරයක්. එහෙමනම් ටෙන්ඩර් කර යන්න ඔනේ. කොන්ත්‍රාත්කරුවන්ට සාධාරණයක් ඉටු වෙන්න ඕනේ. ඉටු වෙන්න ඔනේ නම් එකනේ මේ පණත් වලින් දිලා තිබෙන්නේ. ඔයාට ඕන නම් පණත අවලංගු කරගෙන කර ගන්න. එක වෙනම කතන්දරයක්.

<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

නැහැ මා කිවුවේ නැහැ නිත්‍යනුකුල නොවන ලෙස කරන්න කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මේ අහන්න. ව්‍යාපෘතියක් කරනකොට ඒ යෝජනා ඇවිත් ඇස්තමේන්තු ඇවිත් ක්‍රමානුකුලව තිබෙනවා නම් කිසි දිනයක පරක්කු වෙන්නේ නැහැ. ඒක තමයි මේ කියන්නේ. අපි කිසිම

කෙනෙකු සමඟ එහෙම අමනාපයක් නැහැ. අපි කියන්නේ මෙය නිත්‍යානුකූලව කරගෙන යන්න. අපේ සියළු සහායෝගය මෙතෙක් දීලා තිබෙනවා. ඒ විදියට අපි දෙනවා. දෙනවා නම් මන්ත්‍රිවරුන්ගේ මේ අත ඔසවන ගෙවීමට සාධාරණ විදියට නිත්‍යානුකූල වන විදියට ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුයි. එච්චරයි කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

මෙතෙක් පැවති පිඩාකාරි තත්ත්වයන් නැති කරමින් ගරු ආණ්ඩුකාරතුමන්ගේ සාකච්ඡාවට අනුව මේ සහනශිලි බව පිළිබඳ අප සතුටු විය යුතුයි. අපේ කොන්ත්‍රාත්කරුවන් අපි බොහොම අපහසුවෙන් සොයා ගන්නේ. ඔවුනට විඳින්නට සිදුවූ මේ ගෙවිම් පමාවිම් මා හිතන්නේ මේ නව කාරක සභාවෙන් නැති වි යනවා. එමනිසා මේ ගෙවිම් පිළිබඳ කඩිනමින් ඔවුනට සහාන සලසා කඩිනමින් සැලසිම ගැන අප සතුටු වෙනවා. ඒ වගේම මින් ඉදිරියට මේ ස්ථාවර කාරක සභාවේ කටයුතු සාර් ථක කර ගැනිමට හැකිවේවා කියා ප්‍රාර් ථනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා නම් පලමුව ස්තුති වන්ත වෙනවා. සභාවේදි ඇතිවූ ගැටළුවක් නිසා නවක මන්ත්‍රිවරුන් වශයෙන් අපි යෝජනාවක් කළා. මේ මුදල් වියදම් කරන සියළුම දේවල් මූල්‍ය කමිටුවට යොමු කරලා මුල්‍ය කමිටුවේ අධික්ෂණ කටයුතු වලින් පසු සභාවේ අපි අනුමැතිය දෙනවා කියා. මොකද අපි අලුත් මන්ත්‍රිවරු අපි දන්නේ නැතුව වියදමක් සම්මත කළහොත් සමහර විට ඔබතුමා සභාපති වශයෙන් ඉන්නත් පුළුවන් නොසිටින්නත් පුළුවන් අපි මන්ත්‍රිවරු වශයෙන් ඉන්නත් පුළුවන් නොසිටින්නත් පුළුවන්. ගෙදර ගිහිනුත් මේවා ගෙවන්න වෙනවා. කොන්ත්‍රාත් කරන අය මා දන්නවා කොන්ත්‍රාත් කරන්නේ රත්තරං බඩුටික උකසට තියා , පොළියට මුදල් අරගෙන එහෙම තමයි කරන්නේ. ඒ මිනිසුන්ට අපි ආදරේයි. කොන්ත්‍රාත්කරුවන්ගේ මුදල් ඉක්මනට ගෙවන්න ඕනේ. දැන් මේ ගනිපු තීරණය හරියට ක්‍රියාත්මක කරන්න . මොකද මේ ඔක්කොම වියදම් ඔබතුමලා දරන වියදම්. පුනරාවර්තන වියදම් , කර් මාන්ත වියදම් සියළුම වියදම් මුල්‍ය කමිටුවට දමන්න. මුල්‍ය කමිටුවට මන්ත්‍රී මණ්ඩලයක් සම්මත වෙලා තිබෙනවා. අනුමත කර ගන්න. මේක විශාල ගැටළුවක් විසඳා ගැනිමක් ඔබතුමා. එකයි අපි ගියවර යෝජනා කළේ මෙය මුල්‍ය කමිටුවට දමා විසඳා ගන්න කියා. මේ දැන් එක හරියට ක්‍රියාත්මක කරන්න. ඊළඟ වියදම්වලට කිසිම ගැටළුවක් වෙන්නේ නැහැ. ඔතන මුල්‍ය කමිටුව අනුමත කර තිබෙනවා මෙය ගෙවන්න කියා . එගොල්ලන් හොඳට බලා තමයි මෙය

ගෙවන්න කියන්නේ. නවක මන්ත්‍රීවරු වෙච්ච අපිට ප්‍රශ්නයක් නැහැ. අපි මුල්‍ය කමිටුවට කියා තිබෙනවා නම් මෙය ගෙවන්න කියා . අපේ අනුමැතියත් ඔබතුමාට දෙනවා. ඔබතුමා සමඟ පුද්ගලික තරහාක්වත් කොන්ත්‍රාත්කරුවන් එක්ක තරහාක් වත් නෙමේ. සභාව බොහොම ලස්සනට කරගෙන ගිය සභාව. මොකද එක කෙරේන්න ඕන ක්‍රමයට යන්නේ නැති එකයි මේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. මේ කළයුතු ලේහෙසිම ක්‍රමයක් තියාගෙනනේ දැන් මෙය අවුල් කර ගත්තේ. දැන් ගියවර ලක්ෂ 15 වියදම් ගොඩක් අනුමත වුණෙ නැහැ. මොකද අපි දන්නේත් නැහැ. මේක කිවුවාම. අපිට හැමදෙයටම අත ඔසවන්න බයයි. මොකද අපිටත් ඕවා ගෙවන්න වෙනවානේ. මොනවා හරි වුණොත් මන්ත්‍රීවරු වශයෙන්. එමනිසා ඔබතුමා ලොකු ගැටළුවක් විසඳුවේ. දැන් ඉදිරියට කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඔබතුමා අදාල වියදම් ටික මුල්‍ය කමිටුවට දමා අනුමැතිය දෙන්න. අපි අර සෞඛ්‍ය කමිටුව, ක්‍රිඩා කමිටුව ඔක්කොම අනුමත කරනවානේ. කවුරුත් විරුදධ වෙන්නේ නැහැනේ . ලොකු දෙයක් මෙය කිරිම ගැන. බොහොම ස්තුතියි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

බොහොම ස්තුතියි. මිළඟට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මන්ත්‍රීවරු 10ක් අත්සන් කරලා. ගරු උප සභාපතිතුමාට ඉදිරිපත් කරන්න කියා.

**තීරණය -**

2021 වර්ෂයේ අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් වලට ඇතුළත් වන ළමුන් සඳහා ටීෂර්ට් හා නිල ඇඳුම් කට්ටල 200ක් ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.02 ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව**

**05.02.01 සුනාමි ව්‍යසනය හේතුවෙන් දැනට පල්ලෙතොට රතුකුරුස නිවාස සංකීර්ණයේ පදිංචිව සිටින පාසල් යන දරුවන් හට නගර සභාවෙන් නොමිලයේ ලබාදෙන අභ්‍යාස පොත් ලබාදෙන ලෙස කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සුනාමි ව්‍යසනය හේතුවෙන් දැනට පල්ලෙතොට රතුකුරුස නිවාස සංකීර්ණයේ පදිංචිව සිටින පාසල් යන දරුවන් හට නගර සභාවෙන් නොමිලයේ ලබාදෙන අභ්‍යාස පොත් ලබාදෙන ලෙස ගරු සභාවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එය ස්ථිර කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මේ පල්තොට ජීවත් වෙන්නේ පටබැඳිමුල්ල , හිරේවත්ත ප්‍රදේශයේ ජීවත් වන්නේ සුනාමි ව්‍යාසනය නිසා පදිංචි වෙච්ච ධිවර කර්මාන්තයේ නියැලෙන ඉතාමත් අසරණ තත්ත්වයේ සිටින පවුල් 55ක් පමණ තමයි මේ ප්‍රදේශයේ ජීවත් වෙන්නේ. ඒ නිසා මා කොට්ඨාශ මන්ත්‍රීවරයා වශයෙන් මා ළඟම සිටින මන්ත්‍රීවරයා වශයෙන් නිතරම පැමිණ කියන්නේ මේ පොත්ටික ලබා දෙන්න කියා. එකනිසා ළමයින් 42ක් 43ක් කොහේ ඉන්නේ. එමනිසා ඒ පොත්ටික ලබා දෙන්න. අම්බලන්ගොඩ ප්‍රදේශයේ ජීවත් වන පුද්ගලයන් වශයෙන් ඒ පොත්ටික ඒ ළමයින්ටත් ලබා දෙන ලෙස මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව විශේෂයෙන් මතක් කළ යුතුයි. මට මෙහෙම ගැටළුවක් ආවා. රතු කුරුස නිවාස සංකිර්ණයේ මගේ ඥාතින් සිටින විට මා කොළය දෙන්නේ නැහැ. මට කොළ මදිනිසා උප සභාපතිතුමා කොළ දි තිබුණා. ප්‍රායෝගිකව පවුල් අතර ගැටුම් නැහැ. ඉතිං එතන ලොකු ගැටළුවක් වෙනවා. මොකද නගර සභා බල ප්‍රදේශයෙන් පිට දිපු එක. එකත් මා මේ සභාවෙන් කතා කළේ නැහැ. මා කියන්නේ ප්‍රායෝගික ගැටළුවක් ඕක. අම්බලන්ගොඩ මුහුදුකරයේ මිනිසුන් ගොඩක් ඉන්නේ. මොකද මුදල් තිබෙන මිනිසුනුත් නෙමේ. ඉතිං ඒ පොත්ටික ලබා දීම සම්බන්ධව මාත් එකඟ වෙනවා. අපේම අම්බලන්ගොඩ නගරවාසින් . සුනාමි ව්‍යාසනය නිසා අවතැන් වෙච්ච අය. එමනිසා ඒ පොත්ටික ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඕක එකමතිකව සම්මත කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

විරුද්ධ නැහැනේ කවුරුවත්. එකමතිකව සම්මත කරනවා. අපි හැමදාම දුන්නා. ඒ සම්බන්ධව ස්තුති වන්ත වෙනවා.

**තීරණය**

සුනාමි ව්‍යසනය හේතුවෙන් දැනට පල්ලෙතොට රතුකුරුස නිවාස සංකීර්ණයේ පදිංචිව සිටින පාසල් යන දරුවන් හට නගර සභාවෙන් නොමිලයේ ලබාදෙන අභ්‍යාස පොත් ලබාදීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

06. කාරක සභා වාර්තා සම්මත කිරිම

**06.01 2020.11.12 දින පැවති මූල්‍ය කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

**2020.11.12 දින පැවති මූල්‍ය කමිටු වාර්තාව යෝජනා කරනවා.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

**එම යෝජනාව ස්ථිර කරනවා.**

**තීරණය**

2020.11.12 දින පැවති මූල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය

06.02 2020.11.20 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව සභාගත කිරිම.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.11.20 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව **යෝජනා කරනවා.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

**එම යෝජනාව ස්ථිර කරනවා.**

**තීරණය**

2020.11.20 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය

**06.03 2020.11.23 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.11.23 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

**එම යෝජනාව ස්ථිර කරනවා.**

**තීරණය**

2020.11.23 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය

**06.04 2020.11.23 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.11.23 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

**එම යෝජනාව ස්ථිර කරනවා.**

**තීරණය**

2020.11.23 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය

**06.05 2020.11.18 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.11.18 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

**එම යෝජනාව ස්ථිර කරනවා.**

**තීරණය**

2020.11.18 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම් ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය

**06.06 2020.1118 දින පැවති ක්‍රිඩා කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.11.18 දින පැවති ක්‍රිඩා කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය කතා කරමින්</u>**

**එම යෝජනාව ස්ථිර කරනවා.**

**තීරණය**

2020.1118 දින පැවති ක්‍රිඩා කමිටුවේ කමිටු  වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය

**06.07 2020.11.20 දින වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලබන කමිටු වාර්තාව සභාගත සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2020.11.20 දින පැවති වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලබන කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>

**එම යෝජනාව ස්ථිර කරනවා.**

**තීරණය**

2020.11.20 දින වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලබන කමිටුවේ කමිටු  වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය

**07.** ටෙන්ඩර් හා මිළ ගණන්

07.01. ටෙන්ඩර්

07.02 මිළ ගණන්

07.02.01 කාර්යාලයේ ඉහළ මහලේ සිවිලිම ගැසීම සඳහා මිළ ගණන් සභාගත  කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වර්ගය | ෂෙහාන් බිල්ඩර්ස්(රු) | සියත ප්‍රදර්ශනාගා-රය(රු.) | STK බිල්ඩර්ස්(රු.) |
|---|---|---|---|---|---|---|
| 01 | කාර්යාලයේ ඉහල මහලේ සිවිලිම් | වර්ග අඩි 3625.00 | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ගැසීම සඳහා | | I Panal | 1087500/- | 996875/- | 989625/- |
| 02 | කාර්යාල පරිශ්‍රෙයන් පිටත පලංචි යොදාගෙන සවින ල යුතු(අගුව) | වර්ග අඩි 700.00 | I Panal | 217000/- | 196000/- | 204400/- |
| 03 | 18 w Led Panel light | 35 | Orange 2 years warranty | 57750/- | 57750/- | 55125/- |
| 04 | K.D.K.වර්ගයේ විදුලි පංකා සපයා සම්පූර්ණ අයිතම සමග සවි කිරීම | 15 | K.D.K. 2 years warranty | 142500/- | 139350/- | 138000/- |

**තීරණය**

කාර්යාලයේ ඉහළ මහලේ සිවිලිම ගැසීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු, නගර සභාවේ පරිපාලන නිලධාරී, තාක්ෂණ සේවා නිලධාරීන්ගෙන් සමන්විත තාක්ෂණ ඇගයීම් කමිටුවක් මගින් ලැබෙන නිර්දේශ මත තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

## 07.02.02 කාර්යාලයේ ඉහළ මහල නවීකරණය කිරීම සඳහා මිළ ගණන් සභාගත කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වර්ගය | J.N.Interiors Colombo 10 (රු) | $O_2$ Interiors Mattakkuliya (රු.) | ෂෙහාන් බිල්ඩර්ස්(රු.) | |
|---|---|---|---|---|---|---|---|
| 01 | ගොඩනැගිල්ලේ පලමු මහලය පවත්නා බිම් සැලැස්ම අනුව ආයතනය විසින් යෝජනා කරනු ලබන අභ්‍යන්තර ව්‍යුහ සැලැසම නවීන පන්නයෙන් නිමකිරීම | | | 90000/- | 95000/- | - | 100000/- |
| 02 | කාර්යාලයේ බිම කාපට් කිරීම | 3400 | | 544000/- | 677880/- | 1522500/- | 620100/- |
| 03 | කාර්යාලය පාටිෂන් කිරීම | | | 971150/- | 1074225/- | 1554500/- | 1002416/- |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 04 | යෝජිත සැලැස්ම අනුව ගෘහ භාණ්ඩ සැපයීම වැට් 8% | | | 1108750/- | 1324250/- | - | 1307125/- |
| | එකතුව | | | 2931012/- | 3171355/- | 3077000/- | 3029641/- |
| | මුදල් ඇපකරණය | | | HNB Bond | | මුදල් ඇපයක් තබා ඇත | |

**තීරණය**

කාර්යාලයේ ඉහළ මහල නවීකරණය කිරීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු, නගර සභාවේ පරිපාලන නිලධාරී සහ තාක්ෂණ නිලධාරීන්ගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් ලැබෙන නිර්දේශ මත තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.03 විෂබීජනාශක දියර සැපයීම සඳහා මිළ ගණන් සභාගත කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | නෙත්සර කුලීගොඩ | තරු සේල් සෙන්ටර් | නයනරංජන සේල් පොල | අතුල කලර් හවුස් |
|---|---|---|---|---|---|---|
| 01 | විෂබීජනාශක දියර ලීටර් 04 කෑන් සඳහා (sanitizer) | | Britol 3150/- | 3000/- 5 l shine | Flora 4000/- | Jet 3360/- |

**තීරණය**

විෂබීජනාශක දියර සැපයීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අම්බලන්ගොඩ, තරු සේල් සෙන්ටර්හි මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.04 නගර සභා කාර්යාලීය ඉහල මහලේ අලුත්වැඩියාව සඳහා මිළගණන් සභාගත ලදී.**

| අංක | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | | | සියත |
|---|---|---|---|---|

| ය | | ප්‍රමාණය | වර්ගය | ප්‍රදර්ශනාගාරය(රු) |
|---|---|---|---|---|
| 01 | දිග අඩි 05 අඟල් 09 ෂීට් | 16 | IROOF | 42008/- |
| 02 | දිග අඩි 07 අඟල් 11 ෂීට් | 20 | IROOF | 71200/- |
| 03 | දිග අඩි 10 අඟල් 01 ෂීට් | 24 | IROOF | 107868/- |
| 04 | දිග අඩි 12 අඟල් 03 ෂීට් | 78 | IROOF | 426933/- |
| 05 | දිග අඩි 16 අඟල් 06 ෂීට් | 18 | IROOF | 132966/- |
| 06 | දිග අඩි 13 අඟල් 08 ෂීට් | 08 | IROOF | 49128/- |
| 07 | ෂීට් වහලේ මුදුන ආවරණය කිරීම සඳහා එම තහඩු සඳහාම නිපදවූ (top rige) (අඩි 3 දිග) | කැට 30 | IROOF | 27000/- |
| 08 | ෂීට් වහලේ මූලත් පරාල යෙදෙන (hip rage) ආවරණය සඳහා නිම වූ කැට | කැට 72 | IROOF | 54000/- |
| 09 | විශේෂිත ගැල්වනයිස් වොෂර් සහ බ්‍රැකට් සමග අඟල් 3 ඇණ(ඉල්ලුම් කර ඇති ෂීට් සඳහාම සකසන ලද) | 3500 | IROOF | 133000/- |

**තීරණය**

නගර සභා කාර්යාලීය ඉහල මහලේ අලුත්වැඩියාව සඳහා (පොලිමර් සෙවිලි තහඩු හා ඊට අවශ්‍ය අනෙකුත් අයිතම සැපයීම) ආයතන 03 ක් විසින් ලංසු අයදුම්පත් ලබාගෙන ඇතත් ඉදිරිපත් කර ඇත්තේ එක් ලංසු අයදුම්පතක් බැවින් එය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ සිටින දිස්ත්‍රික් ඉංජිනේරුතුමා, නගර සභාවේ තාක්ෂණ සේවා නිලධාරී සහ නගර සභාවේ පරිපාලන නිලධාරිණියගෙන් සමන්විත තාක්ෂණ ඇගයීම් කමිටුවක් මගින් ලැබෙන නිර්දේශ මත තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.05 මානාන හා කළුවඩුමුල්ල ක්‍රීඩාංගන සඳහා 300 W – LED විදුලි බල්බ ලබාගැනීම සඳහා මිළ ගණන් සහාගත කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ | ප්‍රමාණය | වර්ගය | ශ්‍රී නයින | Isiwari | Oneemto |
|---|---|---|---|---|---|---|

| | විස්තරය | | | ඉලෙක්ට්‍රිල් | Enterprises | (pvt)itd |
|---|---|---|---|---|---|---|
| 01 | 300w LED විදුලි බල්බ | 30 | COBRA | 18800/- (COBRA) | 17500/- (Oura 300w) | 20900/- (Oura 300w) |

**තීරණය**

මානාන හා කළුවඩුමුල්ල ක්‍රීඩාංගන සඳහා 300 W – LED විදුලි බල්බ ලබාගැනීම සඳහා පරිපාලන නිලධාරී, තාක්ෂණ නිලධාරී, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා යන ගරු මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් සාම්පල් පරීක්ෂා කිරීමෙන් පසුව තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.06 2021 වර්ෂයට අයවැය ලේඛන මුද්‍රණය කිරීම සඳහා මිළ ගණන් සභාගත කරන ලදී.**

| අනු අ. | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වර්ගය | Print House Galle | Galle printers | Print shop Kalegana |
|---|---|---|---|---|---|---|
| 01 | Book print $A_4$ Size cover – 150 gsm art paper 2 colour print'mat laminating pasting 2 mm chief board' | 40 | | 400/- 40x400 =16000/- | 1000/- 40x1000 =40000/- | 800/- 40x800 =32000/- |

**තීරණය**

2021 වර්ෂයට අයවැය ලේඛන මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ගාල්ල, Print House ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.07 නගර සභා ක්‍රීඩාංගනයේ ඇති ක්‍රීඩාගාරයේ අලුත්වැඩියාව (දොර, ජනෙල්, උළුවහු) සඳහා අවශ්‍ය ලී සැපයීම සඳහා මිල ගණන් සභාගත කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය විස්තරය | වර්ගය | B.H.K. | මේනක ලී වෙළඳසැල | Karandeniya Timber stores |
|---|---|---|---|---|---|---|
| 01 | 1 1/8 ඝනකම අඟල් 9 පළල ලෑලි අඩි 7 දිග | 08 | කොස් | 600/- | 600/- | 675/- |
| 02 | 1 1/8 ඝනකම අඟල් 9 පළල ලෑලි අඩි 3 දිග | 04 | කොස් | 600/- | 600/- | 675/- |
| 03 | අඟල් 3x4 දිග අඩි 8 | 02 | කොස් | 600/- | 550/- | 480/- |
| 04 | අඟල් 3x4 දිග අඩි 3 ½ | 02 | කොස් | 400/- | 450/- | 480/- |
| 05 | අඟල් 3x4 දිග අඩි 3 | 01 | කොස් | 400/- | 450/- | 480/- |
| 06 | අඟල් 3x4 දිග අඩි 7 | 02 | කොස් | 450/- | 500/- | 480/- |
| 07 | අඟල් 1x4 රේගල් දිග අඩි 4 | 04 | කොස් | 150/- | 175/- | 150/- |
| 08 | අඟල් 1x4 රේගල් දිග අඩි 2 | 04 | කොස් | 150/- | 165/- | 150/- |

**තීරණය**

නගර සභා ක්‍රීඩාංගනයේ ඇති ක්‍රීඩාගාරයේ අලුත්වැඩියාව (දොර, ජනෙල්, උළුවහු) සඳහා අවශ්‍ය ලී සැපයීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති කරන්දෙණිය, B.H.K. ලී මෝල සහ ලී වෙළඳසැලෙහි මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.08 නොමිලයේ අභ්‍යාස පොත් බෙදාදීමේ වැඩසටහනට අවශ්‍ය පොත් මිලදී ගැනීම සඳහා මිල ගණන් සභාගත කරන ලදී.**

| අනු අංකය | ප්‍රමාණය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව | වාමර බුක් ෂොප් අම්බලන්ගොඩ | ඇට්ලස් ඇක්සිලියා සමාගම | සී/ස රජයේ වාණිජ නීතිගත සංස්ථාව | A.T.G. STATIONERS GALLE | ඇට්ලස් ඇක්සිලියා සමාගම (ZEBRA |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| 01 | 200 | තනිරූල් පොත් පිටු 80 | 27/- | 25/- | 27.30 | 32/- | Atlas 32.50<br>Penmark 30/- | 23.71 |
| 02 | 15000 | තනිරූල් පොත් පිටු 120 | 37/- | 36.50 | 38.22 | 47/- | Atlas 45/-<br>Penmark 38.89 | 31.62 |
| 03 | 2750 | තනිරූල් පොත් පිටු 160 | 57/- | 51/- | 53.67 | 69.99 | Atlas 63/-<br>Penmark 53.90 | 47.68 |
| 04 | 3000 | තනිරූල් පොත් පිටු 200 | 70/- | 62/- | 68.58 | 90/- | Atlas 81/-<br>Penmark 69.30 | 58.90 |
| 05 | 400 | කොටුරූල් පොත් පිටු 80 | 27/- | 25/- | 27.30 | 32/- | Atlas 32.50<br>Penmark 30/- | 23.71 |
| 06 | 4000 | කොටුරූල් පොත් පිටු 120 | 37/- | 36.50 | 38.22 | 47/- | Atlas 45/-<br>Penmark 38.89 | 31.62 |
| 07 | 1200 | කොටුරූල් පොත් පිටු 160 | 57/- | 51/- | 53.67 | 69.99 | Atlas 63/-<br>Penmark 53.90 | 47.68 |
| 08 | 200 | CR පොත් (තනිරූල්) පිටු 80 | 59/- | 54/- | 60.48 | 62.50 | Atlas 69.00<br>Penmark 55/- | 50.49 |
| 09 | 6000 | CR පොත් (තනිරූල්) පිටු 120 | 80/- | 77/- | 90.72 | 92.50 | Atlas 103.50<br>Penmark 79.92 | 75.73 |
| 10 | 2750 | CR පොත් (තනිරූල්) පිටු 160 | 126/- | 104/- | 117.93 | 122.50 | Atlas 134.40<br>Penmark 107.80 | 100.98 |
| 11 | 3500 | CR පොත් (තනිරූල්) පිටු 200 | 150/- | 127/- | 142.12 | 150/- | Atlas 161.95<br>Penmark 128.40 | 120.61 |
| 12 | 400 | CR පොත් (කොටුරූල්) පිටු 120 | 80/- | 77/- | 90.72 | - | Atlas 103.50<br>Penmark 79.92 | 75.73 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 13 | 900 | CR පොත් (කොටුරූල්) පිටු 160 | 126/- | 104/- | 117.95 | - | Atlas 134.40 Penmark 107.80 | 100.98 |
| 14 | 2100 | CR පොත් (කොටුරූල්) පිටු 200 | 150/- | 127/- | 142.12 | - | Atlas 161.95 Penmark 132/- | 120.61 |
| 15 | 2000 | චිත්‍ර පොත් පිටු 80 | 111/- | 62/- | 70.51 | 105.42 | Atlas 80.35 Penmark 75/- | 70.51 |
| 16 | 1000 | ප්‍රස්ථාර පොත් පිටු 80 | 90/- | 64/- | 73.58 | 105/- | Atlas 83.85 | 73.58 |
| 17 | 400 | ඩබල් රූල් පොත් පිටු 80 | 27/- | 25/- | 28.56 | 32/- | Atlas 32.55 Penmark 27.50 | 28.56 |
| 18 | 500 | රූල් නැති පොත් පිටු 80 | 27/- | 25/- | 28.56 | 32/- | Atlas 32.55 Penmark 27.50 | 28.56 |
| 19 | 50 | CR බොට්නි පොත් පිටු 120 | 90/- | 92/- | 107.26 | 98/- | Atlas 122.20 Penmark 79.92 | 107.26 |

තීරණය

නොමිලයේ අභ්‍යාස පොත් බෙදාදීමේ වැඩසටහනට අවශ්‍ය පොත් මිලදී ගැනීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී, පරිපාලන නිලධාරී , ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා, ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා යන ගරු මන්ත්‍රීවරුන්ගෙන් සහ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවකින් සාම්පල් පරීක්ෂා කර බලා තීරණයක් ගැනිම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

08. ගෙවීම්

08:01 පොදු මංමාවත් වල විදුලි බිල සඳහා සි/ස විදුලි (පෞද්ගලික ) සමාගම වෙත රු.12257/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

08.02 ගෙවීමට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේකේ විදුලි කණු 42ක් දිලා තිබෙනවා මානාන ක්‍රීඩාංගණයට .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

නැහැ. ඒ කළුවඩුමුල්ල ගාමිණී විද්‍යාල ක්‍රීඩාංගණයටත් එක්ක දමා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැනට දමා තිබෙන්නේ 37 ක් පමණයි .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරිතුමණී එය පැහැදිලි කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

මානාන ක්‍රීඩාංගණයට විතරක් නෙමේ කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයටත් එක්ක

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ධම්මික මන්ත්‍රීතුමා කළුවඩුමුල්ලට විදුලි කණු සවි කළාද ? සැපයුම සම්පූර්ණ කළාම තමයි ගෙවීම කරන්න වෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

නැහැ. තවම සිටුවා නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරිතුමනි , මෙහෙමයි. අපි මෙයට අනුමැතිය දෙනවා. සැපයුම සම්පූර්ණ කළපසු තමයි ගෙවීම කරන්න ඕනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඊට පස්සේ එකක් ඇවිත් තිබෙනවා රු.105000/- කට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

08.02 සංශෝධනය කර තිබෙනවා. අම්බලන්ගොඩ පනියන්දුව මානාන ක්‍රිඩාංගණය වටා විදුලි කණු 30ක් සිටුවීම සඳහා ටෙන්ඩර් කමිටුව මඟින් අනුමත වූ කේ.එච්.එල් චතුරංග මහතාට රු.105000/- ක මුදලක් ගෙවීමට ලේකම්ගේ නිර්දේශය පරිදි අනුමත කරනවා. සභාගත කරනවා. කණු 30ක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කණු 30ට රු.105000/- ක් ගෙවන්න ඕනේ. එතකොට තව 11කට ගෙවන්න ඕනේ. මෙහෙමයි මේ ගෙවීම් දමන විට හරියට කරන්න. තාක්ෂණසේවා නිලධාරි මහතා මෙය හරියට කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මානාන ක්‍රිඩාංගණය කියන එකට 30 ක් දැම්මාම හරිනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

හරි මානානට 30 ක් කියන එක හරි. අර කළුවඩුමුල්ලට කියන එක 11 ක් කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

08.02 සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා. අම්බලන්ගොඩ, පනියන්දුව , මානාන ක්‍රීඩාංගනය වටා විදුලි කණු 30 ක් සිටුවීම වෙනුවෙන් කේ.කේ.වී.එල්.චතුරංග මහතා හට රු.105000/- ක මුදලක් ගෙවීම සභාගත කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මානාන ක්‍රිඩාංගණය නෙමේ. පනියන්දුව මානාන ක්‍රිඩාංගණය

**<u>ගරු නගර සභා ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එක මහ අම්බලන්ගොඩ නෙමේ. පනියන්දුව . මොකටද මහ අම්බලන්ගොඩ කියන්නේ. ග්‍රාමසේවා වසම පනියන්දුව. එක පනියන්දුවේ මානාන ක්‍රිඩාංගණය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතතුමනි, මට අර කළුවඩුමුල්ල ක්‍රිඩාංගණයට කණු 11 ක් . මෙය සවි කළාට පසු ගෙවන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙම ගැටළුවක් වෙලා තිබෙනවා. එය අපි හිටෙව්වේ නැති වුණාට. දැනට එල්.ඩී. ඩී. විදුලි බල්බ් නැති එක. ටෙන්ඩරය ආපු නිසා කිසි ප්‍රශ්නයක් නැහැ. 08.02 සංශෝධනය කර තිබෙනවා. අම්බලන්ගොඩ, පනියන්දූව , මානාන ක්‍රීඩාංගනය වටා විදුලි කණු 30 ක් සිටුවීම වෙනුවෙන් (2020.10.23 දින ටෙන්ඩර් කමිටුවෙන් අනුමත වූ) කේ.කේ.වී.එල්.චතුරංග මහතා හට රු.105000/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට යෝජනා කරනවා.

08:02 අම්බලන්ගොඩ, පනියන්දූව , මානාන ක්‍රීඩාංගනය වටා විදුලි කණු 30 ක් සිටුවීම වෙනුවෙන් (2020.10.23 දින ටෙන්ඩර් කමිටුවෙන් අනුමත වූ) කේ.කේ.වී.එල්.චතුරංග මහතා හට රු.105000/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

08:03 2020 ඔක්තෝම්බර් මස නගර සභාවේ ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් කටුනායක, Ceylon Security and Manpower (Private) Ltd ආයතනය වෙත රු.269856.58 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

08:04 අම්බලන්ගොඩ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරුන්ගේ 2020 නොවැම්බර් මස ගමන් වියදම් ලෙස රු.132000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

08:05 මහජන ක්‍රීඩාංගණයේ අදියර 01 යටතේ නැරඹුම් පඩි ඉදිකිරිමේ ( Pavillion ) කර්මාන්තය (අවසන් ගෙවීම ) වෙනුවෙන් රු.1684918.59 ක මුදලක් පටබැඳිමුල්ල ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති

එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, 08.05 අපිට ටිකක් බලන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගොණුව එවන්නම් .

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

හරි එහෙමනම් එය බලා අපි අනුමත කරන්නම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ගොණුව එතනට ගිහින් දෙන්න. 08.06 ගොණුවත් මන්ත්‍රීවරුන්ට එවනවා.

08:06 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ නැරඹුම් වේදිකාවේ තරප්පුවල අමතර වැඩ කොටස් සිදු කිරීමේ කර්මාන්තය ( අවසන් ගෙවීම ) වෙනුවෙන් රු.477,637.34 ක මුදලක් ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

08.06 ගොණුවත් මන්ත්‍රීවරුන්ට එවනවා.

08:07 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ජලය රැදෙන ස්ථානවල මැටි කැනීම් කර ඉවත්කර පස් පිරවීම කර්මාන්තයේ 10% රැඳවුම් මුදල් නිදහස් කිරිම වෙනුවෙන් රු.44818.80 ක මුදලක් ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එහි පරික්ෂණය කරලා ඉවරද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඉවරයි.

09. **ගිණුම්**

09.01 2020 ඔක්තෝම්බර් මස පොදු ගිණුම්, වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020 ඔක්තෝම්බර් මස පොදු ගිණුම්, වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය සභාගත කරන ලදී

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

එය ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේ මෙතන තිබෙනවා පොඩි මෙවා එකක්. එය ගණකාධිකාරිතුමියගෙන් දැන ගන්න. පොළි ගෙවීම් , ලාභාංශ හා ප්‍රසාද මුදල් ගෙවීම් , දේශිය ණය පොළි, දේපල ණය පොළි. කියා එහි දමා තිබෙන්නේ දේපළ ණය පොළි 46620.61. එක තමයි අර එකතුවට ගිහින් තිබෙන්නේ. නමුත් අර 1782.58 ක් වෙලා තිබෙනවා දේශිය ණය පොළි. එය එකතු වෙලා නැහැ අරකට. එක නිවැරදි කර ගන්න. ගිණුම් එකේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ . ගණකාධිකාරි පිළිතුරු දෙයි. මෙය සකස් කළේ . පරික්ෂා කළේ ඔක්කොම අත්සන් කර තමයි මට එන්නේ. මා බලන්නේ නැහැ. හදිස්සියට එන වාර්තාව අපි ඉදිරිපත් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමාට ඔක්කොම බල බල ඉන්න බැහැ. නිලධාරින් ඉන්නවානේ. ඒවා පරික්ෂා කර බලා හරියට කරන්න ඕනේ. එකටනේ ඉද්දලා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කෝ ගණකාධිකාරිතුමිය. කොතනද ඔය ආපහු කියන්න. ගණකාධිකාරිතුමිය මෙන්න මෙකට පිළිතුරු දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එහෙම නේද ? එකතු කරලා නැද්ද? එකතු වෙලා නැහැනේ. අන්න එක එකතු කර ගන්න. රු.47403.19 ක් වෙන්න ඕනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය නිවැරදි කරලා වාර්තාවට ඇතුළත් කරන්න.

**තීරණය**

2020 ඔක්තෝම්බර් මාසයට අදාළ පොදු වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය හා 2020 ඔක්තෝම්බර් මස ලැබීම් විග්‍රහය පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

10. ඇස්තමේන්තු

**10.01 2021 වර්ෂයේ අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් වලට ඇතුළත් වන ළමුන් සඳහා ටීෂර්ට් හා නිල ඇඳුම් කට්ටල 200ක් ලබාදීම සඳහා රු.295000ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2021 වර්ෂයේ අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් වලට ඇතුළත් වන ළමුන් සඳහා ටීෂර්ට් හා නිල ඇඳුම් කට්ටල 200ක් ලබාදීම සඳහා රු.295000ක ඇස්තමේන්තුව ඉදිරිපත් කරනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

**තීරණය-**

2021 වර්ෂයේ අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් වලට ඇතුළත් වන ළමුන් සඳහා ටීෂර්ට් හා නිල ඇඳුම් කට්ටල 200ක් ලබාදීම සඳහා රු.295000/-ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකවසභා සම්මත විය.

11. වෙනත් කරුණු

12. න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ වෙනත් කරුණු

**12.01** අම්බලන්ගොඩ ගා/ප්‍රජාපතී ගෝතමී බාලිකා මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටියෙහි රාත්‍රී කාලයේ ක්‍රීඩා කළ හැකි වන පරිදි විදුලි ආලෝක පද්ධතියක් සවි කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ගා/ප්‍රජාපතී ගෝතමී බාලිකා මහා විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතිය. විද්‍යාලයේ විදුලි ආලෝක පද්ධතියක් ලබා දීම. අප ක්‍රීඩා පිටියෙහි රාත්‍රී කාලයේ ක්‍රීඩා කළ හැකි වන පරිදි විදුලි ආලෝක පද්ධතියක් සවි කිරීම සම්බන්ධ විද්‍යාලයේ විරෝධතාවයක් නොමැති බව දන්වා සිටිනවා. මේ සම්බන්ධවව ඇත්තටම ප්‍රජාපති විද්‍යාලයේ ක්‍රිඩාංගණය ඇත්තටම නගර සභාව විසින් ප්‍රජා පද්ධති විද්‍යාලයට පවරන ලද ක්‍රිඩාංගණයක්. එම ක්‍රිඩාංගණයේ ඇත්තටම දැනට අපේ පාපාන්දු සංචිතය පුහුණු විම් කටයුතු කරන්නේ එතන. ඔවුනගෙනුත් ඉල්ලිමක් තිබෙනවා විදුලි ආලෝකය ලබා දෙන්න කියා. හැබැයි විදුලි ආලෝකය ලබා දුන්නොත් විදුලි බිල

ගෙවන්න සිද්ධ වෙන්නේ විද්‍යාලයට. නමුත් එම විද්‍යාලයේ මේක සකස් කරනවාද නැද්ද කියන එකට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තටම රාත්‍රී කාලයේ පාපන්දු ක්‍රීඩාවේ යෙදෙනවා. පුළුවන් නම් එය ලබා දෙන්න කියා. හැම ක්‍රීඩාංගණයකටම විදුලි ආලෝකය ලබා දෙන එකේ. විලේගොඩත් එය ලබා දෙන්න කියා. මොකද නගර සභාවෙන් කෙරෙන්න ඕන එකක්. ඔය පාරේ විදුලි කණු 7ක් දමා මාගේ අතින් මා විදුලි ආලෝකය ලබා දී තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමාගේ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එය ඇත්තටම මෙය හොඳ ඉල්ලීමක්. ඒ ගම්වාසීනුත් ඒ ප්‍රදේශයේ සිටින ළමුනුත් ක්‍රීඩා කරනවා. ඇත්තටම හැම තැනටම මේවා කරන කොට මේ ක්‍රීඩාංගණය ඔබතුමා දන්නවා ගරු රිවඩ් පතිරණ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්. ඉතිං එමනිසා ඒ ප්‍ර දේශයේ මන්ත්‍රීතුමා අපේ ලසන්ත මහතා කියන පරිදි සියළුම මන්ත්‍රීවරු එයට කැමත්ත ප්‍රකාශ කරලා එය කර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැනට පාපන්දු සංගමයේ සභාපතිතුමා මාගේ මිත්‍රයෙක් ඉන්නේ. මට ඕන වේලාවක උදවුවක් ගන්න පුළුවන්. අම්බලන්ගොඩට පාපන්දු ක්‍රීඩාවට ඕනම දෙයක්. මට කතා කරලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ඔබතුමාගේ සහායත් අපි එකත් බලාපොරෝත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම පොල්වත්ත ක්‍රීඩාංගණය විදුලි ආලෝකරණය කරලා සංගමයේ සභාපති අනුර සිල්වා මහතා ගෙන්වා තමයි මෙය විවෘත කළේ. එය විවෘත කළේ ක්‍රිකට් ක්‍රීඩකයොත් පාපන්දු ක්‍රීඩකයොත් අතර තිබෙන ගැටුම නිමා කිරීමට හොඳම කරුණ මෙකයි කියා එතුමාට වටහා දෙන්න. ඇත්ත වශයෙන්ම

එතුමා පාඩමක් ඉගෙන ගත්තා නම් අද වෙනකොට එතුමාට ලැබෙන මුදල් වලින් ක්‍රිඩාංගණ 100 ක් විතර කරන්න තිබුණා. අපේ පාපන්දු සංචිතයේ සියළු පුහුණු වීම් සිදු කරන්නේ ප්‍රජාපති විද්‍යාලයේ ක්‍රිඩාංගණයේ. එතන කාන්තාවන් සිටින කාන්තා විද්‍යාලයක් . එමනිසා සමහර වේලාවට අපේ පිරිමි ළමුන් හා ගැහුණු ළමුන් මිශ්‍ර විමේදි යම්කිසි ප්‍රශ්න ඇති වෙනවා. ඉතිං එහිදි විදුලි ආලෝකය දමා දිමේදි එම කාන්තා විද්‍යාලයට යම් සහනයක් වෙනවා. මෙහිදි එකම දේ විදුලි බිල ගෙවිම පාසැල භාර ගන්න වෙනවා. අපි කරන්නම්. මෙයට අවශ්‍ය නිත්‍යානුකුල කටයුතු ඉදිරියට කරන්න කියා අපි ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තටම හොඳ කාරණයක්. ක්‍රිඩා පිටිය සඳහා රාත්‍රි කාලය ලබා දිම. පොඩි සමහර වේලාවට ගැටළුවක් ඇති වෙන්න පුළුවන්. ගොඩක් වෙලාවට මාත් දකිනවා. සවස් කාලයේ ගොඩක් වේලාවට ගමේ අය තමයි සෙල්ලම් කරන්නේ. එතකොට ඔය බිල ගෙවීමේදි පාසැලෙන් එම බිල ගෙවාවිද ? ගමේ විදුලිය පාවිච්චි කරනකොට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ලසන්ත මන්ත්‍රිතුමා මෙයට මොකක්ද කරන්නේ කියා එකඟතාවයකට පත් වෙන්න. එයට පත්වෙලා අපිට ඔබතුමා වාර්තා කරන්නකෝ. විදුලි බිල ගෙවිම පිළිබඳ අපිට ගැටළුවක් නැහැ. වෙලා තිබෙන්නේ අපිට අනුන්ගේ බිලක් තමයි ගෙවන්න වෙන්නේ. අපේ බිලක් නම් කමක් නැහැ. ඔන්න ඔතන තමයි ගැටළුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගැටළුව තිබෙන්නේ රාත්‍රි කාලයේ ගමේ අය සෙල්ලම් කරන එක. අපි ප්‍රජා මණ්ඩලයෙන් ගෙවන්න ඉල්ලන්න. නැතිනම් ඕක ගැටුමකට යනවා. පාසලෙන් ගෙවන්නේ නැහැ. ගමේ අය සෙල්ලම් කළාම.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ලසන්ත මන්ත්‍රිතුමා ඉන්නවානේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ලසන්ත මන්ත්‍රිතුමා ඉන්නකම් ගෙවාවි .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ලසන්ත මන්ත්‍රීතුමා ඉන්නකම් ගෙවාවි . එතුමා නැති වුණාමත් මෙය කරන විදිය කල්පනා කරන්න ඕන.

**තීරණය**

අම්බලන්ගොඩ ගා/ප්‍රජාපතී ගෝතමී බාලිකා මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටියෙහි රාත්‍රී කාලයේ ක්‍රීඩා කළ හැකි වන පරිදි විදුලි ආලෝක පද්ධතියක් සවි කිරීම සම්බන්ධව විද්‍යාලයේ විරෝධතාවයක් නොමැති බව දන්වා පාසල් සංවර්ධන සමිතිය විසින් එවා ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කළ අතර , එම ක්‍රීඩා පිටියට නගර සභාව මගින් විදුලි ආලෝක පද්ධතියක් සවිකිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් කළ යෝජනාව ගරු සභාපතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත වූ අතර, විදුලි බිල ගෙවීම පිළිබඳව පාසල් සංවර්ධන සමිතිය සමග එකඟතාවයකට පැමිණ දන්වන ලෙස ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා හට ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

**12:02 මාදම්පාවිල අභයභූමියේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ සීමා සම්බන්ධ ගැටලු නිරාකරණය යන මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මාදම්පාවිල අභයභූමියේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ සීමා සම්බන්ධ ගැටලු නිරාකරණය යන මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ඉදිරිපත් කර ඇති ලිපිය කලින් අප සාකච්ඡා කළා. මෙය ඉවත් කරනවා.

**තීරණය-**

මාදම්පාවිල අභයභූමියේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ සීමා සම්බන්ධ ගැටලු නිරාකරණය යන මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ඉදිරිපත් කර ඇති කරුණ 03.06 යටතේ සකච්ඡා කළ බැවින් මෙම ලිපිය ඉවත් කරන ලදී.

## 12.03 අම්බලන්ගොඩ නගර සීමාව තුළ ජංගම වෙළදාම් කිරීම සුව වෙළදාම් කිරීම සිදුකරනු ලබන අය විසින් එවා ඇති ලිපි සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ නගර සීමාව තුළ ජංගම වෙළදාම් කිරීම සුව වෙළදාම් කිරීම. අපි සභාවෙන් ගත් තීන්දුව අනුව අම්බලන්ගොඩ සිටින වෙළදුන් රාශියක් දැනට අපි ඉවත් කර තිබෙනවා. දැනට මේ ලිපි කියවන්න ගත්තොත් එහෙම එළිවෙනකම් කියවන්න වෙනවා. එමනිසා මා නම්ටික විතරක් කියවන්නම්. එම්.ජී. දිලිප් මහතා,52/8 තුඩුවමුල්ල , ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. හක්කිනි නදිෂා මධුෂානි මිය, 24/1 නම්බුමුල්ල , අම්බලන්ගොඩ ඉදිරිපත් කර තිබෙනවා. සුජීව ජයවර්ධන , නො33 හිරිකැටිය වත්ත , මහ අම්බලන්ගොඩ පාර , අම්බලන්ගොඩ. ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. කේ.ජී . කමනි සන්ධ්‍යා මිය 34ඒ. හල්වතුර , විලේගොඩ, අම්බලන්ගොඩ ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. එම්.එච්. නයනා ගයානි , 72, හල්වතුර , විලේගොඩ , අම්බලන්ගොඩ . ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. ඩී.වී නිහාල් ආනාන්ද 35, නුගේතුඩුව , අම්බලන්ගෙඩ ලිපියක් එවා තිබෙනවා. කේ සුෂානි නන්දනි , දෙවට පාර , රන්දොඹේ , අම්බලන්ගොඩ. ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. මොහමඩ් සල්දියාර් අංක 40 පනාපිටිය කරණ්දෙණිය. ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. කේ රානි ද සොයිසා, අංක 50 නිව්යෝර්ක් ගම්මානය , තල්ගස්ගොඩ ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. ජී. අයි රන්ජන් මහතා , නො 09 , මානිම්මුල්ල , අම්බලන්ගොඩ. ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. පත්තිණිගේ ප්‍රේමලාල් 9/9, සුදුවැල්ල පාර , තල්ගස්ගොඩ. කේ. නන්දන අරුණ ශාන්ත නො 65 හල්වතුර විලේගොඩ ලිපියක් ඉදිරිපත් කරනවා එම්.ඒ.ටී.ඩී ටියුඩර් මහතා අංක 131 , දුව බේකරිය , කැටන්තොට ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. කේ . පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා අංක 12 , ආර්. ඊ. ඒ. ද සිල්වා මාවත , හේප්පුමුල්ල , අම්බලන්ගොඩ මේ අපේ හිටපු නාගරික මන්ත්‍රීතුමා ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. පී.එච් ජගත් චන්දන කුමාර , දෙල්ගොඩ පාර , තෙල්වත්ත ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. කේ .ඩබ්. රුමේෂ් තාරක , ඔලබැද්ද , බටපොළ , ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. එල් දයාසිලි උස්වැල්ල පාර, හිරේවත්ත , අම්බලන්ගොඩ ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. එම් ජී. දිලිප් අම්බලන්ගොඩ, බොට් සපාරි , අම්බලන්ගොඩ . ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. එරාජ් ඉන්දික , තුඩුව මුල්ල , අම්බලන්ගොඩ. ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. කේ . ජගත් . අංක 72 පනියන්දුව , අම්බලන්ගොඩ ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. මනෝරි හංවැල්ල , තුඩුවමුල්ල , අම්බලන්ගොඩ . ලිපියක් ඉදිරිපත් කරනවා. ඉන්ද්‍රානි ප්‍රියංගා 72, චින්තා, පනියන්දුව , අම්බලන්ගොඩ ලිපියක් ඉදිරිපත් කර

තිබෙනවා.එස්.එම්.ප්‍රේමසිලි ද සිල්වා ,37/3 ඒ. ආර්.ඊ.ඒ. ද සිල්වා මාවත , හේප්පුමුල්ල , අම්බලන්ගොඩ . ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. ආර්. අමල් , පන්සල පාර , දේවගොඩ අම්බලන්ගොඩ.ඒ.වී ටෝනි ප්‍රියදර්ශන , මල්ලිකා ඉන්ට්‍රස්ට්‍රිස් , අලුත් පාර , අම්බලන්ගොඩ ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. පේත්තාවඩු සුනිල්, තුඩුවේගොඩ , වඩුමුල්ල, වතුගෙදර ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. එම් ජයන්ත සමන් කුමාර නො 1/86 , කුරුඳුවත්ත , වතුගෙදර ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. කේ.එච් අනුලාවති අංක 03, නගර සභා නිවාස , ඕකන්ද , අම්බලන්ගොඩ , ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. ඩී.එම්.ජී. තනුජා මල්කාන්ති, නො 27 , කන්ද පාර , අම්බලන්ගොඩ ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. එම් මනෝජ් චන්දිම අංක 1/8 හිරිකැටිය හරස් පාර , අම්බලන්ගොඩ ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. එස් .ජී . වික්‍රමරත්න "මිහිර" තණිපොල්ගහ , බටපොළ ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. ඩබ්.අ ශෝක , කන්ද මාවත , අම්බලන්ගොඩ . ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. මේ සියළු දෙනාගේම ඉල්ලීම වන්නේ ව්‍යාපාරික ස්ථානයේ ඇති බඩු අපි ඉවත් කිරිම සම්බන්ධයෙන්. මේ ලිපි ටික ඉදිරිපත් කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි මේ කිවුවේ අනවසර වෙළඳාම සිදු කිරිම සම්බන්ධව. ඔබතුමා මේ ලියුම් ඉදිරිපත් කරනවා. මේක මේ ගරු සභාවට දමා මෙය අපි ලබා දුන්නොත් එහෙම බලපත්‍රයක් ලබා දුන්නා වගේ වෙනවා. අපි කිවුවේ මේ නගරයේ පිටස්තර පුද්ගලයින් පදික වේදිකාවේ සිටින හැමෝම එලවනවා කියා නෙමේනේ. මෙය ආදායම් පරික්ෂක මහතුන් කට්ටියට ගිහින් කිවුවේ මන්ත්‍රිවරු කියපු දෙයක් කියා. මට නම් කමක් නැහැ. මා කතා කරන්නෙත් නැහැ. වැරදි වැඩක් කළේ. අපි මෙය නිත්‍යානුකුලව කරන්න කියා කිවුවේ. නගරයේ ඇවිත් පිටස්තර වෙළඳුන් පැමිණ ලොරි ගණන් බා වෙළඳාම් කරන්නේ. ඒවා ඉවත් කරන්න කිවුවාම මේ පොඩි මිනිසුන් ඔක්කොම දමා ඉවත් කළා. හැබැයි තල්ගස්ගොඩ තිබෙන තැඹිලි ලැල්ලත් අරගෙන ආවා. අර පොල්වත්තේ ආයුර්වේදය ළඟ තිබෙන කුප්පි විකුණන මනුස්සයාත් අරගෙන ආවා. එවා නෙමේ සභාපතිතුමා අපි කිවුවේ අයින් කරන්න කියා. මේ සභාපතිතුමා නම් ලැයිස්තුවකුත් දමා මේ ඔක්කොම කිවුවාම මෙය නිත්‍යානුකුල වෙනවා. හරි එකයි මා මේ කතා කළේ. අපි හැමදාම කිවුවා. මේ පදික වේදිකාවෙන් එහා පැත්තේ කාණුවේ සිටින කට්ටියට එපා කියා. මේ සභාවට අපිට ලියුම් ආවා

අවා. කතා කරලා ඉන්න නැහැ ගෙවල් වල. මේ ලොරි ගණන් ගෙනවිත් බා නගරයේ විකුණනවා. අන්න එවායි අපි අයින් කරන්න කිවුවේ. නමුත් මේ නිලධාරින් ගිහින් කිවුවේ ඒ මිනිසුන්ට මන්ත්‍රිවරු දමන ලෙඩයි කියා මේ. ඉස්සෙල්ලාම ඉවත් කළේ තල්ගස්ගොඩ. මට කමක් නැහැ. තැඹිලි විකුණපු මිනිහා අරගෙන ආවේ ආදායම් පරික්ෂක මහත්වරු. හැබැයි අපේ නිලධාරිනුත් ගියා. තමන්ගේ හිතවත් කට්ටියට කිවුවා පොඩ්ඩක් පස්සට කරලා විකුණ ගන්නකෝ. එහෙම කියාපු කට්ටියත් ඉන්නවා නිලධාරින්. එමනිසා අපි ගත්ත තීරණය මා නම් වෙනස් කරන්න යන්නේ නැහැ. අපි කිවුවේ ලොරි ගණන් ගෙනත් විකුණනවා. අයින් කරන්න කියලා. මේ සභාවේ වෙළඳ බලපත්‍රයයි , වරිපණම් ගෙවා තමයි මේ වෙළඳ සංගමයේ වෙළඳාම් කරන්නේ. නමුත් මේ නිලධාරින් කළේ වෙනත් දෙයක්. මන්ත්‍රිවරුන්ට පහර ගහන්න. මන්ත්‍රිවරුන්ට ලෙඩ දාන්න කියා. මා දැඩි පිළිකුලෙන් හෙලා දකිනවා එදා කළ ක්‍රියා මාර්ගය.එ නිලධාරින් ගිහිල්ලා. ආදායම් පරික්ෂක මහත්වරු ගිහිල්ලා . එහෙම කරන්න හොඳ නැහැ. මොකද මන්ත්‍රිවරුන්ගේ ගරුත්වය ආරක්ෂා කරන්න ඕනේ . නමුත් නිලධාරින් ගිහින් කියන්නේ වෙන ඒවා. නිලධාරින් මේ වැටුපක් ගන්නේ මේ රාජකාරි කරන්න තමයි. අනවශ්‍ය විදියට මේ මන්ත්‍රිවරුන්ට දෙන ලිපි වලට මේ සභාවේ කතා කරන්න. එමනිසා බොහොම කැත විදියට අවුරුදු 50 ක් බුලත් විඩ විකුණන මිනිහාත් අරගෙන ආවා. ඉතිං ඒවා කැත විදියට තමයි කළේ. හැබැයි අදත් මේ මහ පාර ගානේ ලොරි ගණන් ගෙනත් විකුණන එවා විකුණනවා. අර මිනිසුන් අයින් කළා. එමනිසා අපේ කනගාටුව අපි පිළිකුල්භාවය මේ අවස්ථාවේදි ප්‍රකාශ කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා ඉස්සෙල්ලා නැගිට්ටේ එක කියන්න තමයි. මා තමයි ඉස්සෙල්ලා ඔය යෝජනාව මුලින්ම ගෙනාවේ. එක තිබුණේ අපි බොහොම සාධාරණ කතාවක් තමයි මේ සභාවට ගෙනාවේ. සභාවට අපි කිවුවේ නැහැ. අර බුලත් විට විකුණන දුප්පත් මිනිහා අයින් කරන්න. එක පැහැදිලිව අපි කිවුවා. මේ මහ පරිමාණයෙන් කරන වෙළඳාම් නිසා අර පිට ඉඳලා එන කට්ටිය එහෙම ම කිවුවා අපේ හැන්ඩ් සාඩ් එක අරගෙන බලන්න. පිට ගම්වලින් පැමිණ මහ පරිමාණයෙන් කරන වෙළඳුන් නිසා අපේ බදු ගෙවන වෙළඳුන්ට අපේ ගමේ ඒ ප්‍රශ්නයක් ඇති වුණා. එක තමයි අපි මෙතනදි පෙන්නුවේ. මා දන්නේ නැහැ මොකක්ද මෙකේ උනේ කියා. කෙලින්ම අනිත් පැත්ත හැරුණා. මේක වෙලා තිබෙන්නේ . මෙහි නිත්‍යානුකුල පදනම ඉදිරියට දැම්මා . මනුෂික පැත්ත පැත්තකට දැම්මා. එතකොට මන්ත්‍රිවරු අමාරුවේ වැටෙනවා. අපි කිවුවේ අනවසර වෙළඳාම් ඔක්කොම අයින් කරන්න කියන එක නෙමේ මේ සභාවේ කතා වුණේ. එක

හරිම සාධාරණයි. හැම මන්ත්‍රී කෙනෙක්ම පිළි ගත්තා. එතනදි අපි කිවුවේ අපේ මිනිසුන්ට වන බාල්දුව. එගොල්ලන් කුණු දමා ඡාරා කරලා යන එක තමයි අපි කතා කළේ. එකයි. අපි සිද්ධ වුනේ වෙන දෙයක්. එකෙන් පුදුම විදියට අපේ දෙපාර්ශයවම අපේ අපහසුතාවයට ලක් වුණා. එකක් තමයි අපේ කුඩා වෙළඳාම් කරන අය එක පැත්තකින් දොස් කිවුවා. අනිත් පැත්තෙන් උඹලා කතා කළාට කිසි දෙයක් වුණේ නැහැ කියා ඒ මිනිසුනුත් අපිට ආයි බැන්නා. අපිට වුණේ දෙපැත්තකින් බැණුම් අහන එක. මේක හරි සාධාරණව හිතලා මනුෂිව වැඩ කරන්න ඕන. නිලධාරින් අපිත් එක්ක එකට වැඩ කරන්න ඕන. නිලධාරින් අපිට විරුද්ධව වැඩ කරනවා නම් අපි නිලධාරින්ට විරුද්ධව වැඩ කරන්න ඕන. අපි කවදාවත් නිලධාරින් විවේචනය කර නැහැ. මා කවදාවත් කරලා නැහැ. හැබැයි එහෙම නිලධාරින් වැඩ කරන්න හොඳ නැහැ. අපිව අමාරුවේ දමන්න මොකක් හරි යෝජනාවක් ගෙනාවාම දෙන්නම් උඹලට වැඩේ මෙන්න මන්ත්‍රීවරු කිවුවා කියා අර බුලත් විඩ විකුණන කෙනා අයින් කරනවා. අපිට ගමේ ඉන්න නැහැ. අපිට ඡන්ද නැති වෙනවා. අපි මේ ඡන්දෙන් එන මිනිසුන් . මේ වගේ වැඩ කරන්න එපා. අපි බොහොම සුහදව නිලධාරින් එක්ක වැඩ කරන්න කැමතියි. මෙහෙම වැඩ කරන්න එපා. එහෙම හොඳ නැහැ. අපේ විපක්ෂ පක්ෂ කතන්දරයක් නැහැ. එහෙම කරන්න එපා. අපි හැමකෙනෙකුටම ඔය ප්‍රශ්නය තිබෙනවා. මෙහෙම කරන්න එපා කියා ඉල්ලනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගිය සභාවට මේ ව්‍යාපාර ප්‍රජාව කරන ලද යෝජනාව තමයි මේ තිබෙන්නේ. ගරු සභාපතිතුමා, නගර සභාව , අම්බලන්ගොඩ. අනවසර වෙළඳාම් කිරිම සම්බන්ධව. මහ මාර්ග වල පුද්ගලික ඉඩම් වල කරගෙන යන වෙළඳාම් කටයුතු නිසා අම්බලන්ගොඩ නගර සභාවට බදු ගෙවන ව්‍යාපාරික ප්‍රජාව අපහසුතාවයකට පත් වි ඇති බැවින් ඔබතුමලාගේ සියළුම මන්ත්‍රීවරුන් අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින බවට ව්‍යාපාරිකයන් 7කු අත්සන් කරලා මේ ලිපි සියළුම මන්ත්‍රීවරුන්ට දිලා තිබෙනවා එදා. මේ ලිපිය තමයි ඔය සභාගත කළේ. මෙකට තමයි මේ ක්‍රියාත්මක වුණේ. නමුත් මේ ආදායම් පරික්ෂක මහත්වරු ගිහින් දින 14 ක් අපි බලාගෙන හිටියා මෙයට ක්‍රියාත්මක වෙනවා ද කියා. මේ සභාව ගත් තීරණය ක්‍රියාත්මක වුණේ නැහැ. මා ඊට පස්සේ අපේ උප සභාපතිතුමාට කල්පනා කර කිවුවේ මේ සභාව ගත් තිරණය ක්‍රියාත්මක වුණේ නැතිනම් මොකද මේ බඩු ලොරි තුනක් විතර සතියට ඉඩම් තුනක විකුණනවා. මේ අහිසංක මිනිසුන් අමාරුවේ වැටිලා තිබෙන්නේ . බඩු ලොරි කුණු ගොඩවල් ගහලා ඒවා අදින්න ඕනේ

නගර සභාවේන්. ශත පහක්වත් ගෙවන්නෙත් නැහැ. ඒ මිනිසුන් බඩු විකුණානවා. එකට විරුද්ධව තමයි අපි කතා කළේ. මේ සභාවේ. සභාව ගත් තීරණය මොකක්ද ගරු නගාරාධිපතිතුමා කිවුවා සියළුම බඩු අයින් කරන්න කියා. එදා තීරණය. එ තීරණය ගත්තේ නැති නිසා තමයි දින 14කට පස්සේ

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මන්ත්‍රිතුමා මා කිවුවේ සභාව ගත් තින්දුව තීරණය කරන්න කියා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර  මහතා කතා කරමින්**

නමුත් මේ නිලධාරින් ගිහින් කළේ එහා කොනේ සිටින උෟරවත්ත පාලම ළඟ සිටින කරවල වේලන කෙනාගේ සිට

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඔබතුමලා ඕක කියන කොට මා එදත් විරුද්ධයි. අදත් විරුද්ධයි. මා දන්නවා සාමාන්‍ය පොඩි මිනිහෙක් වෙළඳාම් කරන්නේ බොහොම අමාරුවෙන්. එකනිසා මාගේ ප්‍රතිපත්තිය තිබුණේ 97 සිට මේ නගර සභාව පාලනය කර තිබෙනවා. කාණුවෙන් එපිට පාරට නොයන අයුරින් අනිත් පැත්තේ සිට වෙළඳාම් කරන ඕනෑම වෙළෙන්දෙක් අස් කරන්න ඔනේ නැහැ කියන ප්‍රතිපත්තිය. මෙච්චර කල් කළේ එකයි.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර  මහතා කතා කරමින්**

එක තමයි කිවුවේ. එළවළු පළතුරු තිබෙන ඒවා අයින් කරන්න කියා. අතන කුරුඳු තෙල් දමා පහන විකුණන මනුස්සයාගේත් තට්ටුව අරගෙන ඇවිල්ලා. ඒ මිනිහාගේ තට්ටුව අරගෙන ඇවිත් කරපු දන්නවාද සභාපතිතුමා. ඒ බඩු නැවත අපිට මන්ත්‍රිවරයෙක් වශයෙන් බලා නැවත ලබා දෙන්න පුළුවන්. මා සභාපතිතුමාගෙන් අසා ගියා අපේ යාඩ් එකට. ඔක්කොම ගිනි තියලා. සභාවේ තිරණයක් ගත්තා ද සභාපතිතුමා මේ ගෙනෙන බඩු ගිනි තියා විනාශ කරන්න කියා. රු.4730/= ක් දි මා ඒ මනුස්සයාට බෝඩ් ටික ගසා දුන්නා. මොකද අහිංසක මනුස්සයෙක්. මාගේ අතින් රු.4730/= ක් මාගේ අතින් දි බෝඩ් ටික ගසා දුන්නේ. අරන් ඇවිත් විනාශ කර දමලා. මේ සභාවේ තීරණයක් ගත්තේ නැහැ බඩු ගෙනත් විනාශ කරන්න කියා. මේ බඩු අස් කරන්න කිවුවේ මේ ප්‍රධාන ඉඩම් වල තිබෙන බඩු තමයි අස් කරන්න කිවුවේ. මේ තැඹිලි ටිකයි, බුලත් විඩ විකුණන මනුස්සයායි , සපත්තු මස කෙනායි . ඒ මිනිසුන් අපිට කරදරයක් නැහැනේ. මේ

වෙනුවෙන් තමයි අපි කතා කරන්නේ. නමුත් නම ගිහින් තියෙන්නේ මාගේ නමයි උප සභාපතිතුමාගේ නමයි ගිහින් තියෙන්නේ. අපි දෙන්නාගේ උවමනාවට තමයි මේ දේ කළේ කියා. මිනිසුන් අතරට ගිහින් තියෙන්නේ. මට නම් ප්‍රශ්නයක් නැහැ. මේ සභාව ගත්ත තීරණය තමයි අපි ක්‍රියාත්මක කළේ. ඒ වෙනුවෙන් තමයි අපි කතා කළේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා පලමුවෙන්ම කනගාටු වෙනවා . විශේෂයෙන්ම මෙතන කාන්තාවන් තමයි ඉන්නේ. ස්වයං රැකියාවක් කරගෙන බොහොම ආමාරුවෙන් ළමයි ටික හදාගෙන ජීවත් වෙන කාන්තාවන්ට කරදරයක් කරන එක ගැන අපි බොහොම කනගාටු වෙනවා. මන්ත්‍රීවරයක් වශයෙන්. එදා සභා සම්මත වු විදියට නෙමේ වැඩේ වෙලා තිබෙන්නේ. අපි පලමුවෙන්ම සොයා බලන්න ඕනේ නිලධාරින් ඇයි එහෙම කරන්නේ කියා. මන්ත්‍රිවරු යෝජනාවක් කළාට පසු අනවශ්‍ය විදියට පාවිච්චි කරන්නේ ඇයි. ඊට පසු කිසිම අවසරයක් නැතුව බඩු විනාශ කළේ ඇයි. ඒවා සභාවට දමා සභා සම්මුතිය අරගෙන තමයි විනාශ කළ යුත්තේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ආදායම් පරික්ෂක මහතා ඉන්නවාද ?

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ඇත්තටම කනගාටු වෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ආදායම් පරික්ෂක මහතා ඔන්න එකට පිළිතුරු දෙන්න. එතකොට අපිට වාද විවාද කරන්න දෙයක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

එම නිසා විශේෂයෙන්ම කාන්තාවන්ගේ ස්වයං රැකියා කිරිම කරන්න දෙන්න ඕනේ. එදිනෙදා ජීවත් වෙන කාන්තාවන්ට සම්පූර්ණ ශක්තිය ලබා දෙන්න ඕනේ. එක අනිවාර්යෙන්ම දෙන්න ඕනේ. අහිංසක කාන්තාවන්. ජීවත් වෙන්නේ කොළ මිටිය විකුණා ගෙන. බුලත් විඩිය විකුණා ගෙන .

## ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්

ගරු සභාපතිතුමනි, අපේ කොට්ඨාශයේ තිබෙන ප්‍රශ්නයක්. දුව බේකරියේ අය ඔතන තමයි. පිටරට වලත් ඕන තරම් තිබෙනවා මේ වගේ කෙටි ආහාර වර්ග. අපේ නෙමේ මේ තායිලන්තය , මැලේසිෂියාව , වගේ රටවල මේ කෙටි ආහාර වර්ග තිබෙනවා. ඉතිං මේ වගේ එවා කළාම ඒ මිනිසුන්ට ජිවත් වෙන්න විදියක් නැහැ. අර ලසන්ත මන්ත්‍රීතුමා කිවු වගේ මොකක්ද ගිනි තිබ්බා කියා. ඒ මනුස්සයා පහනක් විකුණා තමයි ජිවත් වෙන්නේ. මේ දිනවල සංචාරක ව්‍යාපාර කටයුතු නැහැ. ඉතිං ඒ මනුස්සයාගේ ඒවා අරගෙන ඇවිත් ගිනි තියෙන එකනම් හරිම අසාධාරණයි. එය නැවතත් අපිට සාකච්ඡා කර අවවාදයක් කර දෙන්න පුළුවන්නේ. එතකොට එහෙමනේ. මා දන්නේ නැහැ මොන නිති ද කියා මේවා. ඒක එකක්. අර තල්ගස්ගොඩ පාලම ළඟ දොඩම් ඒවා විකුණනවා. මිනිසුන්ට නරක දෙයක් නොකර මේ මිනිසුන් දෙයක් කරන්නේ. අනික මේ මෙච්චර ව්‍යාසනයක් මේ අවස්ථාවේ සිදුවෙලා තිබෙනවා. ඒ මිනිසුන්ට ජිවත් වෙන්න විදියක් නැහැ. දැන් මිරිස් කිලෝ එකක් රු.600/= ක්. මිනිසුන් ජිවත් වෙන්න මේ දේ කරන්නේ. මෙහි අපි කියා සිටියේ ලසන්ත මන්ත්‍රීතුමලා කියා සිටියේ පිටින් ගෙනත් ලොරි ගණන් විකුණන එක විතරක් නතර කරන්න කියා . එහෙම නැතුව පාරේ පලාකොළ විකුණන කෙනා , බුලත් විඩ් විකුණන කෙනා දමාගෙන එන්නේ.මේක හරි අසාධාරණයි. අපිනම් කිසිම දෙයකට අනුමැතිය දුන්නේ නැහැ. අපි ඒ වගේ දෙයකට අනුමැතිය දෙන්නේ නැහැ. මා ඔබතුමාගේ තීරණයේ ඉන්නවා. මා නම් කිසි දෙයකට අනුමැතිය දෙන්නේ නැහැ. මෙකේ සාධාරණයක් කරන්න. අපි කියන්නේ පිට පළාත් වලින් පැමිණ මහ පරිමාණයෙන් වානිජ්‍ය ලෙස වෙළඳාම් කරන එක විතරක් නතර කරන්න. අපේ ගමේ මිනිසුන් දැන් අර සරසවිය ඉදිරිපිට කොටන් බඩුන් විකුණන රංජන්ලේ කොටන් බඩුන් ටික අරගෙන ආවා. එක පාරක් ඔය කොටන් බඩුන් අරගෙන ඇවිත් මා තමයි ඒ නඩුවට පෙනි සිටියේ . මා මහේස්ත්‍රාත්තුමාට කිවුවා කොටන් බඩුන්නේ විකුණන්නේ කොටන් බඩුන් ටික ආපහු දිලා නිදහස් කරන්න කියා කිවුවා මහේස්ත්‍රාත්තුමා. ඇයි මෙච්චර අකාරුණික කියා නගර සභාව. එකනිසා මේ මිනිසුන් ගැන මනුෂිකව  හිතලා ඔබතුමාත් ඉන්නේ ඒ තීරණයේ නම් මා සිටිනවා පෞද්ගලිකවම. එමනිසා මිනිසුන්ට යහපතක් වන විදියට ක්‍රියා කරන්න කියා ඉල්ලා සිටිනවා.

## ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා  කතා කරමින්

ගරු සභාපතිතුමනි, වචනයක් හරි කතා කරන්න ඕනේ මේ සම්බන්ධව. සභා තීරණයක් හරි ගත්තා නම් මේ සම්බන්ධව උප සභාපතිතුමා ස්ථිර කළා. යෝජනා කළා ලසන්ත මන්ත්‍රීතුමා .

එතුමන්ලා විතරක් මෙකට හසුවෙලා එතුමන්ලා දෙන්නාට පහරක් ගසනවා නම් සභාවට පහරක් ගසනවා නම් මන්ත්‍රීවරු වශයෙන් යම් තීරණයක් ගත්තා නම් ඒ තැන ඉන්න ඕන කියන එක මගේ පෞද්ගලික හැඟිම. ඇත්ත වශයෙන්ම නගර සභාවේ නිලධාරින් මහත්වරු ගිහින් ඒ මහත්වරුත් අසරණයි. අයින් කරන්න කිවුවාට පසු අරවත් අයින් කර ඇවිත් තිබෙනවා. එතන තේරුම් ගැනීමේ ප්‍රශ්නයක් තිබෙන්නේ. විශේෂයෙන් මතක් කළ යුතුයි . අපිට මේ ඇතිවූ කොවිඩ් අවදානමත් එක්ක මිනිසුන් ජිවත් වෙන්නේ. මිනිසුන් කන්න බොන්න හැමදේම කරන්නේ. අපි කලිනුත් කොරෝනා එනකොටම යෝජනාවක් කළා. ටික කාලයකට හරි මෙහි ලොකු වරදක් කරනවා . ලොකුවට මුදල් තිබෙන අය මෙයට බැහලා ලොකුවට ගෙනවා. දුප්පත් ප්‍රජාවටත් ප්‍රශ්නයක් තිබෙනවා. එකත් ලොකු ප්‍රශ්නයක්. ලසන්ත මන්ත්‍රීතුමලා වෙළඳාම් කරනවා. මුදල් නොගෙවන අය ලොකුවට මේවා දමාගෙන කරනවා . ඔක තමයි ලොකුම ගැටළුව. දුප්පත් මිනිහා මේ කොරෝනා නිසා ජිවත් වෙන්න අඟහිඟකම් තිබෙන මිනිසුන්. මාගේ පෝරඹ කොට්ඨාශයේ කුලරත්න පාර අද්දර මල්ලි කෙනෙක් පලා වික්කා. මා අහුවා මොකද මල්ලි ප්‍රශ්නය කියා. මට ළමයින් තුන්දෙනෙක් ඉන්නවා. මා හොඳ සේවකයෙක් කිවුවා. එතකොට ප්‍රශ්න දැම්මා කිවුවා. මා කිවුවා ප්‍රශ්න දැම්මොත්  මට කියන්න. ඔයා තොග ගණන් ගෙනත් ලොරි ගණන් විකුණන්නේ නැහැනේ. ඔයා කියන්න අතුල මන්ත්‍රීතුමා කිවුවා කියා. වරදක් වෙන්න පුළුවන්. ප්‍රායෝගිකව කොරෝනා නිසා මේ මිනිසුන් පලා ටිකක් විකුණන එක ගැටළුවක් වෙන්නේ නැහැ ලසන්ත මන්ත්‍රීතුමාටයි ව්‍යාපාර කරන පුද්ගලයන්ට. අපි මේ වෙළඳාම් කියන්නේ මොකක්ද කියන එක තෝරාගෙන අපි අයින් කළ යුතුයි කියන එකයි මා කියන්නේ. ඒක මොකද පලාටික තැඹිලි ටික මොකක් හරි පොඩි පොඩි දේවල් විකුණන මිනිසුන්ට මෙහි සාධාරණයක් විය යුතුයි. මෙහි තිබෙනවා ලොකුවටම මහ පරිමාණව මුදල් තිබෙන මිනිසුන් ලොකුවට මහ පරිමාණව ගිහින් ලොරි ගණන් බඩු ගෙනවිත් බදු ගෙවන ව්‍යාපාර ප්‍රජාවට මේ ව්‍යාපාර නැති කර තිබෙනවා. මේ කොරෝනා වසංගතයක් එක්ක. මොකද මේක සානුකම්පිතව හිතනවානේ මිනිසුන්. අන්න ඒ ගැටළුව තිබෙන්නේ. තෝරාගෙන ඒ කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා. අපි මේ කොරෝනාවත් එක්ක මේ ප්‍රශ්නයට ගැටළුවට මුහුණ පා තිබෙන්නේ. මන්ත්‍රීවරුන් පිටින් යන එක හරි අසාධාරණයි. මටත් කියා තිබෙනවා මුණටම අර හංදිවල තිබෙන ඒවා අයින් කරන්න කියා අතුල. ඔගොල්ලන් පත්වෙලා තිබෙන මන්ත්‍රීවරු විදියට. අපිට තිබෙන සාධාරණ විදියට අපි ඡන්දෙන් පත් වු මන්ත්‍රීවරුනේ. ඉතිං ඒවා අයින් කරන විට හඳුනා ගත් කොටසක් මා කැමතියි දුප්පත් මිනිසුන් කොරෝනා නිසා කියක් හරි සොයා ගන්න එකට. එතන මා සිටිනවා. හැබැයි අපේ ව්‍යාපාර ප්‍රජාවට ලොකුවට ගිහිල්ලා ලොරි ගණන් ගෙන බලපත්‍ර නැතුව පටවන්නේ නැතුව

ඔය දමාගෙන එවාට මාත් විරුද්ධයි. සභා තීරණයක් ගත් පසු මන්ත්‍රීවරුන්ට වත් ගරු උප සභාපතිතුමාට වත් ඇඟිල්ල දික් නොකර විදියට අපි සභා තීරණය අනුව මන්ත්‍රීවරු වශයෙන් එකට සිටින ලෙස ඉල්ලා සිටින කියන මතයේ ඉන්නවා. මොකක්ද අරකටත් ඒ වගේ. ත්‍රිරෝද රථ කමිටුව. සභා තීරණයක් ගත්තාට පසු ප්‍රශ්න භේදයකින් තොරව එය විසඳන ලෙස ඉල්ලා සිටිනවා. මේ හැම ජීවත් වෙන්නායි කරන්නේ. මෙතන නම් 33ක් තිබෙනවා. මා ගණන් කර ගත්තා . දුප්පත් අය වෙන්නැති. මේ නම් 33 අපි දන්නේ නැහැ. මෙතන මුදල් තිබෙන අයත් ඇති. දුප්පත් මිනිසුත් ඇති මෙතන. අපි අනුමත කළොත් මේවා අපිට හැමදාම ප්‍රශ්න. මේ කොරෝනා නිසා ජීවත් වෙන සුළු පිරිසකට අපි අසාධාරණයක් නොකළ යුතුයි. අපි විරුද්ධයි ව්‍යාපාර ප්‍රජාවට දැනෙන විදියට බදු ගෙවන ව්‍යාපාර ප්‍රජාවට ලොකුවට ලොරි ගණන් ගෙනවිත් මේ වෙළඳාම් කරන එකට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, වැරදි ලෙස අර්ථ කථනය කරමින් ගමේ හාලෙන් ඉදිආප්පයක් ආප්පයක් අපිට පරිභෝජනය කරන්නට සලස්වපු අපේ අහිංසක වෙළඳ ප්‍රජාව ඒ වගේම ගෙන්ද ගම් නොගැසු කෙසෙල් ඇවරියක් , පැණි දොඩම් ගෙඩියක් , ඒවාගේම තැඹිලි ගෙඩියක් අපිට පෙන්වපු ඒ අපේ අහිංසක වෙළඳ ප්‍රජාවට සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් සිදු විය යුතු දේ සිදුවූ හමාරයි. අපි ඔබතුමාගෙන් ඉල්ලනවා ඔවුනට මේ නගර සීමාවේ වෙළඳාම් කිරිමට යම් බලයක් පැවරෙන විදියේ යම් ක්‍රමයක් සැකසීම අප කළ යුතුයි. එමනිසා ජංගම හෝ වෙනයම් ක්‍රමයකට ඔවුනට බලපත්‍රයක් ලබා දීමට අපි ක්‍රියාත්මක විය යුතු බවට අදහස් දක්වමින්, ඔවුනට සිදුවූ අපහසුව ගැන කනගාටුව ප්‍රකාශ කරමින් ඉදිරියේදි ඔවුන් තහවුරු කරන ලෙස ඉල්ලනවා මේ අවස්ථාවේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එදා ඒ බඩු එකතු කරන අවස්ථාවේ මාත් නගරයට ආවා. ඒවා දමා තිබුණා අපේ කැබ් රථයේ. එහි තිබුණේ පැපොල් ගෙඩියක් , ගොටුකොළ , මුකුණුවැන්නා. එක මනුස්සයකු මා අහගෙන කියනවා මාගේ මුදලුත් එකක් දමාගෙන ගිහින්. නමුත් නිලධාරිත් අපහසුතාවයට පත්වෙන මේ ගත්ත යෝජනාව අනුව. මා දන්නේ නැහැ කොහොම ගෙන්නද කියා එවා. එතුමන්ලාටත් දොස් කියලා බැහැ මේක. සභාවෙන් ගත් තීරණයක් එතුමන්ලා

ක්‍රියාත්මක කරනවා. මා හිතන්නේ නැහැ එතුමන්ලාට අවස්ථාවක් නැහැ. ලොකු ලොකු ලොරි වල තිබුණ එවා එතුමන්ලා කියා තිබෙනවා අයින් කර ගන්න කියා. එතුමන්ලාටත් වරද පටවන්න බැහැ. සභාව ගත් තීරණය අනුව ඒ විදියට තිබෙන ටික ගෙනවා. නමුත් මෙතන ගැටළුවක් තිබෙනවා. අපේ මන්ත්‍රීවරු හැමෝම අම්බලන්ගොඩ ඉන්න අය. අම්බලන්ගොඩ නියෝජනය කරන කොට එතකොට මේ මන්ත්‍රීවරුන්ගේ හිතවත් අය ඉන්නවා අපි හැමෝගෙම. ඒ අය කියනවා බලන්න මෙහෙම මෙහෙමයි කියා කියනවා. ඔවුනුත් එහෙමනේ. ඔබතුමාට විශේෂයෙන් බලපානවා. අපි අම්බලන්ගොඩ කොට්ඨාශයේ ඡන්දය ඉල්ලන මිනිසුන්. ඔබතුමා සමහර වේලාවට දිස්ත්‍රික් ඡන්දයක් ඉල්ලනවා. නමුත් ඔබතුමාට තමයි මෙය ප්‍රධාන ලෙස බලපාන්නේ. එකනිසා මෙහි වෙළඳුන් සීමා කරන්න බැරි නිසා කොටසක් ගෙන්නායි කොටසක් නොගෙනිමටයි නැති නිසා මා යෝජනාවක් කරනවා. දැන් පුංචි පොළේ තිබෙනවානේ . දිනකට ගණනක් අය කරනවානේ . මේ පොඩි වෙළඳුන්ගෙන් ඒ වෙළඳමේ හැටියට ටිකක් ලොකුවට කරනවා නම් ඒ අනුව දිනකට නිලධාරියෙකු දමා පොඩි මුදලක් අය කරන්න. එතකොට කාටත් සාධාරණව ඒ කටයුත්ත කෙරෙයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ආදායම් පරීක්ෂක මහතා

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය වෙනත් ආකාරයට මට දකින්න සිද්ධ වෙනවා. දැන් අපේ ලසන්ත මන්ත්‍රීතුමා කියන ආකාරයට ප්‍රධාන කඩවලින් බදු ගෙවා ගෙන තමයි මෙය කරන්නේ. එතකොට මූලික ප්‍රශ්නයක් වෙලා තිබෙනවා බද්ද . නගර සභාව සහ සමස්ත රජයම යැපෙන්නේ බදු මතනේ. අපි නිෂ්පාදනයක් හරි වෙනත් සංවර්ධන ක්‍රියාවලියක් හරි සභාව දුවන්න හරි එහෙම ක්‍රියා මාර්ගයක් අපිට නැහැ. අපි යැපෙන්නේ බදු මඟින්. මූලිකවම ඒ ප්‍රශ්නය බලපානවා. අනිත් පැත්තෙන් සුළු පරිමාණ හෝ මධ්‍යම පරිමාණ ආකාරයෙන් මේ ලොරි වල බඩු ගෙනත් විකුණන මිනිසුන් එක කරන්නේ ජීවත් වෙන්න. මොකද මේ කාලීනව පෙරළිලා එන ක්‍රම මේවා. මොකද අපි පොඩි කාලේ මෙහෙම ලොරි වල ගෙනවිත් බඩු වික්කේ නැහැ. මොකද මිනිසුන් ජීවත් වෙන්න සාධාරණ ව්‍යාපාරයක් කරන්න පෙළඹෙනවා. මිනිසුන් මේ කරන්නේ වැරදි ව්‍යාපාර නෙමේ. වෙළඳාමක් කරලා ජීවත් වෙන්න උත්සාහ කරන්නේ. එතකොට ඒ කඩ සාප්පු ව්‍යාපාරිකයෝ හා ඒ අය අතර ගැටීම ඇති වන්නේ මා කියන්නේ කුඩා පරිමාණයෙන් මේ පාර

දිගේ බඩු වික්කාත් මේ හානිය මේ වෙළඳ ව්‍යාපාරික මහතුන්ට එනවා. සුළු වශයෙන් හරි එනවා. ලොරි දෙක තුනක් ගෙනත් බැවත් මේ හානිය මොකද අපි කඩයටම එන්න ඕන නැහැ. අපිට මහදි කෙසෙල් ගෙඩි ඇවරිය අරගෙන යන්න පුළුවන්. එක නිසා මේක මේ කාලිනව ඇති වෙච්ච අර්බුදයක්. එක මේ ලසුකොට දක්වන්න බැහැ. මේ ලොරි කිහිපයක් ගෙනවිත් බානවා. මේ අය මෙහෙම වෙළඳාම් කරනවා කියා. මේක රටේ ඇතිවු සමස්ත අර්බුදයක්. එක කාලිනව ගොඩ නැඟුන එකක්. එමනිසා මේ මිනිසුන්ගේ ජීවත් විමේ අයිතිය අපිට තහනම් කරන්නත් බැහැ. ඒ මිනිසුන් කසිප්පු පෙරන්න ගියේ නැහැ.කුඩු විකුණන්න ගියේ නැහැ. ඒ මිනිසුන් සාධාරණ වෙළඳාමක් කරන්නේ. අනිත් පැත්තෙන් මේ කඩ සාප්පු හිමියනුත් නිත්‍යානුකූලව නගර සභාව ඉදිරිපත් කරපු කරුණු අනුව ඒ අය ඒ වෙළඳ ව්‍යාපාරය පවත්වාගෙන යනවා. එමනිසා අද ඒ අයට අනිත් අය ජීවත් වෙන්න ගත්ත උත්සාහය තර්ජනයක් වෙලා තිබෙනවා. ඔන්න ඕක තමයි මා දකින විග්‍රහය. එතනදි නගර සභාව සහ රජයේ යැපෙන්න එක තමයි මා දකින අර්බුදය මෙතන තිබෙන. මොකද වෙළඳහල් හිමියොත් ජීවත් වෙන්න ඕන. මේ මිනිසුනුත් ජීවත් වෙන්න ඕන. ඒ මිනිසුන් ඒ සඳහා සාධාරණ ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙන්නේ. මේ සුළු පරිමාණ ව්‍යාපාරිකයන් කියක් හරි සොයාගෙන ජීවත් වෙන මිනිසුන් . තහනම් කරන එක සාධාරණයි කියා මටනම් පිළිගන්න බැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අපි දැන් මේ සභාවේ තින්දුවක් ගත්තා පොදු වෙළඳ සැලේ 7කු ඉදිරිපත් කළ ලිපියක් සම්බන්ධව. ඇත්තටම අපි එම ව්‍යාපාරිකයන් අපිට කිවුවේ නැහැ . පොඩි වෙළඳුන් එළවන්න කියා. දැන් මේ ගියාම තොග වෙළඳුන්ට අවවාද කළා. පොඩි වෙළඳුන් තමයි දමාගෙන ගියේ. අර බුලත් විකුණන මනුස්සයාගේ. එකත් දමාගෙන ඇවිත් . බුලත් තට්ටුව ගිනි තියලා. ඒ කියන තැන්වල තාමත් බඩු විකුණනවා. ඒ ව්‍යාපාරිකයන් අපෙන් ලියුමක් දි මෙය කළා කියා සතුටු වෙන්නේ නැහැ. ඒ අය.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මට හදිස්සි අවශ්‍යතාවයක් නිසා මා ගරු සභාවෙන් නික්ම යනවා.

- පස්වරු 12.45 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා සභා ගර්භයෙන් නික්ම ගියහ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මා ඉල්ලීමක් කරනවා නගර සීමාව ඇතුළත ඒ තොග වෙළඳාම සම්පූර්ණ නතර කරන්න. අපේ මේ අම්බලන්ගොඩ නගර සීමාව තුළ වෙළඳාම් කරන සුළු වෙළඳුන්ට කියන්න පාර අවහිර නොවන විදියට රක්ෂාව කරගෙන ඉන්න දෙන්න. ඕතන බයිට් විකුණන අය ඉන්නවා. කැඳ විකුණන අය ඉන්නවා. කරවල විකුණන අයත් ඉන්නවා. කරදරයක් නැහැ. අපි දන්නවා අවංකවම. මාගේ කැල්ලේ කවුරුවත් පාරට බඩු තියා නැහැ. ඔවුන් ඇතුළත සිට තමයි වෙළඳාම් කරන්නේ. මා ඉල්ලා සිටිනවා. මා යෝජනාවක් වශයෙන් ගෙනවා අපේ අම්බලන්ගොඩ නගර සභාවේ සිටින ස්ථිර අයට ඒ සුළු වෙළඳාමක් කරන්න ඉඩ දෙන්න. පාරට අවහිර නොවන විදියට. තොග වෙළඳාම සම්පූර්ණ අයින් කරන්න කියා මා ඉල්ලීමක් කරනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ ආදායම් පරීක්ෂක මහතා දැන් සභාවේ අදහස අහගෙන හිටියානේ . ඔබතුමා කරපු ක්‍රියා ගැන මා අහන්නේ නැහැ. මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න ඔබතුමාට තිබෙන බාධක මොනවාද? දැන් මේ මන්ත්‍රීවරු කියපු දේ කරන්න බාධාවක් තිබෙනවාද ? මා අහන්නේ ඔය සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන පුද්ගලයා ඔයානේ. එතකොට මේ සම්බන්ධව දැන් කියපු අදහසක් තෙරෙනවානේ. මේ තත්ත්වයට ගන්න ඔයාට මොනවාද තිබෙන හැකියාව. එක අහන්නේ. අපි අහන්නේ ඔයාව මුකුත් අමාරුවේ දමන්න නෙමේ. ඔයාගේ ගැටළුවක් තිබෙනවා නම් එය අපි නිරාකරණය කරලා මොකක්ද කරන්නේ කියන එක. මා අහන්නේ ඔයාට ඔයාගේ රාජකාරිය ඉෂ්ඨ කිරීම සඳහා නීතියෙන් වෙන බාධාවක් තිබෙනවාද? ඉවත් කරන්න කිවුවාම ඔගොල්ලන් මුලින්ම ගිහින් තිබෙන්නේ තල්ගස්ගොඩට. පොළ පාරේ සිටින සියළුම දෙනා අයින් කරන්න ඕන. ඇතුළට යන්න කියන්න ඕනේ. එහෙනම් මන්ත්‍රීවරුන්ගේ අදහස් දක්වන්න. ඉවරයිනේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

දැන් මෙතන තිබෙන්නේ ගැටළුවක් . මා නම් හිටියේ නැහැ සභාවේ. ඔබතුමා සමඟ රණ්ඩු වී මා ගියා යන්න. එක වෙනම කතන්දරයක්. දැන් ඔබතුමා තමයි මෙහි විධායකයා. ජනාධිපති හැරුණාම පළාත් පාලන ආයතන වල දෙවැනියාට විධායක බලය තිබෙන්නේ සභාපතිවරයාට තමයි විධායක බලය තිබෙන්නේ. එතකොට දැන් සභාවේ ගත්ත තීන්දුවත් තිබෙනවා. මොකක්ද තීන්දුව. ඔය ලිපිය අනුව මන්ත්‍රීවරුන්ගේ යම් අභිමානයක් තිබෙනවා. ඒ ලිපියක් දුන්නාම ඉදිරිපත් කරන්න ඕන. හැබැයි මේක කරන්න තිබුණා ඔබතුමාට. මේක ටිකක් බරපතල ප්‍රශ්නයක්. මොකක්ද හේතුව ඔබතුමාගේ දුර කාලය තුළ දැන් ඇඹිලිපිටියේ එක්කෙනාත් ඇවිත් මෙහේ

විකුණනවා. පොළොන්නරුවේ ඉන්න මිනිහාත් ගෙනවිත් මෙහේ විකුණනවා. එතකොට අපේ නගර සභා ආඥා පණත තුළ නගරයේ වැසියන්ගේ අපේ බල ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ අභිවෘද්ධිය සඳහා ඒ කටයුත්ත කරන්න. එතකොට ඔබතුමාට තිබුණා ඒ මොහොතේ. මෙතුමා ඉතිං නීතිය ක්‍රියාත්මක කළේ. ඔබතුමාගේ වරදක් තිබෙනවා. මේ මන්ත්‍රීවරු ගාව ගන්න එපා ඕකට. ඔබතුමා පත් කර එවා තිබෙන්නේ රජයෙන් මේ මන්ත්‍රීවරු ගාව ගන්න නෙමේ. ඔබතුමා එහෙම කිවුවා නම් තරයේ වැරදියි. ඔබතුමාට නීත්‍යානුකූලව දඩුවම් දෙනවා එහෙම කළානම්. මා දන්නේ නැහැ කළාද නැද්ද කියා. අපේ උප සභාපතිතුමා තමයි එක කිවුවේ. එක නිසා තමයි එය කිවුවේ. හැබැයි මේකට ක්‍රමවේදයක් එන්න ඕනේ. දැන් මෙතන තිබෙන ගැටළුව එකයි. මොකද නගරයේ සිටින මිනිසුන් බඩු විකුණනවා. එහි මිල පාලනය කිරිම ඒ අයගේ කර්ත්‍යවයක්. වැඩියෙන් විකුණනවත් ඇති. එක අපිට අදාල වෙන්නේ නැහැ. ඒ ගොල්ලන්ගේ ව්‍යාපාර දියුණු කරන්න එක කරන්න ඕන. හැබැයි ඇඹිලිපිටියේ සිටින මිනිහා මෙතුමා කියන්න වගේ කොරෝනා නිසානේ මෙය අතහැර දමා තිබුණේ. දැන් ඇඹිලිපිටියෙන් එන මිනිහාට කෙරෝනා තිබුණොත් එහෙම. දැන් ඵුඩ්සිටියේ නම් නම ලියන්න ඕනේ. උණ පරික්ෂා කරනවා. එතකොට මේක ගෙනවිත් ලොරියේ ගෙනවිත් විකුණනවා. මා දැක්කා මොන නිරෝධාන නිතියක්වත් නැහැ. එහෙම නම් ඒ නිරෝධනා නීතිය අනුව එහෙම විකුණන්නත් බැහැ. අනිත් එක පරිසරයට හිතකරත් නැහැ. පැපොල් තිබෙනවා නිකං චොරු වෙලා කොළේ තියලා. ඉතිං ඔක තමයි තත්ත්වය. හැබැයි ඔබතුමාගේ විධානය දිමේ පොඩි වරදක් අපි දකිනවා. මේ තින්දු තීරණ දෙන්න සියළුම දෙනා එකඟ වෙනකොට සියළු දෙනාගේ අභිප්‍රායන් ඉටුවන පරිදි කටයුතු නොකිරිම තමයි ඔබතුමාගේ වරද. එක තියෙන්න ඕනේ. එක වෙලා නැහැ. අපිට දකින්න තිබෙන්නේ. ඔබුතුමා හොඳයි. නීතිය ක්‍රියාත්මක කරන්න කියා මාත් එක්කත් ඇරියස් වෙලා තිබුණේ. සමහර වේලාවට තොපිම කාපියව් කියා දෙන්න ඇති. මා හිතන හැටියට. ඕක දුන්නා ඒ විදියට. අපි දන්නවා ඔබතුමා හැරෙනකොට. මොකද මා වසර 14ක් මෙතුමා සමඟ ඉඳලා තිබෙනවා. එකනිසා. හැබැයි ඔබතුමා හොඳයි. මේක තුළ මන්ත්‍රීවරුන්ගේ අභිප්‍රාය තුල ඔබතුමා වරදක් කර තිබෙනවා ද කියා. එක පිළිබඳව විමර්ශනයක් කරලා. මේකේ ක්‍රමවේදයක් ඇති කරන්න. අපේ නැතිබැරි මිනිසුන් ජීවත්වන අපේ නගරයේ ජනතාව එහි සංගනයක් කරලා . නීත්‍යානුකූල නෙවෙන්න පුළුවන් . නමුත් අපි නීත්‍යානුකූල නොවන දේවල් වක්‍රකාරව කර තිබෙනවානේ. අපි කරන ක්‍රමයක් තිබෙනවානේ. ඔබතුමා දන්නවා නීතිඥයෙක් හැටියට ඇතුළට යන්න ගහන්නත් දන්වා එළියට එන්න ගහන්නත් දන්නවා. ඉතිං ඒ වගේ ක්‍රමවේදයක් පණත තුළ කටයුතු කරලා යම් ක්‍රමවේදයක් ඉදිරියේදි සාකච්ඡා කරලා සියළුම මන්ත්‍රීවරුන්ගේ අභිප්‍රාය අනුව කරන්න කියා

අපි ඉල්ලා සිටිනවා. හැබැයි නිලධාරින් වශයෙන් මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය ආරක්ෂා කිරිම සභාව කියන්නේ ලේකම්තුමියණනි, සභාව ගන්න තින්දුව තමයි පළාත් පාලන ආයතන වල තින්දුව වෙන්නේ. ඒක නිසා එය ක්‍රියාත්මක කිරිම සභාපතිතුමා සතුයි. සභාපතිතුමා එය ක්‍රියාත්මක කරන කොට මහජනතාවගේ අභිප්‍රායන් ආරක්ෂා වන අයුරින් කටයුතු කරන්න ඕන. එමනසි මෙයට දැන් දෙන්න මෙයට මොනවා හරි කමිටුවක් පත් කරලා මෙයට ගන්න ඕන ක්‍රියාමාර්ග අරගෙන මෙතුමන්ලාගේත් මොනවා හරි නිත්‍යානුකුල ගැටළු තිබෙනවා නම් එවත් අරගෙන කමිටුවක් පත් කරලා හෙට අනිද්දාම තින්දුවක් ගන්න කියා අපි ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මා හිතනවා මේ සම්බන්ධයෙන් කමිටුවක් මඟින් තින්දුවක් ගන්න කියා. මා කියන්න ඕනේ මා මේ පුටුවේ වාඩි වුණේ 1997. මා කවදාවත් පදික වේදිකාවේ වෙළඳාම් කරන අයට කරදර කිරිමේ බලාපොරෝත්තුවක් තිබ්බේ නැහැ. ඒ අය සමාජයේ යම් කොටසක් කර ඉතාමත්ම අහිංසක ලෙස ජිවත් වන කොටසක් ලෙස තමයි අදහස් කළේ. ඒ වගේම මා උත්සාහ කරපු දෙයක් තමයි අම්බලන්ගොඩ වෙළඳ සංගමය ඇති කරලා අම්බලන්ගොඩ මිනිසුන්ගේ අනන්‍යතාවය රැක ගන්න ඔවුන් ලවා යම්කිසි වැඩ කොටසක් කරගන්න. අද වෙළඳුන් තුළ එකමුතු භාවයක් නැහැ. අපේ පියාණන්ගේ කාලයේ ඇත්ත වශයෙන්ම වෙළඳාමක් කරනවා නම් අල්ලපු කඩයේ එක්කෙනා මේ කඩයට ඇවිත් මහත්මයි මට රක්ෂාවක් දෙන්න කියා ඇහුවා නම් ඒ මුදලාලිගෙන් අහන්නේ නැතුව අනිත් කඩයට ගන්නේ නැති තත්ත්වයක් තිබුණා. එවා විමසා තමයි ගත්තේ . මෙන්න මෙයා අපේ කඩයට එන්න කැමතියි. මෙයා භාර ගන්නද කියා. ඒ වගේම මතක තියා ගන්න මාගේ පියා වෙළඳාමක් වශයෙන් කළේ අයිස්ක්‍රිම් වෙළඳාම. අයිස්ක්‍රිම් වෙළඳුන් 40කට වැඩි ප්‍රමාණයක් හිටියා. එදා සමන් අයිස්ක්‍රිම් ඇරෙන්න වෙන අයිස්ක්‍රිම් එකක් විකුණන්න ඒ 40 නා නම් ඉඩනම් දුන්නේ නැහැ. ඒ වේලාවේ අතින් පයින් ගහලා හරි විකුණනවා. අපි වෙළඳුන් අතර උත්සාහ ගත් එකම දෙයක් තමයි මේ එකමුතුකම අම්බලන්ගොඩ ඇති කරන්න පුළුවන් කියන එක. අම්බලන්ගොඩ ඇති කරන්න පුළුවන් ද කියා මා එම වෙළඳුන්ට කියා තිබෙනවා . අද ත්‍රිවිල් එකක් අරගෙන ගිහින් බලපිටියේ නතර කළහොත් මට මතකයි අපේ එක ත්‍රිවිල් එකක් ගිහින් බේරුවල ඔලුව පලාගෙන ආවේ ඒ මිනිහා ඒ පාක් එකේ නතර කරලා. ඔලුව පැලෙන්න පොලු පහරක් ගසා තිබුණා. නමුත් අද අම්බලන්ගොඩට ඇවිත් ත්‍රිවිල් එක නතර කරන්න හැකියාව තිබෙනවා. අපේ මිනිසුන් කිසිම මේවා එකක් නැහැ. අපේ ජනතාව මේ එකමුතුකම කියන බලාපොරෝත්තු වෙන්නේ නගර සභාව ලව්වා තමයි මේ අය ඉවත් කරන්නේ. හැබැයි ඒ

වෙළඳුන්ට හැකියාව තිබෙනවා මේ අය එකතු වුණොත් මේ කියන සියළු විෂබීජ අයින් කර දමන්න. අපේ පියාණන්ලා අපේ සියලා ඉවත් කළේ ඒ විදියට. ඇයි දැන් ඉන්න මිනිසුන්ට ඒක කරන්න බැරි. වී 56 කන්න ඕනේ නගර සභාවේ සභාපතිද ? එකනිසා අපේ වෙළඳුන් එකමුතු වෙලා ඉන්නවා නම් හරියට ඉන්නවානම් මේ දෙයට අපිට කවුරුවත් මේවා කරන්න දෙයක් නැහැ. අපි දන්නවා මේ පළා විකුණන්නේ අහවලා . අතන ඉන්නේ මෙයා. ඒ විදියට දන්නවා. එකම දෙය මාගේ මතය  නම් පාරේ මැද තියාගෙන සිටින අය සහ අයිනේ තියාගෙන සිටින ඔක්කොම අයින් කරන්න ඕනේ. පාරේ කණු දෙකක් තිබෙනවා. කණු දෙක ඇතුළේ වෙළඳාම කරගෙන ගියාට කමක් නැහැ. නමුත් පාරේ ඉන්න කට්ටියත් ඉන්නවා. ජාරා කමින්ම කරන කට්ටියත් ඉන්නවා. මා දන්නවා පොළ අයිනේ ඉන්නවා එක මනුස්සයෙක් මේ වේලාව අයින් කළාට පස්සේ එයා පොළේ සිටින අය සමඟ ආවා. තවම වෙළඳාම් කරනවා පාරේ ඉඳගෙන . එයා හැමදාම පොළොන් එළියට ඇවිත් ඉන්නේ. ටිකට් එක කඩනවාට. ඒ මනුස්සයා අයින් කළාට පස්සේ කියනවා. තවම වෙළඳාම් කරනවා මේ අය අයින් කරන්නේ නැද්ද කියන කාරණාව. මා අනිත් මිනිසුන්ට කිවුවා මේ මනුස්සයා එක්කද  ඔයාලාගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න ආවේ. හැමදාම පොළ වහලා තියාපන් කියා තමයි මෙයා හැමදාම ආරක්ෂක අංශ කුටිය අසළ ඉන්නේ. අසභ්‍ය වචන කිය කියා ඉන්නේ හැමෝටම. අපිට අපේ අම්මලා තාත්තලා මැරෙනකොටත් කියාගෙන ඉන්නේ. මෙයාත් එක්ක නම් එන්න එපා කියා මා එළවා දැම්මා.  ඉතිං ඒ මිනිසුනුත් ඉන්නවා. හදවත හොඳ ඒ මිනිසුත් ඉන්නවා. ඒ මිනිසුනුත් මේවා කරන්න ඕනේ. මා හිතන්නේ මේක ශක්තිමත් කිරිමට එකම දේ අපේ අම්බලන්ගොඩ වැසියන් සිටිනවා නම් ඒ වැසියන් එකතු කරන්න ඕන . එක අම්මාගේ වැසියන් වශයෙන් සාමුහික මේවා කරන්න ඕනේ. වෙළඳාම නතර කරන්නත් පුළුවන්. සමහර වේලාවට අපි ගියපාර කොරෝනා වේලවේ ඔබතුමාට මතක ඇති මේ මන්ත්‍රිවරුම කිවුවා පදික වේදිකාවේ වෙළඳාම අයින් කරන්න එපා . කඩයට වඩා ලූණු අඩුයි මේකේ. කඩයට වඩා හාල්මැස්සන් අඩුයි පදික වේදිකාවේ. එකනිසා අපි ඒ වේලාවේ අයින් කළේ නැහැ. ඒ වගේ අපි කළා. ඉතිං මෙකෙත් අපි කරන්න ඕන ක්‍රමවේද තිබෙනවා. එමනිසා අපේ නිලධාරින්ට වුණත් නිතිය තිබෙන්නේ එකයි. තමුන්නාසේලා යෝජනා කළා. එකම දෙයයි තිබෙන්නේ. තමුන්නාසේලා අයින් කරන්න කිවුවා. ඒ අය කඩුව අතට ගත්තා . ඒ අය වනාගෙන ගියා. ඉතිං එහි වගකිම තිබෙනවා. මට මෙහි අයින් කිරිම සම්බන්ධයෙන් අම්බලන්ගොඩින් එකම එක්කෙනායි හොඳම හොඳයි කිවුවේ. එකම එක්කෙනෙක් කතා කරලා කිවුවා හරියටම හරි . මොකද දැන්නම් පාරවල් වල ඉඩ තිබෙනවා කියා. ඉතිං එහෙම දකින මිනිසුනුත් ඉන්නවා. ඒ මොකද එකට හේතුවෙලා තිබෙන්නේ  මේ පදික වෙළඳුන් ඒ මිනිසුන්ට හිරිහැර වෙන විදියට

තමයි වෙළඳාම් කරන්නේ. ඉතිං එමනිසා එකත් ආරක්ෂා කරගෙන මා හිතනවා මෙයට විසඳුමක් දෙන්න අපි කට්ටිය පත් කරන්නම්. අපේ ජී. සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමා,

<u>**ගරු නගර සභා ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

මා කතා කළාට පසු කතා කරන්න. මේ ප්‍රශ්නය අපි විසින් තේරුම් නොගත් ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය අපි මන්ත්‍රීවරු සාකච්ඡා කරලා නිලධාරින්ට උපදෙස් තිබ්බා අපේ අවශ්‍යතාවය. අපිට ආපු විරෝධතාවයන්. විවිධප්‍රකාරයෙන් මේ ප්‍රජාවගෙන් අපිට ආව විරෝධතාවය අපේ මන්ත්‍රීවරු සාකච්ඡා කරලා නිලධාරින්ට උපදෙස් දෙන්න තිබ්බා. මෙන්න මේකයි අපිට තිබෙන ප්‍රශ්නය ඔබලාට කරන්න පුළුවන් දෙයක් කරන්න. මේකයි රාජකාරිය කරන්න. මොකද මෙය ඉතිහාසය දක්වාම ගියාම මා එකවතාවක් සභාපතිවරයා වශයෙන් සිටින කාලයේ ගණකාධිකාරි වරයාගෙන් ඇහුවා බලපත්‍ර දෙන්න පුළුවන් ද කියා. දිනකට ටිකට් එකක් කඩන්න පුළුවන් කියා. මොනම තාලෙන් වත් මේක බැහැ කිවුවා. එක තමයි හේතුව අනවසර වෙළඳාමෙන් අපිට ආදායමක් නොලැබෙන . පොළකින් අය කළාට අපිට අනවසර වෙළඳුන් ඉවත් කරන් බැහැ. මෙවැනි තත්ත්වයක නිති ගත කරන්න එපා. එක නිතිය. මා ඉතාමත්ම කනගාටු වෙනවා මේ යෝජනාවේ තිබෙන්නේ රාජකාරිය කරපන් කියා පමණයි. එතකොට අපි රාජකාරිය කරපන් කියා විතරක් ගැහුවාට විතරක් මදියි මන්ත්‍රීවරු හෝ අපි සභාවක් විසින් . ඒ අය සමඟ අපි සාකච්ඡා කරන්න ඕනේ මන්ත්‍රීවරු . අපේ මන්ත්‍රීවරු සාකච්ඡා කරලා ඒ අයට නිසි උපදෙස දුන්නා මේ තත්ත්වය උදා වෙන්නේ නැහැ. මොකද ඒ අයගේ කිසිම තරහාකාරයෙක් මේවායේ වෙළඳාම් කරන්නේ නැහැ. යාළුවෝ වෙන කවුරුත් වෙළඳාම් කරන්නේත් නැහැ. ඒ අය කරන්නේ රාජකාරිය. මොකද මේ ලිපිය ගිහින් තියෙන්නේ ඒ විදියටනේ. දැන් ලිපිය කියෙව්වා. දැන් මේ නිලධාරියා මට මේ රාජකාරිය හම්බ වුණේ මෙහෙමයි කියා. එහෙම දෙයක් ආවාම එයාට බාධා තිබෙන බාධා අපි සභාවේ කතා කළේ නැහැනේ. එයා පොලිසියෙන් අරන් ගියා . එක අනවසර වෙළන්දෙක් .එයාව අරගෙන යනවා. රු.135000/= මෙට්ට අස්සේ තිබුණයි . එවත් එක්ක තමයි මේවා දමාගෙන ගිහින් තිබෙන්නේ. එතකොට කොහොමද උත්තර දෙන්නේ. එක බරපතල ප්‍රශ්නයක්. ඉතිං මේ නිලධාරියොට රාජකාරියක් කරන්න පුළුවන්ද . අපි හිතන තරම් සරල නැහැ. අපි කතා කළාට. හැබැයි මේ සියළු මන්ත්‍රීවරු සියළු දෙනාගේම සාකච්ජාව මේ වෙළඳුන් කිහිප දෙනෙකු සම්බන්ධවයි. එක අපි විසඳා ගන්නේ නැතුව අපි එය වෙනම පැත්තකට ගියා. ගරු සභාපතිතුමා , ගරු ලක්ෂ්මි මන්ත්‍රීතුමිය කියන ආකාරයට ඕනෑම නගරයක මේ නවස වෙළඳාම තිබෙනවා. හැබැයි මහජනතාවට පිඩාවක් නොවන විදියට. මොකද මෙතුවත් කල් අපි අවසර දී තිබෙනවා.

මොකද මිනිසුන් ජීවත් වෙනවානේ ඒ වගේ. එක නගරයක අවශ්‍යතාවයක්. අපි නිහඬව හිටියත් ඒ අයට අශිර්වාද කර තිබෙනව මෙය කරගෙන යන්න කියා. අනිත් පැත්තට අපි කිසි කෙනෙක් කතා කරන්නේ නැහැ පරිභෝගිකයාගේ පැත්තෙන්. අද පැපොල් ගෙඩිය රු.60/-, ඕනෑම පළතුරක් රු.60/- කළේ ඒ වෙළඳුන්. හැබැයි මා එය අනුමත කරන්නේ නැහැ ඒ වෙළඳුන් සම්බන්ධව.ඇයි එහෙම කරන්නේ. එක තමයි අපි සාකච්ඡා කර තිබෙන්නේ. ඇයි ඔගොල්ලන් මේක කරන්නේ නැත්තේ. ජනතාවට මේ සහනය දෙන්න ඕනේ. ඉතිං එතනත් අපි ඉන්න එපැයි. අනවසර හරි අපේ මිනිසුනේ දැන් කරන්න කියන්නේ. දැන් අපේ මිනිසුන් ආරක්ෂා කරගෙන අර අය ඉවත් කිරිමට නම් මේ ප්‍රතිලාභය ජනතාවට දෙන්න ඕන. එක දෙන්නෙත් නැහැ. එක දෙන්නේ නැතුව අපි සභාව විතරක් පාවිච්චි කළොත් මන්ත්‍රිවරු අහන්න පුළුවන්නේ අපි රු.60/- පොල් ගෙඩියක් කන එක රු.100 ට අන්නාසි ගෙඩියක් කන එක අරහං ද කියා. මොකද මා මේ නගරයේ පැය 8ක් 10 ක් සිටින මනුස්සයා. මේ කියන සියළුම කාරණා මාගේ අතේ තිබෙන්නේ.  එක දකිනවා දවස ගණනේ. ඒ දැකලයි මා සභාපතිතුමනි , මා මේ කතා කරන්නේ. එතනදි අන්නාසි ගෙඩිය සුපෝබභෝගි භාණ්ඩයක් වෙලා තිබුණා. ගමේ ජනතාවට. රු.200 ට තිබුණේ. අද මේ වෙළඳුන් රු.100/-  ට දෙනවා. වෙළඳාම කරනවා. වෙළඳාම අනවසරයි. මේ සියළු කියපු දේ මා හිස්මුදුනින් පිළිගන්නවා. එක වැරදියි. ඒ මොකද අර පොඩි මිනිහාට මේක දැනෙනවා. එතකොට පාරිභෝගිකයන් පැත්තෙන් මෙය කතා කළහොත් අපේ වෙළඳුන් ඇයි මෙය නොකරන්නේ. අපේ වෙළඳුන්ටත් තිබෙනවා මේ අයිතිය කරන්න. ඇයි මේ අය මෙය නොකර කරන්නේ. මේ ප්‍රශ්නය ඉවරයි. ඒ අය ඉදිරිපත් නොවි මේක මේ විදියට දැඟලුවාම නිලධාරින් දැඩි අපහසුතාවයට පත් වෙනවා. එතකොට හෙට දිනයේ අනවසර වෙළඳාම කළත් නිලධාරින් අහක බලාගෙන යයි. ඉතිං මෙහෙම කොහොමද රාජකාරිය කරන්නේ. මා මේ නිලධාරින් ගැනම විතරයි කතා කරන්නේ. සියළුම මන්ත්‍රිවරුන් කියපු දේවල් වලට මා එකඟයි. මමත් එතන ඉන්නවා. මා කියන්නේ නැහැ මේ පදික වේදිකාවේ කිසිම කෙනෙක් අයින් කරන්න කියා. මා කියන්නේ ඒ මිනිසුන්ගේ ජීවනෝපාය . ඒ මිනිසුන්ට එක දෙන්න ඕන. නිලධාරින් කොහොමද දන්නේ අපි මේ අදහස් කරන කිහිප දෙනා ඒ අය ඉවත් කරන්නේ. දැන් එයට ක්‍රමවේදයක් අප විසින් යෝජනා කරන්න ඕන මන්ත්‍රිවරු.  එහෙනම් මේ ව්‍යාසනය වෙන්නේ නැහැ. දැන් ඉතිං මේක වෙලා ඉවරයි. කමිටුවක් පත් කරලා ඒ ආකාරයෙන් ඉටු කිරිම සුදුසු යි කියා මා යෝජනා කරනවා. ඒ වගේම නිලධාරින්ගේ පැත්තෙන් ඒ පවරපු රාජකාරිය කරයි කියන මතයේ මා ඉන්නවා. අපි මන්ත්‍රිවරු සාකච්ඡා කරලා ඕක වෙනස් කරන්න තිබුණා කියන මතයේ තමයි මා සිටින්නේ.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සතියක් ඇතුළත තීන්දුවක් ගනිමු. හරි මං හිතනවා අපේ උප සභාපතිතුමා, සරත් මන්ත්‍රීතුමා, ලක්ෂ්මි මන්ත්‍රීතුමිය, ලසන්ත මන්ත්‍රීතුමා, අතුල මන්ත්‍රීතුමා. අයිරාංගනී මන්ත්‍රීතුමිය,රාහුල මන්ත්‍රීතුමා අපි ඇතුල් කරල අපි තීන්දුවක් ගන්න. කරන්න දෙයක් නැහැ ඉතින්. සාමාන්‍යයෙන් අම්බලන්ගොඩ නෙමේ මේ නගර සභාවෙ මං දන්නවා අත්දැකීමෙන්. සියලු හොඳ වැඩ ටික මන්ත්‍රීවරු භාර ගන්නවා. නොහොඳ වැඩ ටික සභාපතිට පවරනවා. ඒකයි ඉතින් වෙලා තියෙන්නෙ. මීලඟට සෝභිත මන්ත්‍රීතුමා. අර මේ ෆයිල් 02 ක් අපි එව්වා අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ නැරඹුම් වේදිකාවේ තරප්පු පෙළ අමතර කොටස් ගෙවීම. ගැටලුවක් තියෙනවද? මෙතන අනුමත කරා කියල දාමු. හරි හරි බලලා ලේකම්තුමියට දන්වන්න ප්‍රශ්නයක් තියෙනවනම්.අපි අනුමත කරා කියලා ලියනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගැටළු තියෙනවාද කියා බලන්න වුණේ නැහැ.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙතන අනුමත කරා කියල දාමු. හරි හරි බලලා ලේකම්තුමියට දන්වන්න ප්‍රශ්නයක් තියෙනවනම්.අපි අනුමත කරා කියලා ලියනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සීමාව තුළ මාර්ග දෙපස අනවසරයෙන් වෙළඳාම් කරන අයවළුන් විසින් තම වෙළඳාම් ඉදිරියටත් කරගෙන යාම සඳහා අවසර ඉල්ලා එවා ඇති ලිපි සම්බන්ධව තීරණයක් ගැනීම සඳහා පහත සඳහන් ගරු නාගරික මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කරන අතර කමිටුව මගින් සතියක් ඇතුළත කීරණයක් ගන්නා ලෙසත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දන්වන ලදී.

01.ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා

02.ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා

03.ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා

04.ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා

05.ගරු නගර සභා මන්ත්‍රිනී ර්.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය

06.ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා

07.ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා

08.ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය

**12.04 2020.03.29 දින පැවැත්වීමට තිබූ දූමාරේ සංගීත ප්‍රසංගය රටේ පවතින කොරෝනා තත්ත්වය හේතුකොටගෙන නොපැවැත්වූ බැවින් ප්‍රසංගයේ දැන්වීම් පුවරු ප්‍රදර්ශන ගාස්තු නැවත ගෙවීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කොරෝනා තත්ත්වය හේතුකොටගෙන ප්‍රචාරණය නොවූ දැන්වීම් පුවරු සඳහා මුදල් නැවත ගෙවීම. ඒ අනුව 2020.03.29 දින පැවැත්වීමට තිබූ දූමාරේ සංගීත ප්‍රසංගය රටේ පවතින කොරෝනා වසංගත තතත්වය හේතුවෙන් කල්දැමීමට සංවිධායක මණ්ඩලය තීන්දු කර ඇත. ඒ අනුව මෙම ප්‍රසංගයේ දැන්වීම් පුවරු සඳහා ගාස්තු වශයෙන් රු.43200/- ක මුදලක් ගෙවා ඇති අතර එම මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා ඇත. මෙම ප්‍රසංගය නොපැවැත්වූවද දැන්වීම් පුවරු සඳහා නගර සභාවට ගෙවූ මුදල් ආදයම් පරීක්ෂකවරු විසින් ගෙවීමට නොහැකි යැයි යෝජනා කර සභාවට යොමුකර ඇත. ඒ අනුව 2020.07.07 පැවති සභා තීරණ 03.17 අනුව මුදල් නැවත ලබාදීම සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමාගෙන් විමසීමක් කරන බව දන්වන ලදී. එය පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් කොවිඩ් වසංගතය හේතුවෙන් රටේ උද්ගතවූ තත්ත්වය සලකා බලා අදාල දැන්වීම් පුවරු ගාස්තුව  බලපත්‍රලාභියාට ගෙවීම සුදුසු බවත් එය සභාවේ විධිමත් සභා සම්මුතියක් ගෙන  කළ යුතු බවත් දන්වන ලදී. ඒ අනුව සභාවට යොමුකරල තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ඕතන තියෙන්නෙ කල් දාල කියලනෙ.ආයෙත් ගන්න පුළුවන්නෙ. අත්හිටවල නැහැනෙ.කරන එක නවත්තල නැහැනෙ. කල් දාල කියලනෙ කියන්නෙ ඒ ගොල්ලො.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නවතා දැමීමට කියල තමයි මේකෙ තියෙන්නෙ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

කල් දැමීමට කියලනෙ දැන් ඔබතුමා කිව්වෙ.

<u>**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නෑ. නවතා දැමීම කියල තමයි තියෙන්නෙ. මේකෙ දාල තියෙනවා පළාත් පාලන කොමසාරිස් එකී පාර්ශවය කර්මාන්තකරුවෙකු ලෙස අගතියට පත්වී ඇති අතර ඒ පිළිබඳව තව දුරටත් සලකා බැලීම සුදුසු වේ කියල. එහෙමනම් අපි නිදහස් කිරීමේ තීන්දුව දෙන්න. ඒ තින්දුව හරියට ගසා දෙන්න.

**තීරණය-**

2020.03.29 දින පැවැත්වීමට තිබූ දුමාරේ සංගීත ප්‍රසංගය රටේ පවතින කොරෝනා තත්ත්වය හේතුකොටගෙන නොපැවැත්වූ බැවින් ප්‍රසංගයේ දැන්වීම් පුවරු ප්‍රදර්ශන ගාස්තු ලෙස නගර සභාවට ගෙවූ රු.43200/- ක මුදල නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12:05 ATD/10/33/2020 දරණ ඔප්පු සාරාංශ අයදුම්පතට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම සම්බන්ධ ඔප්පු සාරාංශය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ATD/10/33/2020 දරණ ඔප්පු සාරාංශ අයදුම්පතට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම සම්බන්ධ ඔප්පු සාරාංශය සභාගත කිරිම. ඔප්පු සාරාංශ අයදුම්පතට අනුව 1% ගාස්තුව වන රු.33600/- ක මුදලක් අයකිරිමට සභා අනුමත වී ඇත. නමුත් එස්.ටී බුද්ධිනි කල්පනා මහත්මියගේ මෙම ඉඩම ඇයගේ මවගේ මෑණියන් විසින් තෑගි ඔප්පුවක් විසින් ලබා දුන් බැවින් මෙම මුදල නිදහස් කරන මෙන් ඉල්ලා සිටිනවා. මෙම ලිපිය සමඟ ලබා දුන් දිවුරුම් ප්‍රකාශ ඇයගේ මවගේ උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් , ඇයගේ උප්පැන්නේ සහතික කළ පිටපතක් ලබා දී ඇත. ඒ අනුව මෙයින් පෙනි යන්නේ ධනවති පරණවිතාන යන අය බුද්ධිනි කල්පනි මහත්මියගේ

මිත්තණිය බව පැහැදිලි වේ. එබැවින් සැලසුම් කමිටුව මඟින් 1% ගාස්තු නිදහස් කර ඇත. මෙය විකිණීමක් නොවන බැවින් 1% ගාස්තු නිදහස් කිරීමට සභාවට යොමුකරන අතර බුද්ධිනි කල්පනි මහත්මියගේ 1% ගාස්තු නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. මෙහි යම් විදියකින් විකිණීමක් සිදුවුවහොත් 1% ගාස්තු අය කරන්න කියා සඳහන් කරන්න ලේකම්තුමියණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපිටත් පුළුවන් ඔය විදියට . දැන් තෑගි ඔප්පුවකට නම් බදු අය කරන්නේ නැහැ.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තෑගි ඔප්පුවක් නෙමේ. තමන්ගේ පියා තම පුතාට දෙනවා නම් එවැනි අවස්ථාවක බදු අයකිරීමක් කරන්නේ නැහැ. හැබැයි ඒ නම නැතුව වෙනත් නමකට පෙරළුනොත් බද්ද ගෙවා තමයි ඒ නමට කරන්නේ.

**තීරණය-**

ATD/10/33/2020 දරණ ඔප්පු සාරාංශ අයදුම්පතට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම සුදුසු බවටත් එම ඉඩම වෙනත් පුද්ගලයෙකුට විකිණීමේදී 1% ගාස්තුව අයකර ගත යුතු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

**12.06 අනසර වෙළෙඳුන් සඳහා දෛනික බලපත්‍ර ලබාදීම සම්බන්ධව ආදායම් පරීක්ෂක විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාවකාලික වෙළඳුන් මාර්ගය අවහිර වන පරිදි වෙළඳාම් කිරීම , මාර්ග වලට අලාභ හානි කිරීම , මාර්ග වල ගමන් කිරීමට බාධාවන් කිරීම අතුරු ව්‍යවස්ථාව යටතේ නඩු පැවරීම සුදුසු බවට යෝජනා කරනවා. මාර්ග වලට අවහිර නොවන පරිදි පුද්ගලික පරිශයන් තුළ දෛනික පදනමින් තාවකාලිකව වෙළඳාම් කරන පුද්ගලයන් සංචාරක වෙළඳුන් විසින් ආහාර ද්‍රව්‍ය වෙළඳාම් කිරීම අතුරු ව්‍යවස්ථාවේ යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සුදුසු බවට යෝජනා කරනවා. එමෙන්ම සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව 2 ( ආ ) ව්‍යවස්ථාව මඟින් යම් උත්සව කාලයක් සඳහා නගර සභාවේ සභාපතිවරයා විසින් තාවකාලික

බලපත්‍රයක් නිකුත් කිරිමට බලය ලබා දි ඇති අතර ඒ අනුව නව අවුරුදු උදාවිම යන උත්සව දෙසැම්බර් 01 සිට ජනවාරි 31 දක්වා දෛනික බලපත්‍ර ලබාදිමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමට යෝජනා කරනවා. එසේ දෛනික බලපත්‍ර ලබාදිමේ දිනක බලපත්‍ර ගාස්තු පහත සඳහන් අයකිරිම සුදුසු බවට යෝජනා කරනවා. වර්ග අඩි 10ක භූමි ප්‍රමාණයක් සඳහා රු.500/- ක්, වර්ග අඩි 11-20 ත් අතර භූමි ප්‍රමාණයක් සඳහා රු.750/- ක් , වර්ග අඩි 20ට වැඩි භූමි ප්‍රමාණය සඳහා රු.1000/- . ඒ අනුව තාවකාලික බලපත්‍ර ලබා දීම ඇමුණුම් 01 අනුව තාවකාලික බලපත්‍රයක් වෙළඳුන් සඳහා ලබාදීමට යෝජනා කරන බව ආදායම් පරික්ෂක මහතා යෝජනා කරනවා. එය සභාවට මා විසින් යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අනවසර පදික වේදිකාවේ දමා ගෙන සිටින අයට බලපත්‍රයක් ලබා දිය හැකිද ?

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පදික වේදිකාවේ නෙමේ. වතුවල දමාගෙන සිටින අයට .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

රු.1000/- ක් නම් එක මදියි.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමලා එහෙනම් මේක සාකච්ඡා කරන්න කමිටුවට ඉදිරිපත් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

කමිටුවෙන් දෙන්නම් හරි.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපිට ගන්න පුළුවන් වාර්ෂික සිමාවකුත් තිබෙනවා. අපිට ගන්න පුළුවන් වසරකට රු.3000/= යි. ඒ අනුව සාපේක්ෂව ඕනේ යෝජනා කරන්න. අපිට එය ඉක්මවා යන්න බැහැ.

**තීරණය-**

අවනසර වෙළෙඳුන් සඳහා දෛනික බලපත්‍ර ලබාදීම සම්බන්ධව ආදායම් පරීක්ෂක විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව සහා තීරණ අංක 12.03 යටතේ පත්කරන ලද ගරු නාගරික මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දන්වන ලදී.

<u>කමිටුව සඳහා පත්කළ ගරු මන්ත්‍රීවරුන්</u>

01.ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා
02.ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා
03.ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා
04.ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා
05.ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය
06.ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා
07.ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා
08.ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය

**12:07 අම්බලන්ගොඩ පොදු වෙළඳපොල වෙළඳ සංකීර්ණයේ අංක 01 හා 02 යන කඩකාමර ටෙන්ඩර් කිරීම**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ පොදු වෙළඳපොල වෙළඳ සංකීර්ණයේ අංක 01 හා 02 යන කඩකාමර බදු කුළී නොගෙවීම් මත ජී.ඩබ් චමරි තරංගා යන අයගෙන් සිදුවීම මත බදු ගිවිසුම අහෝසි කරන ලදී. බදු ගිවිසුම අහෝසි කර මෙම කඩ කාමරය පවරා ගත් පසු නව බදුකරුවෙකු තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතුය. මින් පෙර අවස්ථා ගණනකදි පොදු වෙළඳ පොළේ බදුකරුවන් තෝරා ගැනීමට අවම එක්වන් මුදලක් තිරණය කිරිම ඒ අනුව කටයුතු කළද ඒ අනුව කිසිදු ඉල්ලුම්කරුවෙකු ඉදිරිපත් නොවුණි. එම කඩකාමරයේ එක්වන් මුදල ටෙන්ඩර් කළහොත් එම තත්ත්වයම උදාවීමට ඇති බැවින් මාසික බදු කුලිය වාර්ෂිකව එකතු කළ යුතු බවට යෝජනා වේ. ඒ සඳහා අවම මාසික කුළිය රු.15000/- ලෙස යෝජනා කරන අතර කුළිය දෛනිකව රු.500/- බැගින් අයකර ගැනිමට හැකි වන්නේ නම් ඵලදායි වන්නේය. ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු යයි යෝජනා කරනවා. ඒ අනුව විවෘත ටෙන්ඩර් පටිපාටියට අනුව සුදුසු බදුකරුවෙකු තෝරා ගැනිමට යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්**

ඒ කියන්නේ ටෙන්ඩරයක් ද කරන්නේ. එහෙනම් ගැටළුවක් නැහැ. නිත්‍යානුකූලව යන්න.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපේ නීතියේ හැටියට ටෙන්ඩරයක් දිමේදි එක්වන් අවම ගාස්තුවක් ගන්න ඕනේ. එම එක්වන් වාරිකය දමන නිසා හැමදාම අපිට මේ පොදු වෙළඳ පොළේ ඉල්ලුම්කරුවන් නැහැ. මේ කඩය දි තිබුණේ මාසයකට රු.900/- . මේ අය යෝජනා කරනවා රු.15000/- කට දෙන්න. දවසකට රු.500/- ගණනේ අය කරන්න. එක්වන් වාරිකය නැතුව .

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්**

මේ නිලධාරින් ද නිර්දේශ කර තිබෙන්නේ.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නිර්දේශ තමයි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්**

බදු වල හිඟ තිබෙනවාද ?

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හිඟ තිබෙන ඒවාට එයාට විරුද්ධව නඩු දමන්න ඕනේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්**

අන්න එක ඉස්සෙල්ලා කර ගන්න ඕනේ.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එක අපේ නිලධාරින්ගේ වැඩක්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්**

මේක නිලධාරින්ගේ වැඩක් කිවුවාට ඕක එහෙම දමා බැහැ.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් මෙහෙමයි මන්ත්‍රීතුමා . යම්කිසි නඩුවක් පැවරුවාට පසු නඩුව කැඳවන්නේ මාස තුනකින් විතර . අවුරුද්දට තුන්පාරයි. ඔය කියන එකට නඩුව දමා රු.50000/- විතර ගන්න අවුරුදු 10කින් නඩුව ඉවර වෙන්නේ නැහැ. එතකොට ඒ කාලය ඇතුළත අපි මේය කාටහරි බදු දෙන්න ඕනේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්**

සභාපතිතුමා , මෙය දෙන්න ඕන. නමුත් අපේ හිඟය ගැන අමතක කරන්න බැහැ.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපේ හිඟය ගැන කියන්නේ කලින් එක්කෙනාට නෙමේ . ඒ හිඟ මුදල අපි අය කරනවා. **ගරු නගර සභා ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ.සෝභිත රංජිත් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ හිඟය අයකරන්නේ මෙය දෙන එක්කෙනාගෙන්ද ?

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නැහැ. අරයට තියෙන එක අපි නඩු පවරන්න ඕනේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ.සෝභිත රංජිත් මහතා කතා කරමින්**

මා කියන්නේ නඩුවක් නොපරවා හරි දෙන්න පුළුවන්ද දන්නේ නැහැ.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙකේ පසුගිය සභාවේ අපි සාකච්ඡා කළ එක පිටු පස්සේ එහි දැනට රු.60000/-ක හිඟයක් තිබෙනවා. දැනටම රු.50000/- ගෙවුවා. තව රු.10000/- ගන්න තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ.සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, ඒ රු.10000/- අරගෙන දුන්නාම ප්‍රශ්නය ඉවරයිනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කොයි දේ කළත් කමක් නැහැ. නිත්‍යානුකූලව කරන්න.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් එක තමයි සභාවේ අනුමැතිය ලැබුණාට පසු මෙය කරන්න පුළුවන්. ඒ ගොල්ලන් යෝජනා කර තිබෙනවා. එයට විරුද්ධ කවුරු හරි ඉන්නවාද ? නැහැනේ.

**තීරණය-**

අම්බලන්ගොඩ පොදු වෙළඳපොල වෙළඳ සංකීර්ණයේ අංක 01 හා 02 යන කඩකාමර ටෙන්ඩර් කිරිම සුදුසු බවටත් , එක්වන් මුදල් අයකිරිමකින් තොරව අවම මාසික කුලිය රු.15000/- ක් වන ලෙස දිනකට රු.500/- බැගින් අයකිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් තීරණය කරන ලදී.

**12:08 ATD/13/104/2020 දරණ ඔප්පු සාරාංශ අයදුම්පතට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඔප්පු සාරාංශ අයදුම්පත සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ATD/13/104/2020 දරණ ඔප්පු සාරාංශ අයදුම්පතට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ කොයි දේ කළත් නිත්‍යානුකූලව යන්න.

**තීරණය-**

ATD/13/104/2020 දරණ ඔප්පු සාරාංශ අයදුම්පතට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම සුදුසු බවටත් එම ඉඩම වෙනත් පුද්ගලයෙකුට විකිණීමේදී 1% ගාස්තුව අයකර ගත යුතු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

**12:09 ATD/13/105/2020 දරණ ඔප්පු සාරාංශ අයදුම්පතට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ATD/13/105/2020 දරණ ඔප්පු සාරාංශ අයදුම්පතට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම.

**තීරණය-**

ATD/13/105/2020 දරණ ඔප්පු සාරාංශ අයදුම්පතට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම සුදුසු බවටත් එම ඉඩම වෙනත් පුද්ගලයෙකුට විකිණීමේදී 1% ගාස්තුව අයකර ගත යුතු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

**12:10 ATD/13/106/2020 දරණ ඔප්පු සාරාංශ අයදුම්පතට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ATD/13/106/2020 දරණ ඔප්පු සාරාංශ අයදුම්පතට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම.

**තීරණය-**

ATD/13/106/2020 දරණ ඔප්පු සාරාංශ අයදුම්පතට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම සුදුසු බවටත් එම ඉඩම වෙනත් පුද්ගලයෙකුට විකිණීමේදී 1% ගාස්තුව අයකර ගත යුතු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

**12:11 ATD/13/107/2020 දරණ ඔප්පු සාරාංශ පෝරමයට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ATD/13/107/2020 දරණ ඔප්පු සාරාංශ පෝරමයට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම සම්බන්ධව ආදායම් පරික්ෂක මහතාගේ තීරණය අනුව ඉල්ලුම්කරු විසින් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර ඉල්ලුම්කරු වන ජිනපාල මහතා විසින් 1% ගාස්තු නිදහස් කරන ලෙස ඉල්ලා ඇත. ඒ ආදායම් පරික්ෂකගේ වාර්තාව අනුව පියා විසින් දරුවන් වෙත පවරා දි ඇති බැවින් 1% ගාස්තු නිදහස් කරන ලෙස ඉල්ලා ඇත. නැහැ සම්පූර්ණම මේ හතරම තෑගි. ලේකම්තුමිය මේ වරිපණම් අංක යටතේ සඳහන් කරන්න මේ නම්වලට නැතුව වෙනස් වුවහොත් මේ බද්ද ගන්න ඕන කියා.

**තීරණය-**

ATD/13/107/2020 දරණ ඔප්පු සාරාංශ පෝරමයට අනුව 1% ගාස්තුව නිදහස් කිරීම සුදුසු බවටත් එම ඉඩම වෙනත් පුද්ගලයෙකුට විකිණීමේදී 1% ගාස්තුව අයකර ගත යුතු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

**12:12 අම්බලන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පොල භූමියෙහි ඇති ප්‍රධාන වැසිකිළියේ වල අලුත්වැඩියා කළයුතු මට්ටමක පවතින බැවින් තාක්ෂණ සේවා නිලධාරී වාර්තාව අනුව ජල භාවිතයට හා අපද්‍රව්‍ය බැහැරවන ප්‍රමාණයන්ට ගැලපෙන පරිදි මුද්‍රිත වැසිකිළි වල් 03 ක් සැකසීම.**

<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පොල භූමියෙහි ඇති ප්‍රධාන වැසිකිළියේ වල මේ වන විට අලුත්වැඩියා කරමින් පවතින කටයුතු ඉදිරි සභාවට ප්‍රථමයෙන් අවසන් නොකිරිමේ හැකියාවක් පවති. ඒ අනුව ඒ වැඩ අවසන් කිරිමත් සමඟ වැසිකිළි වළේ පවත්නා තත්ත්වය අලුත් වැඩියාවක් කළ යුතු වේ. නිතර පිරෙන ස්වභාවය නිසා එය සම්පූර්ණ මුද්‍රිත ආකාරයෙන් නිම කිරිම සුදුසු යයි සභාවට යෝජනා කරනවා. එම යෝජනාව අනුව මේ ස්ථානයේ ජල භාවිතයට හා අපද්‍රව්‍ය බැහැරවන ප්‍රමාණයට පරිදි ගැලපෙන පරිදි මුද්‍රිත වැසිකිළි වළවල් තුනක් සැකසිමට සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පොල භූමියෙහි ඇති ප්‍රධාන වැසිකිළියේ වල අලුත්වැඩියා කළයුතු මට්ටමක පවතින බැවින් තාක්ෂණ සේවා නිලධාරී වාර්තාව අනුව ජල භාවිතයට හා

අපද්‍රව්‍ය බැහැරවන ප්‍රමාණයන්ට ගැලපෙන පරිදි මුද්‍රිත වැසිකිළි වල් 03 ක් සැකසීම සුදුසු බවටත් ඒ සඳහා ඇස්තමේන්තු සකස් කරන ලෙස ගරු සභාව තීරණය කරන ලදී.

**වෙනත් කරුණු**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අනේ අර පාර කාපට් කරනවා. කාපට් කරන කොට අර ඩෙනට් පනියන්දුවගේ මහතා සිටි නිවස ළඟ ඉඳගෙන ඉරෝෂ්මි මහත්මියගේ නිවස ළඟට එතන කාණු පද්ධතියක් නැහැ. ඒ කට්ටිය මට ලිපියක් ගෙනත් දුන්නා.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ අයවැය යෝජනාව ඉදිරිපත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් කාපට් කළාට පස්සේ කරන්න පුළුවන්ද ?

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කාපට් කළාට කරන්න පුළුවන්. කාණුවක් හදන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් මාගේ නිවස ඉදිරිපිට කාණුව.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අද ලියා දෙන්න . අද අන්තිම දවස .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාගේ නිවස ඉදිරිපිට තිබෙන කාණුව මොකක්ද කරන ප්‍රශ්නය.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක ඉතිං කොන්ත්‍රාත්කරුවෙකු ලවා කරන්න. කිසිම ගැටළුවක් නැහැ. තිබුණු කාණුවනේ. කවුරු වුණත් . එක ප්‍රශ්නයක් වුණොත් අපි පැහැදිලි කරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී මෙනවිය කතා කරමින්</u>**

නැතිනම් සභාපතිතුමා අතන මැද්දෙන් හරි අතන වතුර බස්සන්න මොකක් හරි කරන්න. නැතිනම් මට හරිම ප්‍රශ්නයක්. මාගේ වත්තෙන් තමයි මුළු මහ අම්බලන්ගොඩම වතුර බහින්නේ.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඉන්න මා කුමාර මහතා සමඟ පෞද්ගලිකව කතා කරලා . මා ඕක විසඳා ගන්න බලන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් මේ වන විට අපේ පොරොක් ඇළ ළඟ අපේ මාර්ග සති පාරේ බැම්ම සමඟ පාරේ වැඩ කෙරිගෙන යනවා. දැන් මා යෝජනා කරනවා මට සභාවෙන් අරමුදල් ලබා දෙන්න . මුදල් අනුමත කරන්න. ඉතිරි ටිකක් මේ සමඟම කරන්න. තව මීටර් 30ක් විතර තිබෙනවා. මා හිතන්නේ මන්ත්‍රිවරු කවුරුවත් අකමැති වෙන එකක් නැහැ. ඒ ටිකක් ඉවර කළේ නැතිනම් අපි කරපු වැඩේ කිසිම ප්‍රතිඵලයක් නැහැ. මා එයට ඔබතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සහායෝගය ඉල්ලා සිටිනවා. එය අවසන් කරන්න අවස්ථාව ලබා දෙන්න කියා.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි එයට අවස්ථාව දෙන්නම්. තව මා ලිපියක් එවා ඇති සියළුම මන්ත්‍රිවරුන්ට. ලබන වසර සඳහා කාපට් කිරිම සඳහා යෝජනා එවන්න කියා. මන්ත්‍රිවරු 21 ට මා දැනුම් දෙන්න කිවුවා . තමාගේ ප්‍රදේශයේ. මා යවන්න කියා දැම්මා. එහිදි ලබන පාර තිබෙන එකේදි කිලෝමීටරයකට වැඩි පාරවල් පමණයි කාපට් කරන්නේ. කිලෝමීටරයට අඩු පාරවල් සියල්ලම ඉන්ටර්ලොග් කිරිම තමයි කරන්නේ. එකනිසා තමන්ගේ තිබෙන පාරවල් වල අපිට කිලෝමීටර් 15ක් හම්බ වෙනවා. ඒ කිලෝමීටර් 15 ලබා ගැනිමට අවශ්‍ය යෝජනා දෙන්න. මා ලියුම දෙන්න ඕන 05 වෙනකොට. එමනිසා 05දාට කලින් ලිපිය එවන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාගේ කොට්ඨාශයේ කිලෝමීටරයේ එක පාරක්වත් නැහැ.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමාගේ දැන් ගත්තොත් එහෙම ගාලු පාරේ සිට පෝරඹ ඒ දක්වා සම්පූර්ණම යනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

නැහැ. එක යනවා. මට අයිති වෙන්නේ පිරිස් වෙද මාවත විතරයි. මා මේ කියන්නේ අපේ කොට්ඨාශයේ කිලෝමීටරයේ ඒවා නැහැ. දැන් උදාහරණයක් විදියට. මෙය සංශෝධනය කර ගන්න. මොකද ඒ ගම්මු අපෙන් අහනවා ඇයි මේ පාර කාපට් කරන්නේ නැතුව අනිත් පාර කාපට් කරන්නේ කොහොමද කියා. මේ මන්ත්‍රිවරුන්ට අඩුම වශයෙන් කිලෝමීටර් භාගයක්වත් අඩුම වශයෙන් වසමකට එක පාරක්වත් එන විදියට කාපට් කරන්න කියා මා ඉල්ලා සිටිනවා. එක පාරක් හරි. එතකොට බෙරෙන්න පුළුවන්.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපිට කන්ද මාවත මෙතන සිට බලපිටිය පැත්තට කිලෝමීටරයක් නැද්ද?

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, රණසුරිය පාර කාපට් කිරිම ගැන පොඩි ගැටළුවක් තිබෙනවා. අනිවාර්යෙන් ජනතාවට බලාගෙන ඉන්නේ. මෙය යටවෙනවා. යටවෙන නිසා මට අරංචි වුණා අඩියක් විතරයි කියා දමන්නේ. උස්සන්නේ අඩියක් කියා. අඩිය මදියි. අර මුත්තයියා ඇළ හැදුවානේ . එමනිසා අර දෙපැත්තේ පාසැල් යන්න බැහැ. වැස්සාම . ඒ කියන්නේ එය යටවෙනවා අඩි 2 ½ විතර උස්සන්න ඕන දෙපැත්ත. එමනිසා කොරිපස් දමා ABC දමා ඒ පාර උස්සා ගන්න ඕන. මේ කොන්ත්‍රාත්කරුවන් සමඟ ඔබතුමා කතා කරලා

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ ඇස්තමේන්තු ලැබෙන හැටියට . අපි එයට වැඩිපුර ඉල්ලා තිබෙනවා. අපි කිවුවා එයට මදි පාඩුවක් තිබෙනවා නම් අපෙන් සභාවෙන් එකට දෙන්නම් කියා.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා , ඔබතුමා මතක් කරන්න. ඔබතුමා දැක තිබෙනවානේ තැන් මොනවාද කියා.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ ස්ථාන මොනවාද කියා මා ඒ අයට පෙන්නුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත  මහතා  කතා කරමින්</u>**

උස්සලා ඒ ටික කර දෙන්න . සභාවෙන් හරි. නැතිනම් වැඩක් නැති වෙනවා ඒ පාර සැදිමේදි.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මහ විදිය ලබන පාර මා මේකට දැම්මා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මහ අම්බලන්ගොඩ පාර මානාන ක්‍රිඩාංගණයට විතරයි කාපට් කරන්නේ. ඉතිරි ටිකක් කර දෙන්න.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. ඉතිරි ටිකක් කර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා  කතා කරමින්</u>**

ඊට එහා කර දෙන්න.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බැහැ . එක ඇවිත් වෙන පාරක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා  කතා කරමින්</u>**

දැන් මේ ව්‍යාපෘති වලට මේ පාර දමන්නකෝ ඉතිරි ටික. අපේ කොට්ඨාශයේ එක පාරක්වත් නැහැනේ. දැන් පන්සල

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ඕක ලියා බලන්නම් අතිගරු ජනාධිපතිතුමාට. දැන් මෙහෙමයි ජනාධිපතිතුමා මෙය සාදා තිබෙන්නේ රටටම. එතකොට අපි අපේ මේ යෝජනාව මේහෙම ඉදිරිපත් වෙනවා. මේ ගැන සලකා බලන්න කියා අපි ඉල්ලීමක් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එතකොට අපේ නමුත් දමන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ආර්.ඊ.ඒ . ද සිල්වා මාවත කාපට් කරනවානේ. එක ඇතුළත් වෙලා තිබෙනවානේ.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කිලෝමීටර් 15ක්නේ. 15 ඇතුළත ඉතුරු වුණොත් අපි දමන්නම්. තව පාරක් අපි නම් කර එවන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් කිලෝමීටරයක් කාපට් කරනවානේ. විලේගොඩට නම් කිලෝමීටරයක් අයිති වෙන්නේ නැහැ. හල්වතුර වටේම දැම්මාත් කිලෝමීටරයක් නැහැ. ඔය පාර තමයි ඉක්මනට අබලන් වෙන්නේ. ට්‍රැක්ටර් යනවා. කසළ අංගණයට ඔක්කොම කසළ අරගෙන යන්නේ. ඉක්මනටම අබලන් වෙන්නේ ඒ පාර. වාහන ටික ඔක්කොම ඔය පාරේ යන්නේ. සභාපතිතුමා කතා කරලා ඒ පාර කාපට් කර දෙන්න. යන වියදමත් අතුරු පාරවල් එක්ක.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කිලෝමීටර් 05ක් ඉතිරි කරලා . අවිත් තිබෙන්නේ කිලෝමීටර් 7ක් විතර. දැන් අපේ ව්‍යාපෘතිය කිලෝමීටර් 07 ක් වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

විලේගොඩට ඇවිත් තිබෙන්නේ කිලෝමීටර් 300 ගාණක්. පොල්වත්ත පරණ පාර එක.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පොල්වත්ත පාරණ පාර. දැන් ආපහු ටෙන්ඩර් කළාම . ආපහු ටෙන්ඩර් එක එනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එපිට මුල්ල පාර කාපට් කර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් අපි ඉල්ලුවා මහ අම්බලන්ගොඩ පාරේ ABC ඒ විස්තර ටික අපිට ලැබෙනවාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා නම් දැක නැහැ. අපේ එක වැඩ පරිපාලක මහතෙකු එතන හිටියේ නැහැ. ගල් කියුබ් කොච්චර විතර බා තිබෙනවාද ? එහෙනම් එච්චර ප්‍රමාණයක් මෙතන නැහැ.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක අපිට බලන්න පුළුවන්. දමන මේවා එක අනුව. තාක්ෂණසේවා නිලධාරි මහත්වරු එය හරියට බලා එය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

අපේ කාර්මික නිලධාරිතුමා අත්සන් කර තිබෙනවා නම් කිසි ප්‍රශ්නයක් නැහැ. ගැටළුවක් නැහැ. හරියට බා තිබෙනවා නම්.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමන්ලා සියළු දෙනාගේම අදහස මා පිළි ගන්නවා. මේවා භාර ගැනීමේදි එවා නිසි විදියට කෙරනේන ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

මා ඉල්ලීමක් කරනවා අපේ නිලානි මන්ත්‍රිතුමියට එතන අධික්ෂණය කරන්න. එතුමියගේ අත්සන නැතුව බාන්න එපා කියා. මන්ත්‍රිතුමියට පුළුවන්ද මෙතන අධික්ෂණය කරන්න. කියුබ් ගණන . මොකද කොන්ත්‍රාත්කරුත් ඒ මහත්වරුත් අසරණ කරන්න එපා. ඕවා බලන්න පොඩ්ඩක් අධික්ෂණය කරලා. මොකද අපි ළඟ නැහැ කොන්ත්‍රාත්කාර මහත්වරු.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. මන්ත්‍රීවරු මෙහෙම දෙයක් තිබෙනවා. ඔය කොන්ත්‍රාත්කාර මහත්වරු මිට පස්සේ සැපයුම් කරන එකක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පොඩ්ඩක් හොයා බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ . සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා කියන්නේ අර අතන කුණු දමන තැනට අපි මන්ත්‍රීවරු පත් කළානේ පස් ගෙන එන එක බලන්න කියා. ඒ වගේ කමිටුවක් පත් කරන්න පස් දමන තැනටයි ABC දමන තැනටයි මන්ත්‍රීවරු තුන් දෙනෙක් පත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් හදලා ඉවරයි භාගයක්.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නිලානි මන්ත්‍රීතුමිය මෙහි ඉතිරි කොටස අධික්ෂණය කිරිමට භාර ගන්නවාද? එහෙමනම් තාක්ෂණසේවා නිලධාරි මහත්වරු එහෙම ගෙනහින් බානවා නම් නිලානි මන්ත්‍රීතුමියගේත් අත්සන ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මට තිබෙන ප්‍රශ්නය ඔබතුමා මේක තේරුම් ගත්තේ නැහැ.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා ඔබතුමා එක්ක එකඟයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ප්‍රශ්නයට පිළිතුරු ලැබෙන්න ඕනේ. දැන් මා කියන්නේ හතළිස් ගණනක් බැවා. ඒ විස්තර ටික අපිට ලැබෙන්න ඕන. කාණුවේ දිග මෙච්චරයි. මෙතනට මෙච්චර බැවා. ඒ දමපු ප්‍රමාණයත් එක්ක මේ හතළිස් ගණන සම්බන්ධ වුණාද? අන්න එකයි පිළිතුර එන්න ඕන. මේක උප

සභාපතිතුමා අධික්ෂණය කරලා මෙහි විස්තරය අපිට දෙන්න. අනිත් එක තමයි මේ මිට පස්සේ මේ අමතර දමන ඒවා අපේ මන්ත්‍රිවරුන්ට කියව ගන්න වත් වේලාවක් හිටින්නේ නැහැ. මිට පස්සේ ලේකම්තුමිය මේ විදියට කරන්න යන්න එපා. ඒ එන න්‍යාය පත්‍රය පිටු 100ක් වුණත් කමක් නැහැ එවන්න. උදේට දමනවා. දෙනවා ඇවිත් ගෙනත්. අපේ ඔලුවත් මංඤන් වෙනවා. දෙන එවා කියවන්නත් බැහැ. එක නිසා එක කරන්න එකක්.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මිට පස්සේ උදේ දමන එවා ඊළඟ සභාවට දමන්න. එතකොට ඉවරයි. දැන් ප්‍රශ්නයක් නැහැනේ . දැන් කර්මාන්ත අධික්ෂණ කමිටුවකුත් එනවානේ. මුලා කමිටුව හරහා මේකට යොදන්නේ නැතුව එකට දැම්මාම මෙතන කාලය ඉවරයි. මැද්දේ අපි සභාව තිබෙනවා. මැද්දේදි එක තියෙනවා. අනුමත කර ගැනීමේ හැකියාව තිබෙනවා. මේය මේවා කරන්න ඕන කියන එක තමයි අපේ කණ්ඩායමත් කියන්නේ. විපක්ෂ කණ්ඩායම කියන්නේත් ඒ ටිකයි. කිසිම වෙනසක් නැහැ අපේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඕක තේරුම් ගත් එක හොඳයි. අපි සතුටු වෙනවා.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි තේරුම් අරගෙන තිබෙන්නේ. අපි කවදාවත් යටි මඩි ගසා හොරකම් කර නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

හොරකම් කරනවා නෙමේනේ අපි කියන්නේ. අපි කියන්නේ ඔබතුමා හොඳයි. අපි කියන්නේ මේ වැඩපිළිවළ ක්‍රමානුකූලව යන්න ඕනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් ඔය කාපට් වෙනුවට වෙන කතන්දරයක් ගියානේ. එකේ මිටර 100 ද 500 කියා තිබෙනවාද ? පොඩි පොඩි එවා දමන්න පුළුවන්ද ?

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කිලෝ මීටරයට අඩුනම් ඉන්ටර්ලොග්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඉන්ටර්ලොග් එකට මීටර් 100 මීටර් 80 දමන්න පුළුවන්ද ?

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පුළුවන්. මේ ලැයිස්තුව අත්සන් කර මා 05 යවන්න ඕනේ. ඒ කියන්නේ අද 01දා. හෙටයි අනිද්දයි ඇතුළත මන්ත්‍රිවරු ලැයිස්තුව ගෙනත් දෙන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔය කලින් දැම්ම එවාට අමතරව නේද?

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අරවා වැඩ කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

අනිත් එක තමයි දැන් අපිට ඔය න්‍යාය පත්‍රයට දමපු ලිපි පසුව හම්බ වෙනකොට අපිට එය හරියට කියවා ගන්න වේලාවක් නැහැ. මාතෘකාව ගැන කතා කරන්න. රාහුල මන්ත්‍රිතුමා කිවු පරිදි අපිට ඒවා ලැබෙන්න සලස්වන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මේ වේලාවේ සතොස ඉදිරිපිට මාළු පෙට්ටි ගෙනත් තියාගෙන විකුණනවාලු. කඩ කරුවන් දූරකථන ඇමතුම් දෙනවා ගඳයි ඉන්න බැහැ කියා. දැන් මේ අවස්ථාවේ දූරකථන ඇමතුමක් ආවා.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ආදායම් පරික්ෂක මහතාණෙනි , අන්න අර මාළු විකුණනවා සතොස ඉදිරිපිට . අන්න ඒවා ඉවත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරු . දැන් අද තිබෙන තත්ත්වය. අද වෙනකොට අපිට එක ලැබෙන්න ඕන.නැහැ මට ලැබුණු නැහැ. මට ලැබෙන්නත් ඕන නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපිට ලැබුණා. නිරෝධානය වෙච්ච නම්ටික.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

බොට ලැබුණාට මට වැඩක් නැහැනේ. මට ලැබිච්ච නැති එකනේ මා කතා කරන්නේ. උඹ නිකං දා ගන්න යන්න ඕනේ නැහැ.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා.

පස්වරු 2.25 ට රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරනවා.

ඩබ්.ඩී.ආර්.ජේ.රුද්‍රිගු මිය
ලේකම්
අම්බලන්ගොඩ - නගර සභාව

අරුණ ප්‍රදීප් මණිමෙල්වඩු
සභාපති
අම්බලන්ගොඩ - නගර සභාව

2020.12.24

වන දින
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදි.